ISSN 2420-7381

# සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය

# 2020

හත්වන වෙළුම, දෙවන කලාපය

# Journal of Social Statistics

# 2020

**Volume 07, Issue 02**

**ප්‍රකාශනය**

**සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය**

**සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය**

**කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව**

සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහය 2020 - සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගම් වාර්ෂික ප්‍රකාශනය

---

මුද්‍රණය 2021 පෙබරවාරි

---

ISSN 2420-7381

---

සංස්කාරක : සහකාර කථිකාචාර්ය ලෂිනි ලියනගේ

සහාය සංස්කාරක : සහකාර කථිකාචාර්ය පී. ජී. ටී. එන්. පෙරේරා

---

කවර නිර්මාණය : සහකාර කථිකාචාර්ය ලෂිනි ලියනගේ

---

හත්වන වෙළුම, දෙවන කලාපය

---

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ඇතුලත් ශාස්ත්‍රීය ලිපිවල අන්තර්ගත කරුණු සම්බන්ධ වගකීම කර්තෘන් සතුවන අතර, ඒ සඳහා සංස්කාරක මණ්ඩලය වගකීමක් නොදරයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශයේ සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රකාශයට පත් කරන සමාජ සංඛ්‍යානය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි හත්වන වෙළුම, දෙවන කලාපය ප්‍රකාශන අනුග්‍රහය

# සඟරා ලිපි විමර්ශන මණ්ඩලය


- මහාචාර්ය ඩබ්.එම්. සේමසිංහ මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (S.J'pura), Ph.D. (Kel'ya)*

- මහාචාර්ය එච්. එම්. නවරත්න බණ්ඩා මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (C'bo), M.Sc. (York), Ph.D. (Kel'ya)*

- මහාචාර්ය ආර්. ඒ. සීතා ප්‍රියංගනි මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.A. (Kel'ya), M.A. (Japan), MSSc. (Kel'ya), Ph.D. (NZ)*

*1ග* ආචාර්ය මංජුල ගුණරත්න මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
*B.A. (Kel'ya), M.S.Sc. (Kel'ya), Ph.D. (UMS)*

- ලක්දිනි දසනායක මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
  *B.Sc. (Kel'ya), PG.Dip. (C'bo), MSSc. (Kel'ya)*

2ග ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
*B.A. (Kel'ya), M.A.(ROK), Ph.D (SNU)*

3ග අපේක්ෂා ඇඹුල්දෙණිය මිය (ආධුනික කථිකාචාර්ය)
*B.A. (Kel'ya), PQHRM (IPM), M.Sc. (Col'bo)*

4ග දිලුෂි කොඩිතුවක්කු මෙය (ආධුනික කථිකාචාර්ය)
*B.A. (Kel'ya), M.Sc. (Moratuwa)*



# Message from the Vice Chancellor

# University of Kelaniya

It is with great pleasure that I write this message of felicitation for the 7th volume of the Journal of Social Statistics (JSS) – 2020”, because I strongly believe that undergraduate level education and training in research is essential to improve and sustain the quality of university education.

Despite the multitude of challenges faced by researchers and conference organizers during the current COVID19 pandemic, the Department of Social Statistics has remained steadfast in its commitment to building a strong research environment and providing a suitable platform for the dissemination of research results for the 7th consecutive year. I am certain that the research findings presented in this issue of the Journal of Social Statistics will undoubtedly assist policy makers and planners to translate conclusions into meaningful action.

I take this opportunity to thank all the staff members of the Department of Social Statistics for all their efforts to preserve the image of the Department as a benchmark in academic outreach, with quality teaching-learning activities, and a deep commitment to dissemination of research studies. I am very happy to note your hard work in publishing this journal.

Finally, I wish all researchers’ fruitful deliberations that would help you achieve your high academic and career goals.

**Professor Nilanthi de Silva**

Vice Chancellor

University of Kelaniya



# Message from the Dean
# Faculty of Social Sciences

It is with great pleasure that I extend my warmest wishes for the 7th volume of the Journal of Social Statistics – 2020 published by the Department of Social Statistics.

The journal will provide an opportunity for undergraduates following Social Statistics to share their research findings and to exchange their views on multidisciplinary topics. The evidence-based research would contribute to addressing current issues related to different fields in Sri Lanka. Training undergraduates to engage in high quality research is very important. Not only conducting research, but also publishing research findings in reputed journals is equally important in order to use them for the enhancement of knowledge and national development. I am sure this journal will be of great benefit to all authors and readers.

Finally, I would like to thank everyone who has supported the publication of this year’s journal and I offer my congratulations to the Head of the Department, organizing committee and authors. Furthermore, I wish them the very best in their future endeavours.

**Professor M. M. Gunatilaka**

Dean

Faculty of Social Sciences

University of Kelaniya



# Message from the Head
# Department of Social Statistics

For the seventh consecutive year, the Department of Social Statistics, Faculty of Social Sciences, University of Kelaniya publishes "Journal of Social Statistics (JSS) – 2020" under the "Statica" major programme.

JSS is a bi-annual and blind reviewed journal which strives towards publishing original and genuine articles encompassing different topics in Social Sciences. The Journal will contain original research articles. The unbiased and un-opinionated review system effectively filters the validity and importance of articles in today's social sciences domain.

JSS is a tremendous opportunity for undergraduates following their bachelor's degree in Social Statistics. This journal offers an immense support for the young researchers to develop their research skills and academic writing skills. As a department, we always dedicate in motivating researchers to publish adequate research findings. The main objective of the publication of this journal is to create a platform to open a unique opportunity for our undergraduates for publication of high quality scholarly articles on a variety of topics related to Social Sciences. On this purpose, I believe, JSS-2020 will be simply remarkable among the others.

I would like to acknowledge the commitment shown by all the staff of the department of Social Statistics, members of the Social Statistics Students' Association. I take this opportunity appreciate the Finally, I congratulate all the authors and wish you all the best for your future accomplishments

**Dr. Manjula Gunarathna**

Head, Department of Social Statistics

University of Kelaniya



# Message from the Chairman
# Research Council
# University of Kelaniya

It is with great pleasure that I convey this message to the "Journal of Social Statistics (JSS) – 2020" which is published under STATICA Program by the Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya.

Training undergraduates to engage in high quality research is very significant as they are our future researchers. It is not only conducting research, but also publishing it in a journal is equally important in order to use them for the enhancement of knowledge and national development.

I congratulate the coordinators and the organizing committee for publishing the "Journal of social Statistics (JSS) 2020" successfully.

**Senior Professor N.P. Sunil-Chandra**

Chairman of the Research Council

University of Kelaniya



# Message from the Editor

## Journal of Social Statistics (JSS)

For the seventh consecutive year, Social Statistics Students' Association, Department of Social Statistics, University of Kelaniya publishes the 7th volume of the Journal of Social Statistics (JSS 2020).

JSS 2020 is a tremendous opportunity for undergraduates to publish their research findings. The aim of JSS is to provide a forum for the dissemination of original research, which publishes bi-annually in the multidisciplinary areas of research. We are keen to boost publication of high quality evidence-based researches in all the categories of academia in a broad sense with a quantitative perspective, by authors who are doing their bachelor's degree in Social Statistics at University of Kelaniya. This helps young researchers to develop their research skills and academic writing skills too.

I would like to convey my sincere gratitude to Dr. K. M. L. M. Manjula Gunarathna, Head, Department of Social Statistics for his vast guide and support for this event. As well as I would like to thank all the Senior Professors, Professors, Senior Lecturers and Lecturers for reviewing articles and their guidance in this event. And I thank all our submitting authors, who have toiled in the production of their work. Finally, I strongly encourage you to submit novel and enlightening manuscripts to educate and support the growing academic world and I wish all the participants to have a successful future.

**Ms. Lashini Liyanage**
Assistant Lecturer
Department of Social Statistics
University of Kelaniya

# සමාජ සංඛ්‍යානය විෂය ශිෂ්‍ය සංගමය

# නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| සභාපති | ඩබ්. එම්. එම්. වීරසුන්දර |
| උප සභාපති | සී. බී. බිංගුමලී |
| ලේකම් | එන්. බී. පී. උපේක්ෂානී |
| සම ලේකම් | ඩබ්. ජී. පී. සී. වටගල |
| භාණ්ඩගාරික | අයි. එච්. ආර්. ටී. එම්. බණ්ඩාර |
| සඟරා සංස්කාරක | එච්. එල්. ඒ. එම්. සෙව්වන්දි |
| කමිටු සාමාජිකයන් | එච්. ඒ. එන්. ඩී. ප්‍රේමලාල් |
| | එස්. ජේ. එස්. එස්. දිනෙත්සලා |
| | බී. කේ. කේ. ගයාන් |
| | එම්. කේ. ඩී. විතානවසම් |
| | ඩබ්. එම්. සී. ලක්ෂාණි |
| | ඩබ්. එම්. ඒ. පී. වන්නිනායක |

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික | ආචාර්ය එච්. ආර්. එස්. සුලෝචනී මිය |

## පටුන


ශ්‍රී ලංකාවේ උසස්පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා ඔවුන්ගේ කියවීමේ පුරුදු මගින් සිදු කරන බලපෑම 01

ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය 11

ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපාන සාධක : කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරෙන් 23

කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනය 37

පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑම (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරෙන්) 61

ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය සහ වෘත්තීය අධ්‍යාපනය 77

තරුණ සේවා වියුක්තිය කෙරෙහි බලපාන සාධක (ගාල්ල දිස්ත්‍රික්කය ඇසුරින්) 95

සාම්ප්‍රදායික කර්මාන්තහිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම 103

වනඅලි උවදුර ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සහ ජන ජීවිතයට සිදුකරන බලපෑම පිළිබඳ අධ්‍යයනය (පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්) 117

Factors Affecting on the Rural Household Savings Behaviour : A special reference to Gampaha District 131

# ශ්‍රී ලංකාවේ උසස්පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා ඔවුන්ගේ කියවීමේ පුරුදු මගින් සිදු කරන බලපෑම

එස්. ඒ. එස්. ඩී. ජයතිලක

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
sithudilrukshi2@gmail.com

***සංක්ෂේපය***

*කියවීම වයස්භේදයකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට නියැලිය හැකි විනෝදාංශයක් මෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන්ද වැඩි අවධානයකට ලක්වන මාතෘකාවකි. නමුත් මෑත කාලීනව, විශේෂයෙන්ම පාසල් සිසුන් මෙම කියවීමට පෙන්වන නැඹුරුතාවය ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ උසස්පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු ඔවුන්ගේ අධ්‍යයන කාර්යසාධනය සඳහා සිදු කරන බලපෑම කෙබඳු දැයි හඳුනා ගැනීමයි. මෙහි දී ශ්‍රී ලංකාවේ වැඩිම පාසල් ප්‍රමාණයක් ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව කලාපයේ පාසල් 188ක් අතරින් ගල්ගමුව අධ්‍යාපන කොට්ඨාසයේ වැඩිම පාසල් ප්‍රමාණයක් ලෙස 57ක් පාසල් පවතී. එහිදී ද ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට යටත්ව පාසල් 36ක් හඳුනාගත හැකිවේ. එම පාසල් අතරින්ද උසස්පෙළ පහසුකම් පවතින පාසල් 8කි. එබැවින් එම පාසල් 8 මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙහිදී අපේක්ෂිත සංගහනය තුළින් නියැදිය තෝරා ගැනීමට පොකුරු නියැදීම, ස්තෘත නියැදීම සහ සමානුපාතික විභේදනය යොදා ගෙන ඇත. නියැදියෙන් දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, කයි වර්ග පරීක්ෂාව, සහසම්බන්ධතා සංගුණකය හා බහුගුණ ප්‍රතිපායනය උපයෝගී කරගන්නා ලදී. ඒ අනුව උසස්පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතින බවට මෙම අධ්‍යයනය මගින් තහවුරු විය. එසේම සිසුන්ගේ ස්ත්‍රීපුරුෂභාවය අනුව, ඔවුන් හදාරණ විෂයන් අනුව සහ නව තාක්ෂණය භාවිතා කරමින් සිසුන් කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලයත් ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතින බව පැහැදිලි විය. තවද සිසුන් කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලය, සිසුන්ගේ කියවීම වර්ධනයට පාසල විසින් අවුරුද්දක් තුළ පවත්වන ව්‍යාපෘති ගණන, සිසුන්ගේ මිතුරන් අතර සතියකදී හුවමාරු කරගන්නා කියවීමේ මාධ්‍යයන් සංඛ්‍යාව යන සාධක සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා බලපාන බව මෙම අධ්‍යයනය මගින් තහවුරු විය. කියවීම කිසිදු භේදයකින් තොරව සෑම පුද්ගලයෙකුටම වැදගත්වන අතර ඒ අතරින් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා වැඩි බලපෑමක් ඒ ඔස්සේ සිදු කරයි. එසේ මෙම අධ්‍යයනය මගින් හෙළි වූ ආකාරයට වර්තමානය තුළ සිසුන් සිදු කරන සාමාන්‍ය මට්ටමේ කියවීමේ පුරුදු මීට වඩා වැඩි ප්‍රවණතාවයකින් සිදු කිරීම මගින් වඩාත් යහපත් ප්‍රතිඵල උදාකර ගත හැකිය.*

***මුඛ්‍ය පද : අධ්‍යයන කාර්යසාධනය, උසස්පෙළ පාසල් සිසුන්, කියවීම***

## 1. හැඳින්වීම

කියවීම මිනිසෙකුගේ ජීවිතයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එය භාෂාවේ වැදගත්ම අංගයක් වන අතර මුළු ජීවිත කාලය පුරාම එය ඉගෙනීම සඳහා අත්‍යාවශ්‍ය මෙවලමකි. එය ඉතා කුඩා අවධියේ සිටම පුරුද්දක් වශයෙන් තම දින චර්යාව කොටගත් අයෙකු සතු දැනුමේ ප්‍රමාණය මෙතෙක් යැයි නිර්ණය කළ නොහැකි වේ. කියවීම පුරුද්දක් වශයෙන් සිදු කිරීමට ඒ පිළිබඳව පුද්ගලයින්ගේ ආකල්ප, ආශ්‍රය කරන්නන්, වටපිටාවේ ස්වරූපය හා ඒ පිළිබඳව සිදු කරන උනන්දු කිරීම් යන කරුණු කාරණා හේතු වේ. මෙගින් සරලවම නිර්මාණශීලීත්වය, විවේචනාත්මක චින්තන හැකියාව, පෞරුෂත්ව සහ මානසික හැකියාවන් වර්ධනය කරයි. විශේෂයෙන්ම සමාජය තුළ පවතින එක් මතයක් වන්නේ කියවීම මගින් පුද්ගලයෙකුගේ මතක ශක්තිය, එනම් ධාරණය කරගැනීමේ හැකියාව වර්ධනය කරන බවයි (Sunil, Amarasiri, Gunasekara & Subasinghe, 2016).

වර්තමානයේදී ද කියවන්නන් බොහෝ ප්‍රමාණයක් සිටින නමුත් නව තාක්ෂණික ලෝකයත් සමඟ එය ගලපාගනිමින් සමාජ, තාක්ෂණික වෙනස්කම් වලට අනුවර්තනය වෙමින් පවත්වාගෙන යාම අභියෝගයට කරුණක් වී ඇත. මෙම සන්දර්භය තුළ එය අඛණ්ඩව පවත්වාගෙන යාම රටට සම්පතකි. කෙසේ නමුත් වර්තමානය වන විට පවතින සමාජමය වටපිටාව සහ ඇතැම් කරුණු කිහිපයක් පදනම් කරගෙන කියවීම වත්මන් පරපුරෙන් කෙමෙන් දුරස්වන බවට සාධක හමු වේ. මෙම හේතුව නිසාවෙන් මේ වන විට කියවීම් නිසා අපට ලබා ගත හැකි ප්‍රයෝජන මෙන්ම වාසිදායක තත්වයන් දුරස්වේදැයි යන්න ගැටලුවකි. කියවීම වයස්භේදයකින් තොරව ජීවිතයට ළං කරගත යුතු අංගයක් වුවත් විශේෂයෙන්ම පාසල් යන වයසේ දරුවන්හට මෙමගින් සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම මේ මොහොතේ සිදුවිය යුතුම සමාජමය අවශ්‍යතාවයකි. ඒ අතරින්ද පාසල් සමයේ විශේෂ කඩඉමක් පසු කරන උසස්පෙළ සිසුන් සතුව පවතින කියවීමේ පුරුදුත් එමගින් ඔවුන්ගේ අධ්‍යාපන කාර්යසාධනය සඳහා සිදුවන බලපෑමත් හඳුනාගැනීම සඳහා තෝරා ගත් පාසල් කිහිපයක් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

නව ලෝකයත් සමඟ කියවීමේ පුරුදුවල සිදු වෙමින් පවතින වෙනස්කම් අභිමුව එහි භාවිතයත්, පාසල් සිසුන්ට කියවීමේ පුරුදු ප්‍රගුණ කිරීමෙන් මෙන්ම ඉන් බැහැර වීමෙන් බලපෑමක් එල්ල වන්නේ ද යන්න මෙමගින් අධ්‍යයනයට ලක් කරනු ලබයි. එහි දී හඳුනාගත් අරමුණු කිහිපයකි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උසස් පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදු හා එමගින් ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා වන බලපෑම අධ්‍යයනය කිරීම. ඊට අමතරව ස්ත්‍රී පුරුෂභාවය අනුව උසස් පෙළ සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා ඔවුන්ගේ කියවීමේ පුරුදු වල බලපෑම අධ්‍යයනය කිරීම, උසස් පෙළ කලා, වාණිජ, විද්‍යා, තාක්ෂණවේදය යන කාණ්ඩවලට අයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා කියවීමේ පුරුදු වල බලපෑම වෙන වෙනම අධ්‍යයනය කිරීම සහ නව තාක්ෂණය භාවිතා කරමින් සිදු කරන කියවීමේ පුරුදුත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා ඒවාගේ භාවිතය සහ එහි බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම ලෙස සෙසු අරමුණු ද කිහිපයකි.

## 2. සාහිත්‍ය විමර්ශනය

කියවීමේ පුරුදු පිළිබඳව අවධානය යොමු කිරිමේ දී පාසල් සිසුන් විශේෂ කරගනිමින් දක්වන විට බොහෝ සිසුන් දවසින් අවම විනාඩි 15ක් හා උපරිම පැය 9ක් වන කාලයක් අතරතුර කියවීම්හි නිරතවේ. එය සාමාන්‍ය කාලය විනාඩි 142කි. කියවීමේ ප්‍රභවය ලෙස ඔවුන්ගේ පළමු තේරීම වන්නේ පාසල් පුස්තකාලයයි. දෙවන තේරීම වන්නේ පංති පුස්තකාලයයි. මහජන පුස්තකාලය, ළමා සමාජ පුස්තකාලය, තරුණ සමාජ පුස්තකාලය ඉන් අනතුරුව පිලිවෙළින් දක්වා ඇත. එසේම දරුවන්ගේ කියවීමේ අරමුණු ලෙස බහුතරයක් හඳුනාගෙන ඇත්තේ පළමු අරමුණ ලෙස දැනුම වැඩි දියුණු කර ගැනීමයි. දරුවන්ගේ දෙවන අරමුණ වන්නේ කියවීම තුළින් විභාග සමත් විමයි. තෙවන වශයෙන් මොවුන්ගේ අරමුණ වන්නේ විනෝදය සඳහා කියවිම හා විනෝදාස්වාදය ලබා ගැනීම සඳහා වේ. මීට අමතරව දරුවන්ගේ නිර්මාණාත්මක වැඩ සඳහා, තරඟ සඳහා, ඉගෙනීම ලබා ගැනිම සඳහා මෙසේ පුස්තකාලය භාවිතා කරයි (Sunil, Amarasiri, Gunasekara & Subasinghe, 2016).

කියවීමේ සංඛ්‍යාලේඛන යම්තාක් පක්ෂාග්‍රාහි විය හැකිය. ඒ මන්ද යත් සෑම කෙනෙකුම එක හා සමාන නොවන බැවිනි. ඇතැමුන් සිතන්නේ ඔවුන් දිනපතා කියවන බවයි. නමුත් යථාර්ථය නම් කියවා ඇත්තේ ෆේස්බුක් හෝ සමාජ මාධ්‍ය වල පලවන දේවල් පමණි. සිසුන් කියවන ආකාරය සහ කියවීමට ඔවුන් ප්‍රතික්‍රියා කරන්නේ කෙසේද යන්න විමසිය යුතුය. එය බලපැවැත්වන්නේ කියවීමට ඔවුන්ට උගන්වන ආකාරය අනුවය. කුඩා අවධියේ දී දරුවා කියවිමට ඉගැන්විය යුතුය. මන්ද ජිවිතයේ මුල් අවධිය කියවිමේ පුරුදු වර්ධනය කිරිමේ උච්චතම අවස්ථාවක් වන බැවිනි. එතරම් කුඩා අවධියේදී සිටම පෝෂණය කරන්නේ නම් දරුවා වර්ධනය වන විට ඔවුන් කියවීමේ පුරුද්ද රඳවා තබා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට වැඩි ඉඩක් ඇත. එය කියවීමේ පුරුදු සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය වැඩි දියුණු කරන බව ඔප්පු කරයි. ඇතැම්විට ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ කිසිදාක කියවීමේ පුරුදු නොමැති නම් ඔවුන් ඔවුන්ගේ ශාස්ත්‍රීය දක්ෂතා පෙන්වන්නේ නැත. එහිදී කාර්ය සාධනය සහ පාසලේ හොඳ ලකුණු නොලැබිය හැකිය. කියවීම එදිනෙදා ජීවිතයේ අත්‍යාවශ්‍ය අංගයකි. කියවීමකින් තොරව බොහෝ කලකට පෙර සිටම තොරතුරු හා දැනුම අද වනවිට නොතිබෙනු ඇත. කියවීමකින් තොරව එය අපට ලබා ගත නොහැකිය (Rosli, Razali & Zamil, 2017).


කියවීම සහ අධ්‍යාපන කාර්ය සාධනය සඳහා වන බලපෑම සම්බන්ධයෙන්, සිසුන් අතර පවතින කියවීමේ පුරුදු අධ්‍යාපන කාර්ය සාධනය සඳහා සිදු කරන බලපෑම යන පර්යේෂණ අනුව නියැදියට ඇතුලත් කරගත් සිසුන් 1000න් 56.7% ක් අධ්‍යාපන කාර්ය සාධනයට කියවීම බලපාන බවට ඉහළ වශයෙන් එකඟ වී ඇත. 29.3% ක් සාමාන්‍ය ලෙස එකඟවී ඇති අතරම 7.1% ක් එය ප්‍රතික්ෂේප කරන ලදී. 6.9% ක් ඉහළ වශයෙන් ප්‍රතික්ෂේප කරන ලද අතර සාපේක්ෂව ගත් කළ 86% ක් මෙම අදහස හා එකඟ වී ඇත. "හොඳ කියවීමේ පුරුදු හා අධ්‍යාපන කාර්ය සාධනය අතර සබඳතාවක් පවතී" ලෙස ඉදිරිපත් කළ ප්‍රකාශයටද 50% කට වැඩි ප්‍රතිශතයක් එකඟ වී ඇත (Acheaw & Larson, 2014).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීයික යන දත්ත ආකාර දෙවර්ගයම රැස් කිරීම සිදු කරන ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය ද ද්විතීයික දත්ත එක් රැස් කිරීම සඳහා මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන සහ සඟරා යොදා ගන්නා ලදී. නියැදිය තෝරා ගැනීමේ දී පොකුරු නියැදීමේ ක්‍රමය යොදා ගත් අතර එනම් ශ්‍රී ලංකාවේ වැඩිම පාසල් සංඛ්‍යාවක් ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප අතරින් මහව කලාපයේ පාසල් 188ක් අතරින්ද ගල්ගමුව අධ්‍යාපන කොට්ඨාසයේ වැඩිම පාසල් ප්‍රමාණයක් ලෙස 57ක් පාසල් පවති. එහිදී ද ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට යටත්ව පාසල් 36ක් හඳුනාගත හැකිවේ. එම පාසල් අතරින්ද උසස්පෙළ පහසුකම් පවතින පාසල් 8කි. එබැවින් එම පාසල් 8 මූලික කරගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එම පාසල්වලට අදාළ උසස්පෙළ පාසල් සිසුන් 1130ක් අතරින් ඉලක්ක සංගහණයේ ඒකක තෝරා ගැනීම සිදු කරන ලදී. මෙහි දී නියැදිය 100ක් වන පරිදි තෝරා ගැනීම සිදු කළ අතර එහි දී විද්‍යා අංශයෙන් සිසුන් 5ක් ද, කලා අංශයෙන් සිසුන් 72ක් ද, වාණිජ අංශයෙන් සිසුන් 12ක්ද, සහ තාක්ෂණවේදය අංශයෙන් සිසුන් 11ක් ද යනාදී වශයෙන් සිසුන් නියැදියට ඇතුළත් කරගන්නා ලදී. පර්යේෂණයේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා සමානුපාතික විභේදන ක්‍රමය යොදා ගනිමින් පාසල් 8ටම සමාන අවස්ථාවන් ලබා දීම සඳහා කටයුතු කරන ලදී.

### 4. දත්ත විශ්ලේෂණය


*ප්‍රස්තාර අංක 01: විෂයන් අනුව සිසුන්ගේ නියැදි සංයුතිය*




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

මෙහි දී කලා, වාණිජ, විද්‍යා සහ තාක්ෂණවේදය යන විෂය ධාරාවන් හදාරණ සිසුන් යොදා ගෙන ඇති අතර මෙයට අනුව 72% ක් වන වැඩිම සිසුන් ප්‍රතිශතය දක්වෙන්නේ කලා අංශයෙනි. වාණිජ හා තාක්ෂණවේදය යන අංශයන් වලින් පිලිවෙළින් 12% ක් හා 11% ක් යන සිසු ප්‍රතිශතයන් ගනු ලබන අතර විද්‍යා අංශය 5% ක අඩු සිසු ප්‍රතිශතයක් ගනු ලබයි. මෙසේ මෙම පර්යේෂණය සඳහා අදාළ නියැදිය තෝරා ගැනීම ප්‍රායෝගිකව සිදු කරන ලදී.

*ප්‍රස්තාර අංක 02: ස්ත්‍රීපුරුෂභාවය අනුව නියැදි සංයුතිය*





මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

නියැදි සංයුතිය අර්ථ දැක්වීමේ දී එහි මූලිකම අවස්ථාවක් වන්නේ අදාළ නියැදියේ සිටින ස්ත්‍රීන් සහ පුරුෂයින්ගේ ප්‍රතිශතය වෙන් වෙන්ව පැහැදිලි කිරීමයි. මෙම පර්යේෂණය සඳහා ද තෝරා ගත් නියැදිය තුළ වැඩිම දත්ත දායකයින් ප්‍රමාණයක් ස්ත්‍රී කාණ්ඩයට අයත් වන අතර එය 50% කට වඩා වැඩි ප්‍රතිශතයකි. එමෙන්ම පුරුෂ කාණ්ඩයෙන් 50%කට අඩු ප්‍රතිශතයක් දායක වී ඇත. එනම් 37% ක ප්‍රමාණයක් පුරුෂ ද, 63%ක ප්‍රමාණයක් ස්ත්‍රී ද ලෙස දත්ත දායකයින් ලෙස ක්‍රියා කර ඇත. එය මෙම ප්‍රස්තාර සටහන මගින් දක්වා ඇත.

### 4.1 සිසුන් කියවීමේ පුරුදු සඳහා දිනකට ගත කරන කාලය

*ප්‍රස්තාර අංක 03: සිසුන් කියවීමේ පුරුදු සඳහා දිනකට ගත කරන කාලය*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

සිසුන් කියවීම සඳහා දිනකට ගත කරන කාලය සම්බන්ධ ඉහත 03 ප්‍රස්තාර සටහනට අනුව වැඩිම සිසු ප්‍රතිශතයක් කියවීමේ කටයුතු සඳහා පැය 2ත් 3ත් අතර කාල පරාසයක් යොදා ගන්නා අතර ඒ 35% කි. අවම ප්‍රතිශතයක් එනම් 18% ක් පැය 3ට වඩා වැඩි කාලයක් සිය කියවීමේ කටයුතු සඳහා යොමු කර ඇත. සෙසු කාල පරාසයන්ට අනුව 27%ක් පැය 1ත් 2ත් අතර කාල පරාසයත් 20% ක් පැයට වඩා අඩු කාලයක් ද නියෝජනය කරනු ලබයි.

මෙහි දී හඳුනාගත හැකි විශේෂත්වය වන්නේ පැයට වඩා අඩුවෙන් සහ පැය 3ට වඩා වැඩි යන කාලයන් වෙත සිසුන් යොමු වීමේ අඩු ප්‍රවණතාවක් දක්නට ඇති බවයි. ඉන් පැයට වඩා අඩු කාලයක් තුළ සිදු කරන කියවීම් ප්‍රමාණය අඩු වීම සාපේක්ෂව යහපත් ප්‍රතිඵල ගෙන දෙන්නක් වුවත් පැය 3ට වඩා වැඩි කාලයක් කියවන්නන් අවම වීම එතරම් යහපත් කරුණක් නොවේ. එම නිසා පැය 3ට වඩා වැඩි කාල පරාසයේ වැඩි වීමක් තව දුරටත් අපේක්ෂා කළ යුතු වේ. සෙසු අවස්ථාවන් යුගලය සාපේක්ෂව ධනාත්මක අවස්ථාවක, එනම් මධ්‍යස්ථ සිසු ප්‍රතිශතයකින් පැවතීමත් මගින් සාපේක්ෂව සිසුන් කියවීමට අවධානය ලබා දෙන බව පැහැදිලි වේ.

*වගු අංක 01: අන්තර්ජාලය භාවිතා කරමින් කියවීම සඳහා ගත කරන පැය ගණන*

| මාතෘකාව | අන්තර්ජාලය භාවිතා කරමින් කියවීම සඳහා ගත කරන පැය ගණන |
|---|---|
| පැයට වඩා අඩු | 57% |
| පැය 1ත් 2ත් අතර | 35% |
| පැය 2ත් 3ත් අතර | 7% |
| පැය 3ට වඩා වැඩි | 1% |


මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

නව තාක්ෂණය භාවිතා කරමින් සිසුන් කියවීම සඳහා කාලය වෙන් කරන ආකාරය සම්බන්ධයෙන් මෙම වගුව මගින් පැහැදිලි වේ. අන්තර්ජාලය භාවිතා කරමින් කියවීම සඳහා ගත කරන පැය ගණන සම්බන්ධව, එනම් සිසුන් වැඩිම ප්‍රතිශතයක් තෝරා ඇත්තේ පැයට වඩා අඩු කාල සීමාවයි. දෙවනුව සිසුන් වැඩිම ප්‍රමාණයක් තෝරා ඇත්තේ පැය 1ත් 2ත් අතර ඇති කාල සීමාවයි. මීළඟට 7% ක සිසු ප්‍රතිශතයක් දක්වා ඇත්තේ පැය 2ත් 3ත් අතර කාල සීමාවටයි. අවම සිසුන් ප්‍රමාණයක් තෝරා ඇත්තේ පැය 3ට වඩා වැඩි කාල සීමාව වන අතර එය 1% ක ප්‍රතිශතයකි. එසේ මෙම දත්ත මගින් පැහැදිලි වන්නේ සිසුන් අන්තර්ජාලය භාවිතා කරමින් කියවීම් සිදු කිරීමේ ප්‍රවණතාවය අවම ස්වරූපයක් ගන්නා බවයි.

### 4.2 කියවීම් සම්බන්ධ අදහස්

ප්‍රස්තාර සටහන 04 මගින් දැක්වෙන පරිදි කියවීම සම්බන්ධයෙන් සිසුන්ගෙන් බහුතරයක් යහපත් ප්‍රතිචාර දක්වා ඇත. මෙහි දී වැඩිම ප්‍රතිශතයක් ලබා තිබෙන්නේ කියවීම පාසලේ ඇගයීම්, ව්‍යාපෘති කිරීම සඳහා උපකාරී වේ යන අදහස සමඟ වීම සාපේක්ෂව සෙසු අදහස් සමඟ සන්සන්දනය කරන විට විශේෂත්වයකි. එනම් එකග වේ යන අවස්ථාව 49% ක් සිසුන් ප්‍රතිචාර ලෙස එම අදහසට පක්ෂව දක්වා ඇත.

*ප්‍රස්තාර අංක 04: කියවීම් සම්බන්ධ අදහස්*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

### 4.3 කයි වර්ග පරීක්ෂාව

කල්පිතය ගොඩනැංවීම

$H_0$: විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත වේ

$H_1$: විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත නොවේ

*වගු අංක 02: කයි වර්ග පරීක්ෂාව*

| **පරීක්ෂාව** | **පරීක්ෂා අගය (P)** | **තීරණය** |
|---|---|---|
| උසස්පෙළ සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් ඔවුන්ගේ අධ්‍යාපනයට අතර සම්බන්ධතාවය | 0.000 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස්පෙළ පාසල් ශිෂ්‍යයාවන් කියවීමේ පුරුදුවලට ගත කරන කාලය අනුව ඔවුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවය | 0.000 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස්පෙළ පාසල් ශිෂ්‍යයන් කියවීමේ පුරුදුවලට ගත කරන කාලය අනුව ඔවුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවය | 0.000 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස් පෙළ කලා විෂය කාණ්ඩයට අයත් සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවය | 0.000 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |

| | | |
|---|---|---|
| උසස් පෙළ වාණිජ විෂය කාණ්ඩයට අයත් සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතීද යන්න පරීක්ෂා කිරීම | 0.001 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස් පෙළ විද්‍යා විෂය කාණ්ඩයට අයත් සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතීද යන්න පරීක්ෂා කිරීම | 0.004 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස් පෙළ තාක්ෂණවේදය විෂය කාණ්ඩයට අයත් සිසුන්ගේ කියවීමේ පුරුදුවලට ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතීද යන්න පරීක්ෂා කිරීම | 0.003 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| උසස්පෙළ සිසුන් නව තාක්ෂණය යොදාගනිමින් කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර සම්බන්ධතාවයක් පවතීද යන්න පරීක්ෂා කිරීම | 0.012 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |

මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2020)

කයිවර්ග පරීක්ෂාව මගින් පැහැදිලි වන්නේ සළකා බලන ලද මෙම සාධක අතර සම්බන්ධතාවයක් පවතින බවයි.

### 4.4 සහසම්බන්ධතා විශ්ලේෂණය

උසස්පෙළ සිසුන් නව තාක්ෂණය යොදාගනිමින් කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලයත් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයත් අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීම සඳහා ඇස්තමේන්තු කරන ලද සහසම්බන්ධතා සංගුණකයේ අගය +0.356 කි. සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් සිදු කරනු ලබන කියවීමේ පුරුදු සඳහා වැය කරන කාලය පහළ ප්‍රතිශතයකින් බලපෑම් සිදු කර ඇත. එනම් කොතෙක් දුරට අන්තර්ජාලය වැනි නව තාක්ෂණික ක්‍රමවේදයන් මගින් යම් කාලයක් කියවීමේ පුරුදු සඳහා යොදා ගනු ලැබුවත් එය සාම්ප්‍රදායික ලෙස කියවීම් සිදු කරන කාලයත් සමඟ ගත්විට සිදු කරනු ලබන්නේ අඩු බලපෑමක් බව මෙමගින් වඩාත් පැහැදිලි වේ.

### 5. සමාලෝචනය

සමස්තයක් ලෙස ගත්විට පැහැදිලි වන්නේ සිසුන්ගේ කියවීමේ පුරුදු හා සිසුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනය අතර සම්බන්ධතාවයක් පවතන බවයි. එය ධනාත්මක අනුලෝම සම්බන්ධතාවයක් පෙන්නුම් කරනු ලබයි. එනම් සරලවම, සිසුන් දිනකට කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලය අඩු වන විට ඔවුන්ගේ වාර විභාග ලකුණුවල සැළකිය යුතු මට්ටමේ අඩු වීමටක් දක්නට ලැබේ. නමුත් සිසුන් දිනකට කියවීම සඳහා එනම් කියවීමේ පුරුදු සඳහා ගත කරන කාලය වැඩි වන විට ඔවුන්ගේ වාර විභාග ලකුණු මට්ටම ඉහළ යාමක් පැහැදිලිව දක්නට ලැබේ.

මෙම අධ්‍යයනය මගින් හෙළි වූ කරුණු අනුව සිසුන් කියවීමේ පුරුදු ප්‍රගුණ කරමින් සිටින නමුත් එය තවමත් සාමාන්‍ය මට්ටමින් පවති. එය ද හුදෙක් බොහෝමයක් සිසුන් සිදු කරනු ලබන්නේ සිය විෂයන්ට අදාළව සිදු කරනු ලබන කියවීම් සහ එම විෂයානුබද්ධ වැඩ සඳහා පමණක් වීමත් අමතර කියවීම් සඳහා යොමු වීම අවම මට්ටමක පවතින බවත් තහවුරු විය. සිසුන්ගේ නිවෙස්වල කියවීම් සම්බන්ධයෙන් පවතින පසුබිමත්, පාසල තුළදී මිතුරන්ගෙන්, ගුරුවරුන්ගෙන්, පාසලෙන් කියවීම සම්බන්ධයෙන් ලැබෙන උත්තේජනත් අනුව සිසුන් කියවීමේ පුරුදු වලට ප්‍රවිශ්ට වීමේ හැකියාවට බලපානු ලබයි. එම අවස්ථාවන් ඒ ආකාරයෙන්ම සිසුන්ගේ අධ්‍යයන කාර්යසාධනය සඳහාද බලපාන බව තහවුරු විය. එනම් සරලවම සිසුන්ට කියවීම සම්බන්ධයෙන් පුරුදු පවතීනම් ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සඳහා එම පුරුදු සෘජුවම බලපාන බව මෙම අධ්‍යයනය මගින් තහවුරු විය.

සිසුන් කියවීමේ පුරුදු සඳහා වැය කරන කාලය සාමාන්‍ය මට්ටමට වඩා වැඩි මට්ටමකින්, එනම් කියවීමට ගත කරන කාලයට පෙරට වඩා වැඩි අවධානයක් ලබා දීම මගින් සිසුන්ගේ අධ්‍යයන කාර්ය සාධනයේ ධනාත්මක වෙනස් වීම් තවදුරටත් ලබා ගත හැකිය. ස්ත්‍රීපුරුෂභාවය අනුව සිසුන්ගේ කියවීමේ පුරුදු සම්බන්ධයෙන් අවධානය යොමු කළ විට ශිෂ්‍යාවන්ට වඩා ශිෂ්‍යයින්ගේ කියවීමේ පුරුදු මීට වඩා ප්‍රගුණ කළ යුතු තත්ත්වයක පවතී. එමෙන්ම එක් එක් පාසල් මගින් සිසුන්ගේ කියවීමේ පුරුදු වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන වැඩසටහන් මීට වඩා ක්‍රියාශීලී තත්වයක් පැවතිය යුතු වීම අවශ්‍යවන අතර එමගින් සිසුන්ට වැඩි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට අවකාශය ලැබෙනු ඇත. කියවීම සඳහා පාසල් සිසුන් නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරිම සම්බන්ධයෙන් අවධානය යොමු කළ විට පැහැදිලි වන වැදගත් කරුණක් වන්නේ අන්තර්ජාලය භාවිතා කිරීමට ගත කරන කාලයෙන් වැඩි කාලයක් කියවීම් සඳහා වෙන් කරන්නේ නම් මෙම ක්‍රම මගින් ද කියවීමේ පුරුදු සඳහා අවශ්‍ය තවත් අවස්ථාවන් ලබා ගත හැකි බවයි. මෙසේ නිසි පරිදි තවදුරටත් කියවීමේ පුරුදු ප්‍රගුණ කිරීමෙන් සිසුන්ට සිය අධ්‍යයන කාර්ය සාධනය සඳහා යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Acheaw, M., & Larson, A. G. (2014, May 6). Reading Habits among Students and its Effect on Academic Performance. *Library Philosophy and practice*.

Mayekar, S. (2010). *Study of the Impact of Reading Habits on the Performance of UG and PG Students.* Hirachand Nemchand College of Commerce, Solapur.

Rosli, N. A., Razali, N. F., & zamil, Z. U. (2017). The Determination of Reading habits among Students. *International Journal of Academic Research in Business and Social Sciences*.

Sunil, W., Amarasiri, G.D., Gunasekara, A. S., & Subasinghe, K. (2016). Reading Habits and obstacles faced by school Children in Northern and Eastern Provinces in Sri Lanka.

# ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය

එස්. එම්. ජී. සී. සමරකෝන්

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
gayanisamarakoon95@gmail.com

***සංක්ෂේපය***

*වර්තමානයේ සංවර්ධනය නොවූ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් බහුතරයක් මුහුණපාන ගැටලුවක් බවට දරිද්‍රතාව පත් වී තිබේ. තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අපොහොසත් වන අවම පෝෂණ මට්ටමක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ආදායම් මට්ටමක් නොපවතින නිසා පුද්ගලයන් දුප්පත් ලෙස අර්ථ දැක්විය හැකිය. ලෝක බැංකුව 2000 වර්ෂය සඳහා නිකුත් කරන ලද සංවර්ධන වාර්තාවෙහි දරිද්‍රතාවය දක්වා ඇත්තේ සුබී භාවයේ විහීනතාවය ලෙසට ය. ශ්‍රී ලංකාව තවමත් සංවර්ධිත තත්ත්වයට ප්‍රවේශ නොවීම නිසා දිළිඳුබව සමාජය තුළ මුල් බැස ගත් ගැටලුවක් බවට පත් ව තිබේ. 1977 දී හඳුන්වා දුන් නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය හේතුවෙන් පැවැති වෙළෙඳපොළ බාධක ඉවත් වී වෙළෙඳපොළ නිදහස්කරණය වීමත් සමග ආර්ථික වෘද්ධිය උපාය මාර්ග තුළින් පමණක් මෙරට පවතින දරිද්‍රතාව අවම කිරීමට අපේක්ෂා කළත් එම අරමුණ කරා ළඟාවීමට අපහසු බව තහවුරු විය. ඒ සමග 2000 සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දරිද්‍රතාව පිටුදැකීම අවශ්‍ය වී ඇති බැවින් ආර්ථික වෘද්ධියේ ප්‍රතිඵල දිළිඳු ජනතාව වෙත ප්‍රවේශ වන ප්‍රතිපත්ති කරා යොමු වීමක් පසුගිය දශක කිහිපය තුළ දැකගත හැකි විය. ඒ යටතේ ගත් උපාය මාර්ග අතරින් සුවිශේෂී උපාය මාර්ගයක් වන්නේ ක්ෂුද්‍රමූල්‍ය සේවා භාවිතයට දිළිඳු ජනයා දිරිමත් කිරීමයි. ක්ෂුද්‍රමූල්‍ය තුළින් ප්‍රධාන වශයෙන්ම ප්‍රමාණවත් ඇපකර ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැතිකම හා විධිමත් බැංකු හරහා තම මූල්‍ය පහසුකම් සපුරාගත නොහැකි දිළිඳු පුද්ගලයින් වෙත ණය පහසුකම්, ඉතිරිකිරීමේ පහසුකම් සහ වෙනත් මූල්‍ය පහසුකම් සැලසීම සිදු කරනු ලැබේ. ඒ අනුව ක්ෂුද්‍රමූල්‍ය ණය භාවිතා කිරීමේ ඵලදායීතාවය ණය ලබා ගැනීමට පෙර හා පසු පුද්ගලයින්ගේ ජීවන තත්ත්වයේ හා ආදායමේ සිදු වූ වෙනස පාදක කර ගනිමින් දිළිඳුකමට සිදු වී ඇති වෙනස මැන බැලීම මෙම අධ්‍යයනය මගින් සිදු කරනු ලැබේ. මෙම වෙනස මැනීම සඳහා ග්‍රාමීය අංශයේ බහුලව ක්ෂුද්‍රමූල්‍ය ණය භාවිතා කරන පුද්ගලයින් නියැදිය ලෙස යොදා ගෙන ඇත. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය සහ ආර්ථිකමිතික විශ්ලේෂණය ක්‍රමය යොදා ගෙන ඇත. මෙම පර්යේෂණය මෙහෙයවීමේ දී ආර්ථිකමිතික විශ්ලේෂණය සිදු කිරීමට බද්ධ නියැදි t පරීක්ෂාව යොදා ගෙන තිබේ. ඒ අනුව අධ්‍යයනයට අදාළව සමස්තයක් ලෙස නිගමනය කළ හැකි කරුණු වන්නේ ක්ෂුද්‍රමූල්‍ය භාවිතයත් සමග ප්‍රජා විද්‍යාත්මක හා ආර්ථිකමය සාධකවල වෙනස් වීමක් පවතින බවයි. මෙමගින් අනාවරණය කර ගත් ආකාරයට පුද්ගල ආදායම, වියදම, පුද්ගල ඉතුරුම් හා ආයෝජනය අඩු වී ඇති අතර ණය ගැනීමේ ප්‍රමාණය වැඩි වන බව ප්‍රමාණාත්මක අධ්‍යයනයෙන් පැහැදිලි වී ඇත. ඒ අනුව ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය අඩු බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දිය හැකිය.*

***මුඛ්‍ය පද ආදායම, ක්ෂුද්‍රමූල්‍ය, ග්‍රාමීය, දිළිඳුකම, වියදම***

## 1. හැඳින්වීම

ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නයක් වී තිබෙන්නේ සම්පත් හිගකම පිළිබඳ ගැටලුව වේ. එනම් මිනිසුන්ගේ අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව ආර්ථිකයක් තුළ පවත්නා සම්පත් ප්‍රමාණය සීමාසහිත බව නිසා හට ගන්නා ගැටලුවක් වේ. සමස්ත ආර්ථිකයක් පුරා ජීවත් වන මිනිසුන්ගේ විවිධාකාර වු නිෂ්පාදන තිරණ, සහ පරිභෝජන තිරණ එම ආර්ථිකය තුළ පවත්නා භූමිය, ශ්‍රමය, ව්‍යවසායකත්වය, ප්‍රාග්ධන ප්‍රමාණය මත තිරණය වේ. ආර්ථික විද්‍යාවේ දී මිනිසා හා සමාජයේ හැසිරීම් හා සංසිද්ධීන් පැහැදිලි කිරිම, විශ්ලේෂණය කිරිම හා පුරෝකතනය කිරිම සිදු කෙරේ. අන්ත දිළිඳුකම යටතේ තමන්ගේ ජීවන තත්ත්‍වය කිසිසේත් ම පවත්වා ගෙන යාමේ හැකියාවක් නොමැති වීම මින් අදහස් කරයි. එනම් ආහාර පාන, ඉදුම් හිටුම්, ඇඳුම් පැළඳුම් උපයාගැනීම සඳහා හැකියාවක් නොමැතිකමයි. ලෝක ජනගහනයෙන් 10.7% ජීවත් වන්නේ දිනකට එක්සත් ජනපදයේ ඩොලර් 1.9 ට වඩා අඩු අගයකිනි. ලෝකයේ අවුරුදු පහට අඩු ළමා මරණ සංඛ්‍යාව අතරින් දෙවන විශාලතම ළමා මරණ සංඛ්‍යාව මිලියන 2.5 ක් දකුණු ආසියාවෙන් වාර්තා විය.

ශ්‍රී ලංකාවේ නාගරික හා ග්‍රාමීය දුප්පත්කම අතර සැලකිය යුතු පරතරයක් පවතී. ශ්‍රී ලංකාවේ ජනගහනය දරිද්‍රතා රේඛාවෙන් පහළ යමින් පවතී. මෙම දිළිඳුකම තවමත් පැතිර පවතින අතර ශ්‍රී ලංකාව තුළ අභියෝගාත්මක තත්ත්වයක් තවමත් පවති. තමන් විසින් උපයාගන්නා ආදායමෙන් පුද්ගලයකුට අවශ්‍ය අවම කොන්දේසි කිහිපය භුක්ති විඳීමට නොහැකි නම් දුප්පත් ලෙස හඳුනා ගෙන තිබේ. දරිද්‍රතාවයේ පැතිකඩයන් කිහිපයකි. අඩු අධ්‍යාපන සුදුසුකම්, සමාජීයය හා ආර්ථික අවාසි, ස්වයං විශ්වාසය, ඌන සේවා නියුක්තිය හා රැකියා විරහිතතාවය යන ප්‍රධාන සාධකයන් ආර්ථික තත්ත්වය සඳහා බලපාන අතර දිළිඳුකම අඩු කිරීම සඳහා ද බලපානු ලබයි.

දිළින්දන් හට සහයෝගීතාවය දැක්වීමේ උපදේශාත්මක සමූහය විසින් නිර්වචනය කර ඇති පරිදි ක්ෂුද්‍රමූල්‍ය යනු අඩු ආදායම් ලාභීන්ට මූල්‍ය සේවා සැලසීමයි. ප්‍රධාන වශයෙන්ම ප්‍රමාණවත් ඇපකර ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැතිකම හේතුවෙන් විධිමත් බැංකු හරහා තම මූල්‍ය පහසුකම් සපුරා ගත නොහැකි දිළිඳු පුද්ගලයන් වෙත ණය පහසකුම්, ඉතිරිකිරීමේ පහසුකම් සහ වෙනත් මූල්‍ය පහසුකම් සැලසීම මෙමගින් සිදු කරනු ලැබේ. ක්ෂුද්‍රමූල්‍ය මගින් අපේක්ෂා කරනු ලබන්නේ අඩු ආදායම්ලාභින්ගේ ආදායම් උත්පාදනය කිරීමේ කටයුතු සහ ආදායම් උත්පාදන ධාරිතාවන් වැඩිදියුණු කිරීම සහ ප්‍රසාරණය කිරීමයි. ඒ අනුව ක්ෂුද්‍රමූල්‍ය තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම අපේක්ෂා කෙරෙන අතර, රටෙහි ආර්ථික සංවර්ධනය උදෙසා ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වයක් බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභි බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, සමූපකාර ග්‍රාමීය බැංකු, සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිති, දිවි නැගුම බැංකු සහ අනෙකුත් ප්‍රජා මූලික සංවිධාන, ක්ෂුද්‍රමූල්‍ය සමාගම්, ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරවල නිරතවන රාජ්‍ය නොවන සංවිධාන වැනි ආයතන රාශියක් ක්ෂුද්‍ර මූල්‍යකරණයේ නිරත වේ. මින් සමහරක් ආයතන නොයෙක් අධිකාරීන් යටතේ නියාමනය වේ. සමූපකාර ග්‍රාමීය බැංකු සහ සමූපකාර සහ ගනුදෙනු පිළිබඳ සමිති සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ද, දිවිනැගුම බැංකු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ද නියාමනය කෙරේ.

බැංකු සහ අනෙකුත් සාම්ප්‍රදායික මූල්‍ය ආයතන කෙරෙහි අවම ප්‍රවේශවීමේ හැකියාවක් ඇති දුප්පත් හා අඩු ආදායම්ලාභී ගනුදෙනුකරුවන්ගේ විවිධ ආකාරයේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරා දීම ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල මූලික අරමුණයි. ලොව වටා දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අඩු ආදායම්ලාභී ජනතාව මිලියන ගණනක් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමට මෙන්ම ආර්ථික අවධානම අවම කර ගනිමින් පවුල් සුභසාධනය වර්ධනය කර ගැනීමට ද ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රය හරහා හැකියාව ලැබේ. දිළිඳුකම පිටුදැකීමේ අරමුණෙන් රටවල් බොහෝමයක් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් දිළිඳුබව අඩු කිරීමට අවධානය යොමු කර ඇත. සමෘද්ධි වැඩ සටහන ප්‍රධාන වශයෙන් දිළිඳුබව තුරන් කිරීම හා ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම සමඟ ප්‍රවේශයන් තුනකින් ක්‍රියාත්මක වේ.

ක්ෂුද්‍රමූල්‍යකරණය ග්‍රාමීය ප්‍රදේශයන්හි දිළිඳුකම තුරන් කිරීමේ වැඩ පිළිවෙල හා ආර්ථික වර්ධනයෙහි වැදගත් භූමිකාවක් ඉටු කරයි. ක්ෂුද්‍රමූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන අරමුණ වන්නේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වර්ධනය කිරීමට අපේක්ෂා කරන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මූල්‍යමය හා මූල්‍ය නොවන සේවාවන් සැපයීමයි. ඒ යටතේ ඉතිරිකිරීම්, ආයෝජනය, අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි මූල්‍ය හා අවිධිමත් සේවාවන් සංවර්ධනය කිරීම සඳහා අඩු ආදායම්ලාභීන්ට පහසුකම් මේ යටතේ සලසා දීම දැකිය හැකිය. මේ අනුව ඉහත සඳහන් කළ කරුණුවලින් දැක් වූ දිළිඳුකම සම්බන්ධ ගැටලුවලට විසඳුම් ලෙස ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වයක් ඇති බව සඳහන් වේ. ඒ අනුව ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු වේ. මෙම අධ්‍යයනය කර ගැනීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන කිහිපයක දායකත්වය ලබා ගෙන ඇත.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පන්නලගම සහ අඹගස්දෝව ග්‍රාම නිළධාරී වසම්වල දිළිඳුකම අවම කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය අධ්‍යයනය කිරීමය. මෙහි සෙසු අරමුණු වන්නේ ග්‍රාමීය අංශයේ දිළිඳුකමට බලපාන සමාජ හා ජනගහන සාධක හඳුනා ගැනීම, ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල සේවාවන් හඳුනා ගැනීම, ක්ෂුද්‍රමූල්‍ය සේවාවන්ට සම්බන්ධ වීමට පෙර සහ පසු ග්‍රාමිය ජනතාවගේ ආදායම්, වියදම් වෙනස් වීම පිළිබඳ අධ්‍යයනය කිරීම, ක්ෂුද්‍රමූල්‍ය සේවාවන්ට සම්බන්ධ වීමට පෙර සහ පසු ග්‍රාමිය ජනතාවගේ ඉතුරුම්වල හා ආයෝජනවල වෙනස් වීම පිළිබඳ අධ්‍යයනය කිරීම, ක්ෂුද්‍රමූල්‍ය සේවාවන්ට සම්බන්ධ වීමට පෙර සහ පසු ග්‍රාමිය ජනතාවගේ ණය ගැනීමේ ප්‍රමාණයේ වෙනස පිළිබඳ අධ්‍යයනය කිරීම සහ ග්‍රාමීය දිළිඳුකම අඩුකිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් හඳුනා ගැනීමය.

## 2. සාහිත්‍යය විමර්ශනය

ග්‍රාමීය ප්‍රදේශයේ දිළිඳුකම අඩු කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය යන අධ්‍යයනයට අදාලව වෙනත් පැතිකඩ ඔස්සේ පර්යේෂණයන් සිදුකර ඇති අතර දිළිඳුකම අඩුකිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය සේවාවන් දායකවන ආකාරය පිළිබඳ වෙනත් අධ්‍යයනයන් සිදුකර ඇති අතර ඒ පිළිබඳ මෙමගින් අධ්‍යයනය කරයි.

''දරිද්‍රතාව සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල බලපෑම'' යන මාතෘකාව මගින් දරිද්‍රතාවය පිටුදැකීම සඳහා පුළුල් වශයෙන් පිළිගත් ක්ෂුද්‍ර ණය යොජනා ක්‍රමයක් වන ක්ෂුද්‍ර මූල්‍යකරණය දශක කිහිපයක් පුරා ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇත (Ganga, 2005). විශේෂයෙන්ම දුප්පත් ජනතාව වෙත ක්ෂුද්‍රමූල්‍ය සේවා සපයන ආයතන ගණනාවක් නොසලකා හැර ඇති අතර ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය අංශයේ බලපෑම පිළිබඳව මනා දැනුමක් පවතී. ක්ෂුද්‍රමූල්‍ය අංශය, අවිධිමත් මූල්‍ය ප්‍රභවයන් හා දරිද්‍රතාවය හා සුබසාධනය සඳහා ඇති බලපෑම පිළිබඳ ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ක්ෂුද්‍රමූල්‍ය සේවා, ග්‍රාමීය අංශවල රාජ්‍ය නොවන සංවිධාන සහ වාණිජ බැංකු ඇතුළුව පෞද්ගලික ක්‍රියාකරුවන්ගේ සීමාව ඉතා සීමිතය.

''දිළිඳුකම අඩු කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය දායකත්වය'' යන අධ්‍යයනය මගින් ග්‍රාමීය දුප්පත්කම අඩු කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල මැදිහත් වීම පිළිබඳව අධ්‍යයනය කර ඇත. ගොවීන් සහ ව්‍යවසායකයින්ගෙන් මෙම පර්යේෂණයේ ප්‍රධාන නියදින් වන අතර ඔවුන්ගෙන් ලබා ගත් දත්ත අනුව අනාවරණය වන්නේ ක්ෂුද්‍රමූල්‍ය මගින් ණය සැපයීම හා සමාජ සුභ සාධනය සඳහා දායකත්වයක් ලබා දී ඇති බවයි (Nukpezah & Blankson, 2017). ඒ අනුව ක්ෂුද්‍රමූල්‍ය මැදිහත් වීම මගින් කාන්තාවන්ගේ, ගොවීන්ගේ සහ ව්‍යවසායකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා උසස් ජීවන මට්ටමක් කරා යාමට හැකි වී ඇත. මෙම අධ්‍යයනයෙහි ඇගයුම වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතා අවම කිරීමේ වැඩ සටහන් සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණ දායක වන බවයි.

ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල කාර්යක්ෂමතාවය හා දරිද්‍රතාවය අවම කිරීම සඳහා බලපෑම මේ යටතේ අධ්‍යයනය කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාවය අවමකිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍යය තීරණාත්මක කාර්යභාරයක් සිදු කරයි. එම හේතුව නිසා ක්ෂුද්‍ර මූල්‍යය ආයතනවල කාර්යක්ෂමතාවය පුළුල් ලෙස විමර්ශනය කෙරේ (Kim & Sang, 2018).

දිළිඳුකම පිටුදැකීම සම්බන්ධයෙන් ක්ෂුද්‍ර මූල්‍යයකරණයේ ඵලදායීතාව පරීක්ෂා කිරීම සම්බන්ධ අධ්‍යයන ගණනාවක් තිබුන ද ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා සමෘද්ධි ක්ෂුද්‍රමූල්‍ය පහසුකම් වල ඵලදායීතාව පිළිබඳ සීමිත දැනුමක් පවති. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම සමෘද්ධි අනුබද්ධ සමාගම් හා අනෙකුත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ක්ෂුද්‍රමූල්‍ය ණය සහ ඉතිරිකිරීම් ප්‍රමාණය අධ්‍යයනය කර ඇති අතර මාගේ අධ්‍යයනය වන්නේ ග්‍රාමීය ප්‍රදේශයේ දිළිඳුකම අඩු කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය අධ්‍යයනය කිරීමයි. ඉහතින් දක්වන ලද පර්යේෂණවල දැනුමේ හිඩසක් පවතින බැවින් එම හිඩස පිරවීම සඳහා මෙම පර්යේෂණය සිදු කරනු ලබයි.

### 3. අධ්‍යයන ක්‍රමවේදය

ඉහළම දරිද්‍රතා මට්ටමක් වාර්තා වන දිස්ත්‍රික්කයක් ලෙස බදුල්ල දිස්ත්‍රික්කය සැලකේ. එසේම මොණරාගල දිස්ත්‍රික්කය තුළත් ඉහළ දරිද්‍රතා මට්ටමක් පවතින අතර මෙම දිස්ත්‍රික්ක දෙකම ඌව පළාතට අයත් වීමත් ඉහළම දරිද්‍රතා මට්ටමක් වාර්තා වන ප්‍රදේශය වේ. මෙම කරුණු මත බදුල්ල දිස්ත්‍රික්කය අධ්‍යයනය සඳහා තෝරා ගැනීම ඉතා යෝග්‍ය වේ. මෙහිදී බදුල්ල දිස්ත්‍රික්කයේ ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම සේවා වසම් 02 ක් ආශ්‍රයෙන් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් ණය ලබා ගත් පුද්ගලයින් 100 ක් නියැදිය සඳහා යොදා ගන්නා ලදී.

මෙම අධ්‍යයනය මිශ්‍ර අධ්‍යයනයක් ලෙසට බදුල්ල දිස්ත්‍රික්කය ඇසුරින් ප්‍රාථමික දත්ත ලබා ගෙන ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. එසේම අවශ්‍ය ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර ප්‍රකාශන සඟරා මගින් ලබා ගැනීමට කටයුතු කරයි. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නියැදිය සකස් කර ගැනීමේදී සම්භාවිතා නියැදුම් ක්‍රමයේ සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගෙන ඇත. රැස් කරගනු ලබන ප්‍රාථමික දත්ත යොදා ගනිමින් එම දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, බද්ධ t පරීක්ෂාව, සරල ප්‍රතිපායනය, සහසම්බන්ධතා සංගුණකය ආදි ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කර ඇත. මෙම මිණුම් ලබා ගැනීම සඳහා SPSS මෘදුකාංගය හා Excel මෘදුකාංගය යොදා ගෙන ඇත.


අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීමේදී බදුල්ල දිස්ත්‍රික්කයේ ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පන්නලගම සහ අඹගස්දෝව ග්‍රාම සේවා වසම් තෝරා ගැනීමට පාදක වූ ප්‍රධාන තර්කය ලෙස මෙම ග්‍රාමීය ප්‍රදේශයේ ජීවත් වන බහුතරයක් පුද්ගලයින්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීමත් එමෙන්ම මෙම ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටීම හා ක්ෂුද්‍රමූල්‍ය ආයතන මගින් තනි පුද්ගල ණය හා කණ්ඩායම් ණය ලබා ගැනීමේ ප්‍රවණතාවයත් ඉතා ඉහළ මට්ටමක පවතී. ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පන්නලගම සහ අඹගස්දෝව ග්‍රාම සේවා වසම්වල ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් ණය පහසුකම් ලබා ගත් පවුල් 1672 ක් වන අතර ණය ලබාගත් කුටුම්භයන් 100 ක් සරල සසම්භාවී නියැදීමේ ක්‍රමයට මෙම පර්යේෂණයේ නියැදිය වශයෙන් තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙහි නියැදිය තෝරා ගැනීමේදී මෙම 100 ක් වන නියැදි ප්‍රමාණය ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙකෙහි ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් ණය ලබා ගත් කුටුම්භ ව්‍යාප්තිය පදනම් කරගනිමින් සමානුපාතික ක්‍රමයට ලබා ගනී. ඒ අනුව පන්නලගම සහ අඹගස්දෝව ග්‍රාම සේවා වසම්වලින් පිළිවෙළින් 57 ක් හා 43 ක් වශයෙන් සමස්ත නියැදිය වූ 100 තෝරා ගනී.

ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය අධ්‍යයනය කරනු ලබන මෙම පර්යේෂණයේ දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම මේ යටතේ සිදු කරයි. දත්ත මූලාශ්‍ර ද්විත්වයකින් සමන්විත වේ. මෙම ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල සාමාජික අංකය සහ ණය අයදුම්පතෙහි සඳහන් ලිපිනයන් සමඟ සම්බන්ධ වූ මූලික හා ද්විතීක දත්ත මෙම පර්යේෂණය සඳහා යොදා ගනු ලබයි.

## 4. දත්ත විශ්ලේෂණය

### 4.1 ක්ෂුද්‍රමූල්‍ය භාවිතා කරන්නන්ගේ පුම්තිරිභාවය

*ප්‍රස්තාර සටහන 1 : ක්ෂුද්‍රමූල්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ පුම්තිරිභාවය*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය යන විශ්ලේෂණයට සම්බන්ධ වූවන්ගේ පුමිතිරභාවය විමසා බැලම වැදගත් වනු ඇත. ඒ අනුව ඉහත රූප සටහනෙහි දැක්වෙන පරිදි සමස්ත නියැදියෙහි අන්තර්ගත පුරුෂයින් ප්‍රමාණය සහ ස්ත්‍රීන් ප්‍රමාණයන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි අතර මෙම නියැදිය පුරුෂයින් 26% ක් ද ස්ත්‍රීන් 74% ක් වශයෙන් සමන්විත වනු ඇත. ඒ අනුව දැකිය හැකි ප්‍රධාන නිරීක්ෂණය වන්නේ ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් වැඩි වශයෙන් ණය ඉල්ලුම් කරනු ලබන්නේ ස්ත්‍රීන් වන බවයි. එයට හේතුව ලෙස මෙම ප්‍රදේශයේ ස්වයං රැකියා සඳහා වැඩි දායකත්වයක් ලබා දෙනු ලබන්නේ කාන්තාවන් වීමයි. එමෙන්ම මෙහි වැඩි වශයෙන් කණ්ඩායම් ණය ලබා ගැනීම සඳහා කාන්තාවන් පෙළඹේ. විශේෂයෙන් ම ක්ෂුද්‍රමූල්‍ය ණය කාන්තාවන් මුල් කරගෙන ලබා දෙන බව මෙය මගින් වැඩි දුරට පෙන්වා දිය හැකි ය.

### 4.2 ක්ෂුද්‍රමූල්‍ය භාවිතා කරන්නන්ගේ අධ්‍යාපන මට්ටම

*ප්‍රස්තාර සටහන 2 : ක්ෂුද්‍රමූල්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

මෙම නියැදියෙහි පුද්ගල අධ්‍යාපන මට්ටම ප්‍රධාන කාණ්ඩ පහකට බෙදා දක්වන අතර එහි දී වැඩි පිරිසක් වන 37% ක් 8 ශ්‍රේණිය දක්වා ද, 28% දෙනෙකු සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් වන අතර 1-5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූවන් 18% ක් සිටින අතර 17% ක් උසස් පෙළ දක්වා ඉගෙනුම ලබා ඇති පුද්ගලයින් ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් ලබා ගෙන ඇත. මෙම නියැදි තුළ උපාධිය හැදූරූ පුද්ගලයින් නොසිටින අතර එයට හේතුව ලෙස උසස් අධ්‍යාපනය හැදූරූ පිරිස වාණිජ බැංකුවලින් ණය ගන්නා පිරිස වන අතර ඔවුන් ඉතිරිකිරීම් වැඩි පොළියක් ලැබෙන මූල්‍ය ආයතනවල ගනුදෙනු කිරීමට පෙළඹේ. මේ අනුව වැඩි කුටුම්භ ප්‍රමාණයක් සිටින්නේ අඩු අධ්‍යාපනයක් ලැබූ පුද්ගලයන් බව මෙම නියැදි සමීක්ෂණය මගින් අනාවරණය විය. ඒ අනුව ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් යොමු වනුයේ අඩු අධ්‍යාපනය ලැබූ කාන්තාවන් ය.

මේ අනුව අඩු අධ්‍යාපනයක් ලබනවා යනු මෙම ප්‍රදේශයේ ජනතාව ඉහළ වැටුපක් සහිත රැකියා අවස්ථාවන්ට යොමු නොවීමයි. මෙම ප්‍රදේශයේ වැඩි වශයෙන් පුද්ගලයින්ගේ රැකියා නියෝජනය දෙස බැලීමේ දී ගොවීන්, තේ වගා කරන්නන්, තේ කර්මාන්ත ශාලාවල වැඩ කරන කම්කරුවන්, වඩුවන්, පෙදරේරුවන්, ස්වයං රැකියා නියුතු වූවන් සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් සමන්විත වේ. මෙය රැකියා කාණ්ඩ දෙකකට බෙදිය හැකි ය. එනම් ස්ථිර හා තාවකාලික රැකියාවන් ලෙස. මෙම විශ්ලේෂණය මගින් රැකියාවේ ස්වභාවය අනුව දරිද්‍රතාවය අවම වීම සඳහා බලපෑමක් සිදුවේ ද යන්න සොයා බැලිය හැකිය.

### 4.3 ක්ෂුද්‍රමූල්‍ය ණය භාවිතා කරන පුද්ගලයින්ගේ රැකියා තත්ත්වය

*ප්‍රස්තාර සටහන 3 : ක්ෂුද්‍රමූල්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ රැකියා තත්ත්වය*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

මේ අනුව පෙනී යන්නේ මෙම ග්‍රාමීය ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය වන්නේ ගොවිතැන (47%), ස්වයං රැකියා (30%) හා තේ වගාව (12%) ය. මෙහි දී ස්වයං රැකියා ලෙස පෙළ ගස්වා ඇත්තේ මල් වගා කිරීම සහ ගව පාලනයයි. ඉඩම් අයිතයික් නොලබන සහ පෙදරේරුවන්, වඩුවන්, කුලී වැඩ කරන පුද්ගලයින් හා කුඩා ව්‍යාපාරවල නිරතවන කුටම්ුභ ලෙස දැක්විය හැකිය. ඒ අනුව ගොවිතැන් කරන්නන් හා තේ වගාවේ නිරතව සිටින කුටම්ුභ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් ලෙස පෙන්වා දිය හැකි ය. එයට එක් හේතුවක් ලෙස එම කුටුම්භවල වයස් ජනගහනය වැඩි වීමත් කාලයත් සමඟ අස්වැන්න සඳහා වෙළඳපොලේ පවතින මිලෙහි ඇතිවන අඩු වීමත් හේතු වේ.


ඒ අනුව ග්‍රාමීය ප්‍රදේශවල කුටුම්භ අවශ්‍යතා වෙනුවෙන් ක්ෂුද්‍රමූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීමට වැඩි ප්‍රමුඛතාවයක් දක්වන්නේ ගොවීන් සහ තේ වගාව කරන කුටුම්භයන් ය. එමෙන්ම දරිද්‍රතාවය පිටුදැකීමට වන සීමාවක් ලෙස කුටුම්භයන් මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වීම  මෙම විශ්ලේෂණයේ දී පෙන්නුම් කරයි. එමෙන්ම ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගැනීමට පසු පෙර ආදායමට වඩා පසු ආදායම අඩු වීම දරිද්‍රතාවය පිටුදැකීමට වන සීමාවක් ලෙස පෙන්වා දිය හැකි ය. මේ ආකාරයට දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගන්නා පුද්ගලයින්ගේ රැකියාව බලපායි.

### 4.4 දරිද්‍රතා රේඛාව ආශ්‍රයෙන් ආදායම් මට්ටම විශ්ලේෂණය

ක්ෂුද්‍රමූල්‍ය පහසුකම් ලබා ඇති කුටුම්භයන්ගේ දරිද්‍රතාවය පිළිබඳව මෙම අධ්‍යයනයෙන් සලකා බලන අතර පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා ගෘහයට ප්‍රමාණවත් ආදායමක් තිබිය යුතුය. මෙම අධ්‍යයනයේ දී ආදායම් වෙනස්වීම් පෙන්වීමට සහ පුද්ගල සහසම්බන්ධතා විශ්ලේෂණය භාවිතා කරමින් පෙර ආදායම් හා පසු ආදායම්වල වෙනස භාවිතා කර ක්ෂුද්‍ර ණය ගෙවුම් සහ පෙර ආදායමේ වෙනස අතර ඇති සම්බන්ධතාවය කුමක්දැයි පරීක්ෂා කරයි. එවිට දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය බලපෑම විස්තර කිරීමට දරිද්‍රතා විශ්ලේෂණය සිදු කරන අතර දරිද්‍රතාවය විශ්ලේෂණය කිරීම සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ නිල දරිද්‍රතා රේඛාව භාවිතා කරනු ලබයි.

නිල දරිද්‍රතා රේඛාව භාවිතා කරමින් දරිද්‍රතාවය විශ්ලේෂණය කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ණය ගැනීමෙන් පෙර සහ පසු තත්ත්වයන් කුටුම්භ 100ක් අතුරින් දරිද්‍රතාවය සඳහා සිදු කරන බලපෑම හඳුනා ගැනීම සිදු වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතා රේඛාව සහ ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගෙන ඇති කුටුම්භයන්ගේ පූර්ව ආදායම ඒක පුද්ගල ආදායමට අනුව දරිද්‍රතා මට්ටම මගින් ඇගයීම් සිදු කරයි. සමෘද්ධි බැංකුවේ සහ දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ ණය ඉල්ලුම්පත්‍ර භාවිතයෙන් එම දත්ත එකතු කරන ලදී.


*ප්‍රස්තාර සටහන **ෑරරදරඡ හද ඵැංඵ දේවැජසසෙැා් ඵහකැ සබ ාදජමපැබඵග** : ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගැනීමට පෙර දරිද්‍රතා මට්ටම*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

2020 දී බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතා රේඛාව රු. 4905 ක් විය (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). එහි අර්ථය වන්නේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා මසකට අවම වියදමක් දැරීමයි. මෙම විශ්ලේෂණයේ දී ඒක පුද්ගල ආදායමට පෙර අවම වියදම් සඳහා ආවරණය කළ යුතු අවම ආදායම් මට්ටමක් කුටුම්භයන්ට තිබේදැයි සොයා බලයි. 4-15 ප්‍රස්තාර සටහනට අනුව ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගැනීමට පෙර දරිද්‍රතා රේඛාවේ 100 න් ඉහළ ගෘහස්ථයන් සිටියේ 8 ක් පමණි. 2020 වර්ෂයේ දරිද්‍රතා රේඛාවට පහළින් කුටුම්භයන් සිටියේ 92% කි. කෙසේ වෙතත් මෙම පුද්ගලයින් විවිධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ණය අපේක්ෂා කරනු ලැබීය. සාමාන්‍යයෙන් ක්ෂුද්‍රමූල්‍ය ණයවල පොලී අනුපාත සාමාන්‍ය ණය පහසුකම්වලට වඩා වැඩිය. සමෘද්ධි ක්ෂුද්‍රමූල්‍ය ණය සඳහා පොලී අනුපාත අනෙකුත් ක්ෂුද්‍රමූල්‍ය ණය සපයන්නන්ට වඩා සාපේක්ෂව අඩුය. කෙසේ වෙතත් සමෘද්ධි ණය මගින් දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණ පමණක් නොව වාණිජමය අරමුණු ද ඇත. ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගත් පසු කාලයේදී කුටුම්භ කිහිපයක මාසික ආදායමද ඉහළ ගොස් ඇති අතර මෙම වැඩිවීමට ක්ෂුද්‍රමූල්‍ය ණය ධනාත්මක බලපෑමක් ඇති කරයි.

*ප්‍රස්තාර සටහන 5 : ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගත් පසු දරිද්‍රතා මට්ටම*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

2020 දී බදුල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතා රේඛාව රු. 4905 කි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). කුටුම්භවලින් 34% ක් මාසික ආදායම දරිද්‍රතා රේඛාව ඉක්මවා යන අතර තව දුරටත් ඔවුන් දරිද්‍රතාවයෙන් පෙළෙන්නේ නැත. කෙසේ වෙතත් 41% ක කුටුම්භයන්ට පෙර ආදායමට වඩා පසු ආදායම වැඩි කර ගැනීමට හැකි වී තිබේ. මෙම වැඩිවීම් සඳහා හේතු කිහිපයක් හඳුනාගැනීමට හැකි වන අතර සමහර කුටුම්භයන් ඔවුන් ලබා ගත් ක්ෂුද්‍රමූල්‍ය ණය ඵලදායී ලෙස භාවිතා කිරීමට සමත් වී තිබේ. මෙම සියලු කුටුම්භයන් ක්ෂුද්‍රමූල්‍ය ණය ලබාගෙන ඇති අතර ඒවා ආදායමට ධනාත්මක ලෙස බලපා ඇත. නමුත් ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගත් පුද්ගලයින් අතරින් 59%ක් පෙර පැවති ආදායමටත් වඩා පහළ බසින ලද ආදායම් මට්ටමකට උරුමකම් කියයි. ඔවුන් ලබා ගත් ක්ෂුද්‍රමූල්‍ය ණය ඵලදායී ලෙස භාවිතා කිරීමට අසමත් ව ඇති අතරම ආදායම අඩු වීමටත් එය හේතුවක් ව ඇති බව පැහැදිලි වේ.

ක්ෂුද්‍රමූල්‍ය ණය ලබා ගත් පුද්ගලයින්ගේ කුටුම්භයන්හි පෙර සහ පසු ආදායම් මට්ටම් ඇසුරින් දරිද්‍රතාවය සමනය කිරීමට මෙන්ම බලපෑම් ඇති කිරීමට ද ක්ෂුද්‍රමූල්‍යකරණයට හැකි වන බව විස්තරාත්මක විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ.

*වගු සටහන 1 : ආර්ථික විචල්‍යයන්ගේ මාසිකව සිදු වූ වෙනස (SPSS ප්‍රතිදානයන්ට අනුව)*

| **විචල්‍යය** | **පෙර තත්ත්වය (රු.)** | **පසු තත්ත්වය (රු.)** | **වෙනස ප්‍රතිශතයක් ලෙස** | **වෙනස** |
|---|---|---|---|---|
| ආදායම | 19330.00 | 18010.00 | 7% | අඩු වී ඇත |
| වියදම | 14273.00 | 13149.00 | 8% | අඩු වී ඇත |
| ඉතුරුම් | 2940.00 | 2621.00 | 10% | අඩු වී ඇත |
| ණය | 166300.00 | 210800.00 | 26% | වැඩි වී ඇත |
| ආයෝජනය | 2890.00 | 2731.00 | 6% | අඩු වී ඇත |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය (2021)

ආර්ථිකමිතික විශ්ලේෂණය මගින් පැහැදිලි වන්නේ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා අවශ්‍ය වන්නා වූ පදනම ක්ෂුද්‍රමූල්‍ය සේවාවන් භාවිතය මගින් සිදු නොවන බවයි. එනම් ක්ෂුද්‍රමූල්‍ය සේවා භාවිතා කරන පුද්ගලයින්ගේ ආදායම ණය ගැනීමට පසු අඩු වීම, ඉතුරුම් අඩු වීම, ණය ගනුදෙනු වැඩි වීම, ආයෝජන ප්‍රමාණය අඩු වීම හරහා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය මෙමගින් පෙන්වා දිය හැකි ය.

**5. සමාලෝචනය**

දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතියක් රටකට අවශ්‍ය වන්නේ දිළිඳුකම තුරන් කිරීමට නොව දුප්පත්කම හැකිතාක් අවම කිරීමටයි. ඒ සඳහා අදාළ ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ දිළිඳු ජනයා වෙත ගලා යා යුතුය. ආර්ථිකමය වශයෙන් දුප්පත්කම නැති කිරීම යනු දිළිඳු ප්‍රතිශතය අවම කිරීමයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයන්ට අනුව 2010 වසරේ දී දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනය 7.6 % වූ අතර එය 2016 වන විට 4.1 % දක්වා අඩු වී ඇත. වර්තමානය වන විට ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. ඒ අතර ක්ෂුද්‍රමූල්‍ය මගින් ක්ෂුද්‍රමූල්‍ය කෙටි කාලීන හා දිගුකාලීන ණය ලබා දීම ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වී ඇත. ඒ අනුව ක්ෂුද්‍රමූල්‍ය ආයතන මගින් ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා දායකත්වයක් ලැබේ ද නොලැබේ ද යන්න පිළිබඳ ප්‍රමාණාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු කර ඇත. මෙම අධ්‍යයනයට අනුව පුද්ගලයින් ක්ෂුද්‍රමූල්‍ය ණය විධිමත් ආයෝජන අවස්ථාවන් සඳහා යොදා නොමැතිකම හේතුවෙන් ආදායමේ ධනාත්මක වෙනසක් සිදු නොවී ඇති බව දක්නට හැකි ප්‍රධාන කරුණකි.

මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය යටතේ දී අවධානය යොමු කරන ලද්දේ අධ්‍යයන මාතෘකාව සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගැනීමට සහ අධ්‍යයනයේ සැකැස්ම සහ අධ්‍යයනය සිදු කරනු කරන ආකාරය පිළිබඳව හඳුනා ගැනීමටයි. ඒ අනුව ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය පිළිබඳව සිදු කරන ලද පර්යේෂණයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා මෙම පරිච්ඡේදය වැදගත් වේ. එමෙන්ම අධ්‍යයනයේ අරමුණු පිළිබඳව ද පළමු පරිච්ඡේදයේ අන්තර්ගත වේ. අධ්‍යයන සාහිත්‍ය පර්යේෂණ නිබන්ධනය මගින් ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය පිළිබඳ න්‍යායාත්මක පසුබිම පිළිබඳව සලකා බලනු ඇත. ඒ අනුව දේශීය සහ විදේශීය වශයෙන් මේ පිළිබඳව සිදුකර ඇති නොයෙකුත් පර්යේෂණයන් පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

පර්යේෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයන නිබන්ධනය සඳහා යොදා ගන්නා පර්යේෂණ ක්‍රමවේදයන් සාකච්ඡාවට ලක් කරන ලදී. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය, විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය, ආර්ථිකමිතික ක්‍රමවේදය යන ක්‍රමවේදයන් ප්‍රධාන වශයෙන් මෙහි දී සලකා බැලිණි. අධ්‍යයනයේ වැදගත්ම කොටස වශයෙන් පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය සඳහන් කළ හැකි ය. මේ යටතේ විස්තරාත්මක විශ්ලේෂණයක් මෙන්ම ආර්ථිකමිතික විශ්ලේෂණයක් සිදු කළ අතර එහි විස්තරාත්මක විශ්ලේෂණයේ දී පුද්ගලයින් ක්ෂුද්‍රමූල්‍ය ණය භාවිතය කෙරෙහි බලපාන විචල්‍යයන් පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණ උපක්‍රම භාවිතා කර තිබේ. එම උපක්‍රම ලෙස ප්‍රස්තාර සටහන්, වගු සටහන් යනාදිය යොදා ගෙන තිබේ.

එමෙන්ම ආර්ථිකමිතික විශ්ලේෂණය යටතේ බද්ධ නියැදි t පරීක්ෂාව මෙහි දී යොදා ගෙන ඇත. එහි දී ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම පරායත්ත විචල්‍යය ලෙසත් ස්වායත්ත විචල්‍යය ලෙස ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල දායකත්වය යොදාගෙන තිබේ. ඒ අනුව ස්වායත්ත විචල්‍යයේ සාධක ලෙස පුද්ගල ආදායම, පුද්ගල වියදම, පුද්ගල ඉතුරුම්, ණය යන විචල්‍යන් ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම සඳහා දක්වන සම්බන්ධතාවයේ ස්වරූපය සම්බන්ධව විශ්ලේෂණය කර ආකෘතිය ගොඩනගා තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් පැහැදිළි කර ඇති ආකාරයට ආදායම, වියදම, ඉතුරුම්, ණය වෙනස් වීම මගින් දරිද්‍රතාවය පිටුදැකීමට අවශ්‍ය පදනම ක්ෂුද්‍රමූල්‍ය ආයතන මගින් ලබා නොදෙන බව පැහැදිළි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2013). ශ්‍රී ලංකා දරිද්‍රතා විමසුම 2012/13. කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2018). ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාජ සංඛ්‍යානය, කොළඹ.

Ganga, M.T.,(2005).*Microfinance in Sri Lanka: A Household Level Analysis of Outreach and Impact on Poverty*.

Kaluarachchi, D., & Jahfer,A.(2012).*Micro Finance and Poverty Alleviation in Sri Lanka. Colombo*

Kim, N. T., & Sang, N. M. (2018). Evaluating the efficiency of microfinance institutions in Vietnam and the Impact of this efficiency on poverty reduction. In *Global Tensions in Financial Markets*. Emerald Publishing Limited.

Nukpezah, J. A., & Blankson, C. (2017). Microfinance intervention in poverty reduction: A study of women farmer-entrepreneurs in rural Ghana. *Journal of African Business*, *18*(4), 457-475.

# ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපාන සාධක : කෑගල්ල දිස්ත්‍රික්කය ඇසුරෙන්

කේ. එම්. එස්. එම් සමරවීර

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

samaraweerasachini@gmail.com

***සංක්ෂේපය***

*ගෝලීය වශයෙන් දරිද්‍රතාවය ව්‍යාප්තව ඇති අතර මෙය සමස්ත ලෝකයේ ප්‍රධාන සංවර්ධන අභියෝගයකි. එබැවින් මෙම තත්වය සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ද නාගරික, ග්‍රාමීය සහ වතු යන අංශයන්හි දක්නට ලැබෙන සමාජීය සහ ආර්ථික වශයෙන් මුහුන දෙන එක් ගැටලුවකි. මේ අනුව පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපා ඇති සාධක හඳුනාගැනීම වේ. ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් දරිද්‍රතාවය පිළිබඳව සලකා බැලූ විට සබරගමුව පළාත දෙවන ස්ථානය ගනු ලබයි. මේ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය අතින් දෙවන ස්ථානය ලබා ගන්නා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිළධාරී වසම් 71 අතරින් ග්‍රාම නිළධාරී වසම් 4ක් පොකුරු නියැදීම යටතේ තෝරා ගන්නා ලදී. එහි දී සසම්භාවීව සමෘද්ධිලාභී පවුල් 99ක් තෝරාගනු ලබයි. එසේ ම මෙම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, සරල ප්‍රතිපායනය, සාධක විශ්ලේෂණය සහ කයි වර්ග පරීක්ෂාව යන දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. කුටුම්බ වියදම කෙරෙහි කුටුම්බ ආදායමෙහි බලපෑම පරීක්ෂා කිරීමේ දී විචල්‍යයන් දෙක අතර ධන සහසම්බන්ධතාවක් පවතින බව දැක්විය හැකිය. සාධක විශ්ලේෂණය මගින් දරිද්‍රතාවය සඳහා බලපාන සාධක 5ක් ගම්‍ය විය. ඒවා නම් කුටුම්බ පරිභෝජන වියදම අධික වීම, ප්‍රජා විද්‍යාත්මක හේතු මත ස්ථිර රැකියා අවස්ථා නොමැති වීම, ප්‍රමාණවත් යටිතල පහසුකම් හිඟ වීම, අඩු සමාජීය තත්වය නිරූපණය කිරීම සහ කුටුම්බ ආදායම ප්‍රමාණවත් නොවීම යන සාධක බලපාන බව සොයාගන්නා ලදී. මේ අනුව දරිද්‍රතාවය පිටුදැකීම සඳහා කුටුම්බ මට්ටමින් ජනයා මුහුණ දෙන සමාජ සහ ආර්ථික ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීම සහ විසඳුම් ලබා දීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, වැඩසටහන් සහ සංවිධාන ගම් මට්ටමින් දියත් කරමින් ජනතාව දැනුවත් කිරීම, සේවා සහ පහසුකම් වර්ධනය කිරීම, සමෘද්ධිලාභී කුටුම්බ වන බැවින් ඔවුන් හට සහනාධාර ලබා දීම සහ සවිබල ගැන්වීම, ඔවුන් ලබාගන්නා සහනාධාර සහ ණය මුදල් ඒ ඒ අවශ්‍ය කාර්යයන් සඳහා යොදවන්නේ දැයි අධීක්ෂණය කිරීම, ඔවුන් ණය ලබා ගැනීම් අවම කර ඉතුරුම් ක්‍රම සඳහා ග්‍රාමීය බැංකු ඇති කර මුදල් හුවමාරුව කාර්යක්ෂම කිරීම, උපත් පාලනය පිළිබඳව නිසි දැනුවත් කිරීමක් සිදු කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීම, සේවා වියුක්ත කාන්තාවන් සඳහා ස්වයං රැකියා අවස්ථා, ඇඟලුම් කම්හල් සහ වෙනත් කෘෂි බෝග වගාවන් පිළිබඳ දැනුවත් කිරීම මගින් ඔවුන්ට අවශ්‍යයසම්පත් සහ වෙළෙඳපල අවස්ථා සම්පාදනය කිරීම, නුපුහුණු ශ්‍රමිකයින් සඳහා වෘත්තීය පුහුණුවක් ලබා දීම, පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට නොහැකි වූ දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනයක් ඔස්සේ වෘත්තීය පුහුණුව ලබා දීම ආදිය යෝජනා කළ හැකිය.*

***මුඛ්‍ය පද : දරිද්‍රතාවය, දිළිඳු කුටුම්බයන් සහ සමාජ ආර්ථික සාධක***

## 1. හැඳින්වීම

දරිද්‍රතාවය, යනු ''පුද්ගලයින්ට සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සේ සලකනු ලබන භාණ්ඩ සහ සේවා ලබා ගැනීමට ඇති නොහැකියාව'' ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය (1998) දී නිර්වචනය කර ඇත. ගෝලීය වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගෙන් 79% ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. නව සංඛ්‍යා ලේඛනවලට අනුව 2015 දී මිලියන 736 ක් පමණ ජනතාව දරිද්‍රතාවයෙන් පෙළෙමින් ජීවත් වේ. 2020 ලෝකයේ මිලියන 580ක් පමණ ග්‍රාමීය ජනතාව දරිද්‍රතාවයෙන් පෙළෙන බව අනුමාන කර ඇත. ලෝකයේ දෙවන ස්ථානයට දකුණු ආසියාව පත්වන්නේ මිලියන 2.5ක අවුරුදු පහට අඩු ළමා මරණ සංඛ්‍යාවක් වාර්තා වීමෙනි (ලෝක බැංකු සමූහය). බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල පවත්නා දේශපාලන සහ ආර්ථික රාමුව යටතේ පුද්ගලයෙකු ග්‍රාමීය ප්‍රදේශයක ජීවත් වීම නිසා දරිද්‍රතාවයෙන් හා දුගී බවෙන් පෙළීමේ සම්භාවිතාව වැඩි වී ඇති බවට ප්‍රබල සාක්ෂි දරිද්‍රතාවය හා හවුල් සමෘද්ධිය විසින් පෙන්වා දෙනු ලබයි (The World Bank, 2018). ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2010) සංඛ්‍යාලේඛනවලට අනුව මෙරට ග්‍රාමීය නිවාස තුනකින් හෝ හතරකින් එක් නිවසක් දරිද්‍රතා රේඛාවට පහළ සීමාවේ පවතින බව පෙන්වා දී ඇත. නාගරික නොවන ප්‍රදේශයන්හි දරිද්‍රතාව රටේ සමස්ත දරිද්‍රතාවෙන් 90% නියෝජනය කෙෙ හැකියාව 0.3% ක් වේ (ආසියානු සංවර්ධන බැංකුව, 2019). 2006/2007 වර්ශයන්හි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සමීක්ෂණයෙහි ර්.

2016 දී ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 4.1% ක් ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමක පවතියි. 2019 දී ඇමරිකන් ඩොලර් 1.9 ට අඩු ආදායම් ලබන පුද්ගලයින්ගේ මිලදී ගැනීමේ ප්‍රතිඵලවලට අනුව ග්‍රාමීය අංශයන්හි දරිද්‍රතාවය 15.7% වේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයන් මගින් 82% ක ඉහළ ජනගහනයක් පවතින බව පෙන්නුම් කරනු ලබයි. දරිද්‍රතාවය වැඩියෙන්ම ව්‍යාප්ත වී ඇති පළාත ලෙස ඌව පළාත හඳුනා ගත හැකිය. එය 27% ක් වේ. ඉන් අනතුරුව පිළිවෙලින් සබරගමුව පළාත සහ මධ්‍යම පළාත දෙවන සහ තෙවන ස්ථාන ගනු ලබයි. දරිද්‍රතාවය ව්‍යාප්ත වී ඇති ආකාරය දිස්ත්‍රික්ක මට්ටමින් සලකා බැලූ විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ වැඩිම දරිද්‍රතාවයක් පෙන්නුම්කරනු ලබයි. එය 33.8% ක් වේ (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2006). 2002 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ දී ජනගහන දරිද්‍රතා දර්ශකය විශාල ලෙස අවම වීමක් පෙන්නුම් කරනු ලබයි. එනම් 24.7% සිට 9.4% දක්වා සැලකිය යුතු අන්දමින් පහත වැටී ඇත. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාවය තවමත් නොවිසඳුණු ගැටලුවක් බවයි. ක්‍රමයෙන් අවම වන දරිද්‍රතා මට්ටමක් නිරූපණය කළ ද තවමත් එය ශුන්‍ය මට්ටමකට ගෙන ඒමට ශ්‍රී ලංකාවට හැකිවී නැත (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2010).

මෙම අධ්‍යයනයේ පර්යේෂණ අරමුණු කිහිපයක් පවතියි. ඒවා නම්, කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය  දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපා ඇති සාධක හඳුනාගැනීම යටතේ ග්‍රාමීය  දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම හඳුනා ගැනීම සහ ග්‍රාමීය  දිළිඳු කුටුම්බයන්ගේ ප්‍රජා විද්‍යාත්මක සාධක ව්‍යාප්ත වී ඇති ආකාරය අධ්‍යනය කිරීම සිදු කරනු ලබයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක යන මාතෘකාව යටතේ සිදු කරන ලද අධ්‍යයනයට අනුව දරිද්‍රතාවය සඳහා බලපා ඇති හේතු ලෙස ශ්‍රී ලංකාව වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස පිහිටා තිබීම, රැකියා කටයුතු ලෙස කෘෂිකාර්මික කටයුතුවල නියුක්ත වීම, දිළිඳු පවුලක උපත ලැබීම සහ සාර්ථක අධ්‍යාපන සැලැස්මක් නොතිබීම ලෙස දක්වා තිබේ (Denning, 2017). ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ කුටුම්බ දරිද්‍රතාවය කෙරෙහි බලපාන නිර්ණායක යන මාතෘකාව පදනම් කරගනිමින් සිදුකරන ලද අධ්‍යයනයට අනුව දරිද්‍රතාවය අවම කිරීම කෙරෙහි බලපා ඇති සාධක ලෙස ගෘහ මූලිකයා පුද්ගලික අංශයේ රැකියාවන්හි නිරත වීම, ගෘහ මූලිකයාගේ අධ්‍යාපනය, ගෘහ මූලිකයා කෘෂිකාර්මික නොවන අංශයන්හි නිරත වීම වැනි සාධක හඳුනාගත හැකිය. මෙහි දී දරිද්‍රතාවයට බලපා ඇති සාධක ලෙස ඉහළ ස්ත්‍රී වැඩිහිටි අනුපාතය, විශාල කුටුම්බ සාමාජික සංඛ්‍යාව, ස්ත්‍රී මූලික කුටුම්බ සහ ඉහළ යැපීම් අනුපාතය වැනි සාධක ද මේ අතර වේ (Ranathunga & Gibson, 2014). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ දළ විශ්ලේෂණයක් යන මාතෘකාව පදනම් කරගනිමින් සිදු කරන ලද අධ්‍යයනයට අනුව කිසියම් දෙයක් නොමැති බව සහ කිසියම් දෙයක් අවම බව දරිද්‍රතාවය බවයි. එනම් විරැකියාව, ප්‍රමාණවත් ආදායම, යටිතල පහසුකම්, නිවාස, ඉඩම්, ජලය සහ ආහාර නොමැති වීම වැනි සාධක මේ අතර වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවය සඳහා පවතින සාධක ලෙස දුර්වල ආර්ථික තත්වය, නිවාස නොමැති වීම, විරැකියාව, ජල හිඟය සහ වගාවන් සත්ව හානිය නිසා විනාශ වීම හඳුන්වා දී ඇත. මේ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතාවය පැවතිමට හේතු සාධක වී ඇත්තේ ආහාර හිඟකම, රෙදිපිළි හිඟය, විරැකියාව සහ නිදහස නොමැති වීම වේ (Jabbar & Senanayake, 2004).


## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය අනුව පළමුව නියැදිය තෝරා ගැනීම සිදු කරයි. එහි දී කෑගල්ල දිස්ත්‍රික්කයේ  ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 11 අතරින් දෙපිය පොකුරු නියැදීම මගින් මාවනැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තෝරා ගන්නා ලදී. එහි වසම් 71ක් පිහිටා ඇති අතර ඒ අතරින් ග්‍රාම නිළධාරී වසම් 4ක් තෝරා ගන්නා ලදී. මෙම ග්‍රාම නිළධාරී වසම් 4හි 8963ක ජනතාව අතරින් 90%ක වෙසෙසියා මට්ටමට අනුව නියැදිය සඳහා පුද්ගලයින් 99ක් තෝරා ගන්නා ලදී. ඒ අනුව දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන අතර ද්විතීයික දත්ත රැස් කිරීමේ දී පර්යේෂණ මාතෘකාවට අදාළ ග්‍රන්ථ සහ අන්තර්ජාලය යොදාගන්නා ලදී. මෙම පර්යේෂණයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය, සරල ප්‍රතිපායනය, කයි වර්ග පරීක්ෂාව, කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය පරීක්ෂා කිරීම සහ සාධක විශ්ලේෂණය ආදී ක්‍රම දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදී.

## 4. දත්ත විශ්ලේෂණය

ගෘහ මූලිකයාගේ විවාහක බව එනම් විවාහක, අවිවාහක, දික්කසාද, වැන්දඹු සහ වෙන්වූ ආදී වශයෙන් ඒ තත්වයන් දරිද්‍රතාවය කෙරෙහි බලපා ඇති ආකාරය පහත ප්‍රස්තාර සටහනෙන් දැක්විය හැකිය.

*ප්‍රස්තාර සටහන 1 : ගෘහ මූලිකයාගේ විවාහක බව*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ප්‍රස්තාරයට අනුව 76%ක ගෘහ මූලිකයින් වැඩි පිරිසක් විවාහක පුද්ගලයින් වේ. 11% ක් දික්කසාද වූ ගෘහමූලිකයන් වන අතර 9% ක් වැන්දඹු වූ ගෘහමූලිකයන් වේ. අවිවාහක ගෘහමූලිකයන් 1% ක අවම අගයක් පෙන්නුම් කරනු ලබයි. මේ අනුව ග්‍රාමීය දිළිඳු කුටුම්බවල දරිද්‍රතාවය කෙරෙහි බලපාන සාධකයක් වන විවාහක බව අනුව වැඩිම ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබන්නේ විවාහක ගෘහමූලිකයන් සහ දික්කසාද වූ ගෘහමූලිකයන් වේ. මේ අනුව විවාහය හේතුකොටගෙන දරිද්‍රතා මට්ටම ඉහළ යාමට වැඩි වශයෙන් බලපා ඇති බව දක්නට ලැබේ.

ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටමද දරිද්‍රතාවය කෙරෙහි බලපෑම් ඇතිකරන අතර එම බලපෑම පහත ප්‍රස්තාර සටහනෙන් හඳුනාගත හැකිය.

*ප්‍රස්තාර සටහන 2 : ගෘහමූලිකයාගේ අධ්‍යාපන මට්ටම*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

මෙම ප්‍රස්තාරට අනුව ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම ඔහුගේ රැකියාව තීරණය කරන අතර රැකියාව අනුව ආර්ථික මට්ටම තීරණය වේ. ඒ අනුව ගෘහමූලිකයන් වැඩි පිරිසක් අ.පො.ස උසස් පෙළ හදාරා ඇති අතර එය 45%ක් වේ. ඒ අනුව 38%ක් අ.පො.ස සාමාන්‍ය පෙළ හදාරා ඇති අතර 12%ක් ද්විතියික අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය ලබා ඇත. අවම වශයෙන් 4%ක් ප්‍රාථමික අධ්‍යාපනය සහ 1%ක් පාසල් ගොස් නැති අය වේ. ඒ අතර උපාධිධාරී සහ වෙනත් යන අධ්‍යාපන මට්ටම්වල සිටින ගෘහමූලිකයින් කිසිවෙකුත් වාර්තා වී නොමැති අතර අධ්‍යාපන මට්ටම සහ දරිද්‍රතාවය අතර සම්බන්ධතාවක් ඇති බව පෙනී යයි.

පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව දරිද්‍රතාවය කෙරෙහි බලපා ඇති ආකාරය පහත ප්‍රස්තාර සටහනෙන් දැක්විය හැකිය.

*ප්‍රස්තාර සටහන 3 : පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ප්‍රස්තාර සටහනට අනුව දරිද්‍රතාවය කෙරෙහි පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව විශාල ලෙස බලපෑමක් සිදු කරනු ලබයි. ඒ අනුව වැඩිම ප්‍රතිශතයක් සාමාජිකයින් සංඛ්‍යාව 5ක් සිටින කුටුම්බ වන අතර එය 42%ක ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබයි. ඉන් අනතුරුව අවම වන පිළිවෙලින් 38%ක් සාමාජිකයින් 4ක් සිටින කුටුම්බද 10%ක් සාමාජිකයින් 6ක් සිටින කුටුම්බ සහ 9%ක් සාමාජිකයින් 3ක් සිටින කුටුම්බ පෙන්නුම් කරනු ලබයි. ඒ අතර 1%ක අවම ප්‍රතිශතයක් ලෙස සාමාජිකයින් 2ක් සිටින කුටුම්බ පෙන්නුම් කරනු ලබයි. මේ අනුව කුටුම්බ සාමාජික සංඛ්‍යාව වැඩිවත්ම දරිද්‍රතා මට්ටම වැඩිවන බව තහවුරු කරගත හැකිය.

මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය දිළිඳු කුටුම්බවල ගෘහමූලිකයාගේ රැකියාවෙහි ස්වභාවය එනම් කුමන අංශවල රැකියාවන්හි නියැලී ඇතිද යන්න පහත ප්‍රස්තාර සටහන මගින් නිරූපණය කර ඇත.

*ප්‍රස්තාර සටහන 4 : ගෘහ මූලිකයාගේ රැකියා තත්වය*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ඉහත ප්‍රස්තාරයට අනුව ගෘහ මූලිකයාගේ රැකියාව අනුව වැඩිම ප්‍රතිශතයක් පෞද්ගලික අංශයේ රැකියාවන්හි නියැලෙයි. එනම් 33%ක් වේ. දෙවනුව 19%ක් ස්වයං රැකියා අංශය හඳුනාගත හැකිය. ඉන් අනතුරුව පිළිවෙලින් කුලී රැකියා සහ කෘෂිකර්මාන්තය ආශ්‍රිත

රැකියාවන්හි නියුතු ගෘහ මූලිකයන් වේ. එනම් පිළිවෙලින් 17%ක් සහ 15%ක අගයන් පෙන්නුම් කරනු ලබයි. අවම අගයන් වශයෙන් විදෙස්ගත රැකියා 11%ක් ලෙසත් සහ රාජ්‍ය අංශයේ රැකියා 5%ක් ලෙසත් රැකියාවන්හි නියුතු පුද්ගලයින් හඳුනාගත හැකිය.

ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ කුටුම්බ ආදායම විචලනය වීමත් සමඟ ඔවුන්ගේ ආර්ථික පසුබිම පිළිබඳව සහ ඔවුන් හට මුහුණ දීමට සිදුවන ගැටලු පිළිබඳව ද අවබෝධයක් ලබාගැනීමට ඉතා වැදගත් අංගයක් වේ. මේ අනුව ඔවන්ගේ ආදායම් විචලනය පහත ප්‍රස්තාරය ආශ්‍රයෙන් හඳුනාගත හැකිය.

*ප්‍රස්තාර සටහන 5 : ගෘහ මූලිකයාගේ සහනාධාර සමඟ ඔවුන්ගේ මාසික ආදායම.*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020.

ප්‍රස්තාර සටහන අනුව මෙහි දී ආධාර ලෙස සමෘද්ධි සහනාධාර, පොහොර සහනාධාර, වැඩිහිටි සහනාධාර සහ වෙනත් ආයතන මගින් ලබාදෙන්නා වූ සහනාධාර හඳුනාගෙන ඇත. මේ අනුව ගෘහ මූලිකයන් 69% දෙනෙක් ආදායම 10000-25000 මට්ටම නියෝජනය කරන කුටුම්බ වේ. දෙවනුව ගෘහ මූලිකයන් 29% දෙනෙක් ආදායම 25000-50000 මට්ටම නියෝජනය කරන කුටුම්බ වන අතර අවම වශයෙන් ආදායම 1000-10000 මට්ටම සහ 50000-75000 මට්ටම 1% ගෘහමූලිකයෙක් ලෙස නියෝජනය කරයි.

ග්‍රාමීය දිළිඳු ජනයා තම එදිනෙදා කටයුතු සඳහා ණය ලබාගැනීමට සිදුවන අවස්ථා ඇත. මේ අනුව පහත ප්‍රස්තාරය මගින් ණය පහසුකම් ලබාගත් කුටුම්බ ප්‍රමාණය දක්නට ලැබේ.

*ප්‍රස්තාර සටහන 6 : ග්‍රාමීය දිළිඳු කුටුම්බයන් ලබා ගත් ණය පහසුකම්.*





මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020.

ප්‍රස්තාරයට අනුව සමස්ත කුටුම්බ සංඛ්‍යාවෙන් 57% දෙනෙක් ණය ලබාගෙන ඇත. මේ අතර කුටුම්බ 43%ක් ණය පහසුකම් ලබාගෙන නොමැත.

### 4.1 මාසික වියදම් කෙරෙහි කුටුම්බ ආදායමේ බලපෑම හඳුනා ගැනීමට සරල ප්‍රතිපායන ආකෘතිය

ආදායම සහ වියදම යන විචල්‍යයන් ආර්ථික මට්ටම පිළිබඳව පුරෝකතනයන් ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නා විචල්‍යයන් වන අතර එමගින් ප්‍රතිපායන ආකෘතිය, විසිරි තිත් සටහන සහ සහසම්බන්ධතා සංගුණක මගින් විමසීම සිදු කළ හැකිය.

*ප්‍රස්තාර සටහන 7 : විසිරි තිත් සටහන*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ඉහත ප්‍රස්තාරයට අනුව විචල්‍යයන් අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය පිළිබඳව දළ අවබෝධයක් ලබාගත හැකිය. එහි දී ආදායම සහ වියදම යන විචල්‍යයන් දෙක අතර ධන සහසම්බන්ධතාවක් පවතින බව දැක්විය හැකිය. මේ සඳහා ගොඩනංවන ලද සරල ප්‍රතිපායන ආකෘතිය පහත දැක්වේ.

$$Y = \beta_0 + \beta_1 X_1 + U_1$$

$Y$ = පවුලේ මාසික වියදම

$X_1$ = ගෘහ මූලිකයාගේ ආදායම

වගු අංක 1 : කුටුම්බ ආදායම සහ වියදම් අතර සහසම්බන්ධතාව පරීක්ෂා කිරීම.

| | | Expenditure | Income |
|---|---|---|---|
| Pearson Correlation | Expenditure | 1.000 | .889 |
| | Income | .889 | 1.000 |
| Sig. (1-tailed) | Expenditure | . | .000 |
| | Income | .000 | . |
| N | Expenditure | 99 | 99 |
| | Income | 99 | 99 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

කුටුම්බ ආදායම සහ වියදම අතර සහසම්බන්ධතා සංගුණකය පරීක්ෂා කිරීම දැක්විය හැකිය. මෙහි දී වියදම කෙරෙහි කුටුම්බ ආදායම කෙතරම් දුරට බලපා ඇතිද යන්න හඳුනාගත හැකිය. ඒ අනුව 0.889ක ධන සහසම්බන්ධතාවක් පවතින බව පෙනී යයි.

පහත දැක්වෙනුයේ ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපායන ආකෘතියයි.

$$Y = \beta_0 + \beta_1 X_1 + U_1$$


$$Y = 5874.599 + 0.623X_1 + U_1$$

මෙහි $\beta_0$ යනු මාසික ආදායම ශූන්‍ය වන විට කුටුම්බයක සාමාන්‍ය වියදම් ප්‍රමාණය වේ. ඒ අනුව 5874.599 වේ. එසේම ආකෘතියේ $\beta_1$ මගින් දැක්වෙන්නේ ආකෘතියට ඇතුලත් කර ඇති ස්වායක්ත විචල්‍යය එනම් මාසික ආදායම එක් ඒකකයකින් වැඩිවන විට පරායක්ත විචල්‍යයේ සිදුවන විචලනයයි. එය 0.623 වේ. ඒ අනුව මාසික ආදායම සහ වියදම් ප්‍රමාණය අතර ධන සම්බන්ධතාවක් පවතී.

### 4.2 සාධක විශ්ලේෂණය

ග්‍රාමීය දිළිඳු කුටුම්බ 99 දෙනෙකුගෙන් යුත් නියැදියේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන හේතු 12ක් පිළිබඳව රැස්කරගත් දත්තවල සාධක විශලේෂණය සිදු කර ඇත.

*ප්‍රස්තාර සටහන 3.8 : අයිගන් අග සහ සාධක අගයන්*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ඉහත ප්‍රස්තාරයට අනුව ප්‍රධාන සංරචක ගණන ගණනය කිරීමට හැකියාව පවතී. ඒ අනුව 0ට ආසන්නයේ ලක්ෂයේ පවතින ප්‍රධාන සංරචක ප්‍රමාණය අධ්‍යයනය සඳහා යොදා ගනියි. ඒ අනුව මෙහි ප්‍රධාන සංරචක 5ක් යැයි තීරණය කළ හැකිය.

*වගු අංක 2 : සාධක නිර්මාණය කිරීම*

| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** |
| වයස | .073 | -.455 | .058 | .028 | -.022 |
| රැකියාව | .461 | .620 | .156 | -.240 | -.061 |
| අධ්‍යාපන මට්ටම | -.024 | .532 | -.105 | -.610 | .039 |
| විවාහක තත්වය | -.175 | .723 | -.021 | .228 | -.034 |
| නිවසේ ස්වභාවය | .073 | .060 | .755 | -.068 | -.208 |
| පවුලේ සාමාජිකයින් ගණන | .606 | -.282 | -.075 | -.103 | .030 |
| ප්‍රවාහන පහසුකම් | .043 | .144 | -.049 | .849 | .029 |
| පදිංචියේ ස්වභාවය | .036 | -.136 | .849 | .065 | .096 |
| මාසික ආදායම | .898 | .033 | .140 | .150 | .043 |
| මාසික වියදම | .942 | -.021 | .062 | .039 | .068 |
| ණය ලබාගැනීම | .077 | .016 | .018 | -.093 | .803 |
| රෝගාබාධ | .017 | -.017 | -.100 | .093 | .692 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

වගු අංක 3.3ට අනුව දරිද්‍රතාවය කෙරෙහි බලපාන සමාජ සහ ආර්ථික සාධක 5ක් හඳුනාගත හැකිය. මෙහි පළමු සාධකය ලෙස කුටුම්බ පරිභෝජන වියදම අධික වීම හඳුනාගත හැකිය. මෙම සාධකය යටතේ මාසික වියදම, මාසික ආදායම සහ පවුලේ සාමාජිකයින් ගණන යන සංරචක අනාවරණය වී ඇත. මෙහි දෙවන සාධකය ලෙස ප්‍රජා විද්‍යාත්මක හේතු මත ස්ථිර රැකියා අවස්ථා නොමැති වීම  හඳුනාගත හැකිය. එම සාධකය යටතේ විවාහක තත්වය, රැකියාව සහ වයස යන සංරචක දරිද්‍රතාවය කෙරෙහි බලපා ඇති බව පෙනී යයි. තෙවන සාධකය ලෙස ප්‍රමාණවත් යටිතල පහසුකම් හිඟ වීම හඳුනාගත හැකිය. එය නිවසේ ස්වභාවය සහ පදිංචියේ ස්වභාවය යන සංරචක මත විදහාදක්වයි. ප්‍රවාහන පහසුකම් සහ අධ්‍යාපන මට්ටම ආදී සංරචක අඩු සමාජීය තත්වය නිරූපණය කිරීම යන සිව්වන සාධකය මත රඳා පවතියි. අවසාන සාධකය ලෙස ආදායම ප්‍රමාණවත් නොවීම හඳුනාගත හැකිය. ඒ යටතේ ණය ලබා ගැනීම සහ රෝගාබාධවලින් පෙළෙන ගෘහ මූලිකයන් යන සංරචකය පෙන්වා දිය හැකිය. ඒ අනුව කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික මට්ටම සඳහා සිදු කරනු ලබන බලපෑම මෙහි දී පෙන්වා පෙන්වා දෙනු ලබයි.

ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපාන සාධක අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා කල්පිත ගොඩනගා ගනිමින් කයි වර්ග පරීක්ෂාව සිදු කරයි.

*වගු අංක 3 : කයි වර්ග පරීක්ෂාව*

| **$H_0$ කල්පිතය** | **කයි වර්ග අගය** | **P අගය** |
|---|---|---|
| පුම්තිරි බව සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් නොමැත | 74.556 | 0.000 |
| වයස සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් නොමැත | 30.865 | 0.002 |
| රැකියාව සහ අධ්‍යාපනය අතර සම්බන්ධතාවයක් නොමැත | 46.393 | 0.001 |
| රැකියාව සහ මාසික වියදම අතර සම්බන්ධතාවයක් නොමැත | 176.363 | 0.000 |
| රැකියාව සහ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් නොමැත | 176.607 | 0.000 |
| කුටුම්බ සාමාජිකයින් ගණන සහ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් නොමැත | 59.831 | 0.338 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත, 2020

ඒ අනුව ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ පුම්තිරි බව සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=74.556 ද P=0.000 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ පුම්තිරි බව සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය. වයස සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=30.865 ද P=0.002 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ වයස සහ විවාහක බව අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය.

ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ අධ්‍යාපනය අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=46.393 ද P=0.001 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ අධ්‍යාපනය අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය. ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ මාසික වියදම අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=176.363 ද P=0.000 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ මාසික වියදම අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය. ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=176.607 ද P=0.000 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ රැකියාව සහ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය. ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ කුටුම්බ සාමාජිකයින් ගණන සහ මාසික වියදම අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කළ කයි වර්ග පරීක්ෂාවේ දී $x^2$=132.088 ද P=0.002 වන බැවින් P<α වන බැවින් $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. එම නිසා ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ කුටුම්බ සාමාජිකයින් ගණන සහ මාසික වියදම අතර සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකිය.

## 5. සමාලෝචනය

ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනයක් කරා ළඟාවීම උදෙසා දරිද්‍රතාවය විශාල ගැටලුවක්ව පවතී. මේ නිසා දරිද්‍රතාවය අවම කිරීම වඩාත් වැදගත් කාර්යයක් වේ. විශේෂයෙන් ලෝකයේ මෙන් ම ලංකාව තුළ ද විවිධ ප්‍රදේශයන්හි දක්නට ලැබෙන මෙම තත්වය කෑගල්ල දිස්ත්‍රික්කයේ විවිධ ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් මෙම දරිද්‍රතාවය පවතින බව දැකගත හැකිය. මෙහි දී තෝරාගන්නා ලද 99ක නියැදිය තුළින් ලබා ගත් දත්ත අනුව දරිද්‍රතාවය සඳහා සමාජ පසුබිම, ආර්ථික පසුබිම සහ ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පහත නිගමන කරා එළඹීමට හැකියාව ඇත. ඒ අනුව ප්‍රජා විද්‍යාත්මක සාධක පිළිබඳව අවධානය යොමු කිරීමේ දී නියැදියට අදාළ කුටුම්බයන්ගේ ගෘහ මූලිකයාගේ පුමිතිරි බව අනුව 81%ක වැඩිම ප්‍රතිශතයක් පුරුෂ ගෘහමූලිකයින් වන අතර 18%ක ප්‍රතිශතයක් ගැහැණු ගෘහමූලිකයින් වේ. විවාහක බව පදනම් කරගෙන සිදු කරන ලද අධ්‍යයනයට අනුව ගෘහ මූලිකයින් වැඩි පිරිසක් විවාහක පුද්ගලයින් වේ. එය 76%ක ප්‍රතිශතයක් ලෙස පෙන්නුම් කර ඇත. ඒ අනුව දරිද්‍රතාවය කෙරෙහි විවාහක බව ද බලපා ඇති බව සනාත වේ. දරිද්‍රතාවය කෙරෙහි පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව විශාල ලෙස බලපෑමක් සිදු කරනු ලබයි. ඒ අනුව වැඩිම ප්‍රතිශතයක් සාමාජිකයින් සංඛ්‍යාව 6ක් සිටින කුටුම්බ වන අතර එය 30%ක ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබයි. ඒ අනුව පවුල් සෞඛ්‍යය ක්‍රමවේදයන් පිළිබඳව නිසි අවබෝධයක් ඔවුන් සතුව නොමැති බව නිගමනය කළ හැකිය.

ආර්ථික පසුබිම පිළිබඳව සලකා බැලීමේ දී කුටුම්බ 99ක ගෘහ මූලිකයන් අතරින් විශාල ප්‍රමාණයක් එනම් ගෘහ මූලිකයන් 68 දෙනෙක් ආදායම රු.10000 - 25000 ත් අතර මට්ටම නියෝජනය කරන අතර කුටුම්බ සංඛ්‍යාවෙන් 56 දෙනෙක් ණය පහසුකම් ලබාගෙන ඇති කුටුම්බ වේ. මේ අනුව ඔවුන් ආර්ථිකය පහළ මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය. මෙහි දී ග්‍රාමීය දිළිඳු කුටුම්බවල ආදායම සහ වියදම අතර කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකය පරීක්ෂා කිරීමේ දී 0.889ක ධන සහසම්බන්ධතාවක් පවතින බව පෙනී යයි. සරල ප්‍රතිපායනය යොදා ගනිමින් සිදු කරන ලද විශ්ලේෂණයට අනුව මාසික ආදායම ශූන්‍ය වන විට කුටුම්බයක සාමාන්‍ය වියදම 5874.599ක අගයක් ගනු ලබයි. ඒ අනුව මාසික ආදායම එක් ඒකකයකින් වැඩිවන විට පරායක්ත විචල්‍යයේ සිදුවන විචලනය එනම් මාසික වියදම 0.623ක අගයක් ගනු ලබයි. ඒ අනුව මාසික ආදායම සහ වියදම් ප්‍රමාණය අතර ධන සම්බන්ධතාවක් පවතී. දිළිඳු ජනයාගේ දරිද්‍රතාවය සඳහා බලපා ඇති සාධක පිළිබඳ සිදුකරන ලද සාධක අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් දරිද්‍රතාවය කෙරෙහි බලපාන සමාජ සහ ආර්ථික සාධක 5ක් හඳුනාගත හැකිය. ඒවා නම් කුටුම්බ පරිභෝජන වියදම අධික වීම, ප්‍රජා විද්‍යාත්මක හේතු මත ස්ථිර රැකියා අවස්ථා නොමැති වීම, ප්‍රමාණවත් යටිතල පහසුකම් හිඟ වීම, අඩු සමාජීය තත්වය නිරූපණය කිරීම සහ කුටුම්බ ආදායම ප්‍රමාණවත් නොවීම යන සාධක හඳුනාගත හැකිය. ඒ අනුව කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික මට්ටම සඳහා සිදු කරනු ලබන බලපෑම මෙහි දී පෙන්වා පෙන්වා දෙනු ලබයි.

ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපාන සාධක අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න සිදු කරන ලද කයි වර්ග පරීක්ෂාවට අනුව ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ පුමිතිරි බව සහ විවාහක බව අතර, වයස සහ විවාහක බව අතර, රැකියාව

සහ අධ්‍යාපනය අතර, රැකියාව සහ මාසික වියදම අතර, රැකියාව සහ මාසික ආදායම අතර, කුටුම්බ සාමාජිකයින් ගණන සහ මාසික වියදම අතර ද සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගැනීමට හැකි විය. මේ අනුව ඉහත සියලු සාධකයන් ග්‍රාමීය දිළිඳු ජනයා දරිද්‍රතාවයෙන් පෙළීමට හේතු වී ඇති බව නිගමනය කළ හැකිය. මෙම අධ්‍යයනයේ තේමාව වූයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන්නේ ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම කෙරෙහි බලපා ඇති සාධක මොනවාද යන්න හඳුනා ගැනීමයි. මේ අනුව මේ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනිමින් ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ සමාජ සහ ආර්ථික පසුබිම පිළිබඳව අධ්‍යයනය සිදු කර ඇත.

මේ අනුව ග්‍රාමීය දිළිඳු කුටුම්බයන්ගේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන සමාජීය සාධක, ආර්ථික සාධක සහ ප්‍රජා විද්‍යාත්මක සාධක සහ දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳව සාහිත්‍ය විමර්ශනයේ දී අවධානය යොමු කර ඇත. මෙහි දී අධ්‍යයනයේ අරමුණු ඉටු කරගැනීම සඳහා නියැදීම වශයෙන් ග්‍රාමීය දිළිඳු කුටුම්බ තෝරා ගැනීමේ දී පැහැදිලි ලෙස දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ග්‍රාම නිළධාරී වසම් ආදී ලෙස ගෙන නිශ්චිත නියැදි රාමුවක් යටතේ අධ්‍යයනය සිදු කර ඇත. මේ නිසා සම්භාවිතා නියදුම් ක්‍රම නියදීම සඳහා භාවිතා කර ඇත. මෙම සම්භාවිතා නියදුම් ක්‍රම අතුරින් දෙපිය පොකුරු නියැදීම මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 11 අතරින් මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගෙන ඇත. මෙම මාවනැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වසම් 71ක් පිහිටා ඇති අතර එයින් වෑගන්තලේ, කෝන්දෙනිය, ගෝන්දිවල සහ මහවත්ත යන ග්‍රාම නිළධාරී වසම් 04 තෝරා ගන්නා ලදී. මේ අතරින් සමෘධිලාභී ග්‍රාමීය කුටුම්බ 99ක සසම්භාවී නියැදියක් යටතේ දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

මෙසේ තෝරාගන්නා ලද නියැදියෙන් දත්ත ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. ඒ අනුව ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය හරහා මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දිළිඳු කුටුම්බවල ස්වභාවය සහ ප්‍රජා විද්‍යාත්මක සාධක අධ්‍යයනය කරන අතර කාල් පියසන්ගේ සහ සම්බන්ධතා සංගුණකයට අනුව මාසික ආදායම සහ මාසික වියදම අතර ධන සහ සම්බන්ධතාවයක් පවතින බව අනාවරණය විය. මෙහි දී සරල ප්‍රතිපායනය මගින් මාසික ආදායම සහ වියදම් ප්‍රමාණය අතර ධන සම්බන්ධතාවක් පවතින බව හඳුනාගත හැකි විය. මේ අනුව කයි වර්ග පරීක්ෂාව මගින් විචල්‍යය අතර පවතින සම්බන්ධතාව සහ සාධක විශ්ලේෂණය මගින් දරිද්‍රතාවය සඳහා බලපා ඇති ආසන්නතම සාධක මොනවාද යන්න හඳුනා ගත හැකි විය. ඒ අනුව මෙම විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව පහත නිගමන ගම්‍ය කරගැනීමට හැකි විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව (2006), වාර්ෂික වාර්තාව 2006, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව (2010), වාර්ෂික වාර්තාව 2010, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව

*Denning*, S. (2017). Poverty Update: *The Four Main Causes of Poverty in Sri Lanka*. Retrieved from borgenmagazine websit: https://www. borgenmagazine.com/causes-of-poverty-in-sri-lanka/#prettyPhoto

Jabbar, S., & Senanayake, D. (2004). *Overview of poverty in Sri Lanka*. Centre for Poverty Analysis.

Ranathunga, S. & Gibson, J. (2014). Determinants of household poverty in the rural sector in Sri Lanka: 1990-2010. Retrieved from research gate website: https://www.researchgate.net/profile/DrseethaRanathunga/publication/272171071_Determinants_of_household_poverty_in_the_rural_sector_in_Sri_Lanka_1990-2010/links/54dd7f540cf25b09b913c37a/Determinants-of-household-poverty-in-the-rural-sector-in-Sri-Lanka-1990-2010.pdf

Sri Lanka Asian Development Bank. (2019), Poverty Data. Retrieved from Asian development bank website: https://www.adb.org/countries/sri-lanka/poverty#:~:text=In%20Sri%20Lanka%2C%204.1%25%20of,day%20in%202019%20is%200.3% 25.

The World Bank. (2018). Poverty And Shared Prosperity, Piecing Together The Poverty Puzzle. Retrieved from World bank website: https://www. worldbank.org/en/publication/poverty-and-sharedprosperity#introducti on

United Nations Commission on Human Rights. (1998). *Guiding Principles on Internal Displacement*. United Nations Commission on Human Rights.

# කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක පිළිබඳ අධ්‍යයනය

ඩබ්. එන්. ප්‍රීතිමාලි

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*

nuwanthikapreethimali96@gmail.com

***සංක්ෂේපය***

*මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වුයේ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු හඳුනා ගැනීමයි. සෙසු අරමුණු ලෙස කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය හඳුනා ගැනීම සහ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සම්බන්ධයෙන් අනාගතයේ වැඩිදියුණු කළ යුතු පරිශීලක අවශ්‍යතා හඳුනා ගැනීම යනාදිය දැක්විය හැක. එහිදී මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථයින් මූලික කරගෙන සිදු කෙරුණ බැවින් අධ්‍යන ප්‍රදේශය වුයේ කැලණිය විශ්වවිද්‍යාලයයි. අධ්‍යයනයට අදාළ ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලි ක්‍රමය මගින් රැස්කරගන්නා ලදි. විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම, කයිවර්ග පරීක්ෂාව සහ සාධක විශ්ලේෂණ ශිල්ප ක්‍රමය යොදා ගන්නා ලදී. මෙහිදී පරිශීලක තෘප්තියට බලපාන ප්‍රධාන සාධක පහක් හඳුනාගත හැකි වූ අතර ඒවානම් පුස්තකාල එකතුවේ බලපෑම, කාර්යමණ්ඩලයේ සේවාවන්හි බලපෑම, පුස්තකාලය භාවිතා කළ හැකි කාල වේලාවන්හි බලපෑම, භෞතික සම්පත් නිසා ඇතිවන බලපෑම සහ නීති රීති සහ ආරක්ෂාව නිසා ඇතිවන බලපෑම යනුවෙනි. සමස්තයක් වශයෙන් ගත් කළ පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය හොඳ මට්ටමක පවතින බව නිගමනය කළ හැකි විය. තවද ස්ත්‍රී විද්‍යාර්ථයින්ට වඩා පුරුෂ විද්‍යාර්ථයින් පුස්තකාල පහසුකම් සහ සේවාවන් සමන්ධයෙන් තෘප්තිමත් බවද නිගමනය කළ හැකි විය. පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ පුස්තකාල භාවිතය වැඩි බවත් අනෙකුත් වසර වලට සාපේක්ෂව පළමු  වසර විද්‍යාර්ථයින්ගේ පුසතකාල භාවිතය අඩු බවත් නිගමනය කළ හැකි විය. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් දැනුවත්භාවය මිනුම් කළ විට ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයින්ගේ දැනුවත්භාවය අඩු බවත් අනිකුත් වසර වල වල විද්‍යාර්ථයින්ට සාපේක්ෂව පළමු වසර විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය අඩු බවත් නිගමනය කළ හැකි විය. සියලු වසර වල විද්‍යාර්ථයින් හට පුස්තකාලය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බවත්, පරිශීලකයින්ට ළඟාවීම සඳහා සමාජ ජාලා පිටු නිර්මාණය කළ යුතු බවත්, විද්‍යාර්ථයින්ගේ විනෝදජනක අවශ්‍යතා සපුරාලන ගුණාත්මක එකතුවක්ද සකස් කල යුතු බවත් සහ  අලුත්වන පරිශීලක අවශ්‍යතා හඳුනා ගැනීමට හා තම සේවාවේ ගුණාත්මකභාවය මිණුම් කිරීමට පුස්තකාලයක් විසින් නිතර නිතර තම සේවාවන් සම්බන්ධයෙන් පරිශීලක තෘප්තිය පිළිබඳ සමීක්ෂණයන් කළ යුතු බවත් යෝජනා කළ හැකිය.*

***මුඛ්‍ය පද : විද්‍යාර්ථයා, තෘප්තිමත්භාවය, පුස්තකාලය***

## 1. හැඳින්වීම

මානව සමාජයේ වර්තමාන දියුණුවට හේතුවී ඇත්තේ මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු පසු පසුකාලීන පරපුරට භාවිතා කළ හැකි අයුරින් වාර්තාගත කිරීමට ඇති හැකි හැකියාවයි. අධ්‍යාපනය, පර්යේෂණය, ආර්ථික කටයුතු, දේශපාලනික කටයුතු, සංස්කෘතික කටයුතු ආදී වූ විවිධ කාර්යයන් නිසා මානව දැනුමට එකතු වන  තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත්ව තිබේ. භූගෝලීය, දේශපාලනික, සමාජයීය හා සංස්කෘතිකමය කඩයිම් හරහා ගලා එන මෙම තොරතුරු ප්‍රවාහය සෙසු අයට ප්‍රයෝජනයට ගතහැකි පරිදි ලබා ගැනීම, සකස් කිරීම, ගබඩා කිරීම, සමුද්‍රණය හා සන්නිවේදනය පිණිස ඇති ප්‍රධාන විඥාපන ඒකකයක් ලෙස පුස්තකාලය ඉතා සුවිශේෂී වෙයි. මානව ක්‍රියා ක්‍රියාකාරිත්වයේ ''තොරතුරු'' වැදගත් ලෙස නොසැලකෙන කිසිදු ක්ෂේත්‍රයක්  සෙවිය නොහැකි තරම් වන කාලයක පුස්තකාලයක් මගින් සමාජය වෙත ඉටුකළ හැකි සේවාවන් අති ඉමහත්ය. ඒ අතරින් අධ්‍යයන පුස්තකාලයක් වන විශ්වවිද්‍යාලයීය පුස්තකාලයට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. ඊට හේතුව වන්නේ විද්‍යාර්ථයින්, ආචාර්යවරුන් මෙන්ම පර්යේෂණ විශාරදයින්ද  තම තොරතුරු සඳහා වන බහුමාන ඉල්ලීම් සපුරා ගන්නේ විශ්වවිද්‍යාලයීය පුස්තකාල මගින් වීමයි. පුද්ගලයෙකුට, ආයතනයකට, රටකට, ජාතියකට ආදී වශයෙන් ඕනෑම කෙනෙකුට තමාගේම වූ සංවර්ධන ඉලක්ක පවතී. බොහෝමයක් සංවර්ධිත රටවල සීඝ්‍ර සංවර්ධනයට හේතු වී ඇත්තේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා දක්වන විශේෂ සැලකිල්ලයි. මේ කුමන ආකාරයේ සංවර්ධනයක් වුවද ලගාකරගැනීමට නම් මූලිකවම මිනිසා තුළ බුද්ධි සංවර්ධනයක් ඇති විය යුතුය. ඒ සඳහා අත්‍යවශ්‍ය මූලික අංගයක් වී ඇත්තේ තොරතුරුයි. අවම වැය කිරීමකින් කෙටිම මාර්ගයක් ඔස්සේ තොරතුරු වෙත ළගාවිය හැකි නම් ඒ පුස්තකාලයක් මඟිනි. පුස්තකාල සේවාව පමණක් නොව අන් කවර සේවාවක වුවද ගුණාත්මක බව ඇගයීමට හොඳම නිර්ණායකය නම් එම සේවාව සඳහා වූ පරිශීලක තෘප්තියයි. කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීමට යොමු වීමට හේතු කිහිපයක්ම මුල් විය. සාහිත්‍යය විමර්ශන යටතේ පුස්තකාල සේවාව සම්බන්ධයෙන් පරිශීලක තෘප්තියට බලපාන හේතු සාධක පිළිබඳ සිදුකරන ලද සමීක්ෂණ යම්කිසි ප්‍රමාණයක් සොයා ගත හැකි වුවත් ඒවා සියල්ලකින්ම සිදුකර තිබුණේ පරිශීලක තෘප්තිය කෙරේ බලපාන වඩාත් බලපෑමක් කළ හැකි සාධකය හෝ සාධක  තේරීම පමණකි. තවද අධ්‍යයන පුස්තකාලයක් සම්බන්ධ කරගනිමින් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය මිනුම් කරන ලද පර්යේෂණ හමු වූයේ ද නැත. එබැවින් එම හිඩැස පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යයන පුස්තකාල අතරින් වැදගත් ස්ථානයක් ගන්නා කැලණිය විද්‍යාලයීය පුස්තකාලයේ පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථීන්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක අධ්‍යනය කිරීමට යොමුවිය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක මොනවාද? යන්නය. මෙහි උප අධ්‍යයන ගැටලු වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය කෙබඳුද? සහ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සම්බන්ධයෙන් අනාගතයේ වැඩිදියුණු කළ යුතු පරිශීලක අවශ්‍යතා කෙබඳුද? යන්නය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු හඳුනා ගැනීම වන අතර මෙහි උප අරමුණු වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය හඳුනා ගැනීම සහ කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලය සම්බන්ධයෙන් අනාගතයේ වැඩිදියුණු කළ යුතු පරිශීලක අවශ්‍යතා හඳුනා ගැනීමය. කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් අභ්‍යන්තරව ඉගෙනුම ලබන විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ පමණක් අධ්‍යනය කර පුස්තකාල පහසුකම් සහ සේවාවන් පිළිබඳ නිගමන වලට එළඹී නමුත් කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ පරිශීලකයින් යටතට අභයන්තර විද්‍යාර්ථයින්ට අමතරව අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් මෙන්ම බාහිරව ඉගෙනුම ලබන විද්‍යාර්ථයින්ද ඇතුළත් වේ. එය මෙම අධ්‍යයනයේ එක් සීමාවක් ලෙස හඳුනාගත හැක. අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමට යොදා ගන්න ලද ප්‍රශ්නාවලියේ සියලු ප්‍රශ්න ආවෘත ප්‍රශ්න වීමද මෙම අධ්‍යයනයේ එක් සිමාවකි.

**2. සාහිත්‍ය විමර්ශනය**

පුස්තකාල සේවාව පමණක් නොව අන් කවර නව සේවාවක් හෝ ද්‍රව්‍යයක් වුවද බිහිවන්නේ සුවිශේෂ සමාජ ඉල්ලුමක ප්‍රතිඵලයක් වශයෙනි. එකිනෙකාට දුරින් විසූ සාමාජිකයන් වෙත අදහස් සම්ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ලිඛිත බස බිහි විය. සන්නිවේදන අවශ්‍යතා වඩාත් පුළුල් හා සංකීර්ණ බවට පත්වීම නිසා මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වැනි නව ප්‍රවණතා රැසකට මග හෙළිවිය. විවිධ ජනමාධ්‍ය ඔස්සේ ගොඩනැගුණු නව දැනුම පෞද්ගලිකව සිය ග්‍රහණයට හසුකර ගැනීමට නොහැකි තරම් පුළුල් වීමත් සමගම එම කාර්යය කර ගැනීම සඳහා වඩාත් සංවිධානාත්මක සහ කාර්යක්ෂම සංවිධානයක අවශ්‍යතාව සමාජයට තදින් දැනෙන්නට විය. පුස්තකාල සේවාව බිහිවූයේ මූලික වශයෙන් මෙම සමාජ අවශ්‍යතාව සපුරාලීම අභිමතාර්ථ කරගෙනය (ගුණසේකර, 2005).

American Library Association (2019) මගින් පුස්තකාලය නිර්වචනය කර ඇත්තේ කියවීම්, උපදේශන, අධ්‍යයන සහ පර්යේෂණ ආදී භාවිතයන් සඳහා සංවිධානය කර පවත්වාගෙන යනු ලබන පොත් සහ අනිකුත් මුද්‍රිත හා මුද්‍රණය නොකරන ලද ද්‍රව්‍ය එකතුවක් ලෙසයි. Aina (2004) ට අනුව පරිශීලකයා යනු පුස්තකාලයක සේවාවන් භාවිතා කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයා වේ. අනුග්‍රාහකයා, සේවා දායකයා, තොරතුරු භාවිතා කරන්නා, පාරිභෝගිකයා, පාඨකයා වැනි බොහෝ සමාන වචන ඒ සඳහා භාවිතා කරන අතර පුස්තකාල එකතුව හා සේවාවන් භාවිතා කිරීමට පරිශීලකයා හට බලයක් තිබේ. පුස්තකාල විසින් ඉටුකරගත යුතු අරමුණු පොදු අරමුණු සහ සුවිශේෂී අරමුණු වශයෙන් මූලික ශීර්ෂ දෙකකි. පොදු අරමුණු නම් සෑම පුස්තකාලයක්ම සිය අභිමතාර්ථ ඉටුකරගැනීම සඳහා මූලික වශයෙන් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු වේ. සුවිශේෂ අරමුණු යනු ඒ ඒ පුස්තකාලයට සුවිශේෂී වූ කාර්යයන් ඉටු කරගැනීම සඳහා ගොඩනගාගත් අරමුණුය (ගුණසේකර, 2005). පරිශීලක තෘප්තිය යනු පුස්තකාලයක ඇති සේවාවන් හෝ සම්පත් පිළිබඳව පරිශීලකයින් සෑහීමකට පත්වේද යන්නයි. පරිශීලකයින්ගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් සපුරාලන්නේ නම් ස්වාභාවිකවම ඔවුන්ගේ ඉල්ලීම් ඉටු වී ඇති බැවින් ඔවුන් සෑහීමකට පත් වේ (Applegate, 1997).

Balog & Plašćak ( 2012) සහ Bashir, Soroya, & Khanum ( 2018) පවසන පරිදි පුස්තකාලයක පරිශීලකයින්ගේ තෘප්තියට ඉහළම බලපෑමක් ඇති කරන සාධකය වන්නේ පුස්තකාලයක තොරතුරු එකතුවයි. සිසුන්ගේ පාඨමාලා, විභාග, පර්යේෂණ කටයුතු මෙන්ම අතිරේක දැනුම සහ විනෝදාත්මක කටයුතු ආදී සියලුම විෂය ක්ෂේත්‍ර වලට අදාළ පොත්පත්, සඟරා, පුවත්පත් විවිධ භාෂාවලින් ඇතුළත් පරිපූර්ණ එකතුවක් තිබීම පුස්තකාලයකට අත්‍යවශ්‍ය බව ඔවුන් පෙන්වා දෙයි. පුස්තකාලයක ඇතුළත් තොරතුරු එකතුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැක. එනම් මුද්‍රිත තොරතුරු සම්පත් හා මුද්‍රිත නොවන තොරතුරු සම්පත් වශයෙනි (Agboola, Bamigboye, & Owolabi, 2019). ඇතැම් පරිශීලකයින් මාර්ගගත එනම් මුද්‍රණය නොකරණ ලද තොරතුරු සම්පත් පිළිබඳ වැඩි තෘප්තියක් පෙන්නුම් කරන අතර ඇතැම් පරිශීලකයින් මුද්‍රිත තොරතුරු සම්පත් කෙරෙහි වැඩි තෘප්තියක් පෙන්නුම් කරයි (Abdullah, 2011).

පුස්තකාල එකතුව නිතරම යාවත්කාලීන කිරීම සහ නව තොරතුරු සම්පත් පැමිණීම පිළිබඳ දැනුවත් කිරීම මගින්ද පරිශීලකින්ගේ තෘප්තිමත්භාවය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි (Ali & Khan, 2019) සහ (Tiemo & Ateboh , 2016). තොරතුරු සම්පත් වෙත ප්‍රවේශ වීමට ඇති පහසුවද පරිශීලක තෘප්තිය කෙරෙහි බලපාන සාධකයක් ලෙස හඳුනාගත හැක. මුද්‍රිත තොරතුරු එකතුවට මෙන්ම මුද්‍රිත නොවන තොරතුරු එකතුවටද පහසුවෙන් ප්‍රවේශ වී අවශ්‍ය තොරතුරු ඉතා ඉක්මණින් සොයා ගැනීමට හැකිවන පරිදි එකතුව සංවිධානය කිරීම මගින්ද අන්තර්ජාලය ඔස්සේ අඩු කාලයකින් අවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය හොඳ තත්ත්වයේ පරිගණක wi-fi පහසුකම් ආදිය තිබීම මගින්ද පරිශීලක තෘප්තිය කෙරෙහි බලපෑමක් ඇති කර හැකි වේ (Twum, Adams, Budu, & Anati Budu, 2020). Shanmugathasan (2016) විසින්ද ශ්‍රී ලංකාවේ වව්නියා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයින්ගේ පුස්තකාලය භාවිතය සහ තෘප්තිය පිළිබඳ විමසා බැලීමට සිදු කරන ලද පර්යේෂණය මගින්ද පුස්තකාලය විසින් සපයන අන්තර්ජාල හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවන් පරිශීලක තෘප්තිය කෙරෙහි බලපාන බව පෙන්වා දී ඇත.

පොත් බැහැර දීමේ සේවාවද පරිශීලක තෘප්තිය කොරහි බලපාන එක් සාධකයක් ලෙස හඳුනාගත හැක. එහිදී එක් පරිශීලකයෙකුට එක් වතාවකදී බැහැර ගෙන යා හැකි පොත් සංඛ්‍යාව මෙන්ම පොත් ලඟ තබා ගත හැකි කාල සීමාවද ආපසු බාරදීමේදී කල්පසුවීම් සඳහා ගෙවියයුතු දඩ මුදල් ගාස්තුද ආදිය පරිශීලක තෘප්තිය කෙරෙහි බලපෑමක් ඇති කරයි (Nunekpeku, 2019). පුස්තකාලය තුළ රාක්ක සැලැස්මද පාරිභෝගික තෘප්තියට හේතු වන සාධකයක් බව Chandrasekar & Sivathaasan (2016) විසින් පෙන්වා දී ඇත. ඒ කෙසේද යත් විවිධ විෂයන් යටතේ වර්ගීකරණය කරන ලද පොත්පත් පිළිවෙළකට, පිරිසිදුව, පහසුවෙන් ලගා විය හැකි පරිදි රාක්කගතකර තිබූ විට එය පරිශීලකයන්ට අවශ්‍ය පොත අඩු කාලයකදී පහසුවෙන් සොයාගැනීමට උපකාර වන බැවින් ඒ පිළිබඳ ඔවුන් තෘප්තිමත් වේ. පොත්පත් වල ඇති කරුණු නිසි ආකාරව අවබෝධ කර ගැනීමටනම් මානසික ඒකාග්‍රතාවයකින් යුතුව ඒවා පරිහරණය කළ යුතු වේ. ඒ සඳහා පුස්තකාලයේ අභ්‍යන්තර පරිසරය එනම් අවකාශය, සුවපහසු ආසන, වාතාශ්‍රය, පිරිසිදුකම සහ නිස්කලංක බව ආදිය උපකාරී වේ.

ඉන් පැහැදිලි වන්නේ හොඳ අභන්තර පරිසරයක් පැවතීම පරිශීලකයින්ගේ අධ්‍යයන කටයුතු වලට ධනාත්මක බලපෑමක් ඇති කරන බවයි (Nawarathne & Singh, 2013). තවද පෙන්වා දී ඇත්තේ පුස්තකාල පරිශීලකයා තෘප්තිමත් වීම කෙරෙහි පුස්තකාලයේ පවත්නා කියවීමේ කාමර, ගෘහ භාණ්ඩ, ආලෝකකරණය, වාතාශ්‍රය, පානීය ජලය, වැසිකිළි පහසුකම් ආදී භෞතික පහසුකම් මෙන්ම සේවකයින් විසින් ඒවා නිසි ආකාරව නඩත්තු කරනවාද යන්නත් බලපාන බවයි. වසර ගණනාවක් පුරා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයීය පුස්තකාල වල කාර්යභාරය වූ ගබඩා නිවාස සංකල්පය අභිබවා නවීන විශ්වවිද්‍යාලයීය පුස්තකාල සේවා මධ්‍යස්ථාන සංකල්පයක් වෙත යොමු වී තිබේ. එහිදී පරිශීලකයන් කෙරෙහි පුද්ගලිකව අවධානය යොමු කිරීම, පරිශීලක අවශ්‍යතා කෙරෙහි සැලකිලිමත් වීම සහ එම අවශ්‍යතා ඉටු කර දීමට සේවකයින් සතු දැනුම සහ නිපුණතාවය යනාදිය පරිශීලක තෘප්තිය කෙරෙහි බලපාන බව පෙන්වා දිය හැක (Wanigasooriya, 2017; Wanigasooriya P. L., 2017). Balog & Plašćak (2012) සහ Orr et al. (2009) විසින්ද පුස්තකාල සේවකයන්ගේ නිපුණතාවය, පරිශීලකයින් කෙරෙහි දක්වන සුහදශීලී බව සහ ප්‍රතිචාරාත්මක බව පරිශීලක තෘප්තිය කෙරෙහි බලපාන වැදගත් සාධක බව පෙන්වා දී ඇත. Callinan (2005) තම පර්යේෂණය මගින් පෙන්වා දී ඇත්තේ පුස්තකාලය භාවිතා කරන පරිශීලකයින් ප්‍රමාණය අඩු වී ඇති බවත් ඊට හේතුව පුස්තකාලය පිළිබඳ ඔවුන්ගේ නොදැනුවත්භාවය බවත්ය. ඉන් පැහැදිලි වන්නේ පුස්තකාලය මගින් ලබාදෙන සේවාවන් කවරේද යන්නත්, එම සේවාවන් වෙත ළඟාවන්නේ කෙසේද යන්නත් පිළිබඳ නිසි ආකාර දැනුමක් පැවතීම පරිශීලකයින් පුස්තකාලය වෙත යොමු කිරීමට හේතුවක් වන බවයි. එබැවින් පුස්තකාලයෙන් ලබාගත හැකි සේවාවන් හා ඒවා ලබාගත හැකි ආකාරය පිළිබඳ දැනනුවත් කිරීම පරිශීලක තෘප්තියට හේතු වේ (Gunasekera, 2010).

Nawarathne & Singh (2013) පෙන්වා දී ඇත්තේ පුස්තකාලය විවෘත කරන වේලාව, පුස්තකාලය වසා දමන වේලාව මෙන්ම පුස්තකාලය විවෘතව ඇති පැය ගණනද පරිශීලකයින්ගේ තෘප්තිමත්භාවයට බලපෑමක් ඇති කරන බවයි. පුස්තකාලය වැඩි කාල වේලාවක් විවෘතව පවතින විට පරිශීලකයින් විසින් එහි ඇති තොරතුරු සම්පත් පරිශීලනය කරන ප්‍රමාණය වැඩි වන බවත් එබැවින් පරිශීලක අවශ්‍යතා වලට අනුව පුස්තකාලය විවෘතව තබන පැය ගණන තීරණය කළ යුතු බවත් ඔවුන් පෙන්වා දී ඇත. ඔවුන් වැඩිදුරටත් පවසන්නේ සාමාන්‍යයෙන් ඕනෑම පුස්තකාලයක් අනෙකුත් ආයතන විවෘත කරනවාට වඩා උදෑසනින් විවෘත කර බොහෝ රාත්‍රී වනතුරු විවෘතව තැබිය යුතු බවයි. පුස්තකාලය මගින් පවත්වාගෙන යන ඡායා පිටපත් සහ මුද්‍රණ සේවාවද පරිශීලකයින්ගේ තෘප්තිය සඳහා බලපා ඇත. එනම් පුස්තකාලයෙන් බැහැර ගෙනයාමට අවස්ථාවක් නොමැති පොත්පත් වල ඡායා පිටපත් සහනදායී මිළට ලබාගත හැකි ඡායා පිටපත් මධ්‍යස්ථානයක් තිබීම පරිශීලකයන්ගෛේ තෘප්තිමත්භාවය කෙරෙහි බලපාන බවයි. එහිදී ඡායා පිටපත් මධ්‍යස්ථානය විවෘතව ඇති කාල සීමාව සහ ඡායා පිටපත් වල මිල ගණන් ආදිය සලකා බලනු ලබයි. පුස්තකාලයේ අංශ දැක්වෙන සිතියම් සහ මග පෙන්වීම් පුවරු නිසි ලෙස ප්‍රදර්ශනය කර තිබීම මගින් පරිශීලකයින් හට අදාළ අංශය කරා ඉක්මණින් යොමු වීමට හැකියාව ලැබේ. තවද පුස්තකාලයේ නීති රීති දැක්වෙන දැන්වීම් පුවරුද එසේ ප්‍රදර්ශනය කිරීම මගින් පුස්තකාලය භාවිතා කරන්නන් හට ඒ ඒ ස්ථාන වලදී තමා හැසිරිය යුතු ආකාරයට මඟ පෙන්වයි.

මෙය වඩාත්ම ප්‍රයෝජනවත් වන්නේ පළමු වරට පුස්තකාලය භාවිතා කරන්නන් හට වේ. කෙසේ වෙතත් මෙම ස්ථාන සිතියම සහ තොරතුරු පුවරු ප්‍රදර්ශනය කර තිබීම පරිශීලක තෘප්තිය කොරෙහි බලපාන සාධකයක් ලෙස හඳුනාගත හැක (Vijeyaluxmy, 2015).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

කිසියම් පර්යේෂණයක් සිදු කිරීමේදී එහි අධ්‍යයන ප්‍රදේශය තෝරා ගැනීම ඉතා වැදගත් වේ. එසේ වන්නේ අධ්‍යනනයට අදාළ මූලිකම තොරතුරු රැස්කරගන්නේ එම ක්ෂේත්‍රයෙන් වීමයි. කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන සාධක හඳුනා ගැනීමේ මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථයින් මූලික කරගෙන සිදු කරන බැවින් අධ්‍යයන ප්‍රදේශය වන්නේ කැලණිය විශ්ව විද්‍යාලයයි. මෙම අධ්‍යයනයට අදාළ සංගහන තරම 10580 ක් වූ අතර 90% වෙසෙසියා මට්ටමක් සළකා නියැදි තරම 100ක් ලෙස ලබා ගන්නා ලදි.


කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන සාධක හඳුනා ගැනීමේ මෙම අධ්‍යයනයේදී ඉලක්ක සංගහනය වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථයින් වේ. ඒ අනුව සංගහනය තුළ ප්‍රධාන වශයෙන්ම විද්‍යා පීඨය, වාණිජ හා කළමනාකරණ පීඨය, සමාජීය විද්‍යා පීඨය සහ මානවශාස්ත්‍ර පීඨය යනුවෙන් පැහැදිලි ස්ථර හතරක් හඳුනාගත හැකි විය. එම ස්ථර හතර නැවත අධ්‍යන වසර අනුවද එම එක් එක් අධ්‍යයන වසරෙහි ඉගෙනුම ලබන විද්‍යාර්ථයන් නැවත ස්ත්‍රී පුරුෂ ලෙසද ස්ථර වශයෙන් බෙදා දැක්විය හැකි විය. එබැවින් නියැදිය තෝරා ගැනීමේදී වඩාත් යෝග්‍ය නියැදුම් ක්‍රම ලෙස සම්භාවිතා නියැදුම් ක්‍රම වන ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය යොදා ගන්නා ලදි.

ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා අධ්‍යයන අරමුණු වලට අදාළව විධිමත්ව සකස් කරන ලද සරල ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්නාවලියක් සකස් කර අන්තර්ජාලය ඔස්සේ එය ප්‍රතිචාර දක්වන්නා වෙත ඉදිරිපත් කරන ලදි. ද්විතියික දත්ත රැස් කිරීමට ආයතනික දත්ත සහ වාර්තා, විමර්ශන ග්‍රන්ථ, සඟරා සහ පර්යේෂණ වාර්තා භාවිතා කරන ලදි. එම විවිධ ක්‍රමවේද ඔස්සේ රැස්කරගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම, සාධක විශ්ලේෂණ ශිල්ප ක්‍රමය සහ කයිවර්ග පරීක්ෂාව යොදා ගන්නා ලදි. දත්ත විශ්ලේෂණය කිරීමට MS Excel සහ SPSS යන මෘදුකාංග භාවිතා කළ අතර දත්ත සාරාංශ කොට ඉදිරිපත් කිරීමට වගු ප්‍රස්තාර සහ රූපසටහන්ද යොදා ගන්නා ලදි.

### 4. දත්ත විශ්ලේෂණය

පීඨ අනුව සංයුතිය ප්‍රස්ථාර සටහන 1 මගින් නිරූපණය කෙරේ. ඒ අනුව ආසන්න වශයෙන් සමාන ප්‍රතිශතයන් වලින් විද්‍යා පීඨය, වාණිජ සහ කළමනාකරණ පීඨය, සමාජීය විද්‍යා පීඨය සහ මානව ශාස්ත්‍ර පීඨය යන පිඨ හතර තුළ නියැදිය සංයුක්ත වී ඇත.


*ප්‍රස්තාර සටහන 1 අධ්‍යයන පීඨය අනුව නියැදියේ සංයුතිය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංයුතිය පහත ප්‍රස්තාර සටහන 2 මගින් නිරූපණය කෙරේ. නියැදි සංයුතියෙන් 1/4 කටත් ආසන්න ප්‍රමාණයක් ස්ත්‍රීන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 28%කි. නියැදි සංයුතියෙන් පුරුෂ ප්‍රතිශතය 72%කි.


*ප්‍රස්තාර සටහන 2 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව නියැදියේ සංයුතිය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

අධ්‍යයන වසර අනුව සංයුතියෙන් වැඩිම ප්‍රතිශතයක් (29%) තෙවන වසර විද්‍යාර්ථයින් වන අතර අඩුම ප්‍රතිශතයක් (18%) හිමිකරගෙන ඇත්තේ සිව්වන වසර විද්‍යාර්ථයින් වේ.


*ප්‍රස්තාර සටහන 3 : අධ්‍යයන වසර අනුව නියැදියේ සංයුතිය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

අධ්‍යයන පීඨ අනුව ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ව්‍යාප්තිය පහත ප්‍රස්තාර සටහන 4 මගින් පෙන්නුම් කෙරේ. ඒ අනුව පීඨ හතරෙහිම ස්ත්‍රී ප්‍රතිශතයට වඩා පුරුෂ ප්‍රතිශතය අඩු බව පෙනේ.


*ප්‍රස්තාර සටහන 4 : අධ්‍යයන පීඨ අනුව ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ව්‍යාප්තිය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

අධ්‍යයන වසර අනුව ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ව්‍යාප්තිය පහත ප්‍රස්තාර සටහන 5 මගින් නිරූපණය කෙරේ. ඒ අනුව වසර හතරෙහිම ස්ත්‍රී ප්‍රතිශතයට වඩා පුරුෂ ප්‍රතිශතය අඩු බව පෙනේ.


*ප්‍රස්තාර සටහන 5 : අධ්‍යයන වසර අනුව ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ව්‍යාප්තිය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කරන වාර ගණන සමස්ත නියැදිය අතර බෙදී ගොස් ඇති ආකාරය පහත ප්‍රස්තාර සටහන 6 මගින් නිරූපණය කෙරේ. නියැදියෙන් වැඩිම ප්‍රතිශතයක් දින කීපයකට වරක් පුස්තකාලය භාවිතා කරන අතර එය සමස්ත නියැදියෙන් 30%කි. අඩුම ප්‍රතිශතයක් කලාතුරකින් පුස්තකාලය භාවිතා කර ඇති අතර එය සමස්ත නියැදියෙන් 4%කි.


*ප්‍රස්තාර සටහන 6: පුස්තකාලය භාවිතා කරන වාර ගණන නියැදිය අතර බෙදී ගොස් ඇති ආකාරය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කරන වාර ගණන ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් වන ආකාරය පහත ප්‍රස්තාර සටහන 7 මගින් නිරූපණය කෙරේ. ඒ අනුව නිතරම පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන්, දිනකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් මෙන්ම දින කිහිපයකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන්ද 80%ක් පමණ ස්ත්‍රී විද්‍යාර්ථයින් වේ. සතියකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින් සියලු දෙනාම ස්ත්‍රීන් වේ. සති කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 60%කට ආසන්න ප්‍රතිශතක් පුරුෂ වන අතර මසකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 50%කට ආසන්න ප්‍රතිශතයක් පුරුෂ වේ. මාස කිහිපයකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 30%කට ආසන්න ප්‍රත්ශතයක් පුරුෂයින් වන අතර කලාතුරකින් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 40%ක් පුරුෂයන් වේ.

*ප්‍රස්තාර සටහන 7 : පුස්තකාලය භාවිතා කරන වාර ගණන ස්ත්‍රී පුරුෂ භාවය අනුව*





මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කරන වාර ගණන අධ්‍යයන වසර අනුව වෙනස් වන ආකාරය ප්‍රස්තාර සටහන 8 මගින් පෙන්නුම් කෙරේ. නිතරම පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 40%කටත් වැඩි ප්‍රතිශතයක්ද දිනකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 25% දින කිහිපයකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 30%කටත් වැඩි ප්‍රතිශතයක්ද සිව්වන වසර විද්‍යාර්ථයින් වේ.

පළමු වසර විද්‍යාර්ථයින්ගෙන් වැඩිම පිරිසක් මාස කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන්නන් වන අතර එය මාස කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන සමස්ත විද්‍යාර්ථයින්ගෙන් 70%කටත් වැඩි ප්‍රතිශතයකි. කලාතුරකින් පුසතකාලය භාවිතා කරන්නන් අතරින් 60%කටත් වැඩි ප්‍රතිශතයක් පළමු වසර විද්‍යාරථයින් වේ.


*ප්‍රස්තාර සටහන 8 : පුස්තකාලය භාවිතා කරන වාර ගණන අධ්‍යයන වසර අනුව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර තිබේද යන්න ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රස්තාර සටහන 9 මගින් පෙන්නුම් කෙරේ. පළමු ප්‍රස්තාර සටහන අනුව සමස්ත නියැදියෙන් 56%ක ප්‍රතිශතයක් පාසල් කාලයේ පටන් පුස්තකාලය භාවිතා කර ඇති අතර 44%ක ප්‍රතිශතයක් පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා නොකළ අය වේ. දෙවන ප්‍රස්තාරට අනුව නියැදිට අයත් පුරුෂයින්ගෙන් 82%ක්ම පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර නොමැති අතර ස්ත්‍රීන්ගෙන් 29%ක ප්‍රතිශතයක් පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර නොමැත.

*ප්‍රස්තාර සටහන 9 : පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර තිබීම ස්ත්‍රී පුරුෂ භාවය අනුව*





මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කරන වාර ගණන සහ පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර තිබීම අතර සම්බන්ධතාව පහත ප්‍රස්තාර සටහන 10 මගින් පෙන්නුම් කෙරේ. ප්‍රස්තාර සටහනින් පෙන්නුම් කෙරෙන ආකාරයට නිතරම පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 60%කට වැඩි ප්‍රතිශතයක්ද, දිනකට වරක් පුස්තකාලය භාවිතා කරන

විද්‍යාර්ථයින්ගෙන් 60%කට වැඩි ප්‍රතිශතයක්ද, දින කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 60%ක වැඩි ප්‍රතිශතයක්ද, සතියකට වරක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයන්ගෙන් 80% වැඩි ප්‍රතිශතයක්ද, සති කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන විදයාර්ථයින්ගෙන් 70%ට ආසන්න ප්‍රමාණයක්ද පාසල් කාලයේ පුස්තකාලය භාවිතා කළ විද්‍යාර්ථයින් වේ. අනෙක් අතට මාසයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 75%කට ආසන්න ප්‍රතිශතයක්ද, මාස කිහිපයකට වතාවක් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 65%කට ආසන්න ප්‍රතිශතයක්ද, කළාතුරකින් පුස්තකාලය භාවිතා කරන විද්‍යාර්ථයින්ගෙන් 80%කටත් වැඩි ප්‍රතිශතයක්ද පාසල් කාලයේ පුස්තකාලය භාවිතා නොකළ අය වේ.


*ප්‍රස්තාර සටහන 10 : පුස්තකාලය භාවිතා කරන වාර ගණන සහ පාසල් කාලයේදී පුසතකාලය භාවිතා කර තිබීම අතර සම්බන්ධතාව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය පහත ප්‍රස්තාර සටහන 11 මගින් නිරූපණය කෙරේ. ප්‍රස්තාරයට අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් වැඩිම විද්‍යාර්ථයින් සංඛ්‍යාවක් සාමාන්‍ය තෘප්තියක් දක්වයි. එය සමස්ත විද්‍යාර්ථයින්ගෙන් 50%කටත් වැඩි ප්‍රතිශතයකි. විද්‍යාර්ථයින්ගෙන් 36%ක් පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් තෘප්තිමත් බව නිරූපණය වේ.


*ප්‍රස්තාර සටහන 11 : පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රස්තාර සටහන 12 මගින් නිරූපණය කෙරේ. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැඩි ලෙස තෘප්තිමත් විද්‍යාර්ථයින් සියලු දෙනා පුරුෂ වන අතර දැඩි ලෙස තෘප්තිමත් නොවන සියලු දෙනා ස්ත්‍රීන් වේ. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් තෘප්තිමත් නොවන විද්‍යාර්ථයින්ගෙන් 50% ස්ත්‍රී සහ 50% පුරුෂ ලෙස ප්‍රස්තාරය නිරූපණය කරයි. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් තෘප්තිමත් සහ සමාන්‍යයෙන් තෘප්තිමත් විද්‍යාර්ථයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් ස්ත්‍රීන් වේ.


*ප්‍රස්තාර සටහන 12 : පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය ස්ත්‍රී පුරුෂ භාවය අනුව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය අධ්‍යයන පීඨය අනුව ප්‍රස්තාර සටහන 13 මගින් නිරූපණය කෙරේ. ඒ අනුව දැඩි ලෙස තෘප්තිමත් නොවන සියලු විද්‍යාර්ථයින් වාණිජ සහ කළමනාකරණ පීඨයේ වන අතර දැඩි ලෙස තෘප්තිමත් සියලු විද්‍යාර්ථයින් විද්‍යා පීඨයේ වේ. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් තෘප්තිමත් නොවන විද්‍යාර්ථයින්ගෙන් 80%කටත් වඩා වැඩි ප්‍රතිශතයක් වාණිජ සහ කළමනාකරණ පීඨයේ වන අතර තෘප්තිමත් සහ සමාන්‍යයෙන් තෘප්තිමත් විද්‍යාරථයින් සාපේක්ෂ ලෙස සියලු පීඨ වලට අයත් වේ.


*ප්‍රස්තාර සටහන 13 : පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය අධ්‍යයන පීඨ අනුව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රස්ථාර සටහන 14හි පළමු සටහන මගින් නිරූපණය කෙරේ. ඒ අනුව සමස්තයක් වශයෙන් 85%ක් පුස්තකාලය පිළිබඳ දැනුවත් අතර 15%ක් පුස්තකාලය පිළිබඳ දැනුවත් භාවයක් නොමැත. දෙවන ප්‍රස්තාර සටහනට අනුව සමස්ත පුරුෂයින්ගෙන් 25%ක් පමණ සහ ස්ත්‍රීන්ගෙන් 11%ක් පමණ පුස්තකාලය පිළිබඳ දැනුවත් නොවන අතර ඒ අනුව ස්ත්‍රීන්ට වඩා පුරුෂයින් පුස්තකාලය පිළිබඳ දැනුවත්භාවයෙන් අඩු බව හඳුනාගත හැක.


*ප්‍රස්තාර සටහන 14 : පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය ස්ත්‍රී පුරුෂ භාවය අනුව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය අධ්‍යයන වසර අනුව ප්‍රස්තාර සටහන 15 මගින් නිරූපණය කෙරේ ඒ අනුව සමස්තයක් වශයෙන් 85%ක් පුස්තකාලය පිළිබඳ දැනුවත් අතර ඉන් 18%ක් පළමු වසර විද්‍යාර්ථයින්ද 22%ක් දෙවන වසර විද්‍යාර්ථයින්ද 26%ක් තෙවන වසර විද්‍යාර්ථයින්ද ඉතිරි 19% සිව්වන වසර විද්‍යාර්ථයින්ද වේ ප්‍රස්ථාර සටහනින් නිරූපණය කෙරෙන ආකාරයට 15%ක් පුස්තකාලය පිළිබඳ දැනුවත් භාවයක් නොමැති අතර ඉන් 12%ක් පළමු වසර විද්‍යාර්ථයින්ද ඉතිරි 3%ක් දෙවන වසර විද්‍යාර්ථයින්ද වේ

*ප්‍රස්තාර සටහන 15 : පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය අධ්‍යයන වසර අනුව*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2021

### 4.1 බහු ප්‍රතිචාර විශ්ලේෂණය

*වගු අංක 1: පුස්තකාලය භාවිතා කිරීමේ අරමුණු අනුව බහු ප්‍රතිචාර විශ්ලේෂණයට අදාළ සංඛ්‍යාති*

| පුස්තකාලය භාවිතා කිරීමේ අරමුණු | ප්‍රතිචාර සංඛ්‍යාව | නියැදියට අනුව ප්‍රතිශතාත්මක අගය |
|---|---|---|
| පොතක් හෝ සඟරාවක් සොයා ගැනමේ අරමුණින් | 63 | 25.8% |
| දත්ත සමුදායට ප්‍රවේශ වීමේ අරමුණින් | 18 | 7.4% |
| පැවරුමක්, පර්යේෂණයක් හෝ විභාගයක් සඳහා උදව් ලබා ගැනීමේ අරමුණින් | 82 | 33.6% |
| තනිව පාඩම් කිරීමේ අරමුණින් | 16 | 6.6% |
| පරිගණක භාවිතා කිරීමේ අරමුණින් | 2 | 0.8% |
| ඡායා පිටපත් සේවාව භාවිතා කිරීමේ අරමුණින් | 25 | 10.2% |
| නව දැනුම එකතු කරගැනීමේ අරමුණින් | 29 | 11.9% |
| විවේකය ඵලදායී ලෙස ගත කිරීමේ අරමුණින් | 9 | 3.7% |
| එකතුව | 244 | 100.0% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කිරීමේ අරමුණු පිළිබඳ විමසන ලද ප්‍රශ්නයට අදාළව ලැබුණු පිළිතුරු වල සාරාංශයක් වගු අංක 1 මගින් දැක්වේ. වැඩිම ප්‍රතිශතයක් එනම් 33.6%ක් පැවරුමක්, පර්යේෂණයක් හෝ විභාගයක් සඳහා උදව් ලබා ගැනීමේ අරමුණින් පුස්තකාලය භාවිතා කර ඇත. එම ප්‍රමාණය 82කි. දෙවැනුව සැලකිය යුතු ප්‍රතිශතයක් එනම් 25.8%ක් පොතක් හෝ සඟරාවක් සොයා ගැනමේ අරමුණින් පුස්තකාලය භාවිතා කර ඇත. එම ප්‍රමාණය 63කි. ඡායා පිටපත් සේවාව භාවිතා කිරීමේ අරමුණින් 10.2%ක ප්‍රමාණයක්ද නව දැනුම එකතු කරගැනීමේ අරමුණින් 11.9%ක ප්‍රමාණයක්ද පුස්තකාලය භාවිතා කර ඇත. සෙසු අරමුණු සඳහා පුස්තකාලය භාවිතා කර ඇත්තේ ප්‍රතිචාරකයින්ගෙන් සුළු ප්‍රමාණයකි.

*වගු අංක 2: වැඩි වශයෙන් භාවිතා කර ඇති පුස්තකාල මූලාශ්‍ර අනුව බහු ප්‍රතිචාර විශ්ලේෂණයට අදාළ සංඛ්‍යාති*

| වැඩි වශයෙන් භාවිතා කර ඇති පුස්තකාල මූලාශ්‍ර | ප්‍රතිචාර සංඛ්‍යාව | ප්‍රතිශතාත්මක අගය |
|---|---|---|
| පොත්පත් | 95 | 54.0% |
| පුවත්පත් හෝ සඟරා | 28 | 15.9% |
| උපාධි නිබන්ධන | 38 | 21.6% |
| රජයේ ලේඛන | 6 | 3.4% |
| විද්‍යුත් සම්පත් | 9 | 5.1% |
| එකතුව | 176 | 100.0% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2021

වැඩි වශයෙන් භාවිතා කර ඇති පුස්තකාල මූලාශ්‍ර පිළිබඳ විමසන ලද ප්‍රශ්නයට අදාළව ලැබුණු පිළිතුරු වල සාරාංශයක් වගු අංක 2 මගින් දැක්වේ. ඒ අනුව ප්‍රතචාරකයින් 100 දෙනෙකුගෙන් ප්‍රතිචාර 176ක් මේ සඳහා ලැබී ඇති අතර ඉන් වැඩිම ප්‍රතිශතයක් එනම් නියැදියෙන් 54.0%ක්ම වැඩි වශයෙන්ම භාවිතා කර ඇති පුස්තකාල මූලාශ්‍රය පොත්පත් ලෙස හඳුනාගත හැක. එම ප්‍රමාණය 95කි. උපාධි නිබන්ධන භාවිතා කළ පිරිස නියැදියෙන් 21.6%කි. පුවත්පොත් හෝ සඟරා වැඩි වශයෙන් භාවිතා කර ඇති පිරිස නියැදියෙන් 15.9%කි. රජයේ ලේඛන විද්‍යුත් සම්පත් වැඩි වශයෙන් භාවිතා කර ඇත්තේ නියැදියෙන් ඉතා සුළු ප්‍රමාණයකි.

*වගු අංක 3: පුස්තකාලයෙන් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගත් ආකාරය අනුව බහු ප්‍රතිචාර විශ්ලේෂණයට අදාළ සංඛ්‍යාති*

| **පුස්තකාලයෙන් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගත් ආකාරය** | **ප්‍රතිචාර සංඛ්‍යාව** | **ප්‍රතිශතාත්මක අගය** |
|---|---|---|
| පුස්තකාලයට ගොස් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීම. | 98 | 85.2% |
| අන්තර්ජාලය ඔස්සේ පිවිසීමෙන් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීම. | 17 | 14.8% |
| එකතුව | 115 | 100.0% |

මූලාශ්‍රයः නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලයෙන් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගත් ආකාරය පිළිබඳ විමසන ලද ප්‍රශ්නයට අදාළව ලැබුණු පිළිතුරු වල සාරාංශයක් වගු අංක 3 මගින් දැක්වේ. ඒ අනුව ප්‍රතචාරකයින් 100 දෙනෙකුගෙන් ප්‍රතිචාර 115ක් මේ සඳහා ලැබී ඇති අතර ඉන් වැඩිම ප්‍රතිශතයක් එනම් නියැදියෙන් 85.2%ක්ම පුස්තකාලයට ගොස් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරා ගැනීම සිදු කර ඇත. එම ප්‍රමාණය 98කි. අන්තර්ජාලය ඔස්සේ පිවිසීමෙන් අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර තෝරාගෙන ඇත්තේ ප්‍රතිචාරකයින්ගෙන් 14.8%ක ප්‍රතිශතයක් පමණි.

*වගු අංක 4: පුස්තකාලයට අන්තර්ජාලය ඔස්සේ පිවිසියේ නම් ඒ සඳහා භාවිතා කරන ලද අනුව බහු ප්‍රතිචාර විශ්ලේෂණයට අදාළ සංඛ්‍යාති*

| **පුස්තකාලයට අන්තර්ජාලය ඔස්සේ පිවිසියේ නම් ඒ සඳහා භාවිතා කරන ලද්දේ** | **ප්‍රතිචාර සංඛ්‍යාව** | **ප්‍රතිශතාත්මක අගය** |
|---|---|---|
| දුරකථනය | 93 | 72.7% |
| ලැප්ටොප් පරිගණකය | 35 | 27.3% |
| එකතුව | 128 | 100.0% |

මූලාශ්‍රයः නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලයට අන්තර්ජාලය ඔස්සේ පිවිසියේ නම් ඒ සඳහා භාවිතා කරන ලද්දේ දුරකථනයද ලැප්ටොප් පරිගණකයද නැතිනම් ඒ දෙකමද යන්න පිළිබඳ විමසන ලද ප්‍රශ්නයට අදාළව ලැබුණු පිළිතුරු වල සාරාංශයක් වගු අංක 4 මගින් දැක්වේ. ඒ අනුව ප්‍රතචාරකයින් 100 දෙනෙකුගෙන් ප්‍රතිචාර 128ක් මේ සඳහා ලැබී ඇති අතර ඉන් වැඩිම ප්‍රතිශතයක් එනම් නියැදියෙන් 72.7%ක ප්‍රතිශතයක් පුස්තකාලයට අන්තර්ජාලය ඔස්සේ

පිවිසීමට දුරකථනය  භාවිතා කර ඇත. එම ප්‍රමාණය 93කි.  නියැදියෙන් 27.3%ක ප්‍රතිශතයක් ඒ සඳහා ලැප්ටොප් පරිගණකය භාවිතා කර ඇත.

*වගු අංක 5: පුස්තකාලය භාවිතා කරන අවස්ථාවන් අනුව බහු ප්‍රතිචාර විශ්ලේෂණයට අදාළ සංඛ්‍යාති*

| පුස්තකාලය භාවිතා කරන අවස්ථාවන් | ප්‍රතිචාර සංඛ්‍යාව | නියැදියට අනුව ප්‍රතිශතාත්මක අගය |
|---|---|---|
| අධ්‍යාපනික කටයුතු සඳහා | 98 | 75.4% |
| විවේකය ගත කිරීම සඳහා | 20 | 15.4% |
| විනෝදාංශයක් වශයෙන් | 12 | 9.2% |
| එකතුව | 130 | 100.0% |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2021

පුස්තකාලය භාවිතා කරන අවස්ථාවන් පිළිබඳ විමසන ලද ප්‍රශ්නයට අදාළව ලැබුණු පිළිතුරු වල සාරාංශයක් වගු අංක 5 මගින් දැක්වේ. ඒ අනුව ප්‍රතචාරකයින් 100 දෙනෙකුගෙන් ප්‍රතිචාර 130ක් මේ සඳහා ලැබී ඇති අතර ඉන් වැඩිම ප්‍රතිශතයක් එනම් නියැදියෙන් 75.4%ක ප්‍රතිශතයක් අධ්‍යාපනික කටයුතු සඳහා පුස්තකාලය භාවිතා කර ඇත. එම ප්‍රමාණය 98කි. විවේකය ගත කිරීම සඳහා නියැදියෙන් 15.4%ක ප්‍රතිශතයක්ද විනෝදාංශයක් වශයෙන් නියැදියෙන් 9.2%ක ප්‍රතිශතයක්ද පුස්තකාලය භාවිතා කර ඇත.

### 4.2 සාධක විශ්ලේෂණය

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක හඳුනා ගැනීමයි. ඒ අනුව සාහිත්‍ය විමර්ශනය යටතේ විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක බොහෝ ප්‍රමාණයක් හඳුනාගන්නා ලදි. එම සාධක ඇසුරින් විද්‍යාර්ථයින් සියදෙනෙකුගෙන් යුතු නියැදියෙන් විශ්වවිද්‍යාලයීය පුස්තකාලයෙහි පහසුකම් සහ සේවාවන් පිළිබඳ තෘප්තිමත්භාවය සාධක 37ක් ඔස්සේ විමසන ලදි. ඒ අතරින් වඩාත් බලපෑමක් සිදුකරන සාධක හඳුනා ගැනීම සඳහා ගවේශණාත්මක සාධක විශ්ලේෂණය සිදු කරන ලදි.

KMO පරික්ෂාව සහ Bartlett's පරික්ෂාව මගින් සාධක විශ්ලේෂණය සඳහා යොදාගන්නා දත්තයන්හි වලංගුභාවය පරික්ෂා කරනු ලබයි. එහිදී KMO අගය මඟින් නියැදියේ ප්‍රමාණවත් බවත් Bartlett's පරික්ෂාව මඟින් නියැදියේ ගෝලාකාරබවද පරික්ෂා කරනු ලබයි. KMO අගය 0.5 ට වඩා විශාල විය යුතු අතර Bartlett's පරීක්ෂාවට අදාළ P අගය 0.05 ට වඩා අඩු අගයක් ගත යුතුය. මෙම අධ්‍යයනයට අදාළ සාධක සඳහා ගණනය කරන ලද KMO අගය 0.525ක් සහ Bartlett's පරික්ෂාවට අදාළ p අගය $\chi^2$=1834.399 = (666), $p < 0.00$ විය. ඉන් පිළිඹිබු වන්නේ මෙම නියැදිය සාධක විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත් බවයි.

KMO අගය මඟින් නියැදියේ ප්‍රමාණවත් බවත් Bartlett's පරික්ෂාව මඟින් නියැදියේ ගෝලාකාරබවත් පරික්ෂා කරන නමුත් තනි තනි විචල්‍යයන් සඳහා වන KMO අගයන් නිරූපණය කෙරෙනුයේ, සහසම්බන්ධතා හා සහවිචලතා න්‍යාසය වශයෙන් ප්‍රධාන

කොටස් දෙකකින් යුතු Anti-image න්‍යාසහෙහි විකර්ණය මගින් වේ. ඒ අනුව මෙම න්‍යාසයේ විකර්ණයේ අගයන් 0.5 ට වඩා විශාල විය යුතුය. එසේ නොවුණහොත් එනම් එක් අගයක් හෝ 0.5 ට වඩා අඩු වුවහොත් ඊට අදාළ සාධකය ආකෘතියෙන් ඉවත් කර නැවත විශ්ලේෂණය සිදු කළ යුතුය. එසේ එම අගය 0.5 ට වඩා අඩු සාධකයන් සාධක ඉවත් කර නැවත සාධක විශ්ලේෂණය සිදු කරන ලදි. එහිදී ලැබුණු KMO අගය 0.687ක් සහ Bartlett's පරීක්ෂාවට අදාළ p අගය $\chi^2 = 1190.216 = (190), p < 0.00$ විය.

නමුත් එම දත්ත වලට අදාළ Communalities වගුවෙහි පුස්තකාල එකතුව (මුද්‍රිත) වෙත ප්‍රවේශ වීම ඉතා පහසු වීම, පුස්තකාල කාර්යමණ්ඩලය විසින් පුස්තකාල පහසුකම් නිසි ලෙස නඩත්තු කිරීම, පුස්තකාලය විසින් පුස්තකාල එකතුව නිතරම යාවත්කාලීන කිරීම යන සාධක තුනට අදාළ Extraction අගයන් 0.5ට අඩුවීම නිසා එම සාධක තුන ඉවත් කර නැවත විශ්ලේෂණය සිදු කරන ලදි.

සාධක විශ්ලේෂයයේ අවසාන ප්‍රතිඵලයට අදාළ KMO අගය 0.687ක් සහ Bartlett's පරීක්ෂාවට අදාළ p අගය $\chi^2 = 1093.452 = (136), p < 0.00$ විය. සාධක විශ්ලේෂණය යටතේ ලැබෙන මුලු විචලතා විශ්ලේෂණ වගුව මගින් නිස්සාරණයට පෙර, පසු හා භ්‍රමණයට පසු එක් එක් රේඛීය සංරචක සාධක හා සම්බන්ධ වන අයිගන් අගයන් ප්‍රතිදානය කරයි. නිස්සාරණයට පෙර රේඛීය සංරචක 17ක් හඳුනාගෙන තිබේ. එබැවින් සමස්ත සාධකයන්ගෙන් 22.329%ක් පළමු සංරචකය මගින් පැහැදිලි කරයි. පළමු සාධක කිහිපය මගින් ප්‍රමාණය පැහැදිලි කරන අතර සෙසු සාධක මගින් පැහැදිලි කෙරෙනුයේ විචලතාව පමණි. මෙහි Rotation Sums of Squared Loadings මගින් සියලු සාධක අතරින් එකට වඩා වැඩි අගයක් උකහා ගන්නා අතර එමගින් සාධක පහක් මෙම විශ්ලේෂණය යටතේ තෝරා ගනී. මෙමගින් භ්‍රමණයෙන් පසු සාධක වල සාමාන්‍ය අගයන් පෙන්වනු ලැබේ. භ්‍රමණය සාධක ව්‍යුහය ප්‍රතිශක්තිකරණය කිරීමේ බලපෑමක් ඇති අතර මෙම දත්ත අනුව එක් ප්‍රතිඵලයක් වනුයේ මුල් සාධක හතරෙහි සාපේක්ෂ වැදගත්කම සමාන සහ අවසන් සාධකයට වඩා ඉහළ අගයන් ගැනීමයි. භ්‍රමණය වීමට පෙර පළමු සාධකය සෙසු සාධක හතරට වඩා සැලකිය යුතු ලෙස විචලතාවයට හේතු වේ (7.626%, 14.127%, 15.495% සහ 17.527%ට සාපේක්ෂව 22.280% ඉහළ අගයක් ගනී.) කෙසේ වෙතත් නිස්සාරණයෙන් පසු එය 20.329කි. සෙසු සාධක වල විචතාවන් පිළිවෙලින් 16.802, 15.104, 14.809, 10.010 ලෙස වේ.

*වගු අංක 6: සංරචක න්‍යාසය*

| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** |
| පුස්තකාල (මුද්‍රිත) එකතුව හොඳින් සංවිධානය/වර්ගීකරණය කර ඇත. | .814 | | | | |
| පුස්තකාල (මුද්‍රිත නොවන) එකතුව හොඳින් සංවිධානය/වර්ගීකරණය කර ඇත. | .799 | | | | |
| පුස්තකාල එකතුව (මුද්‍රිත නොවන) ප්‍රමාණවත් වේ. | .762 | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| පුස්තකාල එකතුව (මුද්‍රිත නොවන) සියලු විෂයන්ගෙන් අන්තර්ගතය. | .749 | | | | |
| පුස්තකාල එකතුව (මුද්‍රිත) ප්‍රමාණවත් වේ. | .713 | | | | |
| මුද්‍රිත පුස්තකාල එකතුව භාවිතා කිරීමට සුදුසු ගුණාත්මක තත්ත්වයෙන් පවතී. | .670 | | | | |
| පුස්තකාලය විවෘත කරන වේලාව සුදුසු වේ. | | .971 | | | |
| පුස්තකාලය වසා දමන වේලාව සුදුසුය. | | .957 | | | |
| පුස්තකාලය විවෘතව තබන පැය ගණන ප්‍රමාණවත්ය. | | .931 | | | |
| පුස්තකාල කාර්යමණ්ඩලය අවශ්‍ය .තොරතුරු සොයා ගැනීමට පරිශීලකයින් හට උපකාර කරයි.. | | | .967 | | |
| පුස්තකාල කාර්යමණ්ඩලය සතුව පුස්තකාල සම්පත් පිළිබඳ මනා දැනුමක් පවතී. | | | .962 | | |
| පුස්තකාල කාර්යමණ්ඩලය පරිශීලකයින් කෙරෙහි පුද්ගලිකව අවධානය යොමු කරයි. | | | .800 | | |
| පුස්තකාලය තුළ කියවීම සඳහා ඇති කියවීම් කාමර සංඛ්‍යාව ප්‍රමාණවත්ය.. | | | | .943 | |
| පුස්තකාලයේ කියවීම් කාමර තුළ ඇති මේස සංඛ්‍යාව ප්‍රමාණවත්ය.. | | | | .886 | |
| පුස්තකාලයේ කියවීම් කාමර තුළ ඇති ආසන සංඛ්‍යාව ප්‍රමාණවත්ය. | | | | .866 | |
| පුස්තකාලය තුළ ගුණාත්මක ආරක්ෂිත වැඩපිළිවලක් ක්‍රියාත්මකවේ. | | | | | .874 |
| පුස්තකාලය තුළ සුදුසු නීති රීති පද්ධතියක් ක්‍රියාත්මක වේ. | | | . | | .832 |

මූලාශ්‍රයː නියැදි සමීක්ෂණ දත්ත, 2021

ඉහත Rotated Component න්‍යාසයට අනුව අවසාන ප්‍රතිඵලය ලෙස පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන ප්‍රධාන සංරචක පහක් හඳුනාගත හැකි විය. එසේ හඳුනාගත හැකි වූ ලැබුණු ප්‍රධාන සංරචක පහ යටතේ අන්තර්ගතව පවතින සාධක සැලකිල්ලට ගෙන එම සංරචක සඳහා පොදු අර්ථයක් ලබා දිය හැක. සාධක විශ්ලේෂණයට ඇතුළත් කරන ලද සාධක වලින් 1/3 කටත් වැඩි ප්‍රමාණයක් එනම් 35.29%ක් ඇතුළත් වන්නේ පළමු සංරචකය තුළයි. එනම් පළමු සංරචකය තුළට සාධක හයක් අන්තර්ගත වේ. පුස්තකාල එකතුවෙහි ප්‍රමාණවත් බව, අන්තර්ගතය, ගුණාත්මකබව, වර්ගීකරණය කර ඇති ආකාරය වැනි සාධක ඇතුළත් පළමු සංරචකය පුස්තකාල එකතුවෙහි බලපෑම ලෙස අර්ථ දැක්විය හැක. දෙවැනි සංරචකය තුළට සමස්ත සාධක ප්‍රමාණයෙන් 17.65%ක් එනම් සාධක තුනක් ඇතුළත් වේ. පුස්කාලය විවෘත කරන වේලාව, වසා දමන වේලාව සහ විවෘතව තබන පැය ගණන යන සාධක ඇතුළත් මෙම සංරචකය පුස්තකාලය භාවිතා කළ හැකි කාල වේලාවන් නිසා ඇතිවන බලපෑම ලෙස

අර්ථ දැක්විය හැක. තුන්වැනි සංරචකයටද සමස්ත සාධක ප්‍රමාණයෙන් 17.65%ක් එනම් සාධක තුනක් ඇතුළත් වේ. පුස්තකාල කාර්යමණ්ඩලයේ දැනුම, පරිශීලකයින් කෙරෙහි දක්වන අවධානය, සහ ඔවුන්ට ලබා දෙන සහයෝගය ආදී කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් ඇති සාධක ඇතුළත් මෙම සංරචකය කාර්යමණ්ඩලයේ සේවාවන් මගින් ඇතිකරන්නා වූ බලපෑම ලෙස අර්ථ දැකිවිය හැක. සිව්වන සංරචකය තුළද සමස්ත සාධක ප්‍රමාණයෙන් 17.65%ක් අන්තර්ගත වේ. කියවීම් කාමර කියවීම සඳහා ඇති මේස සහ පුටු ආදී සාධක ඇතුළත් මෙම සංරචකය පුස්තකාලය අභ්‍යයන්තරයේ ඇති භෞතික සම්පත් නිසා ඇති කෙරෙන බලපෑම ලෙස අර්ථ දැක්විය හැක. පස්වැනි සංරචකය තුළ ඇතුළත් වන්නේ සමස්ත සාධක ප්‍රමාණයෙන් 11.26%ක් පමණි. එනම් සාධක දෙකකි. පුස්තකාලයේ ආරක්ෂිත වැඩපිළිවෙල සහ ක්‍රියාත්මක වන නීති රීති පද්ධතිය යන සාධක ඇතුළත් මෙම සංරචකය නීති රීති සහ ආරක්ෂාව නිසා ඇති වන බලපෑම ලෙස දැක්විය හැකිය.

### 4.3 ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය

ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය යනු ලිකර්ට් පරිමාණයක අභ්‍යයන්තර අනුකූලතාව මැනීම සඳහා වඩාත් පොදු සහ සම්මත පරීක්ෂණයකි. ප්‍රශ්නාවලියක ලිකර්ට් පරිමාණික ප්‍රශ්න ඇතුළත් කර ඇති විට ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය බහුලව භාවිතා වේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක හඳුනා ගැනීම සඳහා සිදුකරන ලද සාධක විශ්ලේෂණයෙන් හඳුනාගත් මූලික සංරචක 5හි වගංගුභාවය ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය මගින් පරීක්ෂා කරන ලදී. එම අගයන්හි සාරාංශයක් පහත වගුවෙහි ඇතුළත් වේ. වගුවට අනුව එම සාධක පහ සඳහාම ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය 0.7ට වඩා ඉහළ අගයක පවතී.

*වගු අංක 4.7: විශ්වවිද්‍යාලයීය පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවයට බලපාන හේතු සාධක සඳහා ගණනය කරන ලද ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගයන්*

| සාධකය | ක්‍රොන්බැච්ගේ ඇල්ෆා අගය |
|---|---|
| පුස්තකාල එකතුවෙහි බලපෑම | 0.845 |
| පුස්තකාලය භාවිතා කළ හැකි කාල වේලාවනහි බලපෑම | 0.961 |
| කාර්යමණ්ඩලයේ සේවාවන්හි බලපෑම | 0.905 |
| භෞතික සම්පත්හි බලපෑම | 0.882 |
| නීති රීති සහ ආරක්ෂාවෙහි බලපෑම | 0.730 |

නියැදි සමීක්ෂණ දත්ත, 2021

### 4.4 කයිවර්ග පරීක්ෂාව

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 7.233ක් සහ p අගය 0.124ක් විය. එම නිසා $H_{01}$ කල්පිතය පිළිගනී. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය යන විචල්‍යය එකිනෙකට ස්වායත්ත වේ.

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ අධ්‍යයන පීඨය අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 14.690ක් සහ p අගය 0.259ක් විය. එම නිසා $H_{02}$ කල්පිතය පිළිගනී. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ අධ්‍යයන පීඨය යන විචල්‍යය එකිනෙකින් ස්වායත්ත වේ. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ අධ්‍යයන වසර අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 17.099ක් සහ p අගය 0.146ක් විය. එම නිසා $H_{03}$ කල්පිතය පිළිගනී. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය සහ අධ්‍යයන වසර යන විචල්‍යය එකිනෙකින් ස්වායත්ත වේ.

පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 1.997ක් සහ p අගය 0.158ක් විය(). එම නිසා $H_{04}$ කල්පිතය පිළිගනී. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ ස්ත්‍රී පුරුෂ භාවය යන විචල්‍යය එකිනෙකින් ස්වායත්ත වේ. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ අධ්‍යයන පීඨය අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 2.508ක් සහ p අගය 0.474ක් විය. එම නිසා $H_{05}$ කල්පිතය පිළිගනී. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ අධ්‍යයන පීඨය යන විචල්‍යය එකිනෙකින් ස්වායත්ත වේ. පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ අධ්‍යයන වසර අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීමේ කයිවර්ග පරීක්ෂාවේදී කයි අගය 21.114ක් සහ p අගය 0.000ක් විය. එම නිසා $H_{06}$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්බන්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සහ අධ්‍යයන වසර යන විචල්‍යය එකිනෙකින් පරායත්ත වේ.

**5. සමාලෝචනය**

පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර තිබේද යන්න විමසන ලද ප්‍රශ්නයට ලැබුණු පිළිතුරු අනුව ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයින් පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කරන ප්‍රමාණය අඩු බව නිගමනය කළ හැකි වූ අතර පාසල් කාලයේ පුස්තකාලය භාවිතය සම්බන්ධයෙන් පැවති පුරුදු, ආකල්ප සහ ලක්ෂණ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය භාවිතය සම්බන්ධයෙන් බලපා ඇති බව නිගමනය කළ හැකි විය. පාසල් කාලයේදී පුස්තකාලය භාවිතා කර තිබේද යන්න අධ්‍යයන පීඨ අනුව සලකා බැලූ විට මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨවල විද්‍යාර්ථයින්ට සාපේක්ෂව විද්‍යා පීඨයේ සහ වාණිජ සහ කළමනාකරණ පීඨයේ විද්‍යාර්ථයින්ගේ පාසල් කාලයේ පුස්තකාල පරිහරණය අඩු මට්ටමක පැවති බවට නිගමනය කළ හැකි විය. පුස්තකාලය භාවිතා කරන වාර ගණන ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් වන ආකාරය සලකා බැලීමේදී පුරුෂයින්ට සාපේක්ෂව සත්‍රීන්ගේ පුස්තකාල භාවිතය වැඩි බව නිගමනය කළ හැකි විය. පුස්තකාලය භාවිතා කරන වාර ගණන අධ්‍යයන පීඨය අනුව වෙනස් වන ආකාරය සලකා බැලූ විට වැඩිම පුස්තකාල භාවිතයක් ඇත්තේ මානවශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථයින්ට වන අතර අඩුම පුස්තකාල භාවිතය් ඇත්තේ

සමාජීය විද්‍යා පීඨයේ විද්‍යාර්ථයින්ට යැයි නිගමනය කළ හැකි විය. පුස්තකාලය භාවිතා කරන වාර ගණන අධ්‍යයන වසර අනුව වෙනස් වන ආකාරය සලකා බැලූ විට පළමු වසරෙහි විද්‍යාර්ථයින් අනිකුත් වසර වල විද්‍යාර්ථයින්ට වඩා පුස්තකාල භාවිතා කරන්නේ කළාතුරකින් බව නිගමනය කළ හැකි විය.පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ තෘප්තිමත්භාවය ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් වන ආකාරය සලකා බැලූ විට ස්ත්‍රී විද්‍යාර්ථයින්ට වඩා පුරුෂ විද්‍යාර්ථයින් පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් තෘප්තිමත් බව නිගමනය කළ හැක.පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය සලකා බැලූ විට ස්ත්‍රීන්ට සාපේක්ෂව පුස්තකාල සම්පත් සහ සේවාවන් සම්බන්ධයෙන් පුරුෂයින්ගේ දැනුවත්භාවය අඩු බව නිගමනය කළ හැකි විය.පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් විද්‍යාර්ථයින්ගේ දැනුවත්භාවය අධ්‍යයන වසර අනුව පහත සලකා බැලූ විට පළමු වසරේ විද්‍යාර්ථයින්ගේ පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් දැනුවත්භාවය සිව්වන වසර විද්‍යාර්ථයින්ගේ පුස්තකාල පහසුකම් සහ සේවාවන් සම්න්ධයෙන් දැනුවත්භාවයට වඩා බෙහෙවින් අඩු බව නිගමනය කළ හැකි විය.

සියලු වසර වල විද්‍යාර්ථයින් හට පුස්තකාලය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. පරිශීලකයින්ට ලඟාවීම සඳහා සමාජ ජාලා පිටු නිර්මාණය කළ යුතුය. විද්‍යාර්ථයින්ගේ විනෝදජනක අවශ්‍යතා සපුරාලන ගුණාත්මක එකතුවක් සකස් කල යුතුය. පරිශීලකයින්ට ලඟාවීම සඳහා පුස්තකාල වලට ඔවුන්ට සමාජ ජාලා පිටු නිර්මාණය කළ හැකිය. අලුත්වන පරිශීලක අවශ්‍යතා හඳුනා ගැනීමට හා තම සේවාවේ ගුණාත්මකභාවය මිණුම් කිරීමට පුස්තකාලයක් විසින් නිතර නිතර තම සේවාවන් සම්බන්ධයෙන් පරිශීලක තෘප්තිය පිළිබඳ සමීක්ෂණයන් කළ යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ගුණසේකර, ඩී. (2005). *පුස්තකාල සේවාවේ මූලිකාංග,* එස්. ගොඩගේ ප්‍රකාශන, කොළඹ

Abdullah, S. (2011). Customer Satisfaction Survey On Library Collection. *Asia-Pacific Conference on Library & Information Education and Practice.* researchgate.net. Retrieved from https://www.researchgate.net/publication/250613302_Customer_Satisfaction_Survey_On_Library_Collection

Agboola, I. O., Bamigboye, O. B., & Owolabi, R. O. (2019). Postgraduate Students' Satisfaction with Library Services at the Federal University of Agriculture, Abeokuta, Nigeria. *Library Philosophy and Practice*. Retrieved from https://digitalcommons.unl.edu/cgi/viewcontent.cgi?article=5819&context=libphilprac

Aina, L.O. (2004) Library and Information Science Text for Africa. Third World Information Services Ltd, Ibadan.

Ali, K. S., & Khan, K. M. (2019). User's Satisfaction on Library & Information Resources, facilities and Services: A Case Study in Vidyavardhaka First Grade College, Mysuru. *National Conference on Library in the Life of UserAt: Web-based technologies in Libraries*. Tumkur : Tumkur University. Retrieved from https://www.researchgate.net/publication/332104337_User's_Satisfaction_on_Library_Information_Resources_facilities_and_Services_A_Case_Study_in_Vidyavardhaka_First_Grade_College_Mysuru

American Library Association. (2019), *Definition of a Library: General Definition,* https://libguides.ala.org/library-definition

Applegate, R. (1997). Models of satisfaction. *Encyclopedia of library and information science*, *60* (23), 200.

Balog, K. P., & Plašćak, B. (2012). Customer satisfaction at the Faculty of Philosophy library in Osijek, Croatia. *Performance measurement and metrics*.

Bashir, F., Soroya, S. H., & Khanum, A. (2018). Users' satisfaction as a valid measure for information resources: A case of public libraries. *Journal of Library Administration*, *58*(3), 302-312.

Callinan, Joanne E. (2005). Information –seeking behavior of undergraduate biology students: A comparative analysis of first year and final year students in university college Dublin. Library Review, 54 (2), 86-99

Chandrasekar, K., & Sivathaasan, N. (2016). Children's section of the Jaffna Public Library: User satisfaction survey. *Library Review*.

Gunasekera, C. (2010, 06). Students Usage of an academic Library: a user survey conducted at the Main Library University of Peradeniya. *Journal of the University Librarians Association of Sri Lanka*, *14*(1). Retrieved from https://jula.sljol.info/articles/10.4038/jula.v14i1.2687/galley/2164/download/

Nawarathne, I. M., & Singh, A. P. (2013, 01). Users' Satisfaction of the Academic Library Services in Sri Lanka. *Journal of Library and Information Science , 07*. doi:DOI: 10.5958/j.0975-6922.7.2.016

Nunekpeku, P. (2019, 12 02). Establishing clients' satisfaction levels with automated library based services: A case study at University of Cape Coast library, Ghana. *Digital Library Perspectives, 36*.

Orr, M., Kenny, P., Gorey, I., Mir, A., Cox, E., & Wilson, J. (2009). Desert Knowledge Cooperative Research Centre Aboriginal Knowledge and Intellectual Property Protocol: Community Guide. *Desert Knowledge Cooperative Research Centre: Alice Springs*.

Shanmugathasan, S. (2016). A Study on User Satisfaction of Undergraduates of Vavuniya Campus of the University of Jaffna, Sri Lanka. 1st International Conference on Library and Information Management (ICLIM - 2016), 21st - 22nd October 2016, Department of Library and Information Science, Faculty of Social Sciences, University of Kelaniya, Sri Lanka. p 116

Tiemo, P. A., & Ateboh , B. A. (2016). Users` Satisfaction with Library Information Resources and Services: A Case Study College of Health Sciences Library Niger Delta University, Amassoma, Nigeria. *Journal of Education and Practice, 07*. Retrieved from https://files.eric.ed.gov/fulltext/EJ1105267.pdf

Twum, K. K., Adams, M., Budu, S., & Anati Budu, R. A. (2020). Achieving university libraries user loyalty through user satisfaction: the role of service quality. *Journal of Marketing for Higher Education*. doi:10.1080/08841241.2020.1825030

Vijeyaluxmy, S. (2015). *Student Satisfaction With Library & Serviecs In An Academic Library*. Trincomalee: International Symposium. Retrieved from http://www.seu.ac.lk/researchandpublications/symposium/5th/libraryandinformationscience/13.pdf

Wanigasooriya, P. L. (2017). LibQUAL Analysis of Library Services in University Libraries in Sri Lanka. *Multidisciplinary Conference 11 July 2017*. London: The Research Center for Social Sciences (RCSS), University of Kelaniya, Sri Lanka. Retrieved from http://repository.kln.ac.lk/bitstream/handle/123456789/19592/25.pdf?sequence=1&isAllowed=y

Wanigasooriya. (2017). User Perception on Affect of Services in University Libraries in Sri Lanka. *International Conference on Library and Information Management (ICLIM)* (p. 77). Department of Library and Information Science, Faculty of Social Sciences, University of Kelaniya. Retrieved from http://repository.kln.ac.lk/handle/123456789/18062?show=full

# පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑම (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරෙන්)

එස්. ජේ. එස්. එස්. දිනෙත්සලා

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
www.sachinisandaru9@gmail.com

***සංක්ෂේපය***

*ඕනෑම ආර්ථිකයක බැංකු ක්ෂේත්‍රය යනු අත්‍යවශ්‍ය අවශ්‍යතාවයන්ගෙන් එකක් වන අතර එය රටේ ධනයට සෘජුවම බලපෑම් කරයි. තත්ත්පරයක් පාසා දියුණු වන තාක්ෂණය ද ඊට අනුරූපව වෙනස්වන ව්‍යාපාරික පරිසරය ද බැංකු ක්ෂේත්‍රයට බලපාන අතර ඒ සඳහා ඩිජිටල්කරණය අත්‍යවශ්‍ය අවශ්‍යයතාවයක් බවට පත්ව ඇත. ආයතනයක පැවැත්ම සඳහා පාරිභෝගික තෘප්තිය ඉතා වැදගත් වන අතර ආයතනයක් වශයෙන් එහි සැබෑ බලපෑම බැංකු අංශයට ද ඉතා වැදගත් බව හඳුනාගෙන තිබේ. ඒ අනුව පාරිභෝගික තෘප්තිය සඳහා ඩිජිටල් බැංකුකරණයේ බලපෑම හඳුනා ගැනීම සඳහා මෙම පර්යේෂණය සිදු කර ඇත. එහිදී පාරිභෝගිකයින්ගේ තෘප්තියට ගනුදෙනු කිරීමේ වේගය, ප්‍රවේශ්‍යතාවයේ හැකියාව, අනුවර්තනය වීමේ හැකියාව සහ දැරිය හැකි මිල වැනි ඩිජිටල් බැංකුකරණයේ බලපෑම හඳුනා ගැනීම සඳහා සාධක හතරක් තෝරා ගෙන ඇත. ප්‍රධාන වශයෙන් පාරිභෝගික තෘප්තිය කෙරෙහි ඩිජිටල් බැංකුකරණයේ බලපෑම හඳුනා ගැනීමත් ඊට අමතරව ඉහත සාධක හතර පාරිභෝගික තෘප්තියට සිදුකරන බලපෑම හඳුනා ගැනීමත් අවසාන වශයෙන් පාරිභෝගිකයන් අතර ප්‍රචලිත ඩිජිටල් බැංකු ක්‍රම හඳුනා ගැනීමත් අරමුණු වී ඇත. මෙම අධ්‍යයනය ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් සිදු කළ අතර තරම 30 ක් වූ නියැදිය තෝරාගනු ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ නගරයක් වන කිරිබත්ගොඩ නගරයෙනි. දත්ත විශ්ලේෂණය සඳහා සහසම්බන්ධතා විශ්ලේෂණය සහ ප්‍රතිගාමී විශ්ලේෂණය ආදී දත්ත විශ්ලේෂණ ක්‍රමවේද භාවිතා කර ඇත. එහිදී ඉහත කී එක් එක් සාධකයන් පාරිභෝගික තෘප්තිය කෙරෙහි ධනාත්මක සම්බන්ධතාවයක් පවත්වන බව තෘප්ත වූ අතර එමගින් එම සාධකයන් පාරිභෝගික තෘප්තිය කෙරෙහි බලපෑමක් සිදු කරන බව නිගමනය කළ හැකි විය. තවද වැඩිපුරම මුදල් තැන්පත් කිරීම සහ ආපසු ගැනීම සඳහා ඩිජිටල් බැංකු සේවාවන් භාවිතා කරන බවත් අතර ශාඛා මට්ටමින් ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, ණීඋපකාරක කවුළුවක□ අවශ්‍යයතාවය, පරිශීලක - හිතකාමී ලෙස වෙබ් අඩවි වැඩිදියුණු කිරීම, ප්‍රධාන භාෂා තුනම භාවිතා කල හැකි වන පරිදි සියලු ඩිජිටල් බැංකු සේවා වැඩි දියුණු කිරීම, අන්තර්ජාල සේවා සපයන්නන් සමඟ අත්වැල් බැඳ ගැනීම හරහා සේවා ප්‍රවේශ්‍යතාවය වේගවත් කර ගැනීම, සියලු වලංගු දුරකථන ජාල භාවිතා කරන පාරිභෝගිකයන්ට ජංගම බැංකුකරණයට දොරටු විවර කිරීම සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වැනි දේ අවශ්‍යය වන බව යෝජනා කළ හැකිය.*

***මුඛ්‍ය පද : පාරිභෝගික තෘප්තිය, ඩිජිටල්කරණයල බැංකුකරණය***

## 1. හැඳින්වීම

ඩිජිටල්කරණය වර්තමානයේ ප්‍රවණතාවයක් බවට පත්ව ඇති අතර එයට සීමා මායිම් නොමැති නිසා ඩිජිටල්කරණය වූ ව්‍යාපාරයකට ලෝකයේ ඕනෑම ස්ථානයක සිට තම ව්‍යාපාර කටයුතු සිදු කල හැක. මේ සමගම පාරිභෝගික ඉල්ලුම් සහ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් බවට ඩිජිටල් ආශ්‍රිත නිශ්පාදන හා සේවාවන් සංවර්ධනය කිරීම වර්තමානයේ පත්ව ඇත. ඩිජිටල් ප්‍රවණතාවය පාරිභෝගිකයන්ගේ සෑම පාරිභෝගික අත්දැකීමක්ම වේගයෙන් වෙලාගෙන ඇති අතර ව්‍යාපාරයකට ඩිජිටල් ගනුදෙනුකරුවන් සමග වේගයෙන් ගමන් කිරීම විශාල අභියෝගයක් බවට පත්ව ඇත (Raicu & Turkes, 2016). බැංකුකරණය යනු පාරිභෝගිකයා අරමුණු කරගත් ව්‍යාපාරයකි. දැවැන්ත තරගකාරිත්වයක් හේතුවෙන් ඕනෑම බැංකු ව්‍යාපාරයක වැදගත්ම අංගය බවට පාරිභෝගික තෘප්තිය පත්ව ඇත. සාම්ප්‍රදායික බැංකුකරණයේ සිට නවීන බැංකුකරණය දක්වා බැංකුකරණය සංක්‍රමණය වීමේදී පාරිභෝගික තෘප්තිය පිළිබඳ සංකල්ප සහ නිර්ණායක සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත (Kumar & Sharma, 2016).

අන්තර්ජාල බැංකු භාවිතය අනෙකුත් රටවල මෙන්ම ලංකාව තුලද කැපී පෙනෙන වේදිකාවකි. ඩිජිටල් බැංකුකරණයේ පැරණිතම ස්වරූපය 1960 දශකයේ ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ කාඩ්පත් පැමිණීම දක්වා දිවෙන අතර 1990 දී මාර්ගගත බැංකුකරණයේ සම්මතභාවයත් සමග ඩිජිටල් බැංකුකරණ සංකල්පය කරලියට පැමිණ ඇත. 2000 දශකයේ බ්‍රෝඩ්බෑන්ඩ් සහ ඊ-වාණිජ්‍යය පද්ධති වැඩිදියුණු කිරීම හරහා නූතන ඩිජිටල් බැංකුකරණයේ දොරටුව වඩාත් විශාල විය. ශ්‍රී ලංකා සන්දර්භය තුළ ඩිජිටල් බැංකුකරණ භාවිතය සම්බන්ධයෙන් ගත් කල, ගනුදෙනුකරුවන් සඳහා ඩිජිටල් බැංකු සේවා පහසුකම් සපයන රාජ්‍ය හා පෞද්ගලික බැංකු ගණනාවක් තිබේ. එම ඩිජිටල් සේවාවන් අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සේවා හඳුන්වාදීම ඉතා වැදගත් වන අතර අන්තර්ජාල තාක්ෂණයට අදාළ අනෙක් ක්ෂේත්‍රය වන්නේ අන්තර්ජාල බැංකු පහසුකම් ය. නමුත් මෙය ගනුදෙනුකරුවන් අතර එතරම් පුළුල් ලෙස ව්‍යාප්ත වී නොමැත (Suraweera, et al., 2011). “2020 - ඩිජිටල් ගනුදෙනු වර්ෂය” ලෙස නම් කොට කාසි සහ නෝට්ටු භාවිතය අවම කරමින් විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ ගනුදෙනු කිරීමට ඉඩ සැලැස්වීමේ අරමුණින් නව විද්‍යුත් ගෙවීම් සහ පියවීම් වැඩපිළිවෙලක් ආරම්භ කල බවට ශ්‍රී ලංකා මහ බැංකු අධිපති දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන් මහතා ප්‍රකාශ කරන ලදී (Central Bank of Sri Lanka, 2020). කාසි සහ නෝට්ටු අංකණය සහ මුද්‍රණය කිරීමට වැය වන මුදල අවම කොට වඩාත් කාර්යක්ෂම ආරක්ෂිත ගෙවීම් පියවීම් ක්‍රමවේදයක් කොළඹින් දුර බැහැර ඇත පිටිසර දක්වා ව්‍යාප්ත කිරීම මෙම වැඩසටහනේ අරමුණ වී ඇතග වර්තමාන ශ්‍රී ලංකාව දෙස බල විට පෙනී යන්නේ බහුතරයක් වාණිජ බැංකු ඩිජිටල්කරණය තදින් වැලඳගෙන ඇති බවත් ඉහළ පාරිභෝගික තෘප්තියක් උදෙසා දිනෙන් දින අලුත් වන ඩිජිටල්කරණයට අනුව බැංකු කටයුතු හැඩ ගැස්වීම තුලින් කාර්යයන් වඩ වඩාත් පහසු කිරීමට උත්සහ කරන බවත්ය.

මෙම අධ්‍යයනය හරහා පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑම කෙසේද? යන්න මූලික වශයෙන් අධ්‍යයනය කරන අතර ඊට අමතරව ගනුදෙනු කිරීමේ වේගය (Speed of transaction), ප්‍රවේශ්‍යතාවයේ හැකියාව (Accessibility), අනුවර්තනය

වීමේ හැකියාව (Adaptability), දැරියහැකි තරම (Affordability) හා පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම සඳහා භාවිතා කරන වඩාත් ජනප්‍රිය ඩිජිටල් බැංකු ක්‍රම මොනවාද යන්නට පිළතුරු සොයයි.

## 2. සාහිත්‍යය විමර්ශනය

Cross (2014) ඩිජිටල් බැංකුකරණය යනු කුමක්ද යන්න පිළිබඳ අදහස් දැක්වීමේදී ඔහු පවසන්නේ "ඩිජිටල්" යන්නෙන් සිදු වන්නේ දකින සහ නොදකින අත්දැකීම් සැලසුම් කිරීමට තාක්ෂණය භාවිතා කිරීමයි. ඩිජිටල් යනු නොපෙනෙන ලෙස පෙනෙන දේ සැදීමයි. නොපෙනෙන පරිදි සේවා ඉතා සුමට හා බාධාවකින් තොරව පාරිභෝගිකයාට ළං කිරීමයි. ඩිජිටල් බැංකුකරණයේ ආරම්භය මතුව ඇත්තේ ෆින්ලන්තයෙන් ය. එයින් අනතුරුව අනෙකුත් සංවර්ධිත රටවල් ද ඩිජිටල් බැංකුකරණයට වැඩි වැඩියෙන් යොමු වීය (Sharma, 2011). තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ මෑත වසර කිහිපය තුළ මෙම ඩිජිටල් බැංකු සංකල්පය විවිධාකාර වූ විද්‍යුත් ක්‍රම මගින් විශාල පාරිභෝගික ප්‍රජාවක් වෙත මූල්‍ය සේවය සපයන අතර එය බැංකු අතර ඇති දැඩි තරඟකාරීත්වයක් නිර්මාණය කරමින් වේගයෙන් ලෝකය පුරා ව්‍යාප්ත වේ (Mahdi, Rezaul, & Rahman, 2010).

මනෝවිද්‍යාව තුල තෘප්තිය විස්තර කරන්නේ අපේක්ෂා කරන හා අවබෝධ කරගත් දැනුම අතර සැසදීමක් ලෙසයි. වර්තමාන තරඟකාරී ලෝකයේ පාරිභෝගික තෘප්තිය යනු සියලු අවධානය යොමු වී ඇති ක්ෂේත්‍රයක් වන අතර ව්‍යාපාරයක පැවැත්ම සහ අවසානය තීරණය කිරීමේ මිනුමක් ලෙස එය හඳුනා ගත හැකිය (Kumar & Sharma, 2016). කෝට්ලර් සහ කෙලර්ට අනුව පාරිභෝගික අපේක්ෂාවන් හා සසඳන විට යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් පිළිබඳව අපේක්ෂිත කාර්යය සාධනයක් දක්නට නොලැබුණු විට පාරිභෝගිකයා අතෘප්තිමත් වන බවත් අපේක්ෂාව ඉක්මවූ කාර්යය සාධනයක් ලබා දීමෙන් තවදුරටත් පාරිභෝගිකයින් සතුටු කළ හැකි බවත් පවසන ලදී (Kotler & Keller, 2016).

වර්තමාන සන්දර්භය අනුව ඩිජිටල් බැංකු සේවා කෙරෙහි පාරිභෝගිකයින්ගේ තෘප්තියට බලපාන සාධක අතරින් වේගවත් සේවය, ප්‍රවේශ්‍යතාවය, අනුගතවීම, දැරිය හැකි මිල යනාදිය මගින් ගනුදෙනුකරුවන් අතර දැඩි විශ්වාසනීයත්වයක් ගොඩනැගෙන බව මැනිය හැකිය (Yaobin & Tao, 2005). ඩිජිටල් බැංකුකරණය තුළ ඇති මෙවලම් වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රල ඩිජිටල් වොලට්, ජංගම බැංකු පහසුකම්, අන්තර්ජාල බැංකුකරණය දවසේ ඕනෑම වේලාවකල ඕනෑම ස්ථානයක සිට ගනුදෙනුකරුවන්ව තම ගනුදෙනු කරා ලඟා කරවන අතර බැංකු පහසුකම් සඳහා ප්‍රවේශය, අරමුදල් සඳහා ප්‍රවේශය, පළපුරුද්ද, අලෙවියෙන් පසු සේවා සහ ප්‍රතිපෝෂණ වැනි විවිධ අත්දැකීම් ද ලබා දේ. මේ අනුව ඩිජිටල් බැංකුකරණය තුළ ප්‍රවේශ්‍යතාවය යන්න අර්ථදක්වන විට පාරිභෝගිකයන්ට විශේෂිත මූල්‍ය මෙහෙයුමක් හරහා තම ගනුදෙනු කරා ළඟා වීමට ඇති හැකියාව විස්තර කෙරේ. ගනුදෙනුවක් සඳහා තම ගිණුමට පිවිසෙමින් හෝ වෙනත් ආකාරයකට ගෙවීම් සිදු කිරීමට ඇති හැකියාව මෙමගින් අර්ථවත් වේ.

තාක්ෂණයේ දියුණුවත් සමඟ එයට අනුගත වූ බැංකු කටයුතුද නවීකරණය වී දියුණු වී ඇත. මෙසේ නවීකරණය වූ බැංකුකරණයත එමගින් ලබා දෙන්නා වූ බැංකු සේවාවන්හි

ඉක්මන් ප්‍රතිචාරය, ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ ගනුදෙනුවල වේගවත් බව නිසාවෙන් පාරිභෝගික අභිප්‍රේරණයට සහ තෘප්තියට එකම හේතුව වේ (Premalatha & Sundaram, 2012). මෙහෙයුම්වල වේගය, භාවිතයේ පහසුව සහ ප්‍රවේශ්‍යතාවය පාරිභෝගික තෘප්තියේ ප්‍රබල විලෝපිකයා වන අතර (Patrı´cio, Fisk , & Cunha, 2003) බැංකු සේවාවන්හි අඩු මට්ටමේ ආරක්ෂාව සහ තාක්ෂණික අසමත්වීම් ද අතෘප්තියේ ප්‍රබල මානයන් (Khan, 2010) වේ. ඒ අනුව වල වේගය යනු පාරිභෝගික විශ්වසනීයත්වයේ ප්‍රබල සංකේතයකි. වර්තමාන ලෝකයේ සියල්ලටම පාහේ මූල්‍යමය වටිනාකමක් ඇත. තාක්ෂණය දියුණුවත් සමඟ වැඩි දියුණු වන සෑම අංශයකම සෑම සේවාවක් සහ භාණ්ඩයක් සඳහාම ලබා දෙන වටිනාකම දිනෙන් දින ඉහළ යයි. නමුත් සේවාවේ ගුණාත්මකභාවය කෙතරම් ඉහළ වූවද ඒ ඒ අවස්ථාවන්හිදී ඒ ඒ පුද්ගලයා සතුව ඇති මූල්‍යමය තත්ත්වයන්ට අනුරූපව ඒ ඒ සේවාවන් ලබා ගන්නවා විනා ඔවුන්ට ඒ සඳහා ශක්තයි ක් නැති නම් ඔවුන් ඒවාගෙන් ඉවත් වෙයි. මේ තත්ත්වය ඩිජිටල් බැංකුකරණයටද බලපාන අතර විශේෂයෙන්ම ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක මෙය තීරණාත්මක තත්ත්වයකි. නමුත් ඩිජිටල් බැංකු සේවා සමඟ වඩා ආකර්ශනීය දිරිගැන්වීම් ඇති බවල එනම් අඩු සේවා ගාස්තු හෝ සේවා ගාස්තු රහිත හෝ කාලය ඉතිරි වන, වැනි  දේ මගින් අදාල සේවාවන් ලබා ගත හැකි යැයි පාරිභෝගිකයන්ට ඒත්තු වන්නේ නම්, ඒවා නිතර භාවිතා කිරීමට ඔවුන් වැඩි කැමැත්තක් දක්වයි.

අනුවර්තනය වීමේ හැකියාව යනු විවිධ තත්ත්වයන්ට අනුව හැඩගැසීමේ හැකියාවයි. එය බැංකු ක්ෂේත්‍රයට අදාලව සාකච්ඡා කරන විට එමගින් අදහස් වන්නේ වෙනස් වන ලෝකයට සාපේක්ෂව බැංකු තම ආයතනයේ පහසවු පිලිබඳව සැලකිලිමත් වීමට වඩා තම ගනුදෙනුකරුවන්ට අවශ්‍ය දේ ඔවුන්ට පහසුම වන් ලබා දීමට අවධානය යොමු කළ යුතු බවයි. බැංකු තම පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට, ඔවුන්ගේ ගැටලු විසඳීමට, ඔවුන්ගේ සම්බන්ධතාවය අගය කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. මෙම ගමනේ සෑම පියවරකදීම අවශ්‍යය හැකියාවන් ඉහළ නැංවීමට ඩිජිටල්කරණයට බලය ඇත (Muluka, 2015). බැංකු සේවාව යනු ස්වභාවයෙන්ම අවධානමට ලක්වන ක්ෂේත්‍රයකි. එබැවින් ආර්ථික, නියාමන හා ප්‍රජා විද්‍යාත්මක මෙන්ම තාක්ෂණික වෙනස්කම් බැංකු ක්ෂේත්‍රයට බලපානු ලැබේ. මේ අනුව තරඟකාරී වෙළඳපොල තුළ ඔවුන්ගේ පැවැත්ම තහවුරු කිරීමට වෙනස්වන පරිසරයට අනුගතව වඩාත් විශව් ාසනීය හා නම්‍යශීලී ස්වභාවයෙන් ක්‍රියාත්මක විය යුතයු . එබැවින් බැංකු අතර සම්බන්ධතාවය සඳහා තාක්ෂණික සේවාවන් සක්‍රීය කිරීම වඩාත් වැදගත් අංගයකි (Moreno, 2014).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

අධ්‍යයනය සඳහා නියැදි ප්‍රමාණය ගනුදෙනුකරුවන් 30කි. ප්‍රථමයෙන් යමානිගේ සූත්‍රය භාවිතා කරමින් ගම්පහ දිස්තික්කයේ 2,409,247ක් (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2018) වන  ජනගහනයෙන් 100ක නියැදි ප්‍රමාණයක් තෝරා ගන්නා ලදී. වැඩි ප්‍රතිචාරයන් සංඛ්‍යාවක් ඉහළ නිරවද්‍යතාවයකින් යුතු පර්යේෂණයකට ඉඩ කඩ සලසන බව පර්යේෂකයා තේරුම් ගෙන තිබුන ද රටේ පවතින කොවිඩ් - 19 වසංගත රෝගී තත්ත්වය නිසාවෙන් එය ප්‍රතිචාරකයන්ටත් පර්යේෂකයාටත් අවධානම් සහගත වන බැවින් ඉහත නියැදිය තවදුරටත් කුඩා කිරීමට පර්යේෂකයාට සිදු විය.


මුජෙන්ඩා සහ මුජෙන්ඩා (2003) ට අනුව, නියැදි ප්‍රමාණයෙන් 10% ත් 30% ත් අතර ප්‍රමාණයක් ඉලක්කගත ජනගහනයේ හොඳ නිරූපණයක් වේ (Muluka, 2015). එම නිසා 30% නියමු අධ්‍යයනයක් සඳහා ප්‍රමාණවත් වන බව පර්යේෂකයා විසින් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රශ්නාවලිය 30 දෙනෙක් අතර බෙදා දෙන ලදී. රාජ්‍යය හා පෞද්ගලික බැංකු නියෝජනය කරමින් 15 දෙනා බැගින් ප්‍රතිචාරකයින් 30 දෙනා තෝරා ගෙන ඇත. මෙම පර්යේෂණය සඳහා සරල සසම්භාවී නියැදි ක්‍රමය භාවිතා කරන ලදී.

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්තයන් රැස් කිරීමට ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගෙන ඇත. ප්‍රශ්නාවලිය මාර්ගයෙන් තෝරාගත් නියැදියේ දත්තයන් එකතු කර ඇති අතර ඊට අමතරව බැංකු කළමනාකරුවන්ගෙන් තොරතුරු ලබා ගැනීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇත. ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා අන්තර්ජාලය හරහා ලබා ගන්නා ලද විවිධ ඩිජිටල් බැංකු චැනල් පිළිබඳ වාර්තා හා ලිපි ලේඛන, බැංකු දත්තයන්, වෙබ් අඩවි තොරතුරු ද භාවිතා කළේය. SPSS මෘදුකාංගය සහ MS Excel මෘදුකාංගය යොදාගනිමින් රැස් කරගත් දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා සහසම්බන්ධතා විශ්ලේෂණය සහ ප්‍රතිගාමී විශ්ලේෂණය ආදී දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයන් ද දත්ත ඉදිරිපත් කිරීම වගු, ප්‍රස්ථාර ආදී දත්ත ඉදිරිපත් කිරීමේ උපකරණ ද භාවිතා කර ඇත.

**4. දත්ත විශ්ලේෂණය**

මෙම අධ්‍යයනය සඳහා යොදාගත් බැංකු ගනුදෙනුකරුවන්ගේ නියැදිය තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ විමසීමේදී නියැදිය තුළ 60%ක් ස්ත්‍රී ගනුදෙනුකරුවන් වේ. පුරුෂ ගනුදෙනුකරුවන් 40%ක් වේ. ඒ අනුව වැඩි වශයෙන් ස්ත්‍රී ගනුදෙනුකරුවන් අන්තර්ගත වන බව ප්‍රස්තාර අංක 1 මගින් පැහැදිලි වේ.


*ප්‍රස්තාර අංක 1: ගනුදෙනුකරුවන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය*




මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

මෙම අධ්‍යයනය තුළ ප්‍රස්තාර අංක 2 මගින් දක්වෙන ගනුදෙනුකරුවන්ගේ වයස් මට්ටම පිළිබඳ සැලකීමේදී ගනුදෙනුකරුවන්ගේ වයස් සීමාව අවුරුදු 18-30, අවුරුදු 31-44, අවුරුදු 45-59, අවුරුදු 60 ට වැඩි ලෙස කාණ්ඩ ගත කරන ලදී. එහිදී ගනුදෙනුකරුවන් වැඩි පිරිසක් වයස අවුරුදු 18-30 කාණ්ඩය තුළ පවතී. එය 43%ක් වේ. අඩු පිරිසක් වයස අවුරුදු 45-59 හා 60 ට වැඩි කාණ්ඩ තුළ පවතී. එය 10%ක් වේ. 37%ක් වයස අවුරුදු 31-44 කාණ්ඩය තුළ පවතී.


*ප්‍රස්තාර අංක 2 : ගනුදෙනුකරුවන්ගේ වයස් මට්ටම*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත (2021)

ප්‍රස්තාර අංක 3ට අනුව ගනුදෙනුකරුවන්ගෙන් 47%ක් රු.40,000-රු.65,000 අතර ආදායමක් උපයයි. 23%ක් රු.65,000-රු.100,000 අතර ප්‍රමාණයේ ආදායමක් ලබාගනී. 13%ක් රු.20,000-රු.40,000 අතර ප්‍රමාණයේ ආදායමක් ලබාගනී. 10%ක් රු.100,000ට වැඩි ප්‍රමාණයේ ආදායමක් ලබාගනී. රු.20,000 ට අඩු ආදායමක් 7%ක් ලබාගනී. මේ අනුව ගනුදෙනුකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් රු.40,000-රු.65,000 අතර ආදායමක් ලබා ගනී.


*ප්‍රස්තාර අංක 3 : ගනුදෙනුකරුවන්ගේ මාසික ආදායම*




මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත (2021)

ප්‍රස්තාර අංක 4 මගින් බැංකු ගනුදෙනුකරුවන් අන්තර්ජාල බැංකු සේවාව භාවිත කර තිබේද යන්න විමසා බලන ලදී. එහිදී කවරදාවත් භාවිතා කර නැත, අඩුවෙන් භාවිතා කරයි, සාමාන්‍යය දුරකට භාවිතා කරයි, වැඩියෙන් භාවිතා කරයි හා නිතරම භාවිතා කරයි යන නිර්ණායක මත නියදිය තුළින් දත්ත ලබා ගන්නා ලදී. එහිදී 46%ක් සාමාන්‍ය දුරට භාවිතා කරන බවත් 27% ක් වැඩියෙන් භාවිතා කරන බවත් 10% ක් නිතරම හා අඩුවෙන් භාවිතා කරන බවත් නිරීක්ෂණය කරනු හැකි විය.


*ප්‍රස්තාර අංක 4 : අන්තර්ජාල බැංකුකරණ සේවා භාවිතය*




මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

ප්‍රස්තාර අංක 5 මගින් මුදල් තැන්පත් කිරීම/ආපසු ගැනීම සඳහා, ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සඳහා, බිල්පත් ගෙවීම සඳහා හා විමසීම් සඳහා ආදී වශයෙන් ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් භාවිතා කරන ඩිජිටල් බැංකුකරණ සේවාව දක්වන ලදී. එහිදී වැඩි පිරිසක් එනම් 57% ක් මුදල් තැන්පත් කිරීම/ආපසු ගැනීම සඳහා භාවිතා කරන බවත් 23% ක් බිල්පත් ගෙවීම සඳහාත් 13% ක් විමසීම් සඳහාත් 7% ක් මුදල් හුවමාරු කිරීම සඳහාත් භාවිතා කරයි. ඒ අනුව මුදල් තැන්පත් කිරීම/ආපසු ගැනීම සඳහා ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් ඩිජිටල් බැංකුකරණ සේවාව භාවිතා කරයි.

*ප්‍රස්තාර අංක 5 : ගනුදෙනකු රුවන් වැඩි වශයෙන් භාවිතා කරන ඩිජිටල් බැංකුකරණ සේවාව*




මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

### 4.1 පාරිභෝගික තෘප්තිය සහ ඩිජිටල් බැංකුකරණය හා සම්බන්ධ සාධක අතර සහසම්බන්ධතා විශ්ලේෂණය

*වගු අංක 1 : සහසම්බන්ධතා විශ්ලේෂණය*

| | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| 1. ගනුදෙනු කිරීමේ වේගය | 1 | | | | |
| 2. ප්‍රවේශ්‍යතාවයේ හැකියාව | .517** | 1 | | | |
| 3. අනුවර්තනය වීමේ හැකියාව | .443* | .673** | 1 | | |
| 4. දැරිය හැකි බව | .423* | .581** | .917** | 1 | |
| 5. පාරිභෝගික තෘප්තිය | .354 | .577** | .860** | .933** | 1 |

**. Correlation is significant at the 0.01 level (2-tailed).
*. Correlation is significant at the 0.05 level (2-tailed).

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

වගු අංක 1 හි ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන්නේ ගනුදෙනු කිරීමේ වේගය හා පාරිභෝගික තෘප්තිය අතර සහසම්බන්ධතාවය 0.517 ක් බවයි. මෙම ප්‍රතිඵලය 0.5 ට වඩා වැඩි වන අතර ධනාත්මක වේ. එනම් ගනුදෙනු කිරීමේ වේගය සහ පාරිභෝගික තෘප්තිය අතර ධන සහසම්බන්ධයක් පවතී. ගනුදෙනුකරුවාගේ තෘප්තිය වැඩි වන්නේ ගනුදෙනු කිරීමේ වේගය වැඩි වන විට දීය. තවද ප්‍රවේශ්‍යතාවයේ හැකියාව හා පාරිභෝගික තෘප්තිය අතර සහසම්බන්ධතාවය 0.443 ක් බවයි. මෙම ප්‍රතිඵලය 0.5 ට වඩා අඩු වන අතර ධනාත්මක වේ. එනම් ප්‍රවේශ්‍යතාවයේ හැකියාව සහ පාරිභෝගික තෘප්තිය අතර ධන සහසම්බන්ධයක් පවතී. අනුවර්තනය වීමේ හැකියාව හා පාරිභෝගික තෘප්තිය අතර සහසම්බන්ධතාවය 0.423 ක් බවයි. මෙම ප්‍රතිඵලය 0.5 ට වඩා අඩු වන අතර ධනාත්මක වේ. එනම් අනුවර්තනය වීමේ සහ පාරිභොගීක තෘප්තිය අතර ධන සහසම්බන්ධයක් පවතී. දැරිය හැකි බව හා පාරිභෝගික තෘප්තිය අතර සහසම්බන්ධතාවය 0.354 ක් බවයි. මෙම ප්‍රතිඵලය 0.5 ට වඩා අඩු වන අතර ධනාත්මක වේ. එනම් දැරිය හැකි බව සහ පාරිභෝගික තෘප්තිය අතර ධන සහසම්බන්ධයක් පවතී.

### 4.2 පාරිභෝගික තෘප්තිය සහ ඩිජිටල් බැංකුකරණය හා සම්බන්ධ සාධක අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම

පාරිභෝගික තෘප්තිය සහ ඩිජිටල් බැංකුකරණය හා සම්බන්ධ සාධක අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම සඳහා කල්පිතයන් 4ක් ගොඩනංවන ලදි.

$H_1$ - ඩිජිටල් බැංකුකරණයේ ගනුදෙනු කිරීමේ වේගය පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත.

$H_2$ - ඩිජිටල් බැංකුකරණයේ ප්‍රවේශවීමේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත.

$H_3$ - ඩිජිටල් බැංකුකරණයේ අනුවර්තනය වීමේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත.

$H_4$ - ඩිජිටල් බැංකුකරණයේ දැරිය හැකි බව පාරිභෝගකි තෘප්තියට බලපාන්නේ නැත.

*වගු අංක 2 : කයි වර්ග විශ්ලේෂණය*

| කල්පිතය | කයි වර්ග අගය | සුචලන අංකය | P අගය | තීරණය |
|---|---|---|---|---|
| $H_1$ | 34.077 | 32 | .032 | $H_1$ කල්පිතය නොපිළිගනී |
| $H_2$ | 151.337 | 99 | .001 | $H_2$ කල්පිතය නොපිළිගනී |
| $H_3$ | 151.190 | 121 | .033 | $H_3$ කල්පිතය නොපිළිගනී |
| $H_4$ | 204.048 | 121 | .000 | $H_4$ කල්පිතය නොපිළිගනී |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

ඩිජිටල් බැංකුකරණයේ ගනුදෙනු කිරීමේ වේගය පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත, යන කල්පිතයට අදාළ P හි අගය 0.032 ක් වේ. එනම් එම අගය 0.05 ට අඩු වීම හේතුවෙන් $H_0$ කල්පිතය නොපිළිගනී. එනම් ඩිජිටල් බැංකුකරණයේ ගනුදෙනු කිරීමේ වේගය පාරිභෝගික තෘප්තියට බලපායි. ඩිජිටල් බැංකුකරණයේ ප්‍රවේශ්‍යතාවයේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත, යන කල්පිතයට අදාළ P හි අගය 0.001 ක් වේ. එනම් එම අගය 0.05 ට අඩු වීම හේතුවෙන් $H_0$ කල්පිතය නොපිළිගනී. එනම් ඩිජිටල් බැංකුකරණයට ප්‍රවේශවීමේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපායි.

ඩිජිටල් බැංකුකරණයේ අනුවර්තනය වීමේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත, යන කල්පිතයට අදාළ P හි අගය 0.033 ක් වේ. එනම් එම අගය 0.05 ට අඩු වීම හේතුවෙන් $H_0$ කල්පිතය නොපිළිගනී. එනම් ඩිජිටල් බැංකුකරණයට අනුවර්තනය වීමේ හැකියාව පාරිභෝගික තෘප්තියට බලපායි. ඩිජිටල් බැංකුකරණයේ දැරිය හැකි බව පාරිභෝගික තෘප්තියට බලපාන්නේ නැත, යන කල්පිතයට අදාළ P හි අගය 0.000 ක් වේ. එනම් එම අගය 0.05 ට අඩු වීම හේතුවෙන් $H_0$ කල්පිතය නොපිළිගනී. එනම් ඩිජිටල් බැංකුකරණයේ දැරිය හැකි බව පාරිභෝගික තෘප්තියට බලපායි.

**4.3 පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණය පිළිබඳ ප්‍රතිගාමී විශ්ලේෂණය**

ප්‍රතිගාමී විශ්ලේෂණයේ ප්‍රතිඵල මගින් ස්වායත්ත විචල්‍යය මගින් පරායත්ත විචල්‍යය වෙනස් වන ආකාරය පෙන්වයි.

මෙහිදී පහත දැක්වෙන කොන්දේසි දෙක සපුරා තිබිය යුතුය. එනම්,

1. R අගය ධන විය යුතුය (0 ට වඩා වැඩි විය යුතුය )
2. ස්වායත්ත විචල්‍යය හා පරායත්ත විචල්‍යය අතර සම්බන්ධතාවයක් තිබිය යුතුය (P අගය 0.05 ට වඩා අඩු විය යුතුය)

වගු අංක 5-6 : ප්‍රතිගාමී විශ්ලේෂණය

**Model Summary**

| Model | R | R Square | Adjusted R Square | Std. Error of the Estimate |
|---|---|---|---|---|
| 1 | .936[a] | .876 | .857 | .372 |

a. Predictors: (Constant), Affordability, Speed_of_transaction, Accessibility, Adaptability

**ANOVA[a]**

| Model | Sum of Squares | df | Mean Square | F | Sig. |
|---|---|---|---|---|---|
| Regression | 24.444 | 4 | 6.111 | 44.278 | .000[b] |
| Residual | 3.450 | 25 | .138 | | |
| Total | 27.895 | 29 | | | |

a. Dependent Variable: Customer_satisfaction

b. Predictors: (Constant), Affordability, Speed_of_transaction, Accessibility, Adaptability

**Coefficients[a]**

| Model | Unstandardized Coefficients | | Standardized Coefficients | t | Sig. |
|---|---|---|---|---|---|
| | B | Std. Error | Beta | | |
| (Constant) | -.524 | .433 | | -1.209 | .000 |
| Speed of Transaction | .127 | .077 | .139 | 3.919 | .003 |
| Accessibility | .091 | .090 | .103 | 4.884 | .000 |
| Adaptability | .023 | .025 | .178 | 5.129 | .000 |
| Affordability | .930 | .936 | .178 | 5.237 | .000 |

a. Dependent Variable: Customer_satisfaction

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

මෙහි ප්‍රතිගාමී විශ්ලේෂණ අගය 0.000 වන බැවින් පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑමක් පවතින බව තෘප්ත කළ හැක.

තවද මෙහි,

1. R අගය 0.936 වන අතර එය 0 ට වඩා ඉහළ අගයක් ගනී.
2. විචල්‍යයන් 4 ම සළකා බලන අගයන් 0.05 ට වඩා අඩු වේ.

මේ අනුව මෙය ඉහත කොන්දේසි දෙකම තෘප්ත කරන බැවින් පාරිභෝගික තෘප්තිය සඳහා එම විචල්‍යයන්ගේ සැළකිය යුතු බලපෑමක් පවතින බව තවදුරටත් තහවුරු කළ හැකිය.

## 5. සමාලෝචනය

පර්යෙෂණයේ අරමුණු සාක්ෂාත් කරමින් තෘප්ත වූයේ පාරිභෝගික තෘප්තිය සහ ගනුදෙනු කිරීමේ වේගය, ප්‍රවේශ්‍යතාවයේ හැකියාව, අනුවර්තනය වීමේ හැකියාව සහ දැරිය හැකි තරම අතර ධනාත්මක සම්බන්ධතාවයක් පවතින බවත් පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑමක් පවතින බවත් ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් ඩිජිටල් බැංකුකරණය භාවිතා කරන්නේ මුදල් තැන්පත් කිරීම සහ මුදල් ආපසු ගැනීමේ සේවාව සඳහා බවත් තහවුරු වීය. ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය තක්සේරු කිරීමේදී බැංකු සහ එහි සේවාවන් පිළිබඳ පාරිභෝගික තෘප්තිය තවමත් වෙනස් වෙමින් සහ යාවත්කාලීන වෙමින් පවතී. ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ වුවද ඩිජිටල්කරණය තරඟකාරී අයුරින් සිදු වුවත් ඇතැම් අවස්තාවන් වලදී ඇතැම් බැංකු තවමත් බැංකු ගනුදෙනු සඳහා සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කරයි. කෙතරම් ජංගම සේවා මධ්‍යස්ථාන තිබුණ ද, කෙතරම් සාධනීය මට්ටමින් ස්මාර්ට් ජංගම දුරකථන භාවිතා කළත් විශ්‍රාම වැටුප් දිනයන්හිදී වයස අවුරුදු 60 ඉක්මවූ ගනුදෙනුකරුවන් ද, කාර්යයාල වැටුප් දිනයන්හදී බහුතර ගනුදෙනුකරුවන් පිරිසක් බැංකු පෝලිම්වල කල් ගත කරන අයුරු නුපුරුදු සිදුවීමකි. මේ තත්ත්වය ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති බැංකු පරිශ්‍රයන් ආශ්‍රිතව ද දැකගත හැකි වූ අතර ඒ ඇසුරින් පැන නැගුණු ගැටලුව ඔස්සේ ගොඩනගාගත් අරමුණු තෘප්ත කිරීම සඳහා දත්ත විශ්ලේෂණය හරහා බොහෝ කරුණු අනාවරණය විය.

විශ්‍රාම වැටුප් දිනයන්හදී  සහ කාර්යයාල වැටුප් දිනයන්හිදී බැංකු පරිශ්‍රයන් තුළ දිගු පෝලිම් දක්නට ලැබෙන බව පර්යේෂකයා ප්‍රධාන පර්යේෂණ ගැටලුව පිළිබඳ පසුබිම විස්තර කිරීමේදී සාකච්ඡා කර ඇති අතර එය තවදුරටත් තහවුරු කරමින් ඩිජිටල් බැංකුකරණය පිළිබඳ පහළ මට්ටමේ භාවිතයක් අවුරුදු 45 - 59 හා අවුරුදු 60ට වැඩි පාරිභෝගිකයන් අතර පවතින බව මෙම අධ්‍යයනයෙන් ඔප්පු වී ඇත. සුබසාධක වැටුප් හා විශ්‍රාම වැටුප් ලබා ගන්නා පිරිස් අයත් වන්නේ මෙම වයස් කාණ්ඩයට වන අතර නව තාක්ෂණය භාවිතා කිරීමේ බියක් හෝ මැලි බවක් දැක්වීම හරහා බැංකු පරිශ්‍රය තුළ දිගු පෝලිම් වල එය හේතු වී ඇති බවක් එමගින් නිගමනය කළ හැක. එය ගම්පහ දිස්ත්‍රික්කයට පමණක් නොව සමස්ත ලංකාවටම පොදු තත්ත්වයකි. හේතුව විශ්‍රාම වැටුප් සහ සුබසාධක වැටුප් ලබන්නන් ලංකාව පුරාම විසිරී ඇති හෙයිනි. නමුත් තරුණ හා මැදි වයස් වල පාරිභෝගියන් අතරේ මෙය සාධනීය අයුරින් ප්‍රචලිත බව දත්ත විශ්ලේෂණයේදී පෙනී යයි. තවදුරටත් ප්‍රජා විද්‍යාත්මක කරුණු සැලකීමේදී පෙනී ගිය කාරණාවක් වූයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඩිජිටල් බැංකුකරණය භාවිතා කරන පාරිභෝගිකයන්ගෙන් වැඩිම පිරිසක්, ප්‍රතිශතයක් වශයෙන් 47% ක් මධ්‍යය - ඉහළ ආදායම් එනම් රු.40,000.00 - රු.65,000.00 අතරේ ආදායම් ලබන බවත්, රු.20,000.00 ට අඩුවෙන් ආදායම් ලබන පාරිභෝගිකයන්ට සාපේක්ෂව ඉහළම ආදායම් ලබන එනම් රු.100,000.00 වැඩි ආදායම් ලබන පාරිභෝගිකයන්  ඩිජිටල් බැංකුකරණය බහුලව භාවිතා කරන බවත් ය. ඒ අනුව මධ්‍යය - ඉහළ ආදායම් ලබන පාරිභෝගිකයන් අතර ඩිජිටල් බැංකුකරණය ප්‍රචලිත බව නිගමනය කළ හැකිය. ඩිජිටල්කරණය යනු වත්මන් අවශ්‍යතාවය වුවද , දියුණු වන ලෝකයට සාපේක්ෂව ලංකාවද ඩිජිටල්කරණයට අනුගත වී තිබෙන පසුබිමක  ගම්පහ දිස්ත්‍රික්කයේ අන්තර්ජාල බැංකුකරණය සාමාන්‍යය මට්ටමින් භාවිතා කරන පාරිභෝගිකයන් 47% ප්‍රතිශතයක පැවතියත් එය කෙදිනකවත් භාවිතා නොකරන

පාරිභෝගිකයන් සමස්ත නියැදියෙන් 7% සහ අවම මට්ටමින් භාවිතා කරන පාරිභෝගිකයන් 10% ප්‍රමාණයක් පෙන්නුම් කිරීම සැලකිය යුතු තත්ත්වයකි. එය සංඛ්‍යාත්මකව අවම මට්ටමක පැවතිය ද නියැදි සමීක්ෂණයකින් එතරම් ප්‍රතිශතයක් සොයාගැනීම තරමක් අවධානය යොමු කළ යුතු තත්ත්වයකි. අධ්‍යයන උප අරමුණු වලදී පර්යේෂකයාට සොයා ගැනීමට අවශ්‍යය වූ පාරිභෝගිකයන් අතරේ වඩා ජනප්‍රිය ඩිජිටල් බැංකුකරණ සේවාව කුමක්ද? යන්නට පිළිතුරු සපයමින් අධ්‍යයනය මගින් තහවුරු වී ඇත්තේ මුදල් තැන්පත් කිරීම සහ ආපසු ගැනීම සඳහා ඩිජිටල් බැංකුකරණය පාරිභෝගිකයන් අතරේ ප්‍රචලිත බවයි. එය ප්‍රතිශතයක් වශයෙන් 57% කි. එය සිදු වන්නේ ස්වයංක්‍රීය මුදල් ගැනීමේ යන්ත්‍ර සහ ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර මගින් වන අතර එමගින් නිගමනය කල හැකි වන්නේ ස්වයංක්‍රීය මුදල් ගැනීමේ යන්ත්‍ර සහ ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර පාරිභෝගිකයන් අතරේ වඩා ජනප්‍රිය බවයි.

සහසම්බන්ධතා විශ්ලේෂණයේදී ද පාරිභෝගික තෘප්තිය සහ ගනුදෙනු කිරීමේ වේගය අතරත්, පාරිභෝගික තෘප්තිය සහ ප්‍රවේශ්‍යතාවයේ හැකියාව අතරත්, පාරිභෝගික තෘප්තිය සහ අනුවර්තනය වීමේ හැකියාව අතරත්, පාරිභෝගික තෘප්තිය සහ දැරිය හැකි බව අතරත් ධනාත්මක සම්බන්ධතාවයක් පෙන්නුම් කිරීම හරහා අධ්‍යයන අරමුණු ඉටුකරමින් පාරිභෝගික තෘප්තිය කෙරෙහි ඉහත සාධකයන්හි බලපෑමක් පවතින බවට අවසානයේදී නිගමනයට එළඹිය හැකිය. අවසාන වශයෙන් ප්‍රතිගාමී විශ්ලේෂණයේ ප්‍රතිඵල වලට අනුව 0.936 ක් වූ R අගය 0 ට වඩා ඉහළ අගයක් ගෙන ඇති නිසාත්, සළකා බලන විචල්‍යයන් 4ම P අගයන් 0.05 ට වඩා අඩු අගයක් ගෙන ඇති නිසාත් අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ඉටු කරමින් පාරිභෝගික තෘප්තිය උදෙසා ඩිජිටල් බැංකුකරණයේ බලපෑමක් පවතින බව අවසානයේදී නිගමනය කළ හැකිය. ඩිජිටල් බැංකුකරණයේ ප්‍රවණතාවය රඳා පවතින්නේ වත්මන් සහ අනාගත ගනුදෙනුකරුවන්ගේ හැසිරීම මතය. ඩිජිටලක්රණ පහසුකම් හඳුන්වා දුන් ආරම්භක අවධියේදී ඩිජිටල් බැංකු කටයුතු ක්‍රියාත්මක වන ආකාරය දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කළ ද එය යාවත්කාලීන කිරීමට ද පියවර ගන්නේ නම් ඩිජිටල්කරණය කෙරෙහි පාරිභෝගික යොමුව තවදුරටත් සාධනීය විය හැක. එයට අනුබද්ධිතව ඩිජිටල් බැංකුකරණයේ වැදගත්කම, ප්‍රතිලාභ පිළිබඳ තවත් බොහෝ දේ තම පාරිභෝගිකයන්ට ඉගැන්වීම සඳහා සහ ඔවුන්ව දැනුවත් කිරීම සඳහා පවත්වන අත් පත්‍රිකා ව්‍යාපාර, වෙබ් පාදක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වැනි ප්‍රවර්ධන ව්‍යාපාර සංවිධානය කිරීමට බැංකු ආයතනවලට හැකිය. පාරිභෝගිකයන් හට ඩිජිටල් බැංකුකරණය වෙත යොමු වීමට අවශ්‍යතාවය තිබුණ ද ඇතැම් අවස්ථාවන්හිදී බිය, පැකිළීම, නුහුරුව ආදී හේතූන් නිසා එයින් පසුබට වීම නිරායාසයෙන් සිදු විය හැකි අතර මෙය අවාසිදායක තත්ත්වයකි. මේ තත්ත්වය මග හරවා ගැනීම සඳහාත් ගනුදෙනුකරුවන්ට විශිෂ්ට සේවාවන් සැපයීම සඳහාත් ශාඛා මට්ටමින් හෝ "උපකාරක කවුළුව" සකස් කිරීම සුදුසු විය හැක.

ඒ මගින් ඩිජිටල් බැංකුකරණයට එක් එක් පාරිභෝගිකයා වෙන් වෙන් වශයෙන් යොමු කළ හැකි අතර එක් එක් පාරිභෝගිකයාට ශාඛා මට්ටමින් වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කරන නිසා සමස්තයක් එය හතිකර ලෙස බලපෑ හැක. මාර්ගස්ථ බැංකුකරණයේ වඩාත්ම දුෂ්කර අංගයක් වන්නේ වෙබ් අඩවි පරිශීලක - හිතකාමී නොමැතිකමයි. අනෙක් අතට, පරිශීලක - හිතකාමී සහ හොඳින් ප්‍රවේශ විය හැකි වෙබ් අඩවියක් සෑම

බැංකුවකටම පාහේ තිබීම සුදුසු විය හැකි අතර ගනුදෙනුකරුවන්ට බැංකුව සමග පහසුවෙන් සම්බන්ධ වීම සඳහා සුදුසු සන්නිවේදන මාර්ගයක් ලෙස එය සංවර්ධනය කිරීම අන්තර්ජාල බැංකුකරණයේ අනාගතයට සුබදායී විය හැක. එමෙන්ම ලංකාවේ සියලුම වලංගු දුරකථන ජාලයන් භාවිතා කරන පාරිභෝගිකයන්ට පොදුවේ භාවිතා කල හැකි ජංගම බැංකුකරණ ක්‍රමයක් හඳුන්වා දීම හරහා ස්මාර්ට් ජංගම දුරකථන නොමැතිව අන්තර්ජාල බැංකුකරණ පහසුකම ලබා ගැනීමට හෝ, බැංකු යෙදුම් භාවිතා කළ නොහැකි පාරිභෝගිකයාට පවා ඩිජිටල්කරණයට ළං වීමට ඉඩකඩ සැලසිය හැක. මෙහිදී පරිශීලකයාගේ ප්‍රවේශ්‍යතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා මාර්ගස්ථ බැංකුවලට ISP (Internet Service Provider) සමඟ නැතිනම් අන්තර්ජාල සේවා සපයන්නන් සමඟ අත්වැල් බැඳ ගැනීම හරහා අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් සමඟ සම්බන්ධ වීමට බැංකුවට අවස්ථාව ඇත.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන් භාවිතා වන භාෂා ත්‍රිත්වයක් පවතින නිසාවෙන් වෙබ් අඩවිය මගින් හෝ බැංකු යෙදුම මගින් හෝ ජංගම සේවා ස්ථානයන්හි ඇති යන්ත්‍ර මගින් හෝ ඩිජිටල් බැංකු පහසුකම් ලබා ගන්නා විටදී එම භාෂා ත්‍රිත්වයෙන් තමන් භාවිතා කර භාෂාවකින් සේවාව ලබා ගැනීම හරහා පාරිභොගිකයන්ගේ ඩිජිටල්කරණයට යොමු වීමේ පැකිලීම මගහරවා ගැනීමට හැකි වියහැකි අතර සාමාන්‍යයෙන් ඩිජිටල්කරණ සේවාවන් සඳහා භාවිත කරන ඉංග්‍රීසි භාෂාව නොවැටහෙන පුද්ගලයාට පවා මෙය සාධනීය විය හැක. විශේෂයෙන් විශ්‍රාම වැටුප් දිනයන්හිදී, සුබසාධක වැටප්පු දිනයන්හිදී බැංකු පරිශ්‍රයේ සැරිසරන අවුරුදු 60 ඉක්මවූ ජ්යේෂ්ඨ පුරවැසියාට පවා මෙම ඩිජිටල්කරණ වේදිකාව බියෙන් පැකිලීමකින් තොරව භාවිතා කිරීමටත්, ඒ හරහා බැංකුවේ දිගු පෝලිම් ක්‍රමයෙන් නැති කිරීමටත්, ඩිජිටල්කරණයේ අනාගතයටත් ධනාත්මකව බලපෑ හැක. රට තුළ මාර්ගස්ථ බැංකු පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලික හා ආයතනික අංශයේ වැඩිදුර සහාය අවශ්‍ය වේ. අනෙක් අතට ශ්‍රී ලංකාවේ අන්තර්ජාල බැංකුකරණයේ ප්‍රගතියට අහිතකර ලෙස බලපෑ හැකි අනවශ්‍ය තත්වයන් ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට සුදුසු පියවර ගැනීම ද අවශ්‍ය වේ. තවද, ඩිජිටල් බැංකුකරණය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඒ ආශ්‍රිත වෙනස්කම් ඇතිකිරීමට සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ.

පර්යේෂණ සොයාගැනීම් වලට අනුව, තරුණ ජනගහනයෙන් බහුතරයක් ඩිජිටල් බැංකුකරණය භාවිතා කිරීමට නැඹුරු වන අතර අනෙක් අතට බොහෝ බැංකු සාම්ප්‍රදායික බැංකුකරණයේ සිට ඩිජිටල් බැංකුකරණයට මාරුවීමට උනන්දුවක් දක්වයි.. මෙම පර්යේෂණ අධ්‍යයනයෙන් තවදුරටත් පෙනී ගියේ බොහෝ පාරිභෝගිකයන් අන්තර්ජාල බැංකුකරණය භාවිතා කිරීමට කැමැත්තක් දක්වන නමුත් 7%ක් එය කෙදිනකවත් භාවිතා කර නොමැති බවත්, 10%ක් අවම මට්ටමකට එය භාවිතා කරන බවයි. මෙය අනාගත ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගත හැකි අතර එය අවම කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීමටත්, ඩිජිටල් බැංකුකරණය වැඩි දියුණු කිරීම සඳහා රට පුරා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඩිජිටල් බැංකුකරණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අවධානය යොමු කිරීම සාධනීය විය හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2018). වාර්ෂික වාර්තාව 2018, http://www.statistics.gov.lk/districtstathbook.asp?district=gampaha

Central Bank of Sri Lanka, (2020). Launching of '2020 - Year of Digital Transactions' Promotional Campaign. https://www.cbsl.gov.lk/en/news/launching-of-2020-year-of-digital-transactions-promotional-campaign#:~:text=The%20promotional%20campaign%20of%20%E2%80%9C2020,central%20bankers%20and%20other%20dignitaries.

Cross, N. (2014). *What's Your Definition of 'Digital' in Banking?* . Retrieved from The Financial Brand: https: thefinancialbrand.com/defining-digital-inbanking-next bank-face book

Khan, M. A. (2010). An Empirical Study of Automated Teller Machine Service. *European Journal of Social Sciences, 12*(1), 23-45.

Kotler, P., & Keller, D. L. (2016). *Marketing Management* (Vol. global edition). Harlow, England: Pearson Education Limited.

Kumar, M., & Sharma, D. S. (2016). *Customer Satisfaction trends in Banking Industry-A Literature Review.* Panjab, Rajpur, India: Chitkara College of Sales and Retail Marketing.

Mahdi, M., Rezaul, K., & Rahman, M. (2010, February). Credit fraud detection in the banking sector in UK: a focus on e-business. *In 2010 Fourth International Conference on Digital Society* , 232 - 237.

Moreno, J. (2014). *A Journey to Digital Transformation with Accenture*. Retrieved from Everyday Bank.

Mugenda, O., & Mugenda , A. (2003). *Research methos: Qusntitative & Qualitative*. Nairobi: African Centre for Technology Studies press.

Muluka, K. O. (2015). Influence of digital banking on customer satisfaction: a case of national bank of kenya bungoma county. Retrieved from http://erepository.uonbi.ac.ke/handle/11295/90293

Patrı´cio, L., Fisk , R. p., & Cunha, J. F. (2003). Improving satisfaction with bank service offerings : measuring the contributin of each delivery channel. *managing service quality, 13*, 471-482. doi: 10.1108/09604520310506531

Premalatha, J. R., & Sundaram, D. (2012). Analysis of Customer Satisfaction with reference to ATM Services in Vellore District. *IJEMR, 2*(2), 1-17. Retrieved from https://ijemr.in/wp-content/uploads/2018/01/Analysisof-Modern-Banking-Services-with-special-reference-to-ATM-services.pdf

Raicu, I., & Turkes, M. C. (2016). An Opinion Mining And Sentiment Analysis Approach For Evaluating Customer Satisfaction In A Digital Banking Environment. *Annales Universitatis Apulensis Series Oeconomica, 2(18)*, 1-16. https://ideas.repec.org/a/alu/journl/v2y2016i18p16.html

Sharma, H. (2011). Bankers' perspectives on e-banking. *Global journal of Research in Management, 1*(1), 71 - 85. Retrieved from http://search.proquest.com/openview/b47924c870ecb45f2a1a807514211d32/1?pq-origsite=gscholar&cbl=2030941

Suraweera, T., Kahingala, S., Batepola, A., Punchihewa, M. G., Senevirathne, K., & Kahandawaarachchi, C. (2011). IT Driven Banking Services in Sri Lanka: Customer Acceptance Retrieved from https://www.semanticscholar.org/paper/IT-Driven-Banking-Services-in-SriLanka%3A-Customer-Suraweera Kahingala/986d7006d41e123d9da9cc219d43570768659161

Yaobin, L., & Tao, Z. (2005). An empirical analysis of factors influencing consumers' initial trust under B2C environment. *Nankai Business Review, 8*(6), 96-101.

# ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්තිය සහ වෘත්තීය අධ්‍යාපනය

එච්. එල්. ඒ. මහේෂා සෙව්වන්දි

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
sewwandimahesha123@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාව තුළ පවතින සේවා වියුක්ති ගැටලුව සඳහා පිළියමක් ලෙස නිර්මාණය වූ වෘත්තීය අධ්‍යාපනය තුළින් වසරින් වසර රැකියා වෙළඳපල වෙත ප්‍රවිශ්ට වන පිරිස වැඩි වූවත් තරුණ සේවා වියුක්ති අනුපාතයද සාපේක්ෂව ඉහළ යාමක් දක්නට ලැබේ. වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීමට සාර්ථක විසඳුමක් වේද යන්න වර්තමානය වනවිට පවතින ප්‍රබල ගැටලුවකි. මෙම අධ්‍යයනයෙහි ප්‍රධානම අරමුණ වන්නේ වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීමට දක්වන දායකත්වය අධ්‍යයනය කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ ස්තෘත සසම්බාවී නියැදුම් ක්‍රමයට අනුව නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යාස්ථානයෙහි පවතින පාඨමාලා ස්තෘත 08කට වෙන් කොට සෑම පාඨමාලාවක්ම නියෝජනය වන පරිදි නියැදියක් ලබා ගන්නා ලදි. මෙහිදී 2015 සිට 2019 දක්වා සෑම වර්ෂයකම වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ සිසුන්ගෙන් 5% ක් නියෝජනය වන පරිදි නියැදිය සකස් කරගෙන ඇති අතර සමස්ත ප්‍රතිචාරකයින් අතරින් 104කින් යුත් නියැදියක් තෝරා ගන්නා ලදි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය හා දුරකථන සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදය භාවිතා කර ඇත. රැස් කරගනු ලැබූ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානමය ශිල්ප ක්‍රම, කයිවර්ග පරීක්ෂාව, ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘති (logistic ආකෘති) යන ක්‍රමවේද භාවිතා කරන ලදි. පුද්ගලයකුගේ සේවා නියුක්තිය හා ඒ සඳහා බලපාන සාධක අතර ස්වායත්තතාව පරීක්ෂා කිරීම තුළින් වෘත්තීය අධයාපනය තුළින් පුද්ගලයකුගේ සේවා නියුක්තියට බලපානු ලබන ප්‍රධාන සාධක හතක් එනම් පුමිතිරිභාවය, විවාහකත්වය, පදිංචි ප්‍රදේශය, වෘත්තීය පුහුණු පාඨමාලාව, වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය, පුහුණු කාල සීමාව, ප්‍රයෝගික පරීක්ෂණයෙහි ප්‍රතිඵල යන්න කයිවර්ග පරීක්ෂාවට අනුව හඳුනාගත හැකි විය. මෙහිදී පුද්ගලයකුට සේවා නියුක්තිකයකු වීම සඳහා බලපෑම් කළ සාධකයන්ගේ බලපෑමේ ප්‍රමාණය තීරණ කිරීම සඳහා logistic ප්‍රතිපායන ආකෘතියක් නිර්මාණය කළ අතර හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව හැර අනෙකුත් සියලුම සාධකයන් හා සේවා නියුක්තිය අතර අනුලෝම සම්බන්ධතාවක් දැක ගත හැකි වන අතර එම සාධක පුද්ගල සේවා නියුක්තිය ඉහළ දැමීමට බලපෑම් කරන බවට නිගමනය කළ හැකිය. ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීම සඳහා සාර්ථක විසඳුමක් වන බවට මෙම අධ්‍යයනය ඇසුරින් නිගමනය කළ හැකි විය.*

***මුඛ්‍ය පදඃ බලපෑම, වෘත්තීය අධ්‍යාපනය, සේවා වියුක්තිය, ශ්‍රී ලංකාව***

## 1. හැඳින්වීම

අධ්‍යාපනය යන්න ඉතාමත් වියුක්ත සංකල්පයකි. ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම, රසවිඳීම හා පුහුණුව ආදී විවිධ අදහස් සමුදායක් අධ්‍යාපනය යන්න තුළ ගැබ් වී තිබේ. පුද්ගලයකුගේ සහජ දක්ෂතා ඉස්මතු කිරීමත් ඒවා මනාව ඔපමට්ටම් කොට ඔහුට හෝ ඇයට එහි වටිනාකම ඒත්තු ගැන්වීමත් අධ්‍යාපනය මගින් සිදුවේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය සාර්ව හා සුක්ෂම ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා උපයෝගී කර ගන්නා අංශයක් ලෙස පෙන්වා දිය හැකිය (Ministry of finance, 2012).

වත්මන් සමාජයෙහි විවිධ අධ්‍යාපන ආයතන පවතී. පවුල, පාසල, විශ්වවිද්‍යාල හා කාර්මික විද්‍යාල ආදිය විවිධ වටිනාකම් ලබාදෙයි. මෙම ආයතනවල ව්‍යුහය හා පරිපාලනය අනුව කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. එනම් විධිමත් අධ්‍යාපනය, අවිධිමත් අධ්‍යාපනය හා නොවිධිමත් අධ්‍යාපනයයි. නොවිධිමත් අධ්‍යාපනය යන්න සුවිශේෂ කණ්ඩායමක් ඉලක්ක කරගෙන සුවිශේෂ අරමුණක් සඳහා ලබා දෙනු ලබන අධ්‍යාපනයයි. උදාඃ- රූපලාවන්‍ය පාඨමාලා, පරිගණක තාක්ෂණික පාඨමාලා, බේකරි පාඨමාලා, ඡායාරූපකරණය වේ. මෙම නොවිධිමත් අධ්‍යාපනය වර්තමානය වන විට ඉතාම අත්‍යවශ්‍යය අංගයක් බවට පත් වී තිබේ. මෙයින් බිහිවන්නේ කුසලතාව වැඩි දියුණු කරගත් පිරිසකි (vanetik, 2019). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අධියර 04ක් යටතේ ක්‍රියාත්මක වේ. මුල් ළමාවිය සංවර්ධනය, සාමාන්‍ය පාසල් අධ්‍යාපනය, තෘතීය හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය සහ වෘත්තීය හා කාර්මික අධ්‍යාපනයයි (vanetik, 2019).

ද්විතියික අධ්‍යාපනයෙන් අනතුරු ව මෙරට තරුණ පිරිස් බොහොමයක් දෙනා ඇඳී යන ක්ෂේත්‍රයක් වන්නේ වෘත්තීය අධ්‍යාපනයයි. එය තම අනාගත මංපෙත් හෙළි පෙහෙළි කරන මාවතකට ප්‍රධාන ආලෝක ධාරාවක් ලෙස රට තුළ පිළිගැනීමක් පවතී. ශ්‍රී ලංකාවේ වෘත්තිය අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම සාමාන්‍යය අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව ක්‍රියාත්මක වේ. අධ්‍යාපනයෙන් ඉහළට ගමන් කිරීමට ඉඩප්‍රස්ථාව අහිමි වූ තරුණ තරුණියන්ට රැකියා අවස්ථා පිළියෙල කර ගැනීමට අවශ්‍ය නිපුණතාව ලබාදෙමින් රටේ ශ්‍රම වෙළෙඳපොල ඉල්ලුමට අවශ්‍ය සැපයුම නිර්මාණය කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය ආරම්භ විය (Vocational Trainng Authority, 2018).

ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය පවතින්නේ පාසල් අධ්‍යාපනයෙන් බැහැරවයි. මේ නිසා පාසල් අධ්‍යාපනයේ විභාග සමත් වීමට හෝ විභාග අවසන් වීමට පෙර ශිෂ්‍යයන් තම අනාගත වෘත්තීය පිළිබඳව අවධානය යොමු නොකරන අතර විභාගය අවසන් වීමෙන් පසු තම ආසන්න ම ප්‍රදේශයෙන් ජනප්‍රිය වෘත්තීය පාඨමාලාවකට යොමු වෙයි. මෙරට වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය හොබවන දැවැන්ත රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පුද්ගලික ආයතන ද බොහෝය. වෘත්තීය පුහුණු අධිකාරිය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතනයකි. වෘත්තීය පුහුණු අධිකාරිය දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 258කින් සමන්විත වන අතර ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 229ක් පවතී. දිස්ත්‍රික්ක වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 22ක් සහ ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 7ක් දිවයින පුරා ව්‍යාප්ත වී ඇත. මෙහිදී පාඨමාලා 150කට වැඩි ප්‍රමාණයක් දිවයින පුරා ක්‍රියාත්මක වේ (Vocational Trainng Authority, 2018).

සේවා වියුක්තිය හෙවත් විරැකියාව ඕනෑම රටක් තුළ පවතින ප්‍රධාන ආර්ථික මෙන් ම සමාජ ගැටලුවකි. රැකියාවක් නොමැතිකම යන්න ආර්ථිකමය වශයෙන් පුද්ගලයෙකුට බලපාන ප්‍රධාන ගැටලුවකි. පුද්ගලයකුට රැකියාවක් නොමැති වීමෙන් ආදායමක් නොලැබී යනු ඇත. ආදායමක් නොමැති වූ විට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හැකියාව එනම් ක්‍රය ශක්තිය නොමැති වේ. එවැනි අවස්ථාවක පාරිභෝජනය හා ජීවන තත්වය පහත මට්ටමකට ලක් වේ. එම තත්ත්වය පුද්ගලයෙකුගේ පවුලටත් එම පවුල මගින් ආර්ථිකයටත් බලපෑම් කරන අතර සමස්ථ ආර්ථිකයේ යහපැවැත්ම බිඳ වැටීම කෙරෙහි මෙම තත්ත්වය බලපායි. මේ තත්වය තුළ ආර්ථිකයේ ප්‍රසාරණයක් සිදු නොවේ. එවිට රටක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කළ නොහැකි ය. මේ ආකාරයට ආර්ථික වර්ධනය බිඳ වැටීම සමස්ථ ආර්ථිකයම බිඳ වැටීම කෙරෙහි බලපාන අතර එමගින් රටක ආර්ථික අස්ථායිතා ගොඩ නැගේ. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මුහුණදෙන ප්‍රධානතම ගැටලුවක් නම් පවතින රැකියා අවස්ථා සඳහා විධිමත් පුහුණුව ලැබූ පිරිසේ ඇති හිඟ බවයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික මට්ටම අනෙකුත් රටවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 98.1% කි. එම අගය තුන්වන ලෝකයේ රටකින් අපේක්ෂිත අගයට වඩා වැඩි අගයක් ගන්නා අතර ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ වැඩිම සාක්ෂරතාවය හිමි රට වේ. (Department of Education, 2019).

2017 හා 2018 වර්ෂ අවසානය වන විට පිළිවලින් 120, 871 හා 121, 569 කට ආසන්න පිරිසක් වෘත්තීය අධ්‍යාපනය සම්පූර්ණ කර රැකියා වෙළඳපල වෙත ප්‍රවිශ්ට වී තිබේ (අධ්‍යාපන අමාත්‍යංශ වාර්තා, 2019). ඒ සමඟම 2015 සිට 2019 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත සේවා වියුක්ති අනුපාත පිළිවලින් 4.52%, 4.24%, 4.18%, 4.12% හා 4.2%ක් වේ (Department of Census and Statistics (DCS), 2019). සමස්ත සේවා වියුක්ත අනුපාතයේ විශාල උච්චාවන නොමැති වුවද වසරින් වසර රටේ තරුණ සේවා වියුක්ති අනුපාතයේ ඉහළ යාමක් දක්නට ලැබේ. 2015 සිට 2019 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ සමස්ථ තරුණ සේවා වියුක්ති අනුපාතය පිළිවලින් 18.1%, 18.81%, 20.05%, 21.02% හා 21.23%ක් වේ (Department of Census and Statistics (DCS), 2019). වසරින් වසර වෘත්තීය අධ්‍යාපනය සම්පූර්ණ කර රැකියා වෙළෙඳපොල වෙත ප්‍රවිශ්ට වන පිරිස වැඩි වූවත් වසරින් වසර තරුණ සේවා වියුක්ති අනුපාතය ද සාපේක්ෂව ඉහළ යාමක් දක්නට ලැබේ. එබැවින් මෙහිදී පැනනගින ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීම සඳහා වෘත්තීය අධ්‍යාපනය සාර්ථක විඳුමක් වේද යන්නයි. මෙම ගැටලුව පදනම් කර ගනිමින් වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීමට දක්වන දායකත්වය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ.

**2. සාහිත්‍ය විමර්ශනය**

Blinova, Bylina & Rusanovskiy (2015) සිදු කල අධ්‍යයනයේදී අවධානය යොමු කලේ රුසියානු කලාපවල තරුණ සේවා වියුක්තිය අඩු කිරීමට බලපාන සාධක සඳහා ආනුභවික විශ්ලේෂණ සිදු කිරීමයි. එමෙන්ම මේ සඳහා වෘත්තීය අධ්‍යාපනයේ කාර්යභාරය තක්සේරු කිරීමද මෙහිදී අපේක්ෂා කෙරිණි. මෙම අධ්‍යයනයට අනුව වෘත්තීය අධ්‍යාපනය රුසියානු කලාපවල සේවා වියුක්තිය අවම කිරීමට බලපෑම් ඇති කරන බවට ඔහු පෙන්වා දී තිබේ. කරයි. රුසියානු තරුණ සේවා වියුක්තිය සඳහා තරුණ සේවා නියුක්ති අනුපාතයේ වේගය, ව්‍යුහය, කලාපයේ ආර්ථික සංවර්ධන මට්ටම හා කලාපයේ ජන විකාශනයේ ව්‍යුහය වැනි

සාධක බලපාන බවට අධ්‍යයනය තුළින් ඔහු පෙන්වා දෙන ලදි. Raheem & Ayika (2019) විසින් සිදු කළ අධ්‍යයනයක් මගින් නයිජීරියාවේ තරුණ සේවා වියුක්තිය පිළිබඳ ගැටලු විසඳීම සඳහා වෘත්තීය අධ්‍යාපය හා පුහුණුවේ විභවතාව පිළිබඳ අවධාණය යොමු කොට තිබේ. මොවුන්ට අනුව වෘත්තීය අධ්‍යාපනය ලොව පුරා පිළිගැනීමකට ලක්ව ඇත්තේ තිරසාර සංවර්ධනය හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ජනතාව හා විශේෂයෙන් ම තරුණ තරුණියන් සවිබල ගැන්වීමේ මෙවලමක් ලෙස යි. රැකියා කුසලතාවක් නොමැති තරුණ තරුණියන්ගේ සේවා වියුක්තිය මගින් අනාරක්ෂිත බව, ජීවන හා දේපලවල අවුල් සහගත තත්ත්වය ආදී ගැටලුවලට මුහුණපායි. වෘත්තීය අධ්‍යාපනයේ මෙන් ම පෞද්ගලික අංශයේ සහයෝගය නොමැතිව තරුණ සේවා වියුක්ති ගැටලුවට එරෙහිව ජයග්‍රහණ අපේක්ෂා කළ නොහැකි බව ඔවුන් පෙන්වා දෙයි.

Schmillen (2019) සිය අධ්‍යයනය මගින් වසර 25කට වැඩි කාලයක් ජර්මනියේ වෘත්තීය අධ්‍යාපනයේ උපාධිධාරීන් 800 000කට වැඩි සංඛ්‍යාවක් සොයා ඔවුන්ගේ වෘත්තීය ජීවිතය තුල වෘත්තීය තේරීම හා සේවා වියුක්තිය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ විමර්ෂණය සිදු කරන ලදි. එහිදී ඔහු සෘණාත්මක රැකියා වර්ධනයකින් පීඩා විඳින වෘත්තිකයන් තෝරා ගැනීමට වඩා සේවා වියුක්තිකව සිටින්නන් සංඛ්‍යානමය හා ආර්ථික වශයෙන් බලපෑම් කරන බව සොයා ගෙන තිබේ. ඔහුට අනුව රැකියා වර්ධනයේ අනපේක්ෂිත එක් සම්මත අපගමනයක් අඩු වීම ජීවන චක්‍රයට වඩා දින 110කින් සේවා වියුක්තිය ඉහළ නැංවීමට හේතු වේ.

Saleh (2017) විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය උතුරු මරියානා දූපත්, ගුවාම්, ඇමරිකානු සැවෝමා හා එක්සත් ජනපදයෙහි වර්ජින් දූපත් වල සේවා වියුක්ති අනුපාතය අවම කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපනයේ දායකත්වය පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදි. එම අධ්‍යයනය මගින් වෘත්තීය අධ්‍යාපනය සම්පූර්ණ කළ වයස අවුරුදු 16-44 සහ 45-64 පුද්ගලයින්ගේ ප්‍රතිශතය සේවා වියුක්ති අනුපාතය පහත වැටීමට බලපෑ බව පෙන්වා දිය හැකිය. එමෙන්ම වැඩි කරන ඒකාබද්ධ ඉගෙනුම් ක්‍රම තුලින් සේවා ස්ථානයේ පුහුණුව පිළිබඳව දිරි ගැන්වීමක් සිදු කරන අතරම වැඩ ප්‍රතිපත්ති මගින් ගුණාත්මක වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන සඳහා ප්‍රවේශය පුලුල් කරන බව ඔහු පෙන්වා දී තිබුණි.

Batchuluun et al (2013) විසින් මොන්ගෝලියාවේ තරුණ සේවා වියුක්තිය සඳහා වෘත්තීය අධ්‍යාපනයේ බලපෑම පිළිබඳ අධ්‍යනයක් සිදු කල අතර එමගින් මොවුන් පෙන්වා දුන්නේ සේවා වියුක්තිය අවම කිරීමට වෘත්තීය අධ්‍යාපනයෙන් මහත් පිටුවහලක් ලැබෙන බවයි. එමෙන්ම මොන්ගෝලියාවේ 2000 වර්ෂයේදී තරුණ සේවා වියුක්ත අනුපාතය 22.8% වූ අතර එය 2010 වර්ෂයේදී 20% දක්වා අඩු වී ඇත. මෙම අධ්‍යයනය මගින් මොවුන් පෙන්වා දී තිබුණේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරමින් 2015 වර්ෂය වන විට තරුණ සේවා වියුක්ත අනුපාතය 2.5% දක්වා අඩු කිරීම එරට රජයේ ප්‍රධාන ඉලක්කයක් වූ බවයි.

Gunarathna, M. (2005) විසින් ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව සේවා වියුක්තිය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදි. එම අධ්‍යයනය සඳහා කාලශ්‍රේණි දත්ත හා හරස්කඩ දත්ත උපයෝගි කර ගන්නා ලදි. එම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව මගින් පිරිනමන පාඨමාලාව හා ඊට අදාළව ලැබෙන රැකියාව අතර පුළුල් පරාසයක් ඇති බව අධ්‍යයනය මගින් තහවුරු කර ගෙන ඇති අතරම ශ්‍රී ලංකාවේ රැකියා ඉල්ලුමට ගැළපෙන වෘත්තීය පුහුණුවක් සිසුන්ට නොලැබෙන බව ඔහු අධ්‍යයනය තුළින් පෙන්වා දී තිබේ.

### 3. අධ්‍යයන ක්‍රමවේදය

වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතනයයි. එය දිවයින පුරා පුහුණු මධ්‍යස්ථාන 258කින් සමන්විත වන අතර ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 7ක් දිවයින පුරා ව්‍යාප්ත වී ඇත. ප්‍රධානම ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වන නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව ලැබූවන් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. ඒ අනුව නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ 2015, 2016, 2017, 2018 හා 2019 යන වර්ෂවල වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කර රැකියා වෙළෙඳපොල වෙත ප්‍රවිශ්ඨ වූ සිසුන් මෙම අධ්‍යයනයේ ඉලක්කගත සංගහනය වන අතර වෘත්තීය පුහුණු මධ්‍යාස්ථානයෙහි පවතින පාඨමාලා 25 ප්‍රධාන කොටස්/ස්තෘත 08කට වෙන් කොට සෑම පාඨමාලාවක් ම නියෝජනය වන පරිදි නියැදියක් ලබා ගත් අතර 2015 වර්ෂයේ සිට සෑම වර්ෂයක ම වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ සිසුන්ගෙන් 5% ක් නියෝජනය වන පරිදි නියැදිය තෝරා ගනු ලැබීය. ස්තෘත සසම්භාවී ක්‍රමයට අනුව පාඨමාලා සඳහා නියැදිය තෝරා ගන්නා ලද අතර 2015 සිට 2019 දක්වා වර්ෂවල පිළිවෙලින් 21, 26, 20, 19 හා 18ක් ලෙස ගෙන මෙම අධ්‍යයනය සඳහා ඒකක 104කින් සමන්විත නියැදියක් තෝරා ගන්නා ලදි.


මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත භාවිතා කර ඇති අතර ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් දුරකථන සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් අධ්‍යයනය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගනු ලැබීය. ද්විතික දත්ත රැස් කිරීමේදී ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තා, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්මේන්තුව මඟින් ප්‍රකාශිත වාර්තා සහ නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතනය තුළින් ලබා ගත් වාර්තා මඟින් ද්විතියික දත්ත රැස්කරගනු ලැබීය.

### 4. දත්ත විශ්ලේෂණය

වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරූ වර්ෂය අනුව තෝරා ගත් සිසුන් 104ක නියැදිය ව්‍යාප්ත වී ඇති ආකාරය මෙහිදී දක්වා තිබේ.

මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් සිසුන්ගේ නියැදිය පාඨමාලාව හැදෑරූ වර්ෂ (2015-2019) අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය ප්‍රස්තාර සටහන 1 මගින් නිරූපණය වේ. ඒ අනුව සමස්ත නියැදියෙන් 25%ක් එනම් වැඩිම ප්‍රතිශතයක් 2016 වර්ෂයේදී වෘත්තීය අධ්‍යාපන පාඨමාලාව සම්පූර්ණ කර රැකියා වෙළෙඳපොල වෙත ප්‍රවිශ්ට වූවන් වන අතර 2015 වර්ෂයේදී වෘත්තීය අධ්‍යාපන පාඨමාලාව සම්පූර්ණ කර රැකියා වෙළෙඳපොල වෙත ප්‍රවිශ්ට වී ඇති සිසුන් ප්‍රමාණය නියැදියෙන් 20%කි. 2017 හා 2018 වර්ෂ වන විට එම ප්‍රතිශතය 19% දක්වා අඩු වී ඇති අතර 2019 වර්ෂයේදී සමස්ත නියැදියෙන් 17%කි.


*ප්‍රස්තාර සටහන 1 : වර්ෂ අනුව (2015-2019) වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ සිසුන්ගේ නියැදි ව්‍යාප්තිය*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

මෙම අධ්‍යයනය සඳහා යොදා ගත් නියැදිය නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු ආයතන තුළ පවතින ප්‍රධාන පාඨමාලා අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය ප්‍රස්තාර සටහන 2 මගින් නිරූපණය වේ.


*ප්‍රස්තාර සටහන 1 : හැදෑරූ පාඨමාලා අනුව නියැදි සිසුන්ගේ ව්‍යාප්තිය*




මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

ඒ අනුව සමස්ථ නියැදියෙන් 34%ක් එනම් වැඩිම ප්‍රතිශතයක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව හදාරා ඇති සිසුන් වන අතර මෙම පාඨමාලාවට සාපේක්ෂව ආයතනය තුළ පවතින අනෙකුත් පාඨමාලා හදාරා ඇති සිසුන් ප්‍රමාණයට සාපේක්ෂව පහළ මට්ටමක පවතී. එම සිසුන්ගේ ප්‍රමාණ සමස්ථ නියැදියෙන් 14%, 14%, 11%, 8%, 7% හා 7% ක අගයන් ගනී. එම ප්‍රමාණ පිළිවෙලින් කාර්මික ශිල්පය, හෝටල් හා සංචාරක, මෝටර් කාර්මික, යාන්ත්‍රික ශිල්පය, ඉදි කිරීම් හා කළමණාකරණය යන ක්ෂේත්‍ර නියෝජනය කරයි. සමස්ථ නියැදියෙන් 5% ක් එනම් අඩුම ප්‍රතිශතයක් මුද්‍රණ ශිල්පය හදාරා ඇති සිසුන් වේ.


*ප්‍රස්තාර සටහන 3: වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ සිසුන්ගේ සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2021)

ප්‍රතිචාරකයාගේ සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු ප්‍රස්තාර සටහන 3 මගින් දැක්වේ. මෙහිදී සමස්ත ප්‍රතිචාරකයින් අතරින් වැඩිම පිරිසක් එනම් 61%ක ප්‍රමාණයක් සේවා නියුක්තිකයන් වන අතර 39%ක පිරිසක් සේවා වියුක්තිකයන් වේ.

*ප්‍රස්තාර සටහන 4 :පාඨමාලාව අනුව සිසුන්ගේ සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු*




මූලාශ්‍රය : සමීක්ෂණ දත්ත (2021)

මෙහිදී මුද්‍රණ ශිල්පය පාඨමාලාව හැදෑරූ සියල්ලන් ම සේවා නියුක්තිකයන් බවට පත් වී තිබේ. ඉදිකිරීම් ශිල්පය හා මෝටර් කාර්මික ශිල්පය යන පාඨමාලා හැදෑරූ සිසුන් වැඩි පිරිසක් එනම් පිළිවලින් 71% හා 67%ක පිරිසක් සේවා නියුක්තිකයන් වන අතර හෝටල් හා සංචාර, කාර්මික, තොරතුරු හා සන්නිවේදන, කළමණාකරණය හා යාන්ත්‍රික ශිල්පය යන පාඨමාලා හැදෑරූ ප්‍රතිචාරකයින්ගෙන් වැඩිම පිරිසක් එනම් පිළිවලින් 67%, 53%, 57%, 57% හා 75%ක පිරිසක් සේවා වියුක්තිකයන් වේ.

*වගු අංක 1 : සේවා නියුක්තියට බලපාන සාධකයන්හි කයි වර්ග පරීක්ෂාව*

| | $H_0$ කල්පිතය | P අගය | වෙසෙසියා මට්ටම (Sig) | තීරණය | නිගමනය |
|---|---|---|---|---|---|
| 1 | සේවා නියුක්තිය සඳහා පුමිතිරිභාවය බලපෑම් නොකරයි. | 0.008 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා පුමිතිරිභාවය බලපෑම් කරයි. |
| 2 | සේවා නියුක්තිය සඳහා වයස බලපෑමක් නොකරයි. | 0.232 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. | සේවා නියුක්තිය සඳහා වයස බලපෑමක් නොකරයි. |
| 3 | සේවා නියුක්තිය සඳහා විවාහකත්වය බලපෑම් නොකරයි. | 0.012 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා විවාහකත්වය බලපෑම් කරයි. |
| 4 | සේවා නියුක්තිය සඳහා වෘත්තීය අධ්‍යාපනයට යොමු වීමට පෙර අවසන් කළ අධ්‍යාපන මට්ටම බලපෑම් නොකරයි. | 0.447 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. | සේවා නියුක්තිය සඳහා වෘත්තීය අධ්‍යාපනයට යොමු වීමට පෙර අවසන් කළ අධ්‍යාපන මට්ටම බලපෑම් නොකරයි. |
| 5 | සේවා නියුක්තිය සඳහා පදිංචි ප්‍රදේශය බලපෑම් නොකරයි. | 0.040 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා පදිංචි ප්‍රදේශය බලපෑම් කරයි. |
| 6 | සේවා නියුක්තිය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ වර්ෂය බලපෑම් නොකරයි. | 0.831 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. | සේවා නියුක්තියට වෘත්තීය පුහුණු පාඨමාලාව අවසන් කළ වර්ෂය බලපෑම් නොකරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **7** | සේවා නියුක්තිය සඳහා හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව බලපෑම් නොකරයි. | 0.017 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව බලපෑම් කරයි. |
| **8** | සේවා නියුක්තිය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය බලපෑම් නොකරයි. | 0.016 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය බලපෑම් කරයි. |
| **9** | සේවා නියුක්තිය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරූ කාල සීමාව බලපෑම් නොකරයි. | 0.075 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනියි. | සේවා නියුක්තිය සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරූ කාල සීමාව බලපෑම් නොකරයි. |
| **10** | සේවා නියුක්තිය සඳහා අවසන් ප්‍රතිඵලයෙහි ස්වභාවය (න්‍යායාත්මක) බලපෑම් නොකරයි. | 0.952 | 0.05 | $H_0$ කල්පිතය පිළිගනී. | සේවා නියුක්තිය සඳහා අවසන් ප්‍රතිඵලයෙහි ස්වභාවය බලපෑම් නොකරයි. |
| **11** | සේවා නියුක්තිය සඳහා අවසන් ප්‍රතිඵලයෙහි ස්වභාවය (ප්‍රායෝගික) බලපෑම් නොකරයි. | 0.042 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා අවසන් ප්‍රතිඵලයෙහි ස්වභාවය (ප්‍රායෝගික) බලපෑම් කරයි. |
| **12** | සේවා නියුක්තිය සඳහා පුහුණු කාල සීමාව අතර බලපෑම් නොකරයි. | 0.009 | 0.05 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ. | සේවා නියුක්තිය සඳහා පුහුණු කාල සීමාව අතර බලපෑම් කරයි. |

මූලාශ්‍රය ඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

කයිවර්ග පරීක්ෂාවට අනුව පුද්ගලයකුගේ සේවා නියුක්තියට බලපාන සාධක කිහිපයක් හඳුනා ගත හැකි වන අතර පුමිතිරිභාවය, විවාහකත්වය, පදිංචි ප්‍රදේශය වැනි ප්‍රජා විද්‍යාත්මක සාධක හා වෘත්තීය පුහුණු පාඨමාලාව, පාඨමාලාවෙහි ස්වභාවය, පුහුණු කාල සීමාව, ප්‍රයෝගික පරීක්ෂණයෙහි ප්‍රතිඵල ආදී වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධ සාධක වශයෙන් ප්‍රධාන ආකාර දෙකක් යටතේ පෙන්වා දිය හැකිය.

මෙම සාධක භාවිතයෙන් logit ආකෘතියක් ගොඩ නංවන ලද ආකෘතියට අදාල පරාමිති මත පදනම් වෙමින් එක් එක් සාධකය වෘත්තීය අධ්‍යාපනය හරහා පුද්ගලයකුට සේවා නියුක්තිකයකු වීමට සිදුකරන බලපෑම විස්තර කරයි. මෙම logistic ආකෘතියෙහි පොදු ආකෘතිය පහත ආකාරයට දැක්විය හැකිය.

$$\ln\frac{p}{1-p} = \beta_0 + \beta_1 x_1 + \beta_2 x_2 + \beta_3 x_3 + \beta_4 x_4 + \beta_5 x_5 + \beta_6 x_6 + \beta_7 x_7$$

$$\ln\frac{p}{1-p} = y^*$$

$$y^* = \beta_0 + \beta_1 x_1 + \beta_2 x_2 + \beta_3 x_3 + \beta_4 x_4 + \beta_5 x_5 + \beta_6 x_6 + \beta_7 x_7$$

මෙම ආකෘතියෙහි පරායත්ත විචල්‍ය වන්නේ පුද්ගලයකු සේවා නියුක්ත වීම යන්නයි ඒ අනුව,

රැකියාවක නියුතු වේ - 1

රැකියාවක නියුතු නොවේ - 0 ලෙස දැක්වෙන ද්වීමය විචල්‍යයකි.

මෙහි P යනු සේවා නියුක්ත වීමේ සම්භාවිතාව වේ. සේවා නියුක්ත නොවීමේ සම්භාවිතාව 1- P වේ. ස්වායත්ත විචල්‍ය වන්නේ,

$X_1$ - ස්ත්‍රී පුරුෂභාවය; 0-ස්ත්‍රී 1-පුරුෂ

$X_2$ – විවාහකත්වය; 0-අවිවාහක 1-විවාහක

$X_3$ – පදිංචි ප්‍රදේශය; 0-ග්‍රාමීය 1-නාගරික

$X_4$ – වෘත්තීය පුහුණු පාඨමාලාව; 1-ඉදිකිරීම් ශිල්පය 2-මෝටර් කාර්මික ශිල්පය 3-කාර්මික අංශය 4- හෝටල් හා සංචාරක 5-තොරතුරු සන්නිවේදනය 6-කළමණාකරණය 7-යාන්ත්‍රික ශිල්පය 8-මුද්‍රණ ශිල්පය

$X_5$ - වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය; 1-NVQ නොවන 2-NVQ 3-සහතික පත්‍ර

$X_6$ – පුහුණු කාල සීමාව; 1-මාස 03 හෝ මාස 06 2 වසරකට වැඩි 3-පුහුණුවක් නොමැත

$X_7$ – ප්‍රායෝගික පරීක්ෂණයෙහි ස්වභාවය; 1-සම්පූර්ණ කරමින් පවතී 2-සම්පූර්ණ කර ඇත 3- සම්පූර්ණ කර නොමැත

යනාදිය විචල්‍යයන් ස්වායත්ත විචල්‍යයන් ලෙස යොදාගෙන තිබේ.

ආකෘතියේ සමස්ත වෙසෙසියාව පිළිබඳ පවතින තොරතුරුවලට අනුව (omnibus tests of model coefficients) ආකෘතියේ සියලුම අවස්ථාවන් සඳහා (step, block, model) සමස්ත පුරෝකථන හැකියාව 0.05ට අඩු අගයක් ගන්නා විටදී ($P < 0.05$) ආකෘතියෙහි සමස්ත වෙසෙසියාව සංඛ්‍යානමය වශයෙන් පිළිගැනීමට හැකි වේ ($P=0.000$).

ආකෘතියේ සාරාංශය පිළිබඳ තොරතුරුවලට අනුව cox and snell R square අගය 0.505ක් වන අතර Nagelkerke R Square අගය 0.684කි. මෙම අගයන් ඉතා ඉහළ අගයක් නොවුනද මෙවැනි ප්‍රවර්ග විචල්‍ය සහිත ආකෘති සැලකීමේදී සැලකිය යුතු අගයක් වේ. මේ අනුව මිනුම් දෙකට අනුව වෘත්තීය අධ්‍යාපනය තුළින් සේවා නියුක්තිකයකු වීමට බලපාන විචල්‍යයන් මගින් පරායත්ත විචල්‍ය ප්‍රතිශතයක් ලෙස 50.5% සිට 68.4% දක්වා පරාසයක විස්තර වන බව පැහැදිලි වේ.

වෘත්තීය අධ්‍යාපනය තුළින් පුද්ගලයෙකු සේවා නියුක්තිකයකු වීම හෝ සේවා නියුක්තිකයකු නොවීම ලෙස වෙන් කර දැක්වීමේ නිරවද්‍යතාවය සලකා බැලිය හැකිය. කිසියම් පුද්ගලයෙක් සේවා නියුක්තිකයකු වේ යැයි වෙන්කිරීම 88.9 කින් නිවැරදි බවත් පුද්ගලයෙක් සේවා නියුක්තිකයකු නොවේ යැයි වෙන් කිරීම 85.4 කින් නිවැරදි බවත් නිගමනය කළ හැකිය. මෙය ඉතා ඉහළ අගයකින් නිවැරදි බවට නිගමනය කළ හැකි වන අතර සාමාන්‍යයෙන් මෙම අගය 50 කට වැඩි අගයක් පැවතීම අපේක්ෂා කරයි.

*වගු අංක 2 ඃ Variables in equation වගු සටහන*

| | | B | S.E. | Wald | df | Sig. |
|---|---|---|---|---|---|---|
| Step 1[a] | Gender(1) | 3.062 | .974 | 9.877 | 1 | .002 |
| | Marital_status(1) | 2.309 | .808 | 8.155 | 1 | .004 |
| | Residence_area(1) | 1.490 | .743 | 4.016 | 1 | .045 |
| | Vocationa_training_course | | | 14.253 | 7 | .047 |
| | Vocationa_training_course(1) | -3.881 | 1.913 | 4.117 | 1 | .042 |
| | Vocationa_training_course(2) | -.760 | 1.724 | .194 | 1 | .659 |
| | Vocationa_training_course(3) | -3.709 | 1.868 | 3.941 | 1 | .047 |
| | Vocationa_training_course(4) | -1.345 | 1.540 | .763 | 1 | .382 |
| | Vocationa_training_course(5) | 1.632 | 1.975 | .682 | 1 | .409 |
| | Vocationa_training_course(6) | -5.443 | 2.171 | 6.284 | 1 | .012 |
| | Vocationa_training_course(7) | -21.186 | 16848.644 | .000 | 1 | .999 |
| | nature_of_the_course | | | 9.527 | 2 | .009 |
| | nature_of_the_course(1) | 3.567 | 1.339 | 7.096 | 1 | .008 |
| | nature_of_the_course(2) | 3.219 | 1.091 | 8.706 | 1 | .003 |
| | nature_of_the_final_result_practical | | | 7.534 | 2 | .023 |
| | nature_of_the_final_result_practical(1) | 2.558 | 1.737 | 2.169 | 1 | .141 |
| | nature_of_the_final_result_practical(2) | 4.038 | 1.566 | 6.647 | 1 | .010 |
| | time_taken_for_training | | | 9.628 | 2 | .008 |
| | time_taken_for_training (1) | .312 | .957 | .107 | 1 | .744 |
| | time_taken_for_training (2) | 2.828 | .958 | 8.726 | 1 | .003 |
| | Constant | -8.716 | 2.795 | 9.726 | 1 | .002 |

මූලාශ්‍රය ඃ නියැදි සමීක්ෂණ දත්ත (2021)

මෙම වගු සටහන 2ට අනුව වෘත්තීය අධ්‍යාපනය හරහා සේවා නියුක්තිකයකු වීමේදී බලපානු ලබන සාධක 95% වෙසෙසියා මට්ටම යටතේ වෙසෙසි වන අතර මෙම අනුව්‍යාජ විචල්‍යයන්හි පවතින ප්‍රවර්ගයන්හි යම් යම් ප්‍රවර්ගයන් 95% වෙසෙසියා මට්ටම යටතේ වෙසෙසි නොවේ. එම වෙසෙසි නොවන සාධක හැර අනෙකුත් සාධක යොදා ගනිමින් ආකෘතිය ගොඩ නංවා තිබේ. අනුව්‍යාජ විචල්‍යයන්හි ප්‍රවර්ග අතරින් පුමිතිරිභාවයෙහි ස්ත්‍රී, විවාහකත්වයෙහි අවිවාහක, පදිංචි ප්‍රදේශයෙහි ග්‍රාමීය, වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ඉඳි කිරීම් පාඨමාලාව, පාඨමාලාවෙහි ස්වභාවයෙහි NVQ නොවන පාඨමාලාව, වෘත්තීය පුහුණු කාල සීමාවෙහි මාස 03ක් හෝ මාස 06ක පුහුණුවක් හා ප්‍රයෝගික පරීක්ෂණයෙහි සම්පූර්ණ කරමින් පවතී යන ප්‍රවර්ගයන් පදනම් ප්‍රවර්ගයන් වන අතර ආකෘතියෙහි අන්තඃඛණ්ඩය මගින් එය නිරූපණය වේ. ඒ අනුව ගොඩ නංවන ලද logistic ආකෘතිය පහත පරිදි දැක්විය හැකිය.

Employment = -8.716+ 3.062(Gender1) +2.309(Marital Status1) +1.490(residence 1)
(0.002) (0.002) (0.004) (0.045)
-3.881(VTA course 1) -3.709(VTA course 3) -5.443(VTA course 6)
(0.042) (0.047) (0.012)
+ 3.567(Nature of the course1) + 3.219(Nature of the course2)
(0.008) (0.003)
+4.038(Nature of practical exam2)+2.828(Time taken for training peried2)
(0.010) (0.003)

ඉහත ආකාරයට logit ආකෘතියක් ඇස්තමේන්තු කළ හැකි අතර වෘත්තීය අධ්‍යාපනය තුළින් පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම හා සේවා නියුක්තියට බලපාන සාධක අතර ධන හා ඍණ සම්බන්ධතාවයන් දැකගත හැකිය. මේ ආකාරයට ආකෘතිය අර්ථ දැක්වීමේදී අදාළ හව්මාන අනුපාතිකයෙහි ලඝු අගයෙහි සිදුවන වෙනස්වීම් පිළිබඳ පමණක් අවබෝධයක් ලබා ගත හැකිය. ඇස්තමේන්තු කරන ලද ප්‍රතිපායන සංගුණකයන්හි ප්‍රතිලඝු ගැනීමෙන් හව්මාන අනුපාතිකයෙහි අගය ගණනය කළ හැකිය.

$$\frac{P}{1-P} = e^{-8.716}.e^{3.062}.e^{2.309}.e^{1.490}.e^{-3.881}.e^{-3.709}.e^{-5.443}.e^{3.567}.e^{3.219}.e^{4.038}.e^{2.828}$$

*වගු අංක 3: ප්‍රතිපායන සංගුණකයන්හි ප්‍රතිලඝු*

| අංකය | සාධකය | P අගය | 1-P අගය |
|---|---|---|---|
| 01 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා පුමිතිරිභාවයෙහි බලපෑම | $P = \frac{e^{3.062}}{1+e^{3.062}} = 0.9553$ | 0.0447 |
| 02 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා විවාහකත්වයෙහි බලපෑම | $P = \frac{e^{2.309}}{1+e^{2.309}} = 0.9096$ | 0.0904 |

| | | | |
|---|---|---|---|
| 03 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා පදිංචි ප්‍රදේශයෙහි බලපෑම | $P = \frac{e^{1.490}}{1 + e^{1.490}} = 0.8161$ | 0.1839 |
| 04 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා පාඨමාලාවෙහි බලපෑම | $P = \frac{e^{-3.881}}{1 + e^{-3.881}} = 0.0202$ | 0.9798 |
| | | $P = \frac{e^{-3.709}}{1 + e^{-3.709}} = 0.0239$ | 0.9761 |
| | | $P = \frac{e^{-5.443}}{1 + e^{-5.443}} = 0.0043$ | 0.9957 |
| 05 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා පාඨමාලාවෙහි ස්වභාවයෙහි බලපෑම | $P = \frac{e^{3.567}}{1 + e^{3.567}} = 0.9725$ | 0.0275 |
| | | $P = \frac{e^{3.219}}{1 + e^{3.219}} = 0.9615$ | 0.0385 |
| 06 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයෙහි බලපෑම | $P = \frac{e^{4.038}}{1 + e^{4.038}} = 0.9827$ | 0.0173 |
| 07 | පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම සඳහා පුහුණු කාලයෙහි බලපෑම | $P = \frac{e^{2.828}}{1 + e^{2.828}} = 0.9442$ | 0.0558 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණ දත්ත (2021)

සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට පුම්තිරිභාවය (ස්ත්‍රී පුරුෂ භාවය) වෙනස් වීම තුළින් සේවා නියුක්තිය 0.9553ක සම්භාවිතාවයකින් (95.53%) ඉහළ යයි. පුම්තිරිභාවය වෙනස් වීම පුද්ගලයකුගේ සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. මෙහිදී ස්ත්‍රීය විවාහය, දරුවන් ලැබීම වැනි හේතුන් මත සේවා නියුක්තිකයන් වීම අවම මට්ටමක පවතින අතරම පුරුෂයා සෑම විටම සේවා නියුක්තිය අපේක්ෂාවෙන් සිටියි. පවුලක් නඩත්තු කිරීමේ හැකියාව පුරුෂයකු සතු විය යුතු අතරම ඒ සඳහා ඔවුන්ට රැකියාවක් තිබීම අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වී තිබේ. වෘත්තීය පාඨමාලා මගින් ලැබෙන යම් යම් රැකියා අවස්ථා ස්ත්‍රීන්ට සහභාගි විය නොහැකි අතර එවැනි අවස්ථාවලදී පුරුෂයන් හට වැඩි ඉඩකඩක් හිමි වේ. මේ නිසා පුම්තිරිභාවය වෙනස් වීම සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි.

සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විටදී විවාහකත්වය වෙනස් වීම තුළින් 0.9096ක සම්භාවිතාවයකින් (90.96%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. විවාහක අවිවාහක බව වෙනස් වීම පුද්ගලයකුලේ සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. මෙහිදී පුද්ගලයකු විශේෂයෙන් පුරුෂයකු විවාහ වීමත් සමඟ පවුලේ ආර්ථිකය ශක්තිමත් කරගත යුතුය. තම පවුල පෝෂණය කිරීම සඳහා ස්ථිර ආදායම් මාර්ගයක් පැවතිය යුතුය. මේ නිසා විවාහකත්වය වෙනස් වීම සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විටදී පදිංචි ප්‍රදේශය වෙනස් වීම තුළින් 0.8161ක සම්භාවිතාවයකින් (81.61%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. පුද්ගල සේවා නියුක්තිය ඉහළ යාමට පුද්ගලයා පදිංචි ප්‍රදේශය බලපායි. විශේෂයෙන් විශාල වශයෙන් රැකියා අවස්ථා ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂව නාගරික ප්‍රදේශ තුළ ස්ථානගත වීම හේතුවෙන් නාගරික ප්‍රදේශවල පදිංචි පුද්ගලයින් පහසුවෙන්ම රැකියා සඳහා යොමු වේ. මේ හේතුවෙන් පදිංචි ප්‍රදේශය වෙනස් වීම සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි.

සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව (මෝටර් කාර්මික ශිල්පය) වෙනස් වන විටදී, සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් 0.0202ක සම්භාවිතාවයකින් (2.02%) පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව වෙනස් වීම තුළින් සේවා වියුක්තිකයන් වීම 97.98% ක් වේ. මෙහිදී විවිධ පාඨමාලාවන් වෘත්තීය අධ්‍යාපනය තුළ පවතින අතර විවිධ පාඨමාලාවන් සඳහා රැකියා වෙළඳපලෙහි ඇති ඉල්ලුම විවිධ වේ. ඉල්ලුම අඩු පාඨමාලාවල නිරතවීමෙන් විශාල වශයෙන් සේවා නියුක්තකයන් බිහි වේ. මේ හේතුවෙන් හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාව සේවා නියුක්තිය පහළ යාමට බලපෑම් කරයි. මෙහිදී සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව (හෝටල් හා සංචාර) වෙනස් වන විටදී, සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් 0.0239ක සම්භාවිතාවයකින් (2.39%) පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව වෙනස් වීම තුළින් සේවා වියුක්තිකයන් වීම 97. 61% ක් වේ. මෙහිදී සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව (යාන්ත්‍රික ශිල්පය) වෙනස් වන විටදී, සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාව වෙනස් වීම තුළින් 0.0043ක සම්භාවිතාවයකින් (0.43%) පුද්ගල සේවා නියුක්තිය පහළ යයි. මෙහිදී පාඨමාලාව වෙනස් වීම තුළින් සේවා වියුක්තිකයන් වීම 99. 57% ක් වේ.

සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. මෙහිදී පාඨමාලාවෙහි ස්වභාවය (NVQ) වෙනස් වන විටදී, සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය වෙනස් වීම තුළින් 0.9725ක සම්භාවිතාවයකින් (97.25%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. මෙහිදී පාඨමාලාවෙහි ස්වභාවය වෙනස් වීම සේවා නියුක්තිකය ඉහළ යාමට බලපෑම් කරයි. විශේෂයෙන්ම රැකියා වෙළඳපල තුළ NVQ මට්ටමක් සහිත පාඨමාලා සම්පූර්ණ කර ඇති පුද්ගලයන් හට ඉතාමත් පහසුවෙන් රැකියා අවස්ථා ලබා ගත හැකිය. මේ හේතුවෙන් හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. මෙහිදී සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. මෙහිදී පාඨමාලාවෙහි ස්වභාවය (සහතික පත්‍ර) වෙනස් වන විටදී, සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට හදාරනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාවෙහි ස්වභාවය වෙනස් වීම තුළින් 0.9615ක සම්භාවිතාවයකින් (96.15%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි.

සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී හදාරා ඇති ප්‍රායෝගික පරීක්ෂණයෙහි ස්වභාවය වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට ප්‍රායෝගික පරීක්ෂණයෙහි ස්වභාවය වෙනස් වීම තුළින් 0.9827ක සම්භාවිතාවයකින් (98.27%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. මෙහිදී අනෙකුත් පුද්ගලයන්ට සාපේක්ෂව ප්‍රායෝගික පරීක්ෂණය අවසන් කර ඇති පුද්ගලයන්ය හට රැකියා ලබා ගැනීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබේ. මේ නිසා අවසන් ප්‍රායෝගික පරීක්ෂණයෙහි ස්වභාවය සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධකයන්හි පුරෝකථන අගයන් නොවෙනස්ව තිබියදී පුහුණු කාලය වෙනස් වීම තුළින් පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. සේවා නියුක්තිකයකු වීමට බලපානු ලබන අනෙකුත් සාධක නියතව පවතින විට පුහුණු කාලයෙහි ස්වභාවය වෙනස් වීම තුළින් 0.9442ක සම්භාවිතාවයකින් (94.42%) පුද්ගල සේවා නියුක්තිය ඉහළ යයි. මෙහිදී පුහුණු කාලයක් සම්පූර්ණ නොකළ පුද්ගලයන්ට සාපේක්ෂව පුහුණුව වසරක් ඊට වැඩි කාලයක් සම්පූර්ණ කළ පුද්ගලයන්ට වැඩි රැකියා අවස්ථාවන් උදා වේ. මේ නිසා පුහුණු කාල පරිච්ඡේදය සේවා නියුක්තිය ඉහළ යාමට බලපෑම් කරයි. මෙහිදී වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවෙහි බලපෑම යන සාධකය හැර අනෙකුත් සියලුම සාධක සේවා නියුක්තිය ඉහළ දැමීමට හේතු වේ. මෙසේ මෙම සාධක මගින් පුද්ගල සේවා නියුක්තිය ඉහළ යෑම මගින් වෘත්තීය අධ්‍යාපනය සේවා වියුක්ති ගැටලුව විසඳීමට සාර්ථක විසඳුමක් වන බවට නිගමනය කළ හැකිය.

**5. සමාලෝචනය**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීමට දක්වන දායකත්වය අධ්‍යයනය කිරීමයි. මෙහිදී වෘත්තීය අධ්‍යාපනය සේවා වියුක්ති ගැටලුව සඳහා සාර්ථක විසඳුමක් වීමට නම් වෘත්තීය අධ්‍යාපන

පාඨමාලා හදාරන පිරිසෙන් වැඩි ප්‍රමාණයක් සේවා නියුක්තිකයන් විය යුතුය. මෙහිදී 104ක් වන සමස්ත ප්‍රතිචාරකයින් අතරින් 63 දෙනෙකු එනම් 61%ක පිරිසක් සේවා නියුක්තිකයන් වී තිබේ. සමස්ත ප්‍රතිචාරකයින් අතරින් වැඩිම පිරිසක් සේවා නියුක්තිකයන් වේ. එමෙන්ම සමස්ත සේවා නියුක්තිකයන් අතරින් 58.73%ක පිරිසක්ම සේවා නියුක්තිකයන් වී ඇත්තේ හදාරා ඇති වෘත්තීය පුහුණු පාඨමාලාවට අනුවයි. වෘත්තීය අධ්‍යාපනය තුළින් පුද්ගලයකු සේවා නියුක්තිකයකු වීම හා ඒ සඳහා බලපෑම් කරනු ලබන සාධකයන්හි බලපෑමේ ප්‍රමාණය අධ්‍යයනය කිරීම සඳහා logistic ප්‍රතිපායන ආකෘතියක් ගොඩ නංවන ලදි. එම ආකෘතියට අනුව අදාල වෘත්තීය පුහුණු පාඨමාලාව හැර අනෙකුත් සියලුම සාධකයන් එනම් පුමිතිරිභාවය, විවාහකත්වය, පදිංචි ප්‍රදේශය වැනි ප්‍රජා විද්‍යාත්මක සාධක හා පාඨමාලාවෙහි ස්වභාවය, පාඨමාලාව හැදෑරූ කාල සීමාව, පුහුණු කාල සීමාව, ප්‍රයෝගික පරීක්ෂණයෙහි ප්‍රතිඵල ආදී වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධ සාධක සේවා නියුක්තිය ඉහළ දැමීමට හේතු වී තිබේ. මෙම සෑම සාධකයක්ම 80%කට වැඩි එනම් 0.8ට වඩා වැඩි සම්භාවිතාවකින් සේවා නියුක්තිය ඉහළ දැමීම සඳහා බලපෑම් කරයි. මේ හේතුව මතද මෙම වෘත්තීය අධ්‍යාපනය තුළින් සේවා නියුක්තිය ඉහළ දැමීමට විශාල දායකත්වයක් ලබා දෙන බවට නිගමනය කළ හැකිය. ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටලුව විසඳීම සඳහා වෘත්තීය අධ්‍යාපනය ඉතාමත් ඉහළ දායකත්වයක් ලබා දෙන බවට නිගමනය කළ හැකිය. එමෙන්ම සේවා වියුක්තිය අවම කිරීමේ අරමුණින් ආරම්භ වූ මෙම වෘත්තීය අධ්‍යාපන සංකල්පය වර්තමානය වන විට එම අරමුණ ව්‍යර්ථ වීමට නොදී තවමත් පවත්වාගෙන යන බව පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීම සඳහා සාර්ථක විසඳුමක් වන බවට මෙම අධ්‍යයනය ඇසුරින් නිගමනය කළ හැකිය.

අධ්‍යයනයේ සොයා ගැනීම් පදනම් කරගෙන නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කළ හැකිය. වෘත්තීය අධ්‍යාපනය පාසල් අධ්‍යාපන ක්‍රමයෙන් බැහැරව ක්‍රියාත්මක නොකර එය පාසල් අධ්‍යාපනයත් සමඟ බද්ධව ක්‍රියාත්මක කිරීම, පාසල් අධ්‍යාපනයෙන් පසුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය, ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය ආදිය සම්බන්ධ කර ගනිමින් වෘත්තීය අධ්‍යාපනයෙහි වැදගත්කම පිළිබඳව සමාජය හා පාසල් දැනුවත් කිරීම, දෙමාපියන් තුළ ද වෘත්තීය පුහුණුව පිළිබඳ ධනාත්මක ආකල්ප ඇති කිරීම, වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ සමාජය තුළ නිර්මාණය වී ඇති පටු ආකල්පයන් ඉවත් කර එහි ඇති වැදගත්කම පිළිබඳ දැන්වත් කිරීම, වෘත්තීය පුහුණුවෙහි ප්‍රධාන ඉලක්ක ගත කණ්ඩායම පාසල් හැරගිය රැකියා නොමැති පිරිස වුවත් මෙම පිරිස පමණක් කේන්ද්‍ර කර නොගෙන දෙමාපියන්, ගුරුවරුන්, පාසල් සිසුන් මේ පිළිබඳව දැනුවත් කිරීම එම නිර්දේශ වේ. වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවෙහි තරුණ සේවා නියුක්තිය සඳහා විශාල දායකත්වයක් ලබා දෙන අතරම වෘත්තීය අධ්‍යාපනය ශ්‍රී ලංකාවෙහි තරුණ සේවා වියුක්ති ගැටලුව සඳහාද සාර්ථක විසඳුමක් වන බවට අධ්‍යයනය ඇසුරින් නිගමනය නිගමනය කරන ලදි.

## ආශ්‍රිත ග්‍රන්ථ


Batchuluun.et.al (2013). Effect of vocational training for youth unemployment. *Foundation and trends in microeconomics*, 9(1-2), 1-157. Retrieved from: https://dx.doi.org/10.1561/0700000058

Blinova, T., Bylina, S., & Rusanovskiy, V. (2015). Vocational education in the system of determinants of reducing youth unemployment: Interregional Comparisons. *Procedia-Social and Behavioral Sciences*, *214*, 526-534. Retrieved from: https://www.sciencedirect.com/science/article/pii/S187704281506111X

Dep artment of Census and Statistics, (2019). Labor force survey annual report 2019. Retrievedfrom:http://www.statistics.gov.lk/Resource/en/LabourForce/Annual_Reports/LFS2019.pdf

Department of Education, (2019). Annual Report 2018-19. Retrieved from: https://www.education.wa.edu.au/dl/ok3x61p

Gunarathna, M. (2005). Unemployment and vocational education Sri Lanka experience. *Proceedings of the annual research symposium*, Retrieved from: http://repository.kln.ac.lk/handle/123456789/2597

Ministry of Finance (2012). Annual report 2012. Retrieved from: http://treasury.gov.lk/documents/10181/12870/2012/ff6bcb87-3e8d-4af0-b9d6-d67c57e81f38

Saleh, I. (2017). The role of vocational training in reducing unemployment rate in outlying states of United States of America. *Sociology*, Retrieved from: https://www.voced.edu.au/content/ngv%3A77552

Schmillen, A. (2019). Vocational education, occupational choice and unemployment professional career. *Empire Econ,* **57,** 805–838. Retrieved from: https://doi.org/10.1007/s00181-018-1484-x

Vaneti, Y. (2019). Types of education. Retrieved from: https://www.througheducation.com/the-different-types-of-education/

Vocational Training Authority (2018). Annual report 2018. Retrieved from: http://www.tvec.gov.lk/wp-content/uploads/2018/10/NSDR-2016-17-Draft-Report.pdf

# තරුණ සේවා වියුක්තිය කෙරෙහි බලපාන සාධක
# (ගාල්ල දිස්ත්‍රික්කය ඇසුරින්)

පී. ඒ. ඒ. මධුහංසනි

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
madhuhansani97@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාව තුළ සමාජ, ආර්ථික මෙන් ම පුද්ගලයින්ගේ මානසික තත්ත්වයටද බලපෑම් එල්ල කරනු ලබන බහුවිධ ගැටලුවක් ලෙස තරුණයන් අතර පවතින සේවා වියුක්ති ගැටලුව පෙන්වා දිය හැකි ය. එම ගැටලුව ශ්‍රී ලංකාවේ එක් එක් ප්‍රදේශ තුළ අඩු වැඩි වශයෙන් පවතින බව ද කිව හැක ය. මෙම අධ්‍යයනයේ අරමුණ තරුණ සේවා වියුක්ති ගැටලුව ඇති වීම කෙරෙහි බලපෑම් කරනු ලබන සාධක හඳුනා ගැනීමයි. තරුණ සේවා වියුක්තිය ඉහළ අගයක් වාර්තා වන ප්‍රදේශයක් විම සැළකිල්ලට ගනිමින් ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්කුඹුර, පණුගල්ගොඩ, ඉඳුරන්නාවිල, අන්දුගොඩ හා හොරදූගොඩ යන ග්‍රාම සේවා වසම්වල තරුණ ප්‍රජාව අතුරින් වයස අවුරුදු 15ත් 29ත් අතර 50කුගෙන් සමන්විත සසම්භාවී නියැදියක් තෝරා ගත් අතර ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස් කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, කයි වර්ග පරීක්ෂාව, සාධක විශ්ලේෂණය යන ඒවා යොදා ගන්නා ලදි. කයි වර්ග පරීක්ෂාව තුළින් තරුණයින් අතර සේවා වියුක්තිය ඇති වීම කෙරෙහි ස්ත්‍රී-පුරුෂභාවය, වයස හා පවුලේ මාසික ආදායම යන විචල්‍යයනුත්, කුටුම්භය සතු ප්‍රමාණවත් ආදායම, පුද්ගල බලපෑම්, අයහපත් සෞඛ්‍යය තත්ත්ව, විවාහයේ බලපෑම, රැකියාවක් කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිකම, අධ්‍යාපන කටයුතුවල නිරතවීම, කුසලතා ප්‍රමාණවත් නොවීම, පුද්ගල ආකල්ප, අනාගත අපේක්ෂාවන්, අතෘප්තිමත්භාවය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ දේශපාලන මැදිහත්වීම් යන විචල්‍යයනුත් බලපෑම් කරන බව නිගමනය කළ හැකි විය. මෙහිදී එළඹෙන ලද ප්‍රධානතම නිගමනය වූයේ මෙම වයස් කාණ්ඩයේ පුද්ගලයින් බොහොමයක් අධ්‍යාපන කටයුතුවල නිරත වන බැවින් සේවා වියුක්තිය ඉහළ වන බවයි. තරුණයන් අතර සේවා වියුක්තිය අවම කිරීමට රැකියා වෙළෙඳපොල නීති ලිහිල් කිරීම, පාසල් හා විශ්වවිද්‍යාල විෂය ක්ෂේත්‍ර පුළුල් කිරීම, පාසලෙන්ම මූලිකත්වය ගනිමින් වෘත්තීය පුහුණුවක් ලබා දීම, පාසල් අධ්‍යාපනය ලබන වසර ගණන අවම කිරීම, විධිමත් අංශයේ නව රැකියා උත්පාදනය හා දේශපාලන මැදිහත්වීම් වැළැක්වීම, රැකියා වෙළඳපොලේ ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවයට අදාළ නිති හා රෙගුලාසි ශක්තිමත් කිරීම, ස්වයං රැකියා සඳහා තරුණයන් දිරි ගැන්වීම වැනි පියවර ගත යුතු බව යෝජනා කළ හැකිය.*

***මුඛ්‍ය පද : සේවා වියුක්තිය, තරුණයන්, සාධක විශ්ලේෂණය, වෙළෙඳපොල,*** *රැකියා*

**1. හැඳින්වීම**

රජය මුහුණ දෙන වඩාත් ම අභියෝගාත්මක ආර්ථික ගැටලුව වන්නේ විරැකියාව යි. මෙය සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වේ. විරැකියාව යනු පුද්ගලයෙකුට ඕනෑම ආකාරයක රැකියාවක් සොයා ගැනීමට ඇති නොහැකියාවයි.

විරැකියාව සෑම ජාතියකටම අභියෝග කරන ගෝලීය ප්‍රශ්නයකි. එය මානව ප්‍රග්ධනයේ ඌන උපයෝගීතාව නියෝජනය කරන අතර එය රටේ සංවර්ධනයේ ගුණාත්මකභාවයට බලපෑම් එල්ල කරනු ලැබේ (Duguma & Tolcha, 2019). විරැකියාව යනු ආර්ථික, දේශපාලනික හා සමාජීය මානයන් සම්බන්ධ වන බහුමාන සංකල්පයකි. එය එක් එක් ප්‍රදේශයන්හි ආර්ථිකය, සමාජ සැකසුම, සංස්කෘතිය සහ අධ්‍යාපන ක්‍රමය මත රඳා පවතින බැවින් එය නිර්වචනය කිරීම හා මැනීම දුෂ්කර සංකල්පයකි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව විරුකියාව යනු කෙටි කාල සීමාව තුළ පැයකට වඩා වැඩ නොකළ නමුත් වැඩ සඳහා ලබා ගත හැකි සහ ක්‍රියාශීලීව සේවය කරන පුද්ගලයන්ය (Kiphesha & Msigwa, 2013).

සේවා වියුක්තියේ එක් විශේෂ ලක්ෂණයක් ලෙස තරුණයන් අතර පවතින සේවා වියුක්ති ගැටලුව දැක්විය හැකිය. සමාජ, ආර්ථික සංවර්ධනය නංවාලීම සඳහා රටකට තිබෙන වැදගත්ම බලවේගය හා සම්පත අතර තාරුණ්‍යය අවිවාදිතය. විශාල සංඛ්‍යාවක් වීමට අමතරව, තරුණයින් ජවසම්පන්න, ධෛර්ය සම්පන්න වන අතර රටේ ආර්ථික කටයුතුවලට හොඳින් සම්බන්ධීකරණය හා සම්බන්ධ වී සිටී නම් සමාජ අර්ථික සංවර්ධනයේ වෙනස්කම් කළ හැකි නව අදහස් ඉදිරිපත් කරයි. එබඳු වැදගත්කමක් තිබියදීත්, තරුණ තරුණියන් බොහෝ අභියෝගයන්ට මුහුණ දී තිබේ. ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන ප්‍රධාන අභියෝග අතර තරුණ විරැකියාව ද වේ (Kiphesha & Msigwa, 2013).

තරුණයින්ගේ විරැකියාව හේතුවෙන් මන්දපෝෂණය, මානසික රෝග සහ ආත්ම විශ්වාසය බිඳ වැටීම, මානසික අවපීඩනයට හේතුවන බව හෙළි වී ඇත. එමෙන්ම සමාජ හා පවුල්වලට ආතතියක් ගෙන දෙන අතර තරුණයින්ගේ අධ්‍යාපනය සඳහා ඉහළ ආයෝජනයක් කිරීමෙන් පසු ඔවුන් රැකියාවල නිරත වනු ඇතැයි අපේක්ෂා කරන අතර ඒ හේතුවෙන් පවුල තුළ ගැටුම් ද ඇති වේ. සාපරාධී ක්‍රියාකාරකම්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම් සහ ගණිකා වෘත්තියේ යෙදීම සඳහා රැකියා නොමැති තරුණ තරුණියන් යොමු වීම සිදු වේ. අප්‍රිකානු මහද්වීපයේ තරුණ විරැකියාව බොහෝ තරුණ තරුණියන්ට අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදීම කෙරෙහි බෙහෙවින් බලපෑම් කර ඇත (Kipesha & Msigwa, 2013). ගෝලීය වශයෙන් සැලකූ විට 2019 වර්ෂයේ වයස අවුරුදු 15 ත් 24 ත් අතර වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය 15.391 ක අගයක් ලෙස වාර්තා වී ඇත (Worldbank, 2019). සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙන්ම සංවර්ධිත රටවලට ද මෙය විශාල ගැටලුවක් බවට පත් වී ඇත. ශ්‍රී ලංකාව තුළ 1963, 1973, 1978/1979, 1981/1982, 1986/1987 වර්ෂවල පාරිභෝගික මූල්‍ය සමීක්ෂණ වාර්තාවන්ට අනුව මුළු සේවා වියුක්තියෙන් 70% කට වඩා වැඩි පිරිසක් අවුරුදු 15-24 වයස් කාණ්ඩයට අයත් වේ *(රත්නායක, nd).* රටක සංවර්ධන ක්‍රියාවලිය සාර්ථක වීමට නම් මානව ප්‍රාග්ධනය නිසි ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. ඒ අනුව සංවර්ධන ක්‍රියාවලිය සඳහා තරුණයින්ගේ සහභාගීත්වය පුළුල් කළ යුතුය. එනම් තරුණයන් අතර පවතින සේවා වියුක්ති ගැටලුව අවම කිරීමට පියවර ගත යුතුය. එහිදී ගැටලුවට විසඳුම් සෙවීමට පෙර එම ගැටලුව ඇති වීමට බලපාන සාධක හඳුනා ගත යුතුය. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් තරුණයන් අතර පවතින විරැකියාවට බලපාන සාධක හඳුනා ගැනීම අරමුණු කරන අතර රටේ සංවර්ධනය සහතික කිරීම සඳහා තරුණයන් අතර සේවා වියුක්ති ගැටළුව සඳහා විසඳුම් යෝජනා කිරීමට ද අපේක්ෂා කෙරේ.

## 2. සාහිත්‍ය විමර්ශනය

Andrew (2015) විසින් දකුණු අප්‍රිකාවේ තරුණ විරැකියාව පිළිබඳව ද්විතීයික දත්ත පමණක් පදනම් කරගනිමින් අධ්‍යයනයක් සිදු කර ඇති අතර එහිදී වයස අවුරුදු 15 ත් 35 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින් අතර පවතින විරැකියාව පිළිබඳව අධ්‍යයනය කර ඇත. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය දකුණු අප්‍රිකාවේ තරුණ තරුණියන්ගේ අධ්‍යාපන මට්ටම හා විරැකියාව අතර පවතින සබඳතාවය අධ්‍යයනය කිරීමයි. ඒ අනුව එරට පවතින අධ්‍යාපන ක්‍රමයේ කුසලතා සංවර්ධනය ප්‍රශස්ත නොවන බව, ශ්‍රම වෙළෙඳපොලට එකවර තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් ඇතුළු වීම, එරට බොහෝ පළාත්වල අහිතකර ආර්ථික තත්ත්ව, සේවා ස්ථාන කුසලතා??? නොමැතිකම හා රැකියා ස්ථානගත කිරීම සඳහා සමාජ ප්‍රාග්ධනය නොමැති වීම යනාදී සාධක දකුණු අප්‍රිකාවේ තරුණ විරැකියාව සමඟ සබඳතා පවත්වන බව නිගමනය කර ඇත.

Kipesha & Msigwa (2013) විසින් ටැන්සානියාව ආශ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල තරුණ සේවා වියුක්ත නිර්ණායක පිළිබඳව අධ්‍යයනයක් සිදු කර ඇත. මෙම අධ්‍යයනය ද ද්විතීයික දත්ත මත සිදු කර ඇති අතර මූලික අරමුණ වී ඇත්තේ ටැන්සානියාවේ තරුණ සේවා වියුක්තිය ඇති වීමට බලපාන සාධක හඳුනා ගැනීමයි. ඒ අනුව අරමුණට අදාළව රැස් කරගත් දත්ත Multinomial Logistic Regression Model භාවිතයෙන් විශ්ලේෂණය කර ඇති අතර එහිදී ස්ත්‍රී-පුරුෂභාවය, භූගෝලීය පිහිටීම, අධ්‍යාපනය, කුසලතා හා විවාහක තත්ත්වය යන විචල්‍ය තරුණ සේවා වියුක්තිය කෙරෙහි බලපාන බව නිගමනය කර ඇත.

Ali & Jabeen (2016) විසින් සැම්බියාව ඇසුරින් තරුණ විරැකියාවේ නිර්ණායක යනුවෙන් අධ්‍යයනයක් සිදු කර ඇත. එහිදී සැම්බියාවේ සංවර්ධිත, අඩු සංවර්ධිත හා සංවර්ධනය නොවූ ප්‍රදේශවලට අයත් වන ලෙස පිළිවෙලින් කුපර්බෙල්ට් (Copperbelt), ලුවාපුලා (Luapula) හා දක්ෂිණ (Southern) ප්‍රදේශ අධ්‍යයන ප්‍රදේශය ලෙස යොදා ගෙන ඇත. නාගරික ප්‍රදේශවල තරුණ විරැකියාව පවතින බැවින් මෙම අධ්‍යයනය එම නගරවල පදිංචි රැකියා විරහිත තරුණයින් 135 ක් නියැදිය ලෙස තෝරා ගනිමින් 2015 සැප්තැම්බර් මස සිට නොවැම්බර් මස දක්වා කාලය තුළ ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් දත්ත රැස් කර ඇත. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ අධ්‍යාපනය, පුහුණුව වැනි තරුණ විරැකියාවේ සැපයුම් පාර්ශව නිර්ණායක සොයා ගැනීමයි. මෙම අධ්‍යයනයේ නිගමන වලට අනුව විධිමත් අංශයේ තරුණ විරැකියාව තීරණය කරන ප්‍රධාන සාධක වූයේ අවශ්‍ය සුදුසුකම් හා පුහුණුව නොමැතිකමයි. අවිධිමත් අංශයේ තරුණයන් තරුණ විරැකියාව තීරණය කරන ප්‍රධාන සාධකය වූයේ ස්වයං රැකියාවක් කිරීමට කැමැත්තෙන් සිටිය ද ප්‍රාග්ධනයට ප්‍රවේශ වීමට ඇති නොහැකියාවයි. ඒ අනුව සාර්ව මට්ටමින් රැකියා හා ආර්ථික ප්‍රතිපත්ති මඟින් රැකියා උත්පාදනය කළ යුතු අතර මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කළ යුතු බවත්, ශ්‍රම වෙළෙඳපොල පුහුණුව, ආධුනිකත්ව පුහුණුව, වෙනත් සේවා පළපුරුදු වැඩසටහන් අවශ්‍ය තරුණ තරුණියන්ට උපකාර කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු බවත් මෙම අධ්‍යයනයෙන් යෝජනා කර ඇත. Ekanayake (2011) විසින් ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාවට බලපාන සාධක පිළිබඳව අධ්‍යයනයක් සිදු කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් රැස් කරගත් ද්විතීයික දත්ත භාවිතයෙන් මෙම අධ්‍යයනය සිදු කර ඇත. අධ්‍යයනයේ මූලික අරමුණ වූ තරුණ විරැකියාවට බලපාන සාධක හඳුනා ගැනීම සඳහා ද්විතීයික දත්ත භාවිතයෙන් ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක් (Logistic Regression Model) නිර්මාණය කර ඇත. ඒ අනුව තරුණ විරැකියාව කෙරෙහි අධ්‍යාපන මට්ටම හා ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාව බලපෑම් කරන බවත්, ජීවත් වන අංශය (ග්‍රාමීය, නාගරික හෝ වතු) හා පරිගණක සාක්ෂරතාව තරුණ විරැකියාව කෙරෙහි බලපෑම් නොකරන බවත් නිගමනය කර ඇත. මීට අමතරව මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව මාතර, ගාල්ල, නුවර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුළ ඉහළ අගයක් ගන්නා බව ද සොයාගෙන ඇත.

### 3. අධ්‍යයන ක්‍රමවේදය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දික්කුඹුර, පණුගල්ගොඩ, ඉඳුරන්නාවිල, අන්දුගොඩ හා හොරදූගොඩ ග්‍රාම සේවා වසම්වලට අයත් වයස අවුරුදු 15 ත් 29 ත් අතර තරුණයින් 50 ක නියැදියක් සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. ඒ අනුව එම නියැදිය ඇසුරින් ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කරන ලදි. අධ්‍යයනය සඳහා අවශ්‍ය ද්වීතතීයික දත්ත ලබා ගැනීම සඳහා මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත වාර සටහන් සඟරා ආදිය උපයෝගී කර ගන්නා ලදි.

### 4. දත්ත විශ්ලේෂණය

### 4.1 දත්තවල විශ්වසනීයත්වය

මෙම අධ්‍යයනයේ ප්‍රශ්නාවලිය මගින් රැස් කළ දත්ත වල විශ්වසනීයත්වය පරීක්ෂා කිරීම සඳහා Conbranch's Alpha පරීක්ෂාව සිදු කරන ලදි. එහිදී Conbranch's Alpha අගය 0.883 ක් ලෙස ලැබුණු අතර එය 0.7 ට වඩා ඉහළ අගයක් ගන්නාබැවින් මෙම දත්තවල විශ්වසනීයත්වය ඉහළ බව පිළිගත හැකිය.

### 4.2 විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණය

මෙමගින් නියැදිය තුළ ප්‍රතිචාරකයින් ව්‍යාප්ත වී ඇති ආකාරය ප්‍රතිශතාත්මකව ඉදිරිපත් කෙරේ.

*වගු අංක 1: නියැදි සංයුතිය (ප්‍රතිශතයක් ලෙස)*

| ග්‍රාම නිලධාරී වසම් අනුව | | අධ්‍යාපන මට්ටම අනුව | |
|---|---|---|---|
| දික්කුඹුර | 22% | 6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය | 8% |
| පණුගල්ගොඩ | 20% | *අ.පො.ස (සා.පෙළ) සමත්* | 22% |
| ඉඳුරන්නාවිල | 28% | *අ.පො.ස (උ.පෙළ) හා ඊට ඉහළ* | 54% |
| අන්දුගොඩ | 18% | විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරන | 12% |
| හොරදූගොඩ | 12% | උපාධිධාරී | 4% |

| ස්ත්‍රී-පුරුෂභාවය අනුව | | විවාහකත්වය අනුව | |
|---|---|---|---|
| ස්ත්‍රී | 50% | විවාහක | 16% |
| පුරුෂ | 50% | අවිවාහක | 84% |
| **වයස් මට්ටම අනුව** | | **රැකියාවක් කිරීම හෝ නොකිරීම අනුව** | |
| 15-19 | 28% | රැකියාවක නිරත වන | 32% |
| 20-24 | 52% | රැකියාවක නිරත නොවන | 68% |
| 25-29 | 20% | | |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

### 4.3 කයි වර්ග පරීක්ෂාව

රැකියාවක් කිරීම හෝ නොකිරීම යන විචල්‍ය සමග ස්ත්‍රීපුරුෂභාවය, වයස, අධ්‍යාපන මට්ටම, විවාහකත්වය, පවුලේ මාසික ආදායම, පවුලේ ආදායම උපයන පුද්ගලයින් සංඛ්‍යාව, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, පරිගණක සාක්ෂරතාවය යනාදි විචල්‍ය අතර ස්වායත්තතාව කාල් පියර්සන්ගේ කයි වර්ග පරීක්ෂාව මගින් පරික්ෂා කරන ලදි. කයි වර්ග පරීක්ෂාව සඳහා 95% ක විශ්වාස මට්ටමක් යොදා ගත් අතර මෙහිදී සලකා බලනු ලබන දෝෂ මට්ටම $\alpha = 0.05$ වේ. ඒ අනුව කයි වර්ග පරික්ෂාව සිදු කිරීම තුළින් ඉහත සඳහන් කරන ලද විචල්‍යවලට පිළිවෙලින් 0.048, 0.041, 0.680, 0.716, 0.030, 0.615, 0.089 හා 0.741ක් ලෙස වෙසෙසියා මට්ටම සඳහා අගය ලැබිණි. ඒ අනුව ස්ත්‍රීපුරුෂභාවය වයස පවුලේ මාසික ආදායම යන විචල්‍ය රැකියාවක් කිරීම හෝ නොකිරීම යන විචල්‍යය සමග සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකි විය.

තව ද පූර්ව අධ්‍යයන මගින් තරුණ සේවා වියුක්තිය කෙරෙහි බලපෑම් කරන බවට හඳුනාගත් විචල්‍ය කිහිපයක් තෝරා ගෙන, රැකියාවක් කිරීම හෝ නොකිරීම යන විචල්‍යය සමඟ ස්වායත්තාව පරීක්ෂා කරන ලදි. ඒ අනුව තෝරා ගත් විචල්‍ය වූයේ කුටුම්භය සතු ප්‍රමාණවත් ආදායම, පුද්ගල බලපෑම්, අයහපත් සෞඛ්‍යය තත්ත්ව, විවාහය, ප්‍රමාණවත් පහසුකම් නොමැතිකම, අධ්‍යාපන කටයුතු, කුසලතා ප්‍රමාණවත් නොවීම, පුද්ගල ආකල්ප, අතෘප්තිමත්භාවය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා දේශපාලන මැදිහත්වීම් ලෙස සඳහන් කළ හැකි අතර මෙම විචල්‍ය රැකියාවක් කිරීම හෝ නොකිරීම යන විචල්‍යය සමඟ ස්වායත්ත වන්නේ ද යන්න හඳුනා ගැනීම සඳහා කයි වර්ග පරීක්ෂාව සිදු කරන ලදි. එහිදි පිළිවෙලින් 0.043, 0.040, 0.048, 0.047, 0.005, 0.041, 0.049, 0.010, 0.034, 0.036 හා 0.041ක් ලෙස වෙසෙසියා මට්ටම සඳහා අගයන් ලබා ගත හැකිවිය. ඒ අනුව පූර්ව අධ්‍යයන මගින් හඳුනා ගත් විචල්‍ය සියල්ල රැකියාවක් කිරීම හෝ නොකිරීම සමඟ සම්බන්ධයක් පවතින වන බව හඳුනාගත හැකි විය.

### 4.4 සාධක විශ්ලේෂණය

විචලතා ආකෘතියක් විස්තර කළ හැකි වඩාත් හොඳම රේඛීය සම්බන්ධතා කාණ්ඩය තෝරා ගැනීම සඳහා ප්‍රධාන සංරචක විශ්ලේෂණය සිදු කරයි. ඒ අනුව මෙහිදී අදාළ නියැදිය අධ්‍යයනය කර තරුණයින් අතර සේවා වියුක්තියක් ඇති වීම කෙරෙහි බලපාන හේතු වන විචල්‍ය 12 ක් පිළිබඳව රැස් කරගත් දත්ත වල සාධක විශ්ලේෂණය සිදු කොට ඇත.

ඒ අනුව KMO පරීක්ෂාව සහ Bartlett’s පරීක්ෂාව සිදු කිරීමෙන් සාධක විශ්ලේෂණය සඳහා යොදා ගන්නා දත්තවල වලංගුතාව පරීක්ෂා කරනු ලැබේ. එහිදී KMO අගය මගින් නියැදියේ ප්‍රමාණවත් බවත් Bartlett’s පරීක්ෂාව මගින් නියැදියේ Sphericity පරීක්ෂා කරනු ලැබේ. KMO අගය 0.5 ට වඩා විශාල විය යුතු අතර Bartlett’s අගයෙහි P අගය 0.05ට වඩා අඩු අගය ගත යුතු ය. මෙම අධ්‍යයනය අනුව KMO අගය 0.671ක් වන අතර Bartlett’s අගය .000 වේ. ඒ අනුව KMO අගය 0.5 ට වඩා විශාල වීමත්, Bartlett’s අගය .000 අගය 0.05ට වඩා අඩු බැවින් මෙම දත්ත සාධක විශ්ලේෂණය සඳහා යෝග්‍ය වන බව නිගමනය කළ හැකි ය.

ඒ අනුව සාධක විශ්ලේෂණය සිදු කිරීමෙන් අධ්‍යයන විචල්‍ය ප්‍රධාන සාධක 4ක් යටතේ හඳුනාගත හැකි විය. එම සාධක හතර වන්නේ 1) කුටුම්භය තුළින් ඇතිවන බලපෑම් 2) ප්‍රමාණවත් සුදුසුකම් හා පහසුකම් නොමැතිකම, 3) මානසික තත්වයන්ගේ බලපෑම්, 4) ආර්ථික හා දේශපාලනික සාධක යන ඒවා ය.

**5. සමාලෝචනය**

තරුණයින් අතර සේවා වියුක්තිය ඇති වීම කෙරෙහි ස්ත්‍රී-පුරුෂභාවය, වයස හා පවුලේ මාසික ආදායම යන විචල්‍ය බලපෑම් කරන බව නිගමනය කළ හැකි ය. කුටුම්භය සතු ප්‍රමාණවත් ආදායම, පුද්ගල බලපෑම්, අයහපත් සෞඛ්‍යය තත්ත්ව, විවාහයේ බලපෑම, රැකියාවක් කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැතිකම, අධ්‍යාපන කටයුතුවල නිරතවීම, කුසලතා ප්‍රමාණවත් නොවීම, පුද්ගල ආකල්ප, අනාගත අපේක්ෂාවන්, අතෘප්තිමත්භාවය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ දේශපාලන මැදිහත්වීම් වැනි විචල්‍ය ද තරුණයින් අතර සේවා වියුක්තිය ඇති වීම කෙරෙහි බලපෑම් කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ තරුණ සේවා වියුක්තියට බලපෑම් කරනු ලබන සාධක හඳුනා ගැනීමයි. ඒ අනුව කුටුම්භය තුළින් ඇතිවන බලපෑම්, ප්‍රමාණවත් සුදුසුකම් හා පහසුකම් නොමැතිකම, මානසික තත්වයන්ගේ බලපෑම්, ආර්ථික හා දේශපාලනික සාධක යනුවෙන් ප්‍රධාන සාධක කිහිපයක් හඳුනාගනු ලැබීය.

ඒ අනුව කුටුම්භය තුළින් ඇතිවන බලපෑම් යටතේ දිගු කාලීන කායික හා මානසික රෝගී තත්ව, රැකියාවක් කිරීම සම්බන්ධයෙන් දෙමාපියන්ගෙන්, ස්වාමිපුරුෂයාගෙන් හෝ බිරිඳගෙන් වන බලපෑම්, කුටුම්භය සතුව ප්‍රමාණවත් ආදායමක් හෝ වත්කමක් පැවතීම, දරුවන් ලැබීම හා පවුල තුළ පැවරෙන වගකීම් වැනි සාධකත්, ප්‍රමාණවත් සුදුසුකම් හා පහසුකම් නොමැතිකම යටතේ තවමත් උසස් අධ්‍යාපන කටයුතුවල හෝ වෘත්තීය අධ්‍යාපන කටයුතු වල නිරත වීම, උසස් අධ්‍යාපනය නොලැබීම, වෘත්තීය අත්දැකීම් නොමැති වීම, සුදුසුකම් ප්‍රමාණවත් නොවීම, තම දැනුම හා රැකියා වෙළෙඳපොල අතර පවතින නොගැලපීම, ප්‍රවාහන පහසුකම් නොමැති වීම හා රැකියා ස්ථානයට ඇති දුර වැනි සාධකත්, මානසික තත්වයන්ගේ බලපෑම් යටතේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වීම හෝ විදේශගත වීමට බලාපොරොත්තු වීම, රැකියාවක් අවශ්‍ය යැයි නොහැඟීම, රැකියාවක් කිරීම තම තත්වයට නොගැලපේ යැයි සිතීම, තවත් අයෙකු යටතේ කටයුතු කිරීමට ඇති අකමැත්ත, ප්‍රමාණවත් වැටුපක් නොලැබීම, අපේක්ෂා කරන ආකාරයේ රැකියා අවස්තා නොතිබීම හා රැකියා ස්තානයේ දුෂ්කරතා වැනි සාධකත්, ආර්ථික හා දේශපාලනික සාධක යටතේ නව රැකියා උත්පාදනය නොකිරීම, රජයේ රැකියා

සඳහා බඳවා ගැනීමේ දී සලකා බලනු ලබන ප්‍රතිපත්ති, රැකියා සඳහා බඳවා ගැනීමේදී සිදු වන දේශපාලන මැදිහත්වීම් හා ආණ්ඩු මාරු වීමත් සමඟ ඇතැම් රැකියා අවලංගු වීම වැනි සාධකත් තරුණයින් අතර විරැකියා තත්වයක් නිර්මාණය වීමට හේතු වන බව නිගමනය කළ හැකි විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Ali, S., & Jabeen, U. A. (2016). Determinants of Youth Unemployment-A supply Side Analysis. *European Journal of Business, Economics and Accountancy, 4*(1), 97-105. Retrieved from http://www.idpublications.org

*Andrew, K. K. (2015). Youth Unemployment in South Africa.*

Central Bank of Sri Lanka. (2020). *Economic and Social Statistics of Sri Lanka.* Central Bank of Sri Lanka. Retrieved from http://www.cbsl.gov.lk

Duguma, A. L., & Tolcha, F. T. (2019, August). Determinants of Urban Youth Unemployment: The Case of Guder Town, Western Shoa Zone, EthiopiaI. *International Journal of Research- Granthaalayah, 7*(8), 318-327.

Ekanayake, P. (2011). Exploration of Factors Affecting the Youth Unemployment in Sri Lanka. Retrieved from https://www.researchgate.net/publication/343281687

Kiphesha, E., & Msigwa, R. E. (2013). Determinants of Youth Unemployment in Developing Countries: Evidences from Tamzania. *Journal of Economics and Sustainable Development, iv*, 67-77. Retrieved from https://www.researchgate.net/publication/257272209

Worldbank. (2019). Retrieved December 01, 2020, from https://www.data.worldbank.org/indicator/SL.UEM.1524.ZS?view=map

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2019), *ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව*, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. Retrieved from http:www.statistics.gov.lk

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2019), *සංඛ්‍යාන අත්පොත-ගාල්ල දිස්ත්‍රික්කය*, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. Retrieved from http:www.statistics.gov.lk

රත්නායක, එන්. පී. (nd). ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නය විසඳීමේ ක්‍රමෝපායක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයෙහි කාර්යභාරය පිලිබඳ විග්‍රහයක්. පිටු අංක 94

# සාම්ප්‍රදායික කර්මාන්තහිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම

එන්. බී. පී. උපේක්ෂානී

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
prathibha.upeksha825@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනය සඳහා සාම්ප්‍රදායික කර්මාන්තවල දායකත්වය සැළකිය යුතු අතර මෙම කර්මාන්තවල දියුණුව භාණ්ඩ නිෂ්පාදන අලෙවිකරණය මත තීරණය වේ. පර්යේෂණයේ අරමුණ ලෙස සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම හඳුනාගෙන ඇත. පර්යේෂණ ප්‍රදේශ ලෙස යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරාගත් අතර පිත්තල, රිදී, පිළිම නෙලීම, බෙර හා වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් 58ක් ස්තෘත සසම්භාවී නියැදිය යටතේ ලබාගනිමින් සාම්ප්‍රදායික කර්මාන්තහිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම පිළිබඳව අධ්‍යයනය කර ඇත. දත්ත විශ්ලේෂණය සඳහා කයිවර්ග පරීක්ෂාව, ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායනය යොදාගෙන ඇත. කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස, පවුලේ සාමාජිකයින් ගණන, මාසික ආදායම හා තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන ස්වායත්ත විචල්‍යයන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට බලපාන විචල්‍යයන් වන බව කයිවර්ග පරීක්ෂාව හරහා හඳුනාගත් අතර මෙම විචල්‍යයන් මගින් සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට වන බලපෑම හඳුනාගැනීමට ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය ඇස්තමේන්තු කර ඇත. ඒ හරහා කර්මාන්තකරුවා පුරුෂයෙකු වන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.943න් ඉහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ වයස ක්‍රමයෙන් වැඩිවන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.088න් පහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන ක්‍රමයෙන් වැඩිවන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.964න් ඉහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම ක්‍රමයෙන් වැඩිවන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.972න් ඉහළ යව බවත්, කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය ක්‍රමයෙන් වැඩි වුවත් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.041න් පහළ යන බවත් ගණනය කර ඇත. පර්යේෂණ යෝජනා ලෙස සාම්ප්‍රදායික කර්මාන්තවල නිෂ්පාදන අලෙවිකරණය වර්ධනය සඳහා සුදුසු අලෙවිකරණ ක්‍රමවේද භාවිතයට යොමුවීම, භාණ්ඩවල ගුණාත්මකභාවය පවත්වාලෙන යාම, ණය ලබාදීම හා විධිමත් මූල්‍ය කළමනාකරණ දැනුම ලබාදීම, නිසි වෙළෙඳපොළක් පැවතීම වැනි යෝජනා ඉදිරිත් කළ හැකිය.*

***මුඛ්‍ය පදඃ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්, නිෂ්පාදන අලෙවිකරණය***

## 1. හැඳින්වීම

සාම්ප්‍රදායික කර්මාන්ත යනු ඈත අතීතයේ පටන් පැවතගෙන එන පරම්පරානුගතව පවත්වාගනු ලැබූ ගෘහ කර්මාන්තයි. මෙම කර්මාන්ත හුදෙක් ම පදනම් වූයේ මිනිසා වාසය කළ පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍යය භාවිත කරමින් තම දෛනික අවශ්‍යතා සපුරාගනු වස් නිර්මාණය කළ නිර්මාණ ඇසුරිනි (Bandara, 2015). Oxford Encyclopedia of the Modern World යන කෘතිය මගින් Stearns ප්‍රකාශ කරන්නේ සාම්ප්‍රදායික කර්මාන්ත යනු පූර්ව කර්මාන්ත කාල පරිච්ඡේදයේ සිදු කළ හස්ත කර්මාන්ත නිෂ්පාදන ක්‍රම වන අතර කර්මාන්තශාලා පාදක කාර්මීකරණ වර්ධනයේ දී පවා අඛණ්ඩව නිෂ්පාදන පවත්වාගෙන ගිය කර්මාන්ත වන බවයි (Stearns, 2008). ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද 'කර්මාන්ත වෙළෙඳ හා සේවා ආර්ථික සංගණනයේ ප්‍රධාන දර්ශකයන් - 2013/14' ප්‍රථම වාර්තාව තුළ දත්ත ඉදිරිපත් කිරීමේ දී කර්මාන්ත සහ ඉදිකිරීම් යන්න මහා පරිමාණ, මධ්‍යය පරිමාණ, කුඩා පරිමාණ හා ක්ෂුද්‍ර පරිමාණ ලෙස වර්ගීකරණය කරමින් දත්ත ගොනුකර ඇත (DCS, 2015). සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ පවතින බහුතර සාම්ප්‍රදායික කර්මාන්ත සේවකයින් කුඩා ප්‍රමාණයක්, සුළු ප්‍රාග්ධනයක් යටතේ පවත්වාගෙන යන බැවින් මේවා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට අයත් වේ. ඒ අනුව සාම්ප්‍රදායික කර්මාන්ත යනු නිෂ්පාදන අංශයට අයත් වන සුළු පරිමාණ වශයෙන් නිෂ්පාදනයන් සිදු කරන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වේ (Arachchge, 2017).

ඈත අතීතයේ භාණ්ඩ හුවමාරු ක්‍රමයත් සමඟ ආරම්භ වූ නිෂ්පාදන අලෙවිය යන්න සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව සලකා බැලීමේ දී වැදගත් වේ. නිෂ්පාදන අලෙවිය යන්න භාණ්ඩ නිෂ්පාදනය සඳහා සැළකිව යුතු බලපෑමක් සිදුකරන මූලාශ්‍රයකි. භාණ්ඩ නිෂ්පාදනය හා නිෂ්පාදන අලෙවිය අතර ධන සබඳතාවයක් තිබීම එම කර්මාන්තයන්ගේ වර්ධනයට හේතුවන අතර එය සමස්ත ආර්ථික වර්ධනයට හේතු වේ. වර්තමානයේ දී සෑම ව්‍යාපාර හිමියෙක්ම තම නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කරනුයේ නිෂ්පාදන අලෙවිකරණය මත කර්මාන්තයේ පැවැත්ම හා ව්‍යාපාර හිමියන්ගේ පැවැත්ම තීරණය වන බැවිනි (Aydin, Ozer & Cetin, 2007). අලෙවිකරණය යනු පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් විසින් භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීම, පිරිනැමීම සහ අවශ්‍ය දේ ලබා ගන්නා සමාජ ක්‍රියාවලිය වන අතර මෙහි දී වටිනාකම් සහිත නිෂ්පාදන සහ සේවාවන් වෙනත් අය සමඟ නිදහසේ හුවමාරු කර ගනී (Kumar & Rajeev, 2019). භාණ්ඩ අලෙවිකරණය සෑම සමාජයකම මූලික සංසිද්ධියක් ලෙස හැඳින්විය හැකි අතර අලෙවිකරණයේ පරමාර්ථය වන්නේ නිෂ්පාදන බෙදා දීම වේ. වර්තමානයේ දී ඉල්ලුමට අනුව අලෙවිකරණය තවදුරටත් සරල ව්‍යායාමයක් නොවන්නේ එය වෙනස්කම්වලට භාජනය වී ඇති බැවිනි. මිලදී ගැනීමේදී පාරිභෝගිකයින් වඩාත් තාර්කික වන නිසාම අලෙවිකරණය සඳහා නවෝත්පාදන අවශ්‍ය වේ (Bhayani, 2018).
මෙම පර්යේෂණයේ අධ්‍යයන ගැටලුව වන්නේ සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම කොපමණ ද යන්නයි. අධ්‍යයන අරමුණ වන්නේ සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම හඳුනාගැනීමයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

සාම්ප්‍රදායික නිෂ්පාදන කර්මාන්ත යනු බාධාවකින් හා වෙනස්වීමක් නොමැතිව දීර්ඝ කාලයක් තිස්සේ පවතින භාණ්ඩ නිෂ්පාදනය කිරීම් සම්බන්ධ අංශයයි. මෙම කර්මාන්ත මෑත කාලයේ දී ගෝලීයකරණය නිසා පරිහාණියට පත් වී ඇත (Barber, Villar & Sarria, 2020). සාම්ප්‍රදායික කර්මාන්ත බොහෝමයක් උපන් දේශය මත පදනම් වන අතර අඩු තාක්ෂණික තීව්‍රතාවයකින් ද යුක්ත වේ. මෙහි ප්‍රතිඵල ලෙස මෙම සාම්ප්‍රදායික කර්මාන්ත තිරසර බවින් තොර වී ඇත (Barber, Villar & Sarria, 2020). සාම්ප්‍රදායික කුඩා කර්මාන්තවලට නව තාක්ෂණය හඳුන්වා දීමේ මාර්ගය වන්නේ පිරිවැය අඩු කිරීම සහ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා නව යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීමයි (Secondo & Calabrese, 2010).

නව හා කාර්යක්ෂම නිෂ්පාදන පහසුකම් හඳුන්වාදීම, පද්ධති ඒකාබද්ධ කිරීම මගින් තාක්ෂණික වෙනස්කම් වේගවත් කළ හැකිය (Iskanius, Page & Anbuudayasankar, 2010). තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික මට්ටමින් කරන ලද අධ්‍යයනයකට අනුව සාම්ප්‍රදායික ක්‍රම භාවිත කිරීම අකාර්යක්ෂම මෙන් ම එය සාම්ප්‍රදායික කර්මාන්තවල තිරසර භාවයට ද බලපායි (Senevirathne, Wewala, Jayasekara, Vidanapathirane & Oshadie, 2010). ශ්‍රී ලංකාවේ 'ශිල්ප සහ ආදාළ වෙළෙඳ සේවකයින්ගේ' පරිගණක සාක්ෂරතාවය 2017 දී 37.6% ද, 2018 දී 41.6% ද හා 2019 දී 41.7% ද වේ (DCS, 2019). නව ඩිජිටල් තාක්ෂණයේ ව්‍යාප්තියත් සමග සෑම සාම්ප්‍රදායික කර්මාන්තයක් තුළ ම ඩිජිටල් පරිවර්තනයන් සිදු වී ඇති අතර සෑම කර්මාන්තයක් තුළ ම මෙම ඩිජිටල් තාක්ෂණය වර්ධනය වීමෙන් එම කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු වේ (Remane, Hanelt, Wiesboeck & Kolbe, 2017).

අනාගතයේ දී ඩිජිටල් තාක්ෂණය ව්‍යාපාරික උපායමාර්ගවලින් වෙන් කළ නොහැකි වේ. ඩිජිටල් තාක්ෂණයේ භාවිත නිසා සෑම කර්මාන්තයක්ම වටිනා නිර්මාණ බිහි කිරීම, බෙදා හැරීම සහ නව ව්‍යාපාර ආකෘතීන් ග්‍රහනය කර ගැනීමට හැකි වේ. සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට මෙම අවස්ථා මෙන් ම අවධානම්වල දී මෙම ඩිජිටල් තාක්ෂණය වැදගත් වේ. එමෙන් ම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට පවත්නා නිෂ්පාදන හා සේවා හඳුනා ගැනීමට හා නව වෙළෙඳපළ හඳුනා ගැනීම යන ප්‍රවේශයන් සඳහා ඩිජිටල් තාක්ෂණය වැදගත් වේ (Nickerson, Remane, Kolbe & Hanelt, 2017).

නිර්මාණකරුවන්ට පහසුවෙන් භාවිත කළ හැකි උපකරණ භාවිතය මගින් ඵලදායී නිෂ්පාදන බිහිවන අතර එමගින් කාලය ද ඉතිරි වේ. නවීන ශිල්ප ක්‍රම හා යන්ත්‍ර භාවිත නොකර සාම්ප්‍රදායික තාක්ෂණය යොදාගනිමින් මූර්තියක් සෑදීම ඉතා දුෂ්කර හා වෙහෙසකාරී වෙයි (Mohapatra & Dash, 2011). සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නවීන ක්‍රමවේදයන් තම නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කළ අතර උදාහරණ ලෙස පිත්තල උපකරණ තැනීමේ දී ෂීට් ලෝහ භාවිත කිරීම, බුමුතුරුණු සඳහා ඛණිජ සායම් භාවිතය දැක්විය හැකිය. මෙලෙස භාණ්ඩ නිෂ්පාදනය සරළ කිරීම මගින් ව්‍යවසායකයින්ගේ ඵලදායීතාවය ඉහළ නැංවිය හැකිය (Roy, 2001).

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පිත්තල කර්මාන්තයේ තිරසරභාවයට හා වර්ධනයට බලපාන ප්‍රධාන ගැටලුව වන්නේ නව තාක්ෂණට අනුගත වීම සඳහා පවතින අපහසුතා හා දුෂ්කරතාවයයි. (Jayawickrama, Dharmawardhana, Kulatunga, Karunarathna & Osadith, 2016). වේගවත් ගෝලීයකරණයත් සමඟ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත තාක්ෂණික ගැටලුවලට මුහුණ දෙයි. බොහෝ සාම්ප්‍රදායික ශිල්පීන් නිෂ්පාදන කටයුතු සඳහා සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම භාවිත කළ ද පාරිභෝගිකයන්, සැපයුම්කරුවන් හා භාණ්ඩ බෙදාහරින්නන් අතර ඇති සන්නිවේදනය වැඩි දියුණු කිරීම හරහා මෙම නිෂ්පාදනවල යම් සැලකිව යුතු දියුණුවක් දැකගත හැකි වේ. එමෙන් ම ඇතැම් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට පිරිවැය අඩු කිරීමට සහ කාර්යක්ෂමව නිෂ්පාදන කටයුතු සිදු කිරීම පිළිබඳව යම් අවබෝධයක් පවතී. ලෝකයේ අනෙකුත් බෝහෝ කර්මාන්ත දැනටමත් අර්ධ ස්වයංක්‍රීයකරණය බවට පරිවර්තනය වී ඇති අතර සමහර කර්මාන්ත පූර්ණ ස්වයංක්‍රීයකරණය වී ඇත. නමුත් ශ්‍රී ලකාවේ සාම්ප්‍රදායික පිත්තල කර්මාන්තය තවමත් සාම්ප්‍රදායික නිෂ්පාදන ක්‍රියාවලියේ නිරත වී සිටී. නිශ්චිත තාක්ෂණික ක්‍රියාදාමයන් පිළිබඳව ඇති නොදැනුවත්කම, මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා පුහුණු කිරීම් නොමැති වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් නොමැති වීම ආදී හේතුන් මෙම තාක්ෂණික ගැටලුවලට හේතු වේ. සාම්ප්‍රදායික ශිල්පීන් සුදුසු ආරක්ෂක උපකරණ භාවිත නොකරන අතර ආරක්ෂක රෙගුලාසි ද අනුගමනය නොකරයි (Dharmawardhana, Gowrynathan, Kulatunga, Herath, Jayasinghe, Ekanayake & Chandrakumar, 2015).

Senevirathne, Wewala, Jayasekara, Vidanapathirane සහ Oshadie (2010) යන පර්යේෂකයින් පෙන්වාදෙන ආකාරයට සාම්ප්‍රදායික කර්මාන්තවල ක්‍රියාත්මත වන පරම්පරාවෙන් පරම්පරාවට මාරුවීම හා සම්බන්ද තාක්ෂණික කුසලතා හා දැනුම බෙදා හැරීමේ සාම්ප්‍රදායික ක්‍රම එලදායී නොවන අතර එය යල්පැනගිය ක්‍රියාවක් වේ (Senevirathne, Wewala, Jayasekara, Vidanapathirane & Oshadie, 2010).

**3. අධ්‍යයන ක්‍රමවේදය**

ශ්‍රී ලංකාව තුළ පුළුල් වශයෙන් සාම්ප්‍රදායික කර්මාන්ත ව්‍යාප්තව පැවතිය ද ප්‍රධාන වශයෙන් සාම්ප්‍රදායික කර්මාන්ත රාශියක් මහනුවර දිස්ත්‍රික්කය තුළ දක්නට ලැබේ. මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති සාම්ප්‍රදායික කර්මාන්ත අතුරින් බහුතර ප්‍රමාණයක් යටිනුවර හා උඩුනුවර ප්‍රදේශ ඇසුරින් ආවරණය කළ හැකි බැවින් මෙම පර්යේෂණයේ පර්යේෂණ ප්‍රදේශය ලෙස යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය කොට්ටාස තෝරාගෙන ඇත. යටිනුවර හා උඩුනුවර ප්‍රදේශ තුළ වැඩි ප්‍රසිද්ධියක් ලබා ඇති පිත්තල, රිදී, පිළිම නෙලීම්, බෙර, වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන කර්මාන්ත 05ක් ඇසුරෙන් මෙම පර්යේෂණයට අදාළව ප්‍රාථමික දත්ත රැස්කරගෙන ඇත. සමස්ත ප්‍රදේශය තුළ පවතින සියලුම සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳ වූ ද්විතීයික දත්ත යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ලබා ගනිමින් නියැදිය නිර්මාණය කර ඇත. නියැදිය තේරීමේ දී සමස්ත යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය කොට්ටාස තුළ පවතින සියලුම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් ගණනින් 10% ප්‍රමාණයක් යමානි ක්‍රමවේදය හරහා තෝරාගෙන අධ්‍යයන කටයුතු සඳහා යොදාගෙන තිබේ.

පර්යේෂණයේ දත්ත රැස් කිරීම සඳහා සසම්භාවී නියැදි ක්‍රමය භාවිත කරයි. පර්යේෂණය සඳහා සසම්භාවී නියැදි ක්‍රමයක් වන ස්තෘත සසම්භවී නියැදි ක්‍රමය යොදාගත් අතර යටිනුවර හා උඩුනුවර ප්‍රදේශවල පිත්තල, රිදී, පිළිම නෙළීම්, බෙර, වෙස් ඇදුම් කට්ටල නිර්මාණය යන කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් ස්තෘත පහක් ලෙස ගෙන එම ස්තෘතවල සිටින කර්මාන්තකරුවන් ගණන මත පදනම්ව මෙහිදී නියැදිය තෝරාගෙන ඒ අනුව ප්‍රාථමික දත්ත රැස් කරගෙන ඇත. පර්යේෂණයට අදාළව යටිනුවර ප්‍රදේශයේ සාම්ප්‍රදායික කර්මාන්තයන්හි නිරතවන සියලුම කර්මාන්තකරුවන්ගේ ලැයිස්තුවක් යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තෝරාගෙන ඇත. ප්‍රාථමික දත්ත මෙන් ම ද්විතීයික දත්ත ද පර්යේෂණයේ දත්ත රැස් කිරීම සඳහා යොදා ගත් අතර ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත ද, යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ද්විතීයික දත්ත ද ලබා ගෙන ඇත. ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා හරහා ලබාගත් ප්‍රාථමික දත්ත ඇසුරින් ප්‍රධාන ලෙස දත්ත විශ්ලේෂණය කර තිබේ. ප්‍රශ්නාවලිය හරහා රැස්කරගත් දත්ත විශ්ලෙෂණය කිරීම සඳහා තීරු, වට, සංයුක්ත ආදී ප්‍රස්තාර සටහන් ද, වගු ද භාවිත කර ඇත.

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තවල නිෂ්පාදන අලෙවිකරණ ක්ෂේත්‍රය පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකි වේ. සාම්ප්‍රදායික කර්මාන්තහිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම පිළිබඳව විමසා බැලීම හරහා තාක්ෂණික වශයෙන් පවතින ගැටලු හඳුනා ගත හැකි අතර මෙම ගැටලු මතු වීමට බලපෑ හේතූන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි විය. එමෙන් ම සාම්ප්‍රදායික කර්මාන්තවල භාණ්ඩ අලෙවි මට්ටම වර්ධනය කිරීම සඳහා කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳව ද මේ හරහා අනාවරණය කරගැනීමට සමත් විය.

**4. දත්ත විශ්ලේෂණය**

මෙහි දී කයිවර්ග පරීක්ෂාව හරහා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට නිෂ්පාදන අලෙවිකිරීමේදී භාවිත කරන තාක්ෂණික ක්‍රම කෙරෙහි බලපානු ලබන ස්වායත්ත විචල්‍යයන් හඳුනාගත් අතර සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට එම ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම හඳුනාගැනීමට ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය ගොඩනගා ඇත.

**4.1 සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට ස්වායත්ත විචල්‍යයන් මගින් වන බලපෑම හඳුනාගැනීමට ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය**

ප්‍රශ්නාවලිය හරහා රැස්කරගත් භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවය, කර්මාන්තකරුවන්ගේ වයස අතර සම්බන්ධතාවය, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන අතර සම්බන්ධතාවය, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම අතර සම්බන්ධතාවය, කර්මාන්තකරුවන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවය, කර්මාන්තකරුවන් එම කර්මාන්තයේ නිරත වූ කාලය අතර සම්බන්ධතාවය හා තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය අතර සම්බන්ධතාවය මැන බැලීම සඳහා සිදුකළ කයිවර්ග පරීක්ෂාවේ දී භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතයට

බලපාන ස්වායත්ත විචල්‍යයන් 05ක් හඳුනාගෙන ඇත. පහත වගු අංක 4-1 මගින් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට නිෂ්පාදන අලෙවිකිරීමේදී භාවිත කරන තාක්ෂණික ක්‍රම කෙරෙහි බලපානු ලබන ස්වායත්ත විචල්‍යයන් හඳුනාගැනීම සඳහා සිදුකළ කයිවර්ග පරීක්ෂා අගයන් දක්වා ඇත.

*වගු අංක 4-1: සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට නිෂ්පාදන අලෙවිකිරීමේදී භාවිත කරන තාක්ෂණික ක්‍රම කෙරෙහි බලපානු ලබන ස්වායත්ත විචල්‍යයන් හඳුනාගැනීම*

| | $H_0$ කල්පිතය | පියර්සන් කයිවර්ග අගය | වෙසෙසියා මට්ටම (Sig) | තීරණය |
|---|---|---|---|---|
| *1* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය අතර සම්බන්ධතාවයක් නැත | 4.986 | 0.026 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| *2* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ වයස අතර සම්බන්ධතාවයක් නැත | 4.207 | 0.040 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| *3* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන අතර සම්බන්ධතාවයක් නැත | 5.754 | 0.016 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| *4* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම අතර සම්බන්ධතාවයක් නැත | 5.944 | 0.015 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |
| *5* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ අධ්‍යාපන මට්ටම අතර සම්බන්ධතාවයක් නැත | 0.093 | 0.760 | $H_0$ කල්පිතය පිළිගැනීම |
| *6* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන් එම කර්මාන්තයේ නිරත වූ කාලය අතර සම්බන්ධතාවයක් නැත | 2.962 | 0.085 | $H_0$ කල්පිතය පිළිගැනීම |
| *7* | භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය හා කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය සම්බන්ධතාවයක් නැත | 18.362 | 0.000 | $H_0$ කල්පිතය ප්‍රතික්ෂේප වේ |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත (2020)

ඒ අනුව භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිතය යන පරායත්ත විචල්‍යය සඳහා කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, කර්මාන්තකරුවන්ගේ වයස, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම හා කර්මාන්තකරුවන් එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන ස්වායත්ත විචල්‍යයන් හේතු වන බව හඳුනාගෙන ඇත.

### 4.1.1 ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය

ඉහතින් පරීක්ෂා කරන ලද කයිවර්ග පරීක්ෂා අගයන් අනුව වෙසෙසියා මට්ටම (Sig) 0.05ට වඩා අඩු අගයන් ලබා ගනිමින් වෙසෙසි වූ කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, කර්මාන්තකරුවන්ගේ වයස, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම හා කර්මාන්තකරුවන් එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන විචල්‍යයන් පමණක් ස්වායත්ත විචල්‍යයන් ලෙස ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය ගොඩනැගීම සඳහා යොදාගෙන ඇත.

$Y_i$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියා නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිත කරයි නම්
0, එසේ නොවේ නම් }

$D_{1i}$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියා පුරුෂ නම්
0, එසේ නොවේ නම් }

$D_{2i}$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ වයස අවුරුදු 45ට වැඩි නම්
0, එසේ නොවේ නම් }

$D_{3i}$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ පවුලේ සාමාජිකයින් ගණන 5ට වැඩි නම්
0, එසේ නොවේ නම් }

$D_{4i}$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ මාසික ආදායම රු 20000ට වැඩි නම්
0, එසේ නොවේ නම් }

$D_{5i}$ = { 1, i වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව දැනුවත්භාවය ඉහළ නම්
0, එසේ නොවේ නම් }

මෙහි දී ආකෘතියට ඇතුළත් නොකළ විචල්‍යයන් පදනම් විචල්‍යයන් වන අතර වන සාම්ප්‍රදායික කර්මාන්තහිමියා ස්ත්‍රී වීම, සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ වයස අවුරුදු 45ට අඩු වීම, සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ පවුලේ සාමාජිකයින් ගණන 5ට අඩු වීම, සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ මාසික ආදායම රු 20000ට අඩු වීම හා සාම්ප්‍රදායික කර්මාන්තහිමියාගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව දැනුවත්භාවය අවම වීම යන විචල්‍යයන් පදනම් විචල්‍යයන් ලෙස සළකා ආකෘතිය ඇස්තමේන්තු කර ඇත. මෙලෙස ආකෘතියෙන් බැහැරවන විචල්‍යයන් මගින් කෙරෙන බලපෑම ස්ථාවර අගය මගින් නිරූපණය කරයි.

ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක සමස්ත වෙසෙසි බව පරීක්ෂා කිරීම සඳහා Omibas පරීක්ෂාව යොදාගනී. ඔම්බස් පරීක්ෂා වගුව මගින් ලබාදෙන පියවර (Step), කොටස (Block) හා ආදර්ශ (Model) හි වෙසෙසි අගය (Sig) 0.05ට වඩා අවම අගයක් ගනී නම් ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක වෙසෙසි වෙයි. ඒ අනුව මෙහිදී ගණනය කරන ලද පියවර (Step), කොටස (Block) හා ආදර්ශ (Model) හි වෙසෙසි අගයන් පිළිවෙළින් 0.010, 0.000, 0.000 වන අතර මෙම අගයන් 0.05ට වඩා කුඩාවන බැවින් ගොඩනගන ලද ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය සමස්ත වෙසෙසි වන බව පැහැදිලි වේ.

සමස්ත ආකෘතිය මගින් පරායත්ත විචල්‍යයේ විචලනය කොපමණ ප්‍රමාණයක් විග්‍රහ කරනවාද යන්න නිර්ණන සංගුණකය හරහා ගණනය කළ හැකිය. නමුත් ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක් තුළ මෙය සරල ප්‍රතිපායනය හා බහුගුණ ප්‍රතිපායනය මෙන් ගණනය කළ නොහැකි වුවත් SPSS මෘදුකාංගය මගින් ලැබෙන ආදර්ශ සාරාංශය (Model Summary) වගුව මගින් $R^2$ අගයන් දෙකක් සඳහා අගයන් ලබාගත හැකිය. ඒ අනුව ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක දී සමස්තයක් වශයෙන් ඇස්තමේන්තු කරන ලද ආකෘතියෙහි අනුසීහුමේ හොඳකම මැනීම සඳහා කොක්ස් සහ ස්නෙල් (Cox & Snell) $R^2$ අගයන් භාවිත කරන අතර මෙම ආකෘතියට අදාලව යැපුම් විචල්‍යයේ පැහැදිළි කළ විචලනය 54.7% සිට 75% පරාසයක පවතින බව පැහැදිළි වේ (ඇමුණුම 24).

නිරීක්ෂණය කරන ලද අගයන්ගෙන් කොපමණ ප්‍රමාණයක් නිවැරදිව පුරෝකථනය කර තිබේදැයි වර්ගීකරණ වගුව (Classification Table) මඟින පුරෝකථනය කළ හැකිය. ඒ අනුව මෙහි දී සමස්ත නියදියෙන් 87.9%ක් ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය මගින් නිවැරදිව පුරෝකථනය කර තිබේ (ඇමුණුම 25).

ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායනය සඳහා ගොඩනගන ලද ප්‍රතිපායන ආකෘතිය පහතින් දැක්වේ.

$$L_i = \left(\frac{Pi}{1-Pi}\right) = -\beta_0 + \beta_1 D_{1i} - \beta_2 D_{2i} + \beta_3 D_{3i} + \beta_4 D_{4i} - \beta_5 D_{5i} + u_i$$

$$\hat{L} = -3.351 + 2.808 D_{1i} - 2.333 D_{2i} + 3.295 D_{3i} + 3.556 D_{4i} - 3.147 D_{5i}$$

$$P = (0.048)(0.030)(0.040)\ (0.011)(0.019)(0.002)$$

මෙම ආකෘතියේ සියලුම වෙසෙසි අගයන් (P) 0.05ට වඩා කුඩා වන බැවින් ඉහත සාධක සියල්ලම පරායත්ත විචල්‍යය වෙනස් වීම සඳහා බලපාන බව කිව හැකිය.

එනම් කර්මාන්තකරුගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස, පවුලේ සාමාජිකයින් ගණන, මාසික ආදායම හා කර්මාන්තකරුවන්ට එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන ස්වායත්ත විචල්‍යයන් සියල්ල ම සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතය යන පරායත්ත විචල්‍යය සමඟ සම්බන්ධතා දක්වයි.

ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක බෑවුම් සංගුණකයේන් දැක්වෙන්නේ ස්වායත්ත විචල්‍යය එක් ඒකකයකින් වෙනස්වන විට හවුමාව අනුපාතිකයේ ලඝු අගයේ ඇතිවන වෙනසයි. $Ln\left(\frac{Pi}{1-Pi}\right)$ යනු හවුමාව අනුපාතිකයේ ලඝු අගයයි. ආකෘතියේ අන්තඃඛණ්ඩය මගින් දැක්වෙන්නේ පදනම් විචල්‍යයන් මගින් වන බලපෑම වන අතර මෙහි දී අනෙකුත් විචල්‍යයන් මගින් පරායත්ත විචල්‍යය සඳහා කිසිදු බලපෑක් නොමැති විට ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතිකයේ ලඝු අගය ඒකක 3.351න් අඩු වේ. ඉහත ඇස්තමේන්තු කළ ආකෘතිය අනුව අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් නොවෙනස්ව පවතින විට කර්මාන්තකරුවා පුරුෂයෙකු වීමත් සමඟ ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතයේ ලඝු අගය ඒකක 2.808න් වැඩි වේ. අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් නොවෙනස්ව පවතින විට කර්මාන්තකරුවන්ගේ වයස එක් ඒකකයකින් වැඩිවන විට ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතයේ ලඝු අගය ඒකක 2.333න් අඩු වේ. අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් නොවෙනස්ව පවතින විට කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන එක් ඒකකයකින් වැඩිවන විට ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතයේ ලඝු අගය ඒකක 3.295න් වැඩි වේ. අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් නොවෙනස්ව පවතින විට කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම එක් ඒකකයකින් වැඩිවන විට ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතයේ ලඝු අගය ඒකක 3.556න් වැඩි වේ. අනෙකුත් ස්වායත්ත විචල්‍යයන් නොවෙනස්ව පවතින විට කර්මාන්තකරුවන්ට එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය එක් ඒකකයකින් වැඩිවන විට ඇස්තමේන්තු කළ හව්මාව අනුපාතයේ ලඝු අගය ඒකක 3.147න් අඩු වේ (ඇමුණුම 26).

ඉහත ආකාරයට හව්මාව අනුපාතයේ ලඝු අගය සඳහා බෑවුම් සංගුණක මගින් වන බලපෑම දැක්විය හැකි වුවත් ඒ ඒ ස්වායත්ත විචල්‍යයන් වෙනස්වීම මගින් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව කොපමණද යන්න මෙමගින් විස්තර කළ නොහැක. මේ අනුව එක් එක් ස්වායත්ත විචල්‍යයේ වෙනසට අනුව පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය ලබා ගැනීම සඳහා පරාමිති අගයන් සඳහා ප්‍රතිලඝු අගයන් ලබා ගනී.

$$\left(\frac{Pi}{1-Pi}\right) = e^{-3.351} . e^{2.808D_{1i}} . e^{-2.333D_{2i}} . e^{3.295D_{3i}} . e^{3.556D_{4i}} . e^{-3.147D_{5i}}$$

$$P_i = \frac{e^{-3.351+2.808D_{1i}-2.333D_{2i}+3.295D_{3i}+3.556D_{4i}-3.147D_{5i}}}{1+e^{-3.351+2.808D_{1i}-2.333D_{2i}+3.295D_{3i}+3.556D_{4i}-3.147D_{5i}}}$$

ඉහත ආකෘතියට අනුව අනෙකුත් විචල්‍යයන් මගින් පරායත්ත විචල්‍යය සඳහා කිසිදු බලපෑක් නොමැති විට පදනම් විචල්‍යයන් මගින් කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය $P_i = \frac{e^{-3.351}}{1+e^{-3.351}} = 0.034$ වේ.

ස්ත්‍රී පුරුෂභාවයේ වෙනසට අනුව පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය $P_i = \frac{e^{2.808D_{1i}}}{1+e^{2.808D_{1i}}} = 0.943$ වේ. ඒ අනුව කර්මාන්තකරුවා පුරුෂයෙකු වන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය 0.943න් ඉහළ යයි.

කර්මාන්තකරුගේ වයස වෙනස්වන විට පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය $P_i = \frac{e^{-2.333D_{2i}}}{1+e^{-2.333D_{2i}}} = 0.088$ වේ. ඒ අනුව කර්මාන්තකරුවන්ගේ වයස ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය 0.088න් පහළ යයි.

කර්මාන්තකරුගේ පවුලේ සාමාජිකයින් ගණන වෙනස්වන විට පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය $P_i = \frac{e^{3.295D_{3i}}}{1+e^{3.295D_{3i}}} = 0.964$ වේ. ඒ අනුව කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය 0.964න් ඉහළ යයි.

කර්මාන්තකරුගේ මාසික ආදායම වෙනස්වන විට පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය $P_i = \frac{e^{3.556D_{4i}}}{1+e^{3.556D_{4i}}} = 0.972$ වේ. ඒ අනුව කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය 0.972න් ඉහළ යයි.

කර්මාන්තකරුගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය වෙනස්වන විට පරායත්ත විචල්‍යය වෙනස්වීමේ සම්භාවිතාවය $P_i = \frac{e^{-3.147D_{5i}}}{1+e^{-3.147D_{5i}}} = 0.041$ වේ. ඒ අනුව කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය ක්‍රමයෙන් වැඩි වුවත් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාවය 0.041න් පහළ යයි. මෙයට හේතුව වන්නේ භාණ්ඩ අලෙවි කිරීම සඳහා යොදාගන්නා තාක්ෂණික ක්‍රම පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් වුවත් ඔවුන් ඒවා තම කර්මාන්ත නිෂ්පාදන අලෙවිය සඳහා භාවිත නොකිරීමයි.

ඉහත ආකෘතියට අනුව කර්මාන්තකරුගේ ස්ත්‍රී පුරුෂභාවය, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම යන ස්වායත්ත විචල්‍යයන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතය යන පරායත්ත විචල්‍යය සමඟ අනුලෝම සම්බන්ධතාවන් දක්වන අතර කර්මාන්තකරුවන්ගේ වයස හා කර්මාන්තකරුවන්ට එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන ස්වායත්ත විචල්‍යයන් සමඟ ප්‍රතිලෝම සම්බන්ධතා දක්වයි.

### 5. සමාලෝචනය

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිත්තල, රිදී, පිළිම නෙළීම, බෙර හා වෙස් ඇඳුම් කට්ටල නිර්මාණය යන සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත කර්මාන්තකරුවන් 58ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදිය යටතේ ලබාගනිමින්

මෙම කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව අධ්‍යයනය කර ඇත. සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා පවත්නා තාක්ෂණය ප්‍රමාණවත්දැයි විමසා බැලීම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව පෙන්වාදිය හැකිය. පර්යේෂණය සඳහා දත්ත රැස්කිරීමේදී ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද යොදාගත් අතර මෙලෙස රැස්කරගත් දත්ත විශ්ලේෂණයේ දී සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයේ ප්‍රමාණවත් බව හඳුනාගැනීමට ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායනය මෙන්ම සුදුසු පරිදි විස්තරාත්මක සංඛ්‍යානයද යොදාගෙන ඇත.

ඉහත සංඛ්‍යානමය දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් මෙම පර්යේෂණයේ අරමුණු තෘප්ත කරගත් අතර ඒ හරහා එළඹි නිගමන පහතින් දැක්වේ.සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳව අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයේ ප්‍රමාණවත් බව පිළිබඳව නිගමනවලට එළඹී ඇත. සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳව රැස්කරගත් දත්ත අනුව කර්මාන්තකරුවන්ගෙන් 64% වැනි බහුතරය භාණ්ඩ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා තාක්ෂණික ක්‍රම භාවිත නොකරන බවත් 36% වැනි කුඩා ප්‍රමාණයක් පමණක් තම අලෙවිකරණ ක්‍රම ලෙස තාක්ෂණික ක්‍රම භාවිත කරන බවත් පෙනී යයි. කර්මාන්තකරුවන් 40%ක් පමණක් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදාගන්නා තාක්ෂණික ක්‍රම පිළිබඳව දැනුවත්ව සිටිය ද 60%ක බහුතර මෙම තාක්ෂණික ක්‍රම පිළිබඳව එතරම් දැනුවත්භාවයකින් යුක්ත නොවේ. 4%ක කර්මාන්තකරුවන් ප්‍රමාණයක් නිෂ්පාදන අලෙවිකිරීම සඳහා යොදාගන්නා තාක්ෂණික ක්‍රම පිළිබඳව දැනුවත්ව සිටිය ද එම ක්‍රම නිෂ්පාදන අලෙවිකිරීම සඳහා යොදා නොගනී. ඒ අනුව කර්මාන්තකරුවන් වට්ස්ඇප් (whatsapp), ෆේස්බුක් (Facebook), විද්‍යුත් තැපැල (E mail) ආදිය නිෂ්පාදන අලෙවිකිරීම සඳහා යොදාගන්නා අතර යූ ටියුබ් (YouTube), ඉන්ස්ටග්‍රෑම් (Instergram) හා වෙබ් අඩවි (Websites) නිෂ්පාදන අලෙවිය සඳහා යොදා නොගනී. මෙම බොහෝ ක්‍රමවේද භාවිතයට නොගැනීමට බලපාන ප්‍රධාන හේතුව වනනේ එම තාක්ෂණික ක්‍රමවේ ද පිළිබඳව පවතින නොදැනුවත්භාවයයි. 36%ක බහුතර කර්මාන්තකරුවන් ප්‍රමාණයක් නොදැනුවත්භාවය නිසා බොහෝ සාර්ථක අලෙවිකරණ ක්‍රමවේද භාවිතයට නොගනී. තාක්ෂණික ගැටලු නිසා 27%ක් හා ප්‍රාග්ධන හිඟකම නිසා 29%ක් සාර්ථක අලෙවිකරණ ක්‍රමවේද භාවිතයට නොගනී. 8%ක් මේ සඳහා කාලය යොමු කිරීමට අකමැති වීම, මෙම තාක්ෂණික ක්‍රම හරහා එතරම් සාර්ථක ප්‍රතිඵල නොලැබීම යන හේතු නිසා මෙම අලෙවිකරණ ක්‍රමවේද භාවිතයට නොගනී. තාක්ෂණික ක්‍රමවේද භාවිත කරන කර්මාන්තකරුවන්ගේ අදහස්වලට අනුව 85% වැනි බහුතර කර්මාන්තකරුවන්ට මේ හරහා සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවී තිබේ. 5%ක කර්මාන්තකරුවන් ප්‍රමාණයක් මෙම තාක්ෂණික ක්‍රම භාවිත කළ ද ඒ හරහා සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී නොමැත. එමෙන් ම කර්මාන්තකරුවන් 10% ක ප්‍රමාණයක් මෙම තාක්ෂණික ක්‍රම භාවිතය හරහා සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවීද නොහැකිවී ද යන්න වටහාගැනීමට සමත් නොවේ.

කයිවර්ග පරීක්ෂා හරහා කර්මාන්තකරුවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, කර්මාන්තකරුවන්ගේ වයස, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම හා කර්මාන්තකරුවන් එම තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය යන ස්වායත්ත විචල්‍යයන් නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට බලපාන විචල්‍යයන් වන බව හඳුනාගත් අතර මෙම විචල්‍යයන් මගින් සාම්ප්‍රදායික කර්මාන්ත හිමියන්ට නිෂ්පාදන අලෙවිකරණයෙහි ලා තාක්ෂණික ක්‍රම භාවිතයට වන බලපෑම හඳුනාගැනීමට ද්වීමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය ඇස්තමේන්තු කර ඇත. මේ හරහා එක් එක් විචල්‍යය වෙනස්වන විට තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව ගණනය කළ අතර ඒ හරහා කර්මාන්තකරුවා පුරුෂයෙකු වන විට නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.943න් ඉහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ වයස ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.088න් පහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ පවුලේ සාමාජිකයින් ගණන ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.964න් ඉහළ යන බවත්, කර්මාන්තකරුවන්ගේ මාසික ආදායම ක්‍රමයෙන් වැඩිවන විට සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.972න් ඉහළ යව බවත්, කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ක්‍රම පිළිබඳව පවතින දැනුවත්භාවය ක්‍රමයෙන් වැඩි වුවත් සාම්ප්‍රදායික කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.041න් පහළ යන බවත්, අනෙකුත් විචල්‍යයන් මගින් පරායත්ත විචල්‍යය සඳහා කිසිදු බලපෑක් නොමැති විට පදනම් විචල්‍යයන් මගින් කර්මාන්තකරුවන් නිෂ්පාදන අලෙවිකිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතයට යොමුවීමට ඇති සම්භාවිතාව 0.034ක් වන බවත් ගණනය කර ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Arachchge, S. A. (2017). Modernization of Tradition for Endurance: Future and Challenges of Traditional Brass Industry of Pilimatalawa, Sri Lanka. *4th International Conference on Rural Development and Entrepreneurship - 2017*. Retrieved from https://www.researchgate.net/publication/323392730_MODERNIZATION_OF_TRADITION_FOR_ENDURANCE_FUTURE_AND_CHALLENGES_OF_TRADITIONAL_BRASS_INDUSTRY_OF_PILIMATALAWA_SRI_LANKA

Aydin, S., Ozer, G., & Cetin, A. T. (2007). The Relationship Between Marketing And Product Development Process And Their Effects On Firm Performance. *Academy of Marketing Studies Journal*, 53-68. Retrieved from https://www.researchgate.net/publication/278300250

Bandara, K. E. (2015, December 22). Retrieved from www.slideshare.net: https://www.slideshare.net/kanchanaeranga/ss-56361247

Barber, J. P., Villar, C., & Sarria, G. B. (2020). Configurational Theory in Traditional Manufacturing Industries: A New Model of High-Performing Small and Medium-Sized Enterprises. *Sustainability 2020*, *12*(17). doi:doi:10.3390/su12176818

Bhayani, S. (2018). Internet Marketing vs Traditional Marketing: A Comparative Analysis. Retrieved from https://www.researchgate.net/publication/327645389

Department of Census and Statistics-DCS. (2015). *Key Indicators of Industry Trade and Services Sector Economis Census 2013/14*. Department of census and statistics. Department of census and statistics. Retrieved from www.statistics.gov.lk

Dharmawardhana, Mahanama; Gowrynathan, J; Kulatunga, Asela; Herath, S A; Jayasinghe, R; Ekanayake, R E; Chandrakumar, Chanjief. (2015). Technological needs assessment of traditional brass industry to enhance the productivity. *International Conference on Industrial Engineering and Operations Management*. Retrieved from https://www.researchgate.net/publication/277813868

Iskanius, P., Page, T., & Anbuudayasankar, S. P. (2010). The traditional industry sector in the changing business environment - A case study of the Finnish steel product industry. *International Journal of Electronic Customer Relationship Management*, *4*(4), 395-414. Retrieved from https://www.researchgate.net/publication/235923447

Jayawickrama, M., Dharmawardhana, M., Kulatunga, A., Karunarathna, K. G., & Osadith, S. A. (2016). Enhancement of productivity of traditional brass manufacturing industry using sustainable manufacturing concept. *13th Global Conference on Sustainable Manufacturing - Decoupling Growth from Resource Use*, 562 – 567. doi:10.1016/j.procir.2016.01.134

Kumar, D., & Rajeev, P. V. (2019). A New Strategic Approach for Marketing of Handicraft Products. Retrieved from https://www.researchgate.net/publication/331233388

Mohapatra, S., & Dash, M. (2011). Problems Associated with Artisans in Making of Handicrafts in Orissa, India. *Management Review: An International Journal*, 56-81. Retrieved from http://higherlogicdownload.s3.amazonaws.com/INFORMS/a19154ba-c5e4-4a42-af42-0c6b23c694b8/UploadedImages/MRIJ6(1)2011(3).pdf

Nickerson, R. C., Remane, G., Kolbe, L. M., & Hanelt, A. (2017). Discovering Digital Business Models in Traditional Industries. *Journal of Business Strategy, 38*(2), 41-51. doi:10.1108/JBS-10-2016-0127

Remane, G., Hanelt, A., Wiesboeck, F., & Kolbe, L. M. (2017). Digital Maturity in Traditional Industries – An Exploratory Analysis. *Twenty-Fifth European Conference on Information Systems (ECIS), Guimarães,Portugal*. Retrieved from https://www.researchgate.net/publication/316687803

Roy, T. (2001). Traditional Industry in the Economy of Colonial India. *The Journal of Asian Studies, 60*(1). doi:10.2307/2659582

Secondo, R., & Calabrese, G. (2010, November). Traditional SMEs and Innovation: The Role of the Industrial Policy in Italy. *Entrepreneurship and Regional Development, 15*(3). doi:10.1080/08985620210158401

Senevirathne, S. R., Wewala, W. H., Jayasekara, B. M., Vidanapathirane, T. R., & Oshadie, M. N. (2010). *Study to Identify the Posibilities and Constraints in Developing Curricular for Sri Lankan Traditional Handicraft Sector under the National Vocational Qualification Frame.* Tertiary and Vocational Education Commission. Retrieved from http://www.tvec.gov.lk/wp-content/uploads/2018/02/unvotec-02.pdf

Stearns, P. N. (2008). *Oxford Encyclopedia of the Modern World.* Oxford University Press. Retrieved from https://www.oxfordreference.com/view/10.1093/oi/authority.20110803105225109

# වනඅලි උවදුර ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සහ ජන ජීවිතයට සිදුකරන බලපෑම පිළිබඳ අධ්‍යයනය (පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

ඊ. පී. පී. එච්. එදිරිවීර

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
poorniediriweera2018@gmail.com

***සංක්ෂේපය***

*මිනිසා, සතා සිවුපාවන්, ගහකොළ, ඇළදොළ ආදී වූ ස්වභාවික සම්පත් සමඟ දක්වනුයේ ඉතා සමීප සම්බන්ධයකි. එය පුරාණයේ සිට අද දක්වාම ක්‍රමයෙන් විකාශනය වෙමින් පැමිණිය ද අද වන විට මිනිසුන් පරිසරය සහ සතුන් සමඟ දක්වන්නා වූ සම්බන්ධයේ දැඩි දුරස්ථභාවයක් පවතී. එසේ මිනිසුන් පරිසරය හා සංවේදී නොවීම සහ සතුන් කෙරෙහි පවතින්නා වූ ආකල්ප වෙනස් වීම තුළ මිනිසුන් හා සතුන් අතර විවිධාකාරයේ ගැටුම් නිර්මාණය වී ඇති බවක් දක්නට ලැබේ. අද වන විට මිනිසුන් හා වන අලින් අතර එසේ ගැටුමක් නිර්මාණය වී ඇත. ජනගහන වර්ධනය සහ මිනිසුන්ගේ එදිනෙදා  අවශ්‍යතා පුළුල් වීමත් සමඟ අලින්ට හිමි  වාසස්ථාන මිනිසුන්ගේ ග්‍රහණයට නතු වීම තුළින් අලින්ට වාසය කිරීමට පැවති භූමි ප්‍රමාණය අවම වීම මත ඔවුන් මිනිස් ජනාවාස ආක්‍රමණය කිරීම සිදු කර ඇත. මේ හේතුවෙන් ඇරඹි වන අලි මිනිස් ගැටුම අද වන විට උවදුරක් බවට පත්ව ඇත. ඒ අනුව වන අලින්ගෙන් එල්ලවන බලපෑම් හමුවේ ග්‍රාමීය ජනතාව දැඩි වශයෙන් පීඩාවට පත්ව ඇත. මෙම අධ්‍යයනය ඔස්සේ වන අලි උවදුර නිසාවෙන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සහ ජන ජීවිතයට එනම් ජන ජීවිතය සැළකීමේදී මානසික සහ සමාජීය වශයෙන් ඔවුන්ට සිදුව ඇති බලපෑමේ ස්වභාවය අධ්‍යයනය කිරීම සිදු කර ඇත. එහිදී එම අරමුණු ළඟා කර ගැනීම සඳහා පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන අලින් සහ මිනිසුන් අතර ගැටුම් බහුලව වාර්තා වූ ග්‍රාම නිළධාරී කොට්ඨාස දෙකක් සරල සසම්භාවී නියැදීම යටතේ නියැදි සමීක්ෂණයක් සිදු කරමින් අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගෙන ඇත. එසේ රැස් කර ගන්නා ලද ප්‍රාථමික දත්තයන් විස්තරාත්මක සහ අනුමිතික සංඛ්‍යාන ශිල්ප ක්‍රම යොදා ගනිමින් අදාළ නිගමනයන් ලබා ගැනීම සඳහා විශ්ලේෂණයන් සිදු කර ඇත. මෙහිදී අලි මිනිස් ගැටුම සම්බන්ධව විවිධ වු නිගමනයන්ට එළෙඹි අතර දැනට පවතින වන අලි උවදුර නිසාවෙන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකමය සමාජීය සහ මානසික වශයෙන් දැඩි ලෙස පීඩා විඳින බවට තහවුරු විය. එමෙන්ම වන අලි උවදුර නිසාවෙන් එල්ල වන බලපෑම් අවම කිරීම සඳහා සුදුසුම පියවරක් ලෙස අලි වැට ඉදි කිරීම දක්වා තිබුණ ද එහි නිසි ප්‍රයෝජන ලබා ගැනීමට නම් එය නිසි ආකාරව නඩත්තු කිරීම අවශ්‍ය වන බව ද නිගමනය කර ඇත. එමෙන්ම වන අලින්ගේ බලපෑම නිසාවෙන් සිදුවන දේපල හා වගා හානි සම්බන්ධව වන්දි ලබා දීමේදී ක්‍රමවත් සහ කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය කරමින් සිදුවන හානි සඳහා විසඳුම් ලබා දිය යුතු අතර, මෙම වන අලි මිනිස් ගැටුම සම්බන්ධව දීර්ඝ කාලීන වූ විසඳුම් ඉදිරිපත් කරමින් මෙය අවම කිරීමට කටයුතු කළ යුතු බව මෙම සමීක්ෂණය ඔස්සේ නිගමනය කර ඇත.*

***මුඛ්‍ය පද : ආර්ථික, බලපෑම, මානසික, වනඅලි උවදුර, සාමාජීය***

## 1. හැඳින්වීම

ගමක ජීවත්වන ගැමියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ කෘෂිකර්මාන්තය යි. එමෙන්ම ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 20%ක ප්‍රමාණයක් සැපයෙන්නේ කෘෂිකර්මාන්තය තුළින් වන අතරම, ග්‍රාමීය ගොවි ජනතාවගෙන් 66%ක ප්‍රමාණයක් වී වගාව ආශ්‍රිතව තම වගා කටයුතු සිදු කරනු ලබයි. එහි දී ඔවුන් කුඹුරු වගාව සහ හේන් වගාව තුළින් තම සමස්ථ ආර්ථිකය සවිබල ගන්වා ගනු ලැබේ. එසේ කෘෂිකර්මාන්තය ප්‍රධාන අර්ථ ක්‍රමය කොටගෙන ජීවත් වූ ගැමියන්ගේ අවශ්‍යතා හා වුවමනා සීමිත විය. ඒ අනුව ඉතාමත් සරලව සහ පරිසර හිතකාමී ලෙස ඔවුන් එකල තම ජීවන රටාව පවත්වා ගෙන ගිය බව අපට හඳුනාගත හැකි වේ. ගැමි ජනතාව පරිසරයට ගහට කොළට සතා සිවුපාවාට මහත් කාරුණික විය. බුදු සමයේ සිටම එය අපට විවිධ අවස්ථාවලදී පිළිබිඹු වී ඇත. ඒ අනුව අලි සහ මිනිසුන් අතර ද පැවතියේ ඉතා යහපත් සම්බන්ධයකි. ගජතා, අලියා, හස්තියා වශයෙන් හඳුන්වනු ලබන අලින් සහ මිනිසුන් අතර සම්බන්ධය ඉතාම පැරණි සම්බන්ධයක් බව අපට පැහැදිලි වේ (අමරසේකර, 2010).

ප්‍රචණ්ඩ අලියෙකු බිහිවන්නේ අහිතවත් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන්ම විනා උපතින් උරුම කර ගන්නා වෛරයක් නිසා නොවේ. එසේ නම් මෙයින් පැහැදිලිවන කරුණ වනුයේ මෙම අලි මිනිස් ගැටුම යන සංකල්පය  අනිසි මිනිස් ක්‍රියාකාරකම්වල ම ප්‍රතිඵලයක් බවයි. නමුත් අතීතය දෙස අවධානය යොමු කිරීමේදී ලංකාවේ ජනප්‍රවාද, ජනකතා, කතාන්දර, ජනවහර ඔස්සේ අලි මිනිස් ගැටුමක් වාර්තා නොවන අතර ඉංග්‍රීසි හා ඕලන්ද ජාතිකයින්ගේ ලිඛිත මූලාශ්‍ර තුළ අලි මිනිස් ගැටුමක් පිළිබඳ බිහිසුණු වාර්තා හමු වීමත් තුළ මෙම ගැටලුව කතාබහට ලක්වන ගැටලුවක් බවට පත් වී ඇත (අමරසේකර, 2010). ඓතිහාසික වාර්තා අනුසාරයෙන් ලංකාවේ අලි මිනිස් ගැටුම, වගා හානි ස්වභාවයේ සිට ජීවිත හානි ස්වභාවය දක්වා ක්‍රම ක්‍රමයෙන් උග්‍ර වී ඇත්තේ අහිතවත් මිනිස් ක්‍රියාකාරකම් නිසාම බව පැහැදිලි වේ. මේ ආකාරයට සීඝ්‍රයෙන් වර්ධනය වන ජනගහනයට සාපේක්ෂව භූමි ප්‍රමාණ හිඟ බැවින් පවතින වනාන්තර ක්ෂය වෙමින් ඒවා මිනිසාගේ ගොදුරු බවට පත් වි ඇත. 1983 දී වන ගහනය 26.6%ක්ද, 1992 දී 20.2%ක්ද වූ අතර 1994 වන විට එය 13% ප්‍රමාණයක් දක්වා සීඝ්‍රයෙන් අඩු වී ඇත. ගැමි ජනාවාස ගණනින් වැඩිවත්ම ඒවා අනුක්‍රමයෙන් නගර බවට පත්විය. හුදෙක්ම ජනගහනයේ වැඩිවීම ම පමණක් නොව තාක්ෂණයේ දියුණුව, සන්නිවේදනයේ දියුණුව, ප්‍රවාහන ක්ෂේත්‍රයන්ගේ දියුණුව සහ විශ්ව ගම්මාන සංකල්පය යනාදිය හේතුවෙන් ගම ක්‍රම ක්‍රමයෙන් නගරයක් ම විය (අමරසේකර, 1994).

වන අලි මිනිස් ගැටුමට බලපාන සාධක ලෙස ආර්ථික සංවර්ධන කටයුතු හේතු කොටගෙන වනාන්තර විනාශ විම, වනාන්තර භූමි ප්‍රදේශ විවිධ වූ හේතුන් නිසා දූෂණයට පත් වීම, මිනිසුන් විසින් වනාන්තර ආක්‍රමණය කිරීම, වනාන්තර භූමි ප්‍රදේශවල පවතින තෘණ භූමි ගෘහාශ්‍රිත ගවයන්ගේ ආහාර බවට පත් වීම, වනාන්තර තුළ අලින්ට වාසය කිරිමට සුදුසු පරිසර තත්ත්වයන් ක්ෂය වී යාම ආදිය දැක්විය හැකිය. එමෙන්ම ආසියානු කලාපයේ අලින් සඳහා පවතින්නා වූ ස්වභාවික වාසස්ථානවල ක්‍රමික අඩු වීමක් දක්නට ලැබෙන අතර ලෝක ජන ගහනයෙන් 20% පමණ ප්‍රතිශතයක් ජීවත්වනු ලබන්නේ අලින්ගේ වාසස්ථාන පවතින ප්‍රදේශවල සහ ඒ අවට ප්‍රදේශවල වේ. ඒ අනුව අලින් සහ මිනිසුන් අතර ගැටුම්වල වැඩි වීමක් දක්නට ලැබේ (බණ්ඩාර, 2002).

අලි මිනිස් ගැටුම හේතුකොට ගෙන ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්ත්වයට, ජන ජීවිතයට සිදුවන බලපෑම කෙබඳු ද යන්න අප විසින් අධ්‍යයනයට බඳුන් කළ යුතු කාලය එළඹ ඇත. ඒ අනුව අලි මිනිස් ගැටුම මැඩලීමට කොතෙකුත් විසඳුම් ගෙන තිබුණ ද දිනෙන් දින එය උග්‍ර අතට පත්වනවා හැර එහි අවම වීමක් දක්නට ලැබෙන්නේ නැති තරම්ය. දිනපතා විවිධ මාධ්‍ය තුළත් මෙය සුපුරුදු පුවතක් බවට පත්ව තිබුණ ද ඒ සෑම අවස්ථාවකදී ම සිදු වූ දේපල, ජීවිත, වගා හානි පිළිබඳව කරුණු ඉදිරිපත් වුවද දීර්ඝ කාලීන විසඳුමක් පෙනෙන තෙක් මානයකවත් නොමැති වීම කණගාටුවට කරුණකි. මන්දයත් නාගරික ජනයාට මෙම උවදුර නොමැති වීම නිසා නාගරික ජනයා ඉතා සුවපහසු ලෙස තම ආර්ථික, සමාජ තත්ත්වය පියවරෙන් පියවර ඉදිරියට ගෙන යනවිට ඈත ගමක ජීවත් වන ගැමියා වන අලි උවදුර පාදක කර ගෙන ආර්ථික සහ ජන ජීවිතය අතින් නිරන්තරයෙන් පිඩාවට පත්වෙමින් සිටී.

මෙම අධ්‍යයනය සිදු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ අලි උවදුර ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සහ ජන ජීවිතයට ඇතිකරන බලපෑම හඳුනා ගැනීමයි. එසේම වර්තමානය වනවිට ග්‍රාමීය ප්‍රදේශවල පවතින වන අලි උවදුරේ ස්වභාවය හඳුනා ගැනීම, වන අලි උවදුර ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට ඇති කරන බලපෑම හඳුනා ගැනීම, වන අලි උවදුර ග්‍රාමීය ජනතාවට මානසික හා සමාජීය වශයෙන් ඇති කරන බලපෑම හඳුනා ගැනීම සහ අලි මිනිස් ගැටුමට ගෙන ඇති විසඳුම් සහ ඒවායේ ප්‍රවණතාවය හඳුනා ගැනීම ආදී සෙසු අරමුණු ද ඒ අතර විය.

**2. සාහිත්‍ය විමර්ශනය**

වියළි කලාපයේ ජලාශ්‍රිත ශිෂ්ඨාචාරය බිඳ වැටීමෙන් පසුව එහි වනාන්තර පැතිරුණු අතර ඒවා බොහෝමයක් ලඳු කැලෑ විය. මෙය වල් අලීන්ට සහ අනෙකුත් සතුන්ට ආශිර්වාදයක් වූ බව නොඅනුමානයි. මෙම කැලෑවල අලියාට අවශ්‍ය ආහාරද, වාරි ජලාශ සහ වල්කෙමවල් තුළ ඌට අවශ්‍ය ජලයද තිබුණු නිසා අලි ගහණය ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන්නට ඇත. තෙත් කලාපය ක්‍රමයෙන් ජනාවාසවත්ම ඉන් අවතැන් වූ සමහර අලින් සහ අනෙකුත් වන සතුන් වියළි කලාපයට සංක්‍රමණය විය. මහා පරිමානයෙන් කැළෑ එළි කිරීම වල් අලින්ට කෑම හිඟයට තුඩු දීමට හේතු වූ බව පැහැදිලි කරුණකි. මේ නිසා තම සුපුරුදු නිවාස පරාස වලින් පිටතට යාමට සිදු වූ වල් අලි වගා බිම් කරාද පැමිණියහ. සමහරවිට වගා සඳහා තව තවත් කැලෑ එළි කිරීමේදී අලින්ගේ වාර්ෂික සංචාරක මාර්ගවලද හේන් බිහි වන්නට ඇත. හේතුව කුමක් උවත් වල් අලි වැසි කාලයේ මෙන්ම ඊට පසු මාස වලද වගාවන් තුළට කඩා වැදීමට පටන් ගත්හ (De Silva, 1998).

වල් අලින්ගෙන් මිනිසාට හානි පැමිණෙන ආකාර තුනකි. එනම් තුවාල සිදුවීම් හෝ මරණ, නිවාස සහ අනෙකුත් දේපල හානි සහ වගා විනාශයන්ය (De Silva, 1998). මෙම හානි තුනම එක්ව සලකා බැලූ කළ 2010-2018 කාල සීමාව තුල වැඩිම සිදුවීම් ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙනි (Prakash, Wijerathne, & Fernando, 2020). මෙම ගැටුම අවම කිරීමට නම් මිනිසා සහ අලියා සහජීවනයෙන් සිටීම වැදගත් වේ. මෙය සිදුකල හැකි වඩාත්ම සුදුසු ක්‍රමය ලෙස අලියා භයානක පලිබෝධකයකුගේ සිට ආර්ථිකමය වාසි සහිත ජීවීන් කොට්ඨාශයක් ලෙස පරිවර්තනය කිරීම වැදගත් වේ.

අද වන විට අලි මිනිස් ගැටුම වඩාත් නරක තත්වයක පවතින අතර හෙට දිනයේදී එය තවත් බැරෑරුම් වනු ඇත. අලි මිනිස් ගැටුම මුලුමනින්ම තුරන් කළ නොහැකි උවද එය පාලනය කළහැකි මට්ටමක පවත්වා ගැනීමට වගබලා ගත යුතුය (Santiapillai, Wijeyamohan, Bandara, Athurupana, Dissanayake, & Read, 2010).

### 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ, අධ්‍යයන සංගහනය ලෙස ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුමට මුහුණපාන සියලුම ග්‍රාමීය ජනතාව හඳුනාගත හැකි අතර, අධ්‍යයනයේ ඉලක්කගත සංගහනය ලෙස අලි මිනිස් ගැටුමට අදාලව වැඩිම බලපෑමක් පවතින අනුරාධපුර දිස්ත්‍රික්කය හඳුනාගත හැකිය. සමස්ථ සංගහනය අධ්‍යයනයට පවතින සීමා මඟහරවා ගනිමින් සංගහනයෙන් නියදියක් තෝරා ගැනීම සිදු කළ යුතු අතර, ඒ අනුව 2018-2019 වසර වලට අදාලව වනජීවී වාර්තා අධ්‍යයනය කිරීමේදී අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතුරින්, අලි මිනිස් ගැටුමට අදාළව වැඩිම වාර්තාගත සිදුවීම් ප්‍රමාණයක් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වන පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නියදි සංගහනය ලෙස යොදාගන්නා ලදි. මෙම අධ්‍යයනයට අදාළ ව සංගහනය තුළින් නියැදිය තෝරා ගැනීම සඳහා, සසම්භාවී නියැදුම් ක්‍රමයක් වන සරල සසම්භාවී නියැදීමේ ක්‍රමවේදය භාවිතා කරන ලද අතරම මෙම අධ්‍යයනයට අදාළව දත්ත රැස් කිරීමේදී පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිළධාරී වසම් 2ක් ඇසුරු කරගනිමින් 100කින් යුත් නියදියක් තෝරා ගන්නා ලදි. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද ද්විතීයික දත්ත සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා, පුවත්පත් වාර්තා, පර්යේෂණ මාතෘකාවට අදාළ ග්‍රන්ථ ආදිය යොදා ගන්නා ලදී.


### 4. දත්ත විශ්ලේෂණය

මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත යන වර්ග දෙකෙන්ම දත්ත රැස් කිරීම සිදු කරන ලදී. එහිදී ප්‍රධාන වශයෙන්ම ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. ප්‍රශ්නාවලිය, දත්ත දායකයින් වෙත ඉදිරිපත් කිරීම සඳහා මුහණුට මුහුණලා හමුවී පිළිතරු ලබාගැනීමේ ක්‍රමය භාවිතා කරන ලදී. එනම් ප්‍රශ්නාවලිය, දත්ත දායකයින් වෙත වාචිකව ඉදිරිපත් කර, ඔවුන් ඒ සඳහා ලබාදෙන පිළිතුරු ලකුණු කර ගැනීම මෙහිදී සිදුකරන ලදි. මේ සඳහා හිරිවඩුන්න ග්‍රාම නිළධාරී වසමෙන් පුද්ගලයන් 59 දෙනෙක් සහ මහරඹාවැව වසමෙන් පුද්ගලයන් 41 දෙනෙකු සසම්භාවීව තෝරාගෙන, ප්‍රශ්න ඉදිරිපත් කිරීම සිදුකරන ලදි. මීට අමතරව සම්මුඛ සාකච්ඡා සහ සෘජු නිරීක්ෂණය යන ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයන්ද මේ සඳහා යොදාගන්නා ලදි. පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හිරිඩඩුන්න සහ මහරඹාවැව ග්‍රාම නිළධාරී කාර්යාල, අනුරාධපුර වනජීවී කාර්යාලය, රිටිගල වනජීවී කළාප කාර්යාලය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, පුවත්පත් වාර්තා, පර්යේෂණ මාතෘකාවට අදාළ ග්‍රන්ථ යනාදිය ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස යොදා ගන්නා ලදි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දත්ත වර්ග දෙකම මෙම අධ්‍යනය සඳහා භාවිතා කරන ලද බැවින්, ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයන් දෙකම මේ සඳහා භාවිතා කර ඇත. ඒ අනුව විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණය, කයි වර්ග පරීක්ෂාව සහ අන්තර්ගත විශ්ලේෂණය යන දත්ත විශ්ලේෂණ ක්‍රමයන් මේ සඳහා යොදාගන්නා ලදි.

## 4.1 නියැදි සංයුතිය

සංගහනයෙන් එනම්, පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් තෝරා ගන්නා ලද 100 දෙනෙකුගෙන් යුක්ත නියැදිය ග්‍රාම නිළධාරී වසම අනුව, පුමිතිරි බව අනුව සහ සිදුකරනු ලබන රැකියාවන්ගේ ස්වභාවය අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය පහත පරිදි වේ.


*ප්‍රස්තාර සටහන 4.1 : ප්‍රතිචාරකයන් පදිංචි ග්‍රාම නිළධාරී වසම අනුව නියැදි ව්‍යාප්තිය*




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත 4.1 ප්‍රස්තාර සටහනට අනුව ග්‍රාම නිළධාරී වසම මත පදනම්ව සලකා බැලීමේදී වැඩි ප්‍රතිචාරකයන් පිරිසක් හිරිවඩුන්න ග්‍රාම නිළධාරී වසම තුළ ජීවත්වන පුද්ගලයන් බව පෙනී යන අතර එය සංඛ්‍යාත්මකව 59කි. සමස්ත නියැදියෙන් ඉතිරි ප්‍රතිචාරකයන් ප්‍රමාණය එනම් 41 දෙනෙකු මහරඹාවැව ග්‍රාම නිළධාරී වසමේ පදිංචිකරුවෝ වෙති. මෙම ග්‍රාම නිළධාරී වසම් දෙකේ සමස්ත ජනගහනය විමසා බැලීමේදී හිරිවඩුන්න වසම තුළ 1193ක් සහ මහරඹාවැව වසම තුළ 845ක ජනගහනයක් පදිංචිව සිටින බැවින් නියැදිය තුළට ඇතුළත් වීමේ වැඩි ඉඩකඩක් හිරිවඩුන්න වසමේ ප්‍රතිචාරකයන්ට ලැබේ.

*ප්‍රස්තාර සටහන 4.2 : ප්‍රතිචාරකයන්ගේ පුමිතිරිබව අනුව නියැදි ව්‍යාප්තිය*





මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත ප්‍රස්තාර සටහනට අනුව පුමිතිරි බව සළකා බැලීමේ දී ප්‍රතිචාරකයින් වැඩි පිරිසක් පුරුෂයින් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 62% කි. ස්ත්‍රී සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස 38% ක් වන අතර එය පුරුෂ ප්‍රතිශතයට වඩා අඩු අගයක් ගන්නා බව පෙනේ. ඒ අනුව වන අලි උවදුර පිළිබඳ අධ්‍යයනයේදී ප්‍රතිචාර ලබාදීම සඳහා වැඩි පිරිසක් පුරුෂ පක්ෂය සහභාගී වී ඇති බව පෙනී යයි.

## 4.2 වන අලි උවදුරේ ස්වභාවය

මෙම ගම්මාන ආශ්‍රිතව අලි මිනිස් ගැටුමේ ආරම්භය සිදු වූ කාල වකවානු පිළිබඳව මෙන්ම වන අලි උවදුරේ ස්වභාවය පිළිබඳව විමසීමකට ලක්කර ඇත.

*ප්‍රස්තාර සටහන 4.3 : වන අලි උවදුර පැවත එන කාලය*





මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත 4.3 ප්‍රස්තාර සටහන දෙස බැලීමේදී බහුතර ප්‍රතිචාරකයන් පිරිසක් එනම්, 61% ප්‍රතිශතයක් පිළිතුරු ලබා දී ඇත්තේ වසර 20ක පමණ කාලයක පටන් මෙම උවදුර පැවත එන බවයි. ප්‍රතිචාරකයන් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා තුළින් පැහැදිලි වූයේ මෙම වන අලි ගම් වැදීමේ ක්‍රියාවලිය ඉතාමත් ඈත අතීතයේ පටන් දක්නට ලැබුණු සිදුවීමක් බවත්, එය ඉමහත් ව්‍යවසනයක් බවට පත්ව ඇත්තේ වසර 20ක තරම් මෑත කාලයක සිට බවත්ය.

වන අලීන් ස්වභාවයෙන්ම රංචුවක් ලෙස, තුන්පත් රෑනක් ලෙස හෝ තනිවම ජීවත් වෙති. මෙම කණ්ඩායම් වලින් සිදුවන බලපෑම ප්‍රමාණාත්මක වශයෙන් පහත ප්‍රස්තාර සටහනෙන් විස්තර කෙරේ.

*ප්‍රස්තාර සටහන 4.4 : වන අලි බලපෑම සිදුවන ආකාරය*





මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

වන අලි උවදුරේ ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ප්‍රධාන වශයෙන් ක්‍රම තුනක් ඔස්සේ එම බලපෑම එල්ල වන බව හඳුනාගත හැකි වුවද, ප්‍රතිචාරකයින්ගේ අදහස අනුව වඩාත් ඉස්මතුව පෙනෙන්නේ ආකාර දෙකක් මගින් බලපෑම එල්ල වන බවයි. ඒ අනුව වැඩි දෙනෙකු එනම් මුළු නියැදියෙන් 54.22%ක ප්‍රමාණයක අදහස වී ඇත්තේ අලි රංචු මගින් වැඩි වශයෙන් බලපෑම් එල්ල වන බවයි. එමෙන්ම තනි අලීන් මගින් සිදුවන බලපෑම 38.55%කි. එම ප්‍රතිශතය අලි රංචුවකින් සිදුවන බලපෑමෙන් අඩකට පමණ ආසන්න බව පැහැදිලි වේ. අලි රංචුවක් වගා භූමියක් වෙත ඇතුළු වූ පසු ඔවුන් පලවා හැරීම ඉතාමක් අපහසු කාර්යක් බව ප්‍රතිචාරකයන්ගෙන් ලද තොරතුරු වලින් පැහැදිලි විය. ඒ අනුව අලි රංචුවක් මගින් සිදුවන හානිය තනි අලියෙකු විසින් සිදු කරන හානියට වඩා විශාල බව සමීක්ෂණය ඔස්සේ වැඩි දුරටත් තහවුරු කර ගත හැකි විය.

### 4.3 වගා හානිවීම්වල ස්වභාවය

මෙම වගාවන් වෙත අලීන්ගෙන් පැමිණෙන හානියේ ස්වභාවය, හානි සිදු කරන වගාවන්, සිදු වූ අලාභයන් යනාදිය පිළිබඳව තොරතුරු පහත පරිදි සාකච්ඡා කළ හැකිය.

*ප්‍රස්තාර සටහන 4..5 : බලපෑම් එල්ල වන වගාවන්*





මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

වන අලින්ගේ බලපෑම හේන්, කුඹුරු සහ ගෙවතු වගාවන් යන වගාවන් තුන සම්බන්ධයෙන්ම එල්ල වන අතර ඉහත ප්‍රස්තාර සටහනේ දක්වා ඇති පරිදි එයින් ද වැඩි බලපෑමක් එල්ල වන්නේ කුඹුරු වගාව සඳහා ය. එය ප්‍රතිශතයක් ලෙස 59% කි. ගෙවතු වගාවන් සම්බන්ධයෙන් එල්ලවන බලපෑම 30%ක් වන අතර අවම බලපෑමක් හේන් වගාවන්ට එල්ලවන බව දැක්විය හැකිය. එය 11%ක් පමණ වේ. මෙසේ හේන් වගාවන් සම්බන්ධයෙන් අඩු බලපෑමක් එල්ලවන වීමට හේතුව ලෙසට අඩු වශයෙන් හේන් වගාව කෙරේ නැඹුරු වීම දැක්විය හැකිය. හේන් වගාවන් සිදු කිරීමට වනාන්තර ප්‍රදේශවලට යාම අවධානම් කාර්යයක් වීම එයට හේතු ලෙස ඔවුහු පෙන්වා දුන්හ.

## 4.4 දේපල හානිවීම්වල ස්වභාවය

වන අලි ගම් වැදීම හේතුකොටගෙන සිදුව ඇති දේපළ හානිවීම්වල ස්වභාවය හඳුනා ගැනීම පහත පරිදි සිදුකොට ඇත.

*ප්‍රස්තාර සටහන 4.6 : දේපල හානි සිදුවීම*





මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත (2020)

සමස්ත ප්‍රතිචාරකයන් පිළිබඳව සැලකීමේදී බහුතර පිරිසකට වන අලීන් ගම්වැදීම හේතුවෙන් දේපල හානි සිදුවී ඇත. ඒ 66% ක ප්‍රතිශතයක් වශයෙනි. ඒ අනුව නියැදියෙන් හරි අඩකටත් වඩා වැඩි බහුතර පිරිසකට දේපළ හානි සිදුවී ඇති බව ප්‍රකාශ කළ හැකිය.

## 4.5 පුද්ගල හානිවීම්

වන අලීන් හේතුවෙන් සිදුවූ පුද්ගල හානි ප්‍රධාන කාණ්ඩ 3 වෙන්කර අධ්‍යයනය කිරීම සිදුකරන ලදි. පහත 4.7 ප්‍රස්තාර සටහනට අනුව පෙනී යන්නේ ප්‍රතිචාරකයන් 100 අතුරින් බහුතරයක්, පුද්ගල හානිවීම් වලට ලක්ව ඇති බවයි. ප්‍රතිශතයක් ලෙස එය 61%කි.


*ප්‍රස්තාර සටහන 4.7 : පුද්ගල හානිවීම්*




මූලාශ්‍රයː සමීක්ෂණ දත්ත (2020)

පුද්ගල හානිවීම් පිළිබඳව විමසා බැලීමේදී බහුතර ලෙස වාර්තා වී ඇත්තේ කම්පනයට පත්වීමට අදාළ සිදුවීම්ය. පුද්ගල හානිවීම්වලට මුහුණදුන් පිරිස අතුරින් ප්‍රතිචාරකයන් 32 දෙනෙකු කම්පන තත්වයන්ට මුහුණ දී ඇත. ආසන්න ප්‍රතිශතාත්මක අගයක් ලෙස දැක්වූ විට එය 35% කි. බරපතල ගණයේ හානි සිදුවූ ප්‍රතිචාරකයන් 8 දෙනෙකු හමුවූ අතර එය 12.9% ක ප්‍රතිශතයකි. ඍජු නිරීක්ෂණ වලදී දැකගත හැකි වු පරිදි බරපතල ගණයේ හානි සිදුවූ පුද්ලයන් අතර අත්පා කැඩුණු බිඳුණු මෙන්ම දෑස් අහිමි වූවන්ද වූ බවයි. මීට අමතරව රැස්කරගන්නා ලද තොරතුරු අනුව සුළු තුවාලවීම් සහිත ප්‍රතිචාරකයින් 22 නෙකුද වන බවක් දැක්වේ.


*ප්‍රස්තාර සටහන 4.8 : පුද්ගල හානියේ ස්වභාවය*




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

### 4.6 වන අලි උවදුර සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ගේ වර්තමාන තත්වය

*ප්‍රස්තාර සටහන 4.9 : වන අලි උවදුර සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ගේ වර්තමාන තත්වය*




මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

ඉහත ප්‍රස්තාර සටහනට අනුව නියැදිය සඳහා තෝරා ගත් ප්‍රතිචාරකයින්ගෙන් 71% ක ප්‍රතිශතයකගේ අදහස වී ඇත්තේ එම කිසිඳු පියවරක් වර්තමානය වන විට සාර්ථක වී නොමැති බවයි. එමෙන්ම 29%ක ප්‍රතිශතයක් අදහස් දක්වා ඇත්තේ එම පියවරයන් සාර්ථක බවයි. නමුත් සමීක්ෂණයේදී ලබාගත් ඍජු නිරීක්ෂණය ඔස්සේ පෙනී ගිය කරුණ නම් ගනු ලැබූ කිසිඳු පියවරක් සාර්ථක වී නොමැති බවයි.

### 4.7 ආර්ථිකමය වශයෙන් සිදුවන බලපෑම

වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට බලපෑමක් සිදුවීම අතර සම්බන්ධතාවයක් පවතී ද යන්න පරීක්ෂා කිරිම මෙහිදී සිදු කරනු ලබයි. ඒ සඳහා පහත 4.1 වගුවේ පරිදි කල්පිත ගොඩනගා ගනිමින් එම කල්පිත කයි වර්ග පරීක්ෂාව මගින් විමසා බැලීමකට ලක්කරන ලදි.

$H_0$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් නොපවතී.

$H_1$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් පවතී.

*වගුව 4.1 : කයි වර්ග පරීක්ෂාව (1)*

| පරීක්ෂා කරන විචල්‍යයන් | පියර්සන් කයි වර්ග අගය | වෙසෙසියා මට්ටම | තීරණය |
|---|---|---|---|
| වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය වශයෙන් ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම. | 33.659 | .014 | H0 කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීමට සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව ($X^2 = 33.659$, $P = 0.014$) $P < \alpha$ වන බැවින්, H0 කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව වන අලි ගම්වදින කාලය සහ ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකයට සිදුවන බලපෑම අතර සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය.

### 4.8 සමාජීය වශයෙන් සිදුවන බලපෑම

$H_0$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට සමාජීයමය වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් නොපවතී.

$H_1$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට සමාජීයමය වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් පවතී.

*වගුව 4.2 : කයි වර්ග පරීක්ෂාව (2)*

| පරීක්ෂා කරන විචල්‍යයන් | පියර්සන් කයි වර්ග අගය | වෙසෙසියා මට්ටම | තීරණය |
|---|---|---|---|
| වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට සමාජීයමය වශයෙන් ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම. | 21.411 | .045 | H0 කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට සමාජීයමය වශයෙන් ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීමට සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව ($X^2$ = 21.411, P = 0.045) P< α වන බැවින්, H0 කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව වන අලි ගම්වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට සමාජීයමය වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය.

## 4.9 මානසික වශයෙන් සිදුවන බලපෑම

$H_0$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට මානසික වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් නොපවතී.

$H_1$ : වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට මානසික වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් පවතී.

*වගුව 4.3 : කයි වර්ග පරීක්ෂාව (3)*

| පරීක්ෂා කරන විචල්‍යයන් | පියර්සන් කයි වර්ග අගය | වෙසෙසියා මට්ටම | තීරණය |
|---|---|---|---|
| වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට මානසික වශයෙන් ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීම. | 18.199 | .010 | H0 කල්පිතය ප්‍රතික්ෂේප කරනු ලබයි. |

මූලාශ්‍රයඃ සමීක්ෂණ දත්ත (2020)

වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට මානසික වශයෙන් ඇතිකරන බලපෑම අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීමට සිදුකළ කයි වර්ග පරීක්ෂාවට අනුව ($X^2$ = 18.199, P = 0.010) P< α වන බැවින් H0 කල්පිතය ප්‍රතික්ෂේප වේ. ඒ අනුව වන අලි ගම්වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට මානසික වශයෙන් සිදුවන බලපෑම අතර සම්බන්ධයක් පවතින බව හඳුනාගත හැකිය.

මෙසේ සිදු කළ පරීක්ෂාවන් මගින් පැහැදිලි වූයේ වන අලි ගම් වදින කාලය සහ ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය වශයෙන්, සමාජීයමය වශයෙන් සහ මානසික වශයෙන් ඇතිකරන බලපෑම අතර සම්බන්ධයක් පවතින බවයි.

## 5. සමාලෝචනය

සමස්ත නියැදියෙන් 84%ක ප්‍රමාණයක් රැකියාවක නිරත නොවන අතර එම පිරිස පූර්ණ වශයෙන් ගොවිතැන් කටයුතුවල නිරත වන බව හඳුනා ගත හැකිය. අලින් මගින් මිනිසුන්ට එල්ලවන බලපෑම ගත්විට අලි රංචු මගින් (54.22%) වැඩි බලපෑමක් පවතින බව තහවුරු විය. වගා කටයුතු සිදුකරන කාලවලදී මෙම සහ රාත්‍රී කාලයේදී වැඩි බලපෑමක් එල්ලවන බව හඳුනාගත හැකි විය. එමෙන්ම අලි මිනිස් ගැටුමේ උග්‍ර අවස්ථාවන් මීට වසර 20ක පමණ පටන් වඩා තීව්‍ර වී ඇති බවද මෙම සමීක්ෂණයෙන් නිගමනය කළ හැකිය. වැඩි වශයෙන් (59%) කුඹුරු වගාව සම්බන්ධයෙන් අලින්ගේ බලපෑම් එල්ලවන බව තහවුරු විය. ඊට සාපේක්ෂව හේන් සහ ගෙවතු වගාවන් සම්බන්ධයෙන් අවම බලපෑමක් එල්ල වේ. හේන් වගාවන් ආශ්‍රිතව බඩඉරිඟු (35.29%) හා ගෙවතු වගාවන් ආශ්‍රිතව පොල් (30.19%) සඳහා දැඩි ලෙස අලින්ගෙන් හානි පැමිණෙන බව හඳුනා ගත හැකිවිය. මීට අමතරව මඤ්ඤොක්කා, කෙසෙල් යන බෝග වගාවන් සම්බන්ධව ද බලපෑම් එල්ල වන බවට රැස්කර ගන්නා ලද දත්ත ඇසුරින් නිගමනය කළ හැකිවේ.

සමස්ත නියැදියම සැළකූ විට මහා පරිමාණයේ වගා හානි සිදුවීම් බහුලව පවතින අතර එය නියැදියෙන් 40% ක ප්‍රමාණයක් නියෝජනය කරයි. අලාභය රුපියල් 60,000-80,000 අතර වන ප්‍රතිචාරකයින් 39 දෙනෙකුද වනබව නිගමනය කළ හැකිය. එමෙන්ම වගා හානි සම්බන්ධව යම් පිරිසකට වන්දි ලැබී තිබුණද එම වන්දි මුදල් සිදුවූ අලාභය සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව සමීක්ෂණය ඔස්සේ නිගමනය විය. මේ හේතුවෙන් බොහෝ පිරිසක් ස්ථිර බෝග වගා කිරීමෙන් ඉවත්ව ඇති අතරම සිය පරිභෝජනය සඳහා පමණක් බෝග වගා කිරීමට නැඹුරු වෙමින් පවතින බව නිගමනය කළ හැකිය. මෙසේ ගොවියෝ කෘෂිකර්මාන්තයෙන් ඉවත්වීම වන අලි උවදුර නිසාවෙන් පීඩා විඳින ගම්මාන සඳහා පමණක් නොව රටේ සමස්ත ආර්ථිකය කෙරේම අහිතකර බලපෑම් ඇති කිරීමට පවතින ඉඩ ප්‍රස්ථාව වැඩිය. වන අලි මිනිස් ගැටුම නිසාවෙන් ග්‍රාමීය ජනතාවට ආර්ථිකමය, සමාජීය සහ මානසික වශයෙන් විශාල බලපෑමක් ජන ජීවිතයට එල්ලවන බව ද සමීක්ෂණය ඔස්සේ තහවුරු විය. ආර්ථික සහ සමාජීය වශයෙන් සිදුව ඇති බලපෑමට සාපේක්ෂව මානසිකව එල්ල වන බලපෑම ඉහළ බව ද හඳුනා ගත හැකි විය.

සමීක්ෂණයේ අතිරේක ප්‍රතිඵලයක් ලෙස මේ අයුරින් වන අලින් ගම් වැදීමට බලපාන හේතු කිහිපයක් නිගමනය කිරීමට හැකිවිය. ගෘහාශ්‍රිත ගවයන් ආහාර සඳහා රක්ෂිතය තුළට මුදා හැරීම ඉන් ප්‍රධානතම හේතුව ලෙසින් ඉදිරිපත් කළ හැකිය. වනාන්තර තුළට මුදා හරින ලද ගවයින් තණකොළ උලාකන අතරම කුඩා ගස් වර්ගද ආහාරයට ගනියි.

අලින් ආහාරයට ගනු ලබන්නේද කුඩා අතු කැබිලි සහිත ශාකයන්ය. දිනපතා 25000කට අධික ගවයින් ප්‍රමාණයක් රක්ෂිතය වෙත මුදා හැරීම මගින් අලින්ට ඔවුන්ගේ ආහාර අහිමිවීමේ අවධානම මතුවේ. මේ හේතුවෙන් අලින් අහාර සොයා ගම්මාන කරා ඇදී එන බව නිගමනය කළ හැකිවේ.

මෙහිදී අවධානයට ලක් වු කරුණු අතර අලි වැට ඉදි කිරීම නිසි පරිසි ඉදි කිරීම, නඩත්තු කිරීම, විදුලි වැට ගම්මාන ආශ්‍රිතව ඉදි කිරීම, පෞද්ගලිකව අලි වැටවල් ඉදිකිරීමට හැකි ක්‍රමවේදයක් වෙළෙඳපොළ තුළ පවතියි. ඒ සඳහා සහනදායි ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලබයි නම් එය වඩාත් යෝග්‍ය වනු ඇත. ඒ සම්බන්ධව ග්‍රාම නිළධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ වන ජීවී කාර්යාලය එක්ව ඒකාබද්ධ නිසි වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කිරීම සුදුසු වේ. අලින්ට වාසය කළ හැකි සුදුසු වාසස්ථාන ඇති කිරීම තවත් සුදුසු පියවරක් ලෙස ද තල් වැටවල් ඉදි කිරීම, කටු සහිත ශාක (දෙහි, දොඩම්, බෝගන්විලා, පතොක්) වගා කිරීම ආදී වූ ස්වභාවික පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කරමින් ගැටුම පාලනයට කඩිනම් සහ දීර්ඝ කාලීන වූ විසඳුම් ලබාදීම සිදු කළ යුතුය. වන අලි උවදුර සමනය කිරීම වෙනුවෙන් සිදු කරනු ලබන පර්යේෂණයක් ලෙස වගාභූමී වටා මී මැසි ජනපද ඉදිකිරීම දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ වස්ගමුව සහ වෙහෙරගල යන ප්‍රදේශයන්හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින අතර, මෙය අලි-මිනිස් දෙපාර්ශවයටම හිතකර විසඳුමක් ලෙස දැක්විය හැකිය. මී මැස්සන් නිසාවෙන් පරාගණ ක්‍රියාවලිය වැඩිවන අතරම අතුරු ප්‍රතිඵලයක් ලෙස මී පැණි ලැබීමද සිදුවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අමරසේකර, ඒ. (1994). සංරක්ෂණ රැල්ල වැඩි වෙතත් වන විනාශය අඩු නොවන්නේ ඇයි. *2*(2).

DeSilva, P. K. (1998). Status and Conservation of the Elephant (elephas maximus) and the alleviation of man-elephant conflict in Sri Lanka.

Prakash, S. L., Wijerathne, A. W., & Fernando, P. (2020). Human-Elephant Conflict in Sri Lanka: Patterns and Extent. *Gajah, 51*, 16-25.

Santiapillai, C., Wijeyamohan, S., Bandara, G., Athurupana, R., Dissanayake, N., & Read, B. (2010). An Assessment of the Human-Elephant Conflict in Sri Lanka. *Ceylon Journal of Science*, *39*(1), 21-33.

## Factors Affecting on the Rural Household Savings Behaviour (with special reference to Gampaha district)

J.A.N.Dilrukshi
*Department of Social Statistics, University of Kelaniya*
nawodadilrukshi92@gmail.com

***Abstract***

*Saving is the most important factor that affect on economic growth. It constitutes the basis for investment, capital formation, growth and development of a country. Developed countries have higher amount of household saving than developing countries. This study aimed to investigate the factors that affecting on rural household savings behaviour in Gampaha district. The data were collected from a cross sectional survey conducted through a structured questionnaire from 40 randomly selected households. Descriptive statistics including frequency, proportion, and percentage and multiple regression analysis, and reliability analysis were used to analyze the data using SPSS and Excel computer software. The results show that number of income earners, household income per month and education positively influence the respondent's decision to save. This demonstrates that an increment in one of these variables led to increase in household saving. Expenditure per month negatively influences the household's decision to save. Marital status does not effect on saving. It can be concluded that most of the households do save but with varying amounts.*

***Key words: Rural household, Savings behaviour, Economic growth***

## 1. INTRODUCTION

Saving is considered as a key macroeconomic variable. It is an important macroeconomic variable to be studied under the purview of the economic arena on an individual as well as household basis. As per Harrod,(1939) the speed of economic growth is determined by the ability to save because high savings rate will drive up the rate of investment and consequently stimulate economic growth. Saving means the share of income not spent on current expenditures. Rises in the savings ratio can have a very significant impact on economic activity. If people save more, it enables the banks to lend more to firms for investment. In economics, theoretically the level of savings equals the level of investment. Investment needs to finance from saving. Investment causes for saving and saving causes for investment. Both saving and investment causes for economic growth.

According to the classical economists including Adam Smith, David Ricardo and J.S. Mill, saving is an important determinant of economic growth. Saving components can base on an individual or on household basis, which proves to be the wellbeing. The benefits of savings are not limited only for the country, but also for the individuals. As for an individual saving becomes the cushion for the future's intercourse of the unforeseen and upcoming as well as the uncertain circumstances of life. Moreover, saving money is important for individuals as it helps protect us in the event of a financial emergency. Additionally, saving money can help us in pay for large purchases, avoid debt reduce our financial stress and giving safety for money too.

In the developed countries, the income is generated at a higher rate, which encourages people to have more savings which opines to more investment leading to more capital formation. To move third world countries to the path of development, rate of savings must be enhanced (Temam & Feleke, 2018). The household's savings contribute a major part of the national savings. Horioka & Watanabe, (1997), Wakabayashi & MacKellar, (1999) and Upender & Reddy, (2007) describe in their empirical studies that expound household saving contributes a lion's share of gross saving in the biggest economies such as China, Japan, USA, and India. These countries are among the countries with higher household saving in the world. It shows that developed countries have higher amount of household saving than developing and less developed countries. This highlighted that in any economy the household savings rate is a prime reason for the highs or lows economic development. For the developing countries including Sri Lanka, the household savings rate is a decisive factor of influencing the overall economic scenario. Developing countries do not have enough domestic savings. Because of that, the most of developing countries rely on foreign aid and debt for undertaking their investment. This in turn, increases country's debt burden. It leads to many socio economic and international political crises. Developing countries have to depend on developed countries because of the fewer saving in their countries. Less saving causes for less investment and it cause to rely on foreign aid. This becomes a vicious cycle. Sri Lanka is a developing country, which face this problem of low saving. The Gross Domestic Savings (GDS) rate of Sri Lanka is declining over the past few years. Therefore, it is important to study about savings and factors affecting on saving as it is a major component in deciding economic growth. Individual and household saving causes for national saving and it causes for investment.

Increasing the rate of saving is one-step that developing country can take to gain development as mention before. The household savings contribute a major part of national savings. In any economy, the household savings rate is a major cause to determine the economic development. There are many studies that done under the topic of factors affecting on household saving in world. However, it is difficult to find literature relate to the same topic on Sri Lanka. Therefore, it is important to investigate the factors that affecting on household savings behaviour.

Hence, the main objective of this study was to explore the factors that affect for rural household savings behaviour.

## 2. **LITERATURE REVIEW**

Jayasinghe et al., (2019) have investigated the factors influencing the savings investment behaviour on the success of small-scale cinnamon planters in Sri Lanka. That study adopted the mix method approach. In this study, sample of 50 respondents were selected using snowball sampling technique. Questionnaire and semi structured interviews have been used to collect data and the collected data have analysed using SPSS computer software. They have identified that the income level, interest rate, and gender, number of dependents, trustworthiness, convenience and precautionary purposes as the factors that had influenced these planters to save.

Gobiga,(2017), has conducted a study to identify the determinants of saving behaviour in Vellavely Division. The data for this study was analysed using the statistical techniques of univariate analysis, cross tabulation techniques, and regression analysis, chi-square test and hypothesis test. The data have collected from a sample with 100 units. This study has revealed that financial literacy and self-control have positively relate with household saving. According to chi- square test, there is a significant relationship between demographic factors and household saving behaviour.

According to Tadesse, (2020) savings is the fraction of income not instantly consumed but kept for future investment, consumption or for unforeseen contingencies in the future. This study investigated the saving behaviour of household and determinants of saving using primary data from 249 sample of household. Descriptive and inferential statistical analysis used to achieve the objective. This study revealed that 14.5% of the household were not saving in financial institutions whereas about 85.5% saved in financial institutions. The chi-square test of association revealed that age of household head, education level of household head, main occupation, knowing about the interest rate of financial

institution, having farm land, getting advice about saving were significantly associated with the saving status of households. The logistic regression showed that age of household, main occupations, knowing about interest rates, income of households and family size were the significant determinants of households saving status. Kumarasinghe & Jayasinghe, ( 2017) have studied on the determinants of household savings in the Colombo district. This study has investigated the factors that influence savings among household of farmers, teachers and entrepreneurs in Colombo district. The sample of the study consists of 90 farmers, teachers and entrepreneurs, which selected through convenience sampling. Primary data have collected through survey method. This study used four main factors of demographic, socioeconomic, income and individual factors to test the determinants of household savings. The result of this study has revealed that household savings are determined by socioeconomic factors, income factors and individual factors while demographic factors do not show a significant association with level of savings.

## 3. METHODOLOGY

The main objective of this study was to identify the factors affecting on rural household saving behavior. Primary data were collected through questionnaire surveys and secondary data were collected from published documents of district secretariat- Gampaha, reports of the Department of Census and Statistics, published articles, reports and documents. Population for this study was the head of the householder of rural families in Gampaha District. Sample size for the study was 40 households (17 households from Dompe pradeshiya sabha and 23 households from Mahara pradeshiya sabha). The sampling method used in the study was simple random sampling. Collected data were analyzed using the SPSS software and MS Excel.

## 4. RESULTS

### 4.1 Demographic factors of sampled households

Out of the sample households taken for the study, the most number of house heads are male (85%). The Female house heads are accounted for approximately 15%, showing a lesser response rate compared to the males. Majority of the head of the household falls under the age group of 55-65 which is 40% out of the sample. On the other hand, 35% of them are in the age group of 45-55. 15% of them are in the age group of above 65. 10% are in the age group 25-35(5%) and 35-45(5%). The marital status of the head of the households also determines the saving behavior of the rural households. In the selected sample there are no separate house heads. Vast

majority (72.5%) of house heads are married. On the other hand 15% of the house heads are unmarried. Out of the sample, 12.5% are recorded as widowed. Majority (52.5%) have the advanced level education, followed by 32.5% have ordinary level education, while 7.5% are graduated from a university respectively.

The average household size of the respondents is 3.80. According to the table 1, majority of families have 4 members (45%). About 30% of households have 3 members. Around 20% of the households consist of the household size of five members. The lowest number of families constitute of two members, which is 5%.

*Table 1: Distribution of households by size*

| Family size | Frequency | Percent |
|---|---|---|
| 2 | 2 | 5% |
| 3 | 12 | 30% |
| 4 | 18 | 45% |
| 5 | 8 | 20% |
| Total | 40 | 100.0 |

Source: Sample Survey Data 2021

Number of income earners and the dependents also plays a major role in determining the saving behavior of the rural households. According to the selected sample, the average household size of the respondents is 3.8. The average number of dependents is 1.25 and average number of income earners is 2.55.


*Table 2: Number of income earners and dependents*

| | N | Minimum | Maximum | Mean |
|---|---|---|---|---|
| No of family members | 40 | 2 | 5 | 3.80 |
| No of dependents | 40 | 0 | 3 | 1.25 |
| No of income earners | 40 | 1 | 4 | 2.55 |

Source: Sample survey data 2021

According to the selected sample 97.5% house heads engaged in various occupations. Majority of them are involved in business (19). Equal numbers of them are engaged in government sector job (15%) and private sector job (15%). Least number of people involve in the job category of agriculture (5%). Another 5% of them are retired.

*Figure 1: Occupation of the heads of households*




Source: Sample survey data 2021


*Table 3: Income and expenditure of the head of households*

| | N | Minimum | Maximum | Mean | Std. Deviation |
|---|---|---|---|---|---|
| Income of the house | 40 | 0 | 60000 | 36125.00 | 11955.446 |
| Family income | 40 | 20000 | 140000 | 82250.00 | 28169.587 |
| Family expenses | 40 | 40000 | 90000 | 61550.00 | 14223.401 |

Source: Sample survey data 2021

Householder income lies between Rs. 0- Rs. 60 000. Average value of head of household income is 36 125.00. Family income lies on 20000-140000. Income is a positive factor that analyses the savings of a country or an individual. If the income level of the respondents is low, the marginal propensity to consume is high. Then the rate of savings will be lower.  Average value of family income is 82 250.00. Family expenses lies between 40000- 90000. Average value of family expenses is 61 550.00. There is a big gap between income and expenditure. High income with low expenditure means they have the habit of savings.

*Figure 2: Distribution of income and expenditure*




Source: Sample survey data 2021

According to the figure no 2, there is a big gap between family income and family expenses. Most of them spend their income to satisfy their basic needs. For every person it is necessary to satisfy his or her basic needs.

### 4.2 Savings Habit of households

Majority (90%) of the respondents save whiles 10 percent of them to do not save. The reasons given by respondents who do not save include “insufficient income”, “high number of dependents” and “difficulty in accessing financial institutions”.

Majority of them save money to use in unforeseen contingencies. 90% of them save money to use in unforeseen contingencies. 77.5% of them save money to use for children’s educational purposes. Half of them save money to use after retirement. Majority of them does not think that financial security is not a major factor that effect on saving. But 12 of them think that financial security drives them to save. According to the table 10, 6 of them think that saving helps to use as an extra income while 34 of them do not think so.

*Table 3: Factors effect on saving*

| | **Reason** | **Yes** | **No** |
|---|---|---|---|
| Reasons for not saving | Income is not sufficient | 4 | 36 |
| | No need to save money | 2 | 38 |
| | Not enough knowledge about financial institutions and their benefits | 1 | 39 |
| | Difficulty in accessing | 4 | 36 |
| | Other | 1 | 39 |
| Reasons for saving | To use in unforeseen contingencies | 36 | 4 |
| | To use for children's education purposes | 31 | 9 |
| | To use after retirement | 20 | 20 |
| | Financial security | 12 | 28 |
| | As an extra income | 6 | 34 |
| | Other | 10 | 30 |

Source: Sample survey data 2021

In this study, several factors are identified which affect for rural household savings (savings per month) and a multiple regression model was estimated to identify the effect of those factors. The dependent variable of this study was amount of household savings (per month). The independent variables of this study were family income (monthly income), family expenditure (monthly expenditure), number of income earners, number of years of education (education level) and marital status. Based on those variables, estimated regression model can be shown as follows.

$$\hat{y} = -6692.310 + 0.598x_1 - 0.599x_2 + 3484.506x_3 + 362.493x_4 + 309.985x_5$$

There is a positive relationship between household saving and household income, household saving and number of income earners, household saving and house heads education(by years) and household saving and marital status of the house head.

When family income ($x_1$) increases by one unit household savings ($\hat{y}$) are predicted to increase in .598, when other variables are constant. When family expenditure($x_2$) increases by one unit household savings($\hat{y}$) are predicted to decrease in .599. When the number of income earners increases by one ($x_3$) the dependent variable increases by 3484.506, when other independent are constant. When years of study ($x_4$ ) increase from 1 year household saving($\hat{y}$) increases by 362.493.

The results of the multiple regression show that number of income earners, household income per month and education positively influences the respondent's decision to save. According to the table, $\hat{\beta}_0$ , $\hat{\beta}_1$, $\hat{\beta}_2$, $\hat{\beta}_3$ and $\hat{\beta}_4$ coefficients become significant at the 5% significant level and marital status become not significant at 5% significant level. However, expenditure per month negatively and significantly influences the respondent's decision to save. Marital status of the respondent doesn't effect on saving.

## 5. CONCLUSION

According to the data analysis, the majority of the head of the households are male. Since Sri Lanka is a patriarchal society, it is common for head of the household to be male. The age groups falling between 15-65 years are considered as the productive or earning population. The study revealed that most (85%) of the respondents are in the active age group (15-65). Again the majority of the respondent has advanced level as the highest educational level and most of them are married (72.5%). The study reveals that majority of the head of the households have an occupation. Mean income of head of household, mean value of family income and mean value of household expenditure are Rs. 36 125.00, Rs. 82 250.00 and Rs. 61 550.00.

The findings of the study revealed that 90 percent of the respondents do saving. The majority (60 %) of those who save prefer saving in the bank. Most of the respondents gave safety of savings and rate of return as the major reason influencing their decision to save a particular institution. 10% of them do not save. Respondents who don't save gave lack of income and access to financial institution in kilometers are major factors that that influence them not to save. Respondents save money to use in unforeseen contingencies, to use after retirement, for safety reasons and because of the interest etc.

The main objective of this study is to identify factors affecting on rural households saving behaviour. According to the results of the multiple regression, it accomplished that number of income earners, household income per month and education positively influences the respondent's decision to save. However, expenditure per month negatively and significantly influences the respondent's decision to save. Marital status of the respondent does not effect on saving.

## REFERENCES

Gedela, S. P. (2012). Determinants of savings behavior in rural and Tribal household: an Empirical analysis of Visakhapatnam district. *International journal of research in social science*, 108-128.

Harrod, R.F. (1939, March 1). An Essay in Dynamic Theory. *The Economic Journal, Volume. 49*(Issue 193), Pages 14-33.

Horioka, C. Y., & Watanabe , W. (1997, May). Why Do People Save? A Micro-Analysis of Motives for Household Saving in Japan. *Economic Journal, Royal Economics Society, Vol. 107*(No. 442), PP. 537-552.

Temam, G. D., & Feleke, S. E. (2018, March 10). Determinants of Saving Among Rural Households in Ethiopia: The case of Wolaita and Dawro Zone,SNNPR. *International Journal of Advanced Research(IJAR), Vol. 6*(No. 3), PP. 731-739.

Upender, M., & Reddy, N. L. (2007). Saving Behaviour in the Indian Economy. *International Journal of Applied Econometrics and Quantitative Studies, Vol. 4*(No. 1), PP. 37– 56.

# කර්තෘ නාම ලේඛනය


| | |
|---|---|
| ඊ. පී. පී. එච්. එදිරිවීර | 117 |
| එච්. එල්. ඒ. මහේෂා සෙව්වන්දි | 77 |
| එන්. බී. පී. උපේක්ෂානී | 103 |
| එස්. එම්. ජී. සී. සමරකෝන් | 11 |
| එස්. ඒ. එස්. ඩී. ජයතිලක | 01 |
| එස්. ජේ. එස්. එස්. දිනෙත්සලා | 61 |
| කේ. එම්. එස්. එම් සමරවීර | 23 |
| පී. ඒ. ඒ. මධුහංසනි | 95 |
| ඩබ්. එන්. ප්‍රීතිමාලි | 37 |


# Author Index


| | |
|---|---|
| J.A.N.Dilrukshi | 131 |